# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2013 ජූලි 09 වන අඟහරුවාදා**
2013 ஜூலை 09 செவ்வாய்க்கிழமை ஐ
Tuesday 09th July 2013

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාත් සභා නව ගොඩනැගිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවති සභා රැස්වීම**

பத்தரமுல்ல, ஸ்ரீ ஜயவர்த்தனபுர, டென்சில் கொப்பேகடுவ மாவத்தை, இல.204 இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்.

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.35 පළාත් සභාව රැස් විය.**
*மு.ப.09.35 க்கு சபை கூடியது*
*The Provincial Council met at 09.35 a.m.*

**ගරු සභාපතිතුමා [ සුනිල් විජේරත්න මහතා ] මූලාසනාරූඪ විය.**
*திரு. தவிசாளர்[ சுனில் விஜேரத்ன அவர்கள் ] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

# සභාපතිවරයාගේ නිවේදනය
## ANNOUNCEMENT OF CHAIRMAN

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නොබෝදා සිදුවූ අභිනව මන්ත්‍රීධූරාප්‍රාප්තිය හේතුකොට ගෙන විපක්ෂයේ මන්ත්‍රී ආසන සංයුතියේ සුළු වෙනස්වීමක් සිදු කර තිබෙන බව කාරුණිකව දැනුම් දෙනවා.

සභා රීති ප්‍රකාරව මෙන්ම හැකිතාක් දුරට සභා සම්ප්‍රදායන්ට ද ගරු කරමින්, ජ්‍යෙෂ්ටතාවයට ද හානියක් නොවන පරිදි මෙම සංශෝධනයන් සිදුකර ඇති අතර, එම ආසන පැනවීම සම්බන්ධව කිනම් හෝ ගරු මන්ත්‍රීවරයෙකුට යම් අපහසුතාවයක් හෝ අසාධාරණයක් සිදු වී යැයි කල්පනා කරනවා නම්, ඒ බව මා වෙත හෝ සභාවේ ලේකම්තුමා වෙත ලිඛිතව දැනුම් දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා.

ඒ සම්බන්ධයෙන් සභා රීති ප්‍රකාරව ලබා දිය හැකි යම් සහනයක් වේ නම්, එය ලබා දීමට නොපැකිලව කටයුතු කරන බවත් කාරුණිකව දැනුම් දෙනවා.

# කාරක සභා වාර්තා
## COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2013.06.18 දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව මම ගරු ඔබතුමන්ලා වෙත පිළිගන්වනවා.

***අදාළ වාර්තාවේ පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***
*Hon. Chairman declared that a copy of the relevant report is placed on the tables of the Hon. Members.*

# පෙත්සම්
## PETITIONS

**ගරු අශෝකා ලංකාතිලක**
Hon. Asoka Lankathilaka

ගරු සභාපතිතුමනි, වැල්ලම්පිටිය, මෙගොඩකොළොන්නාව, අංක 177/3 බී හි පදිංචි බී.එම්. ජුමාරා යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***
*Petitions Presented, ordered to refer to the Petitions committee*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## ORAL ANSWERS TO QUESTIONS

## කළුතර මෝල්කාව මධ්‍යම බෙහෙත් ශාලාව
CENTRAL DISPENSARY OF MOLKAWA, KALUTARA

**01.**

**කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා විසින් ගරු සෞඛ්‍ය, දේශීය වෛද්‍ය සමාජ සුභසාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමාරක්ෂක සේවා සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/v/(1)13/09)**

අ. කළුතර සෞඛ්‍ය වෛද්‍ය අධිකාරි කාර්යාලයෙන් පාලනය වන මෝල්කාව මධ්‍යම බෙහෙත් ශාලාව ඉතා දුෂ්කර ප්‍රදේශයක පිහිටි මහජනතාවට අත්‍යවශ්‍ය බෙහෙත් ශාලාවක් බව ඔබතුමා දන්නෙහිද?

ආ. එම මධ්‍යම බෙහෙත් ශාලාවෙහි වහල, දොරවල් දිරාපත් වී කැසිකිලි පද්ධතිය අක්‍රීය වී, පානීය ජලය සඳහා ඇති ළිඳ අපවිත්‍ර වී, සිවිලිම කඩා වැටෙමින් පවතින බව ඔබතුමා දන්නෙහිද?

ඇ. විශාල පිරිසක් සතියකට දෙවරක් ප්‍රතිකාර ලබා ගන්නා මෙම මධ්‍යම බෙහෙත් ශාලාව ප්‍රතිසංස්කරණය කර පාවිච්චියට සුදුසු තත්ත්වයට පත් කළ යුතු බව ඔබතුමා පිළිගන්නේද?

ඈ. එසේ පිළිගන්නේ නම් ඔබතුමා මෙතෙක් ඒ සඳහා ගෙන ඇති ක්‍රියා මාර්ග මොනවාද?

ඉ. එසේ ක්‍රියාමාර්ග ගෙන නොමැති නම් ඒ කුමක් නිසාද?

**ගරු ජගත් අංගගේ** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමා)
Hon. Jagath Angage (Minister of Health, Indigenous Medicine, Social Welfare and Women's Affairs , Probation and Child Care Services and Council Affairs)

අ. ඔව්.

ආ. ඔව්.

ඇ. ඔව්.

ඈ. 2012 වර්ෂයේ මෙම අඩුපාඩු සකස් කිරීමට මිල ගණන් කැඳවන ලද අතර, එහි ඇස්තමේන්තු මුදල රු. 500,000/- ක් විය. නමුත් එකම කොන්ත්‍රාත්කරුවෙකුවත් ඒ සඳහා ඉදිරිපත් නොවීම නිසා නවීකරණ කටයුතු ප්‍රමාද විය.

එබැවින් 2013 වර්ෂය සඳහා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ අනුමත වී ඇති අරමුදල්වලින් එනම් කළුතර දිස්ත්‍රික්කයේ හදිසි අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් වෙන් කර ඇති අංක A36462165001 දරන ව්‍යාපෘතිය යටතේ හොරණ ප්‍රාදේශීය ඉංජිනේරු විසින් රු. 1,500,000/- ක ඇස්තමේන්තුවක් සකස් කර ඇති අතර, කොන්ත්‍රාත්තුව බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි සමිතියකට පවරා දීමට අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව මෙම මධ්‍යම බෙහෙත් ශාලාවේ බිම ටයිල් කිරීමද ඇතුළත්ව ඉහත "ආ" යටතේ සඳහන් අලුත්වැඩියා කටයුතු සිදු කිරීම මෙම වර්ෂයේ ජුලි මස ආරම්භ කිරීමට හැකි බවත්, මාස 03 ක් පමණ කාලයකදී වැඩ අවසන් කළ හැකි බවත් දන්වමි.

ඉ. අදාළ නොවේ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, මා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රශ්නවලට උත්තර දීමේදී ගරු ඇමතිතුමා කිව්වා, මාස තුනක් ඇතුළත මෙහි ඉදිකිරීම් කටයුතු අවසන් කරනවා කියලා. ගරු සභාපතිතුමනි, මම හිතන්නේ ගරු අමාත්‍යතුමාත්, ඒ අවශ්‍ය නිලධාරීනුත් අපිත් ගිහිල්ලා මෙය සාකච්ඡා කළොත් හොඳයි කියන මතයේ තමයි මාත් සිටින්නේ. ප්‍රසන්න රණතුංග අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා සෞඛ්‍ය අමාත්‍යවරයා වශයෙන් කටයුතු කළ කාලයේ තමයි මේ ආයතනය පිහිටුවලා, ඉඩම පළාත් සභාවට පවරාගෙන තිබෙන්නේ. නමුත් එතැනදී දැන් ගැටළුවක් ඇති වෙනවා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, දැන් ඔබතුමාට දීර්ඝ විස්තරයක් කරන්න ඉඩ දෙන්න අමාරුයි. මේ සම්බන්ධව ඔබතුමාට ප්‍රශ්න තුනක් අහන්න ඉඩ දෙන්න පුළුවන්.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඔබතුමාගේ මාර්ගයෙන් මම ඉල්ලීමක් කරනවා ගරු අමාත්‍යතුමාත්, නිලධාරීනුත් අපිත් ගිහිල්ලා ඒ වැඩ කටයුතු කළොත් හොඳයි කියලා. නැත්නම් මාස තුනෙන් මේක ඉවර කරන්න බැරි වන තත්ත්වයක් තිබෙනවා. ඉඩමේ අයිතිය පිළිබඳව ගැටළුවක් තිබෙනවා. ඒකට එතුමාත් එක්ක යොමු වෙන්න හැකි වෙනවා නම් හොඳයි.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ගරු සභාපතිතුමනි, ඒ පිළිබඳව ප්‍රශ්නයක් නැහැ. ඒ ඉඩම පිළිබඳව අපට දැනට ගැටළුවක් මතු කරලා නැහැ. ඒ නිසා අපට ඉදිකිරීම් කටයුතුවලට බාධාවක් වෙලා නැහැ.

# නොපැමිණ සිටීමේ අවසරය
# LEAVE OF ABSENCE

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු සභාපතිතුමනි, *"නිහාල් ජයවර්ධන ගරු මන්ත්‍රීතුමාට මාස තුනක කාලයක් සඳහා නිවාඩු අනුමත කර දෙන මෙන් ඉල්ලා සිටිනවා."*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, *"නිමල් ආර්. පීරිස් ගරු මන්ත්‍රීතුමා හට මාස තුනක කාලයක් සඳහා නිවාඩු අනුමත කර දෙන මෙන් ඉල්ලා සිටිනවා."*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. මම මේ පළාත් සභාවට ගිය අවුරුද්දේ අගෝස්තු මාසයේ පෙත්සමක් ඉදිරිපත් කළා. ඔබතුමාගේ ප්‍රධානත්වයෙන් ඒ පෙත්සම විභාග කරලා බොහොම පැහැදිලි තීන්දුවක් දුන්නා. වත්තල ප්‍රාදේශීය සභාවේ අකටයුත්තක් පිළිබඳව. ඒ පෙත්සමෙන් දීපු නියෝග කිසිම දෙයක් ඉෂ්ට කරන්නේ නැතිව, වත්තල ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා හිතුවක්කාර විධියට ඒ කටයුත්ත කළා. මේ සභාවේ පෙත්සම් කාරක සභාවෙන් දුන් තීන්දුව මොනම විධියකටවත් පිළිගත්තේ නැහැ. මම ගිය සභා වාරයේදී මේ ප්‍රශ්නය මතු කළා. වරිපනම් අංකත් නිකුත් කරලා තිබෙනවාය කියලා කිව්වා. ක්‍රීඩා පිටියේ ගෙයක් හදපු එක පිළිබඳව ගරු ප්‍රධාන අමාත්‍යතුමා

මගෙන් විස්තර ඉල්ලා ගත්තා මේ ගැන මම බලන්නම් කියලා. නමුත් අද වන තෙක් ඒ ප්‍රශ්නයට නියම පිළිතුරක් ලැබිලා නැහැ.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

වත්තල ප්‍රාදේශීය සභාවම වික්කා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ඒ හේතුව නිසාම ගියවර වත්තල ප්‍රාදේශීය සභාවේ රැස්වීමේදී මන්ත්‍රීවරු හය දෙනයි හිටියේ. ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ මන්ත්‍රීවරු කිහිප දෙනෙක්ම නැගිටලා ගියා. විපක්ෂය සම්පූර්ණයෙන්ම නැගිටලා ගියා. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු තුන් හතර දෙනෙක් නැගිටලා ගියා. හය දෙනාගෙන් තමයි සභාව ගෙන ගියේ. සම්පූර්ණ නීති විරෝධී වැඩක් කළේ. මේ හේතුවම තමයි ඒකට හේතු වුණේ. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුත් විරුද්ධත්වය ප්‍රකාශ කරලා නැගිටලා ගියා. මම අහන්නේ අපි පෙත්සමක් ඉදිරිපත් කරලා - (බාධා කිරීම්)

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

එහෙම දෙයක් නැහැ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

තමුන්නාන්සේ කෑ ගැහුවාට තමුන්නාන්සේගේ හෘද සාක්ෂියත් දන්නවා ඇත්ත මොකක්ද කියලා ඉවර වෙලා. ඒ නිසා ගරු සභාපතිතුමනි, මම ඔබතුමාගෙන් අහන්නේ අපි මේ සභාවට පෙත්සමක් ඉදිරිපත් කරලා, ඒක විභාග කරලා, ඒකට තීන්දුවක් දුන්නාම ඒ තීන්දුව නොසලකා හැර, ඊට පස්සේ දිගින් දිගටම මේ පිළිබඳව කටයුතු කරන්නය කියලා මේ සභාවේදී කටයුතු කළාම ප්‍රධාන ඇමතිතුමා ඒ පිළිබඳව කටයුතු කරන්නම් කියලා ඉල්ලපු අවස්ථාවකවත් මොකක්ද අපේ තත්ත්වය? මේ සම්බන්ධයෙන් තමුන්නාන්සේගේ ඉදිරි පියවර මොකක්ද කියලා මම අහන්න කැමැතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු සභාපතිතුමා, සාමාන්‍යයෙන් අපි පෙත්සම් කාරක සභාවේ නියෝගයක් දෙන්නේ නැහැ. අපි සාමාන්‍ය සම්ප්‍රදාය තමයි පෙත්සම සම්බන්ධව සාකච්ඡා කරලා අදාළ පළාත් පාලන ආයතනයට උපදෙස් දෙනවා මේ සම්බන්ධව සාධාරණ තීන්දුවක් ගන්නය කියලා. ඒකයි සාමාන්‍යයෙන් පෙත්සම්වල සිද්ධ වෙන්නේ. ඒ පිළිබඳව නැවත වරක් සොයා බලන්නම්.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

මම මේකට සාධාරණ පිළිතුරක් ඉල්ලන්නේ. ඔබතුමා දන්නවා මේ බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන දිගින් දිගටම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. කොහොමටත් නියෝගයක් දෙන්න අපට බලයක් නැහැ. අපි -

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

අද ජනමාධ්‍ය ආයතන දිහා බලපුවාමත් ඒක -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සාමාන්‍යයෙන් වෙන දේ තමයි අපි -

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

එකක් නොවෙයි. දෙකක් නොවෙයි. තුනක් නොවෙයි. දිගින් දිගටම බස්නාහිර පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල සභාපතිවරු වැරදි කරනවා.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

ඕවා වැරදියි. වත්තල නගරාධිපති වංචා කළා කියලා -

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා, ඔබතුමා නිශ්ශබ්ද වෙන්න. ඔබතුමා බාධා කිරීම් කරන්න එපා. ඔබතුමා බාධා කිරීම් කරන්නේ මොකද? කරුණාකරලා ඔබතුමා නිශ්ශබ්ද වන්න.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

එතුමා කථා කරන්නේ හෘද සාක්ෂියට විරුද්ධව. (බාධා කිරීම්)

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා ඔබතුමා නිශ්ශබ්ද වන්න. එතුමා වරප්‍රසාද ප්‍රශ්නයක් යොමු කරන්නේ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

එතුමාත් දන්නවා මේකේ ඇත්ත කතන්දරය. එතුමාත් කැමැතියි මම මේක කථා කරනවාට. නමුත් අර බොරුවට විරුද්ධ වෙන්න ඕනෑ හන්දා විරුද්ධ වෙනවා. ඒකයි ඇත්ත කතන්දරය. (බාධා කිරීම්)

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

මම හිතන්නේ ගරු සභාපතිතුමනි, අපි දීර්ඝ වශයෙන් මෙය සාකච්ඡා කළ යුතු නැහැ. අපි ප්‍රධාන පෙත්සම් කාරක සභාවට මේක නැවත යොමු කරලා, එතුමාවත් කැඳවලා, පළාත් පාලන කොමසාරිස්, අපේ අමාත්‍යාංශ ලේකම්තුමාත් එක්ක අපි සාකච්ඡාවක් කරමු.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, ඇත්තෙන්ම මේ පිළිබඳව මගේ අදහස් දැක්වීමක් කරන්න කැමැතියි. වරප්‍රසාද ප්‍රශ්නයක් විධියට. මමත් පෙත්සම් ගණනාවක් මේ සභාවේ පෙත්සම් කාරක සභාවට ඉදිරිපත් කරලා තිබෙනවා. අපි ඒ ඉදිරිපත් කරන්නේ, පළාත් සභාව යටතේ පවතින ආයතනයකින් යම්කිසි පුද්ගලයෙකුට හෝ කෙනෙකුට අසාධාරණයක් සිද්ධ වුණාම, ඒ අසාධාරණය පෙනී පෙනීම තිබෙද්දී ඒක සාධාරණීකරණය කර ගැනීම සඳහා ඒ පුද්ගලයා විශ්වාස කරනවා, පළාත් සභාවේ පෙත්සම් කාරක සභාවට ගියාම මට යම් සාධාරණයක් වෙයි කියලා. ඒ අනුව තමයි මේ ගරු මන්ත්‍රීවරු හරහා මේ පෙත්සම් කාරක සභාවට පෙත්සමක් ඉදිරිපත් කරන්නේ. අපි සද්භාවයෙන්ම ඒ මනුස්සයාට අගතියක්, අසාධාරණයක් වෙලා තිබෙනවා කියලා දැන දැනම, අපි ඒකට සාධාරණය කරන්න කියලා අපේ සභාව යටතේම තිබෙන ආයතනයකට දැනුම් දුන්නාම, ඒක ක්‍රියාත්මක නොකරනවාය කියලා කියන්නේ, සමස්ත පළාත් සභාවම හැල්ලුවට ලක් කිරීමක්. ඒ නිසා එහෙම වෙන්න දෙන්න පුළුවන්කමක් නැහැ. මොකක්ද මේ පළාත් සභාවේ මාර්ගෝපදේශකත්වය? ඒ නිසා ගරු සභාපතිතුමනි, මම කියන්නේ මේකේ අපට බලපෑමක් කරන්න බැරි වුණත්, හැබැයි අපි අර ප්‍රඥප්ති කාරක සභාවල දිගින් දිගටම මතක් කළා, මේකට නෛතික බලයක් දීලා මේ කටයුත්ත කරන්න කියලා. නැත්නම් මිනිස්සු තුළත් අපි ගැනත් ඇති වෙන්නේ, මොකාට ගිහිල්ලා කිව්වත් මේකේ ඇති ප්‍රතිඵලයක් නැහැයි කියලා.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. දිගින් දිගටම මේ ගැන පැහැදිලි කිරීම් අවශ්‍ය නැහැ. මට තේරෙනවා. නමුත් ගරු -

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

පෙත්සම් කාරක සභාවේ සාමාජිකයෙක් විධියට කරුණු පැහැදිලි කරන්නේ. පෙත්සම් කාරක සභාවේ සභාපති ධූරය දරන්නේ ඔබතුමා. ඒ නිසා මේ පෙත්සම් කාරක සභාව ගන්නා තීන්දු තීරණ, දෙන නියෝගය පිළිබඳව දැන් ගැටළු මතු වෙලා තිබෙනවා. ඒ නිසා ඔබතුමා ගරු ප්‍රධාන අමාත්‍යතුමා එක්කත්, ඇමති මණ්ඩලයත් එක්කත් කථා කරලා යම් තීන්දුවක් ප්‍රකාශ කරන්න. නැත්නම් අපි ඔතැන පැය ගාණක් වාඩි වෙලා කීයක් හරි අරගෙන ගිහිල්ලා තේරුමක් නැහැ. ගරු ප්‍රධාන අමාත්‍යතුමා යටතේ පළාත් පාලන ආයතන තිබෙනවා. අපට පුළුවන්නේ තදින් නියෝගය ක්‍රියාත්මක කරන්න. මම ස්තුතිවන්ත වෙනවා සෞඛ්‍ය එකෙයි අධ්‍යාපනයෙයි යම් යම් අවස්ථාවලදී දෙපාර්තමේන්තු ප්‍රධානීන් භාර ගෙන කටයුතු කරනවා. නමුත් සමහර උදවිය මෙහෙම කටයුතු කරන්නේ නැහැ. පළාත් සභාව තවදුරටත් හැල්ලුවට ලක් කරන්නද හදන්නේ කියන එකයි දැන් ප්‍රශ්නය. ඒ නිසා වර්තමානයේ තිබෙන තත්ත්වය උඩ විශේෂයෙන් ඊළඟ සභාවේදී ඔබතුමාගෙන් බලාපොරොත්තු වෙනවා මේ පිළිබඳව පැහැදිලි තීන්දුවක් මේ සභාවට ප්‍රකාශ කරන ලෙස. ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඇත්ත වශයෙන්ම අපි පෙත්සම් කාරක සභාවේදී ගන්නා යම් යම් තීන්දු බොහෝ දුරට අදාළ පළාත් පාලන ආයතනවලින් ක්‍රියාත්මක කරන්නේ නැහැ. ඒක ඇත්තටම කනගාටුදායක සිද්ධියක්. තීන්දු අපි ප්‍රකාශ කළත්, බොහෝ පළාත් පාලන ආයතන ඒවා ක්‍රියාත්මක කරන්න, බොහෝ දුරට ඒ තීන්දු ගණන් ගන්නේ නැහැ, ඒ නිසා අදාළ විෂය භාර අමාත්‍යතුමාගෙන් විශේෂයෙන් මම ඉල්ලා සිටිනවා -

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු සභාපතිතුමනි, ඒ ප්‍රකාශයට මම එකඟ වෙන්නේ නැහැ. පළාත් පාලන ආයතනවලට අපි දෙන්නා වූ යම් යම් උපදෙස් ඒවා ක්‍රියාත්මක කරනවා. ඒකේදී අපේ තිබෙන වරද තමයි අපි සෘජුව පළාත් පාලන ආයතනයට නියෝග දීමට යාම. පෙත්සම් කාරක සභාව නියෝගය ලබා දෙන්න ඕනෑ, අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයාට. එතකොට ලේකම්වරයා හරහා තමයි මේ නියෝගය යන්නට ඕනෑ. ඉතින් මේ ක්‍රමවේදය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි දෙන නියෝගය එහෙමයි.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ඒ නිසා අපි ලේකම්වරයා ගෙන්වලා මේ සම්බන්ධව යළි ක්‍රියාමාර්ග -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි ලේකම්වරයාටයි නියෝගය දෙන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, මොන වරප්‍රසාද යටතේද මෙතුමා කථා කරන්නේ මේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. හරි හරි ඒක -

**ගරු නිමල් ලාන්සා** (මාර්ග සංවර්ධන, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, නිවාස හා ඉදි කිරීම්, ධීවර හා සංචාරක අමාත්‍යතුමා)
Hon. Nimal Lansa - (Minister of Road Development, Animal Production and Development, Housing and Construction, Fisheries and Tourism)

එතුමා මොන වරප්‍රසාද යටතේද කථා කරන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු සංවිධායකතුමා, සාමාන්‍යයෙන් අපි පෙත්සම් කාරක සභාවේ නියෝගය අදාළ අමාත්‍යාංශ ලේකම්තුමාට ලබා දෙන්නේ.

**ගරු උපාලි කොඩිකාර** (ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමුපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Upali Kodikara (Minister of Transport, Sports and Youth Affairs, Cultural and Arts Affairs, Cooperative Development, Food Supplies and Distribution and Rural Development)

පෙත්සම් කාරක සභාව ගන්නා වූ සමහර තීරණ - ඒ කියන්නේ, සමහර විට මට, මගේ අමාත්‍යාංශයට එනවා බලපත්‍ර නිකුත් කරන්න කියලා. එතකොට මට බලපත්‍රයක් නිකුත් කරන්න තිබෙන බලතල සහ නීතිරීති, වැඩ වර්ජන ඒ ඔක්කොම තේරුම් අරගෙන කථා කරලා කරන්න ඕනැ. දැන් සමුපකාර ප්‍රශ්නවලදී. සමහර ඒවා පිළිබඳ පරීක්ෂණ පවත්වලා නැහැ. එතකොට මේවා කරලා අපට එවනවා තීරණ ගන්න කියලා. අපට තීරණ ගන්න බැහැ ඒ වාගේ දේවල් සම්බන්ධව. ඒ වාගේ ගැටළු තිබෙන තැන්වලදී අදාළ ඇමතිවරුන් එක්කත් පෙත්සම් කාරක සභාවට කැඳවන්න. එතකොට තමයි මේ ප්‍රශ්න විසඳෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, අපි ඒ පිළිබඳව දිගින් දිගටම සාකච්ඡා කළ යුතු නැහැ. අපි අදාළ නියෝගය ලේකම්තුමාට දෙන්නේ. අදාළ අමාත්‍යාංශයේ ලේකම්තුමාට තමයි නියෝගය නිකුත් කරන්නේ.

**ගරු ඒ.එම්. යුසුෆ්**
Hon. A M Yoosuf

ගරු සභාපතිතුමනි, අපි ඇමතිවරයා ගෙන්වන්නේ නැහැ. අදාළ අංශයේ ප්‍රධානියා ගෙන්වන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රධානියාව ගෙන්වන්නේ අපි.

**ගරු ඒ.එම්. යුසුෆ්**
Hon. A M Yoosuf

ලේකම් එක්කයි නිලධාරීන් එක්කයි කථා කරලා තීන්දු ගන්නේ. ඇමතිවරයාව කැඳවන්න බැහැ. එතුමන්ලාව හැල්ලු වෙනවා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ඔබතුමා කියන කතන්දරේ. නිලධාරීන් ගෙන්වලා නිලධාරීන්ට නම් ඒ නියෝගය නිකුත් කරන්නේ, නිලධාරියා කියන එක්කෙනා එය ක්‍රියාත්මක නොකළොත් නිලධාරියාට විරුද්ධව අපට කටයුතු කරන්න පුළුවන්. නමුත් සභාවක සභාපතිවරයෙකුට වඩා නිලධාරියෙකුට දෙන නියෝගයක් නිලධාරියෙක් ක්‍රියාත්මක නොකරනවා නම් මම හිතනවා, මේ සභාවට ඊට වඩා බලතල තිබෙනවා. නිලධාරියා පිළිබඳව කටයුතු කරන්න.

**ගරු රේණුක දුෂ්‍යාන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ඒක තමයි මම කියන්නේ.

**ගරු ඒ.එම්. යුසුෆ්**
Hon. A M Yoosuf

ඒක තමයි. ඇමතිවරුන්ව ගෙන්වලා හැල්ලු කරන්න බැහැ.

# අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ
MINISTRIES' ANNOUCEMENTS/ MINISTER'S STATEMENTS

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම අපේ සභාවට දන්වන්න ඕනැ. අපේ 39 වැනි ජාතික ක්‍රීඩා උළෙලේදී මේ වන කොට අපි රන් පදක්කම් 39 ක්, රිදී පදක්කම් 24, ලෝකඩ පදක්කම් 26 ක් අපි ජයග්‍රහණය කරලා තිබෙනවා. ඊයේ පෙරෙයිදා කතරගම පැවැති පාපැදි තරඟය, මැරතන් තරගය මේ සියල්ලක්ම අපි තමයි පළාත් සභාවක් හැටියට ජයග්‍රහනය කළේ. මහ ඇමතිතුමාගේ උපදෙස් පරිදි ඒ බයිසිකල් ධාවනය කරන ක්‍රීඩකයන්ට අපි සියලුම උපකරණ අරන් දුන්නා. අවශ්‍ය චේන් අරන් දීලා, රෝද අරන් දීලා, ටයර් අරන් දීලා ඒගොල්ලන්ට විටමින්, බෙහෙත් වර්ග අරන් දීලා මේ තුළින් අපි විශාල ප්‍රතිඵලයක් ලැබුවා. වාර්තා සහිතව පිහිටුවලා තිබෙනවා. ඒ අනුව පිහිනුම් පිරිමි රන් පදක්කම් 09 යි, පිහිනුම් කාන්තා රන් පදක්කම් 12 යි, මල්ලව පොර රන් පදක්කම් 07 යි. රිදී පද්කම් 01 යි. ලෝකඩ පදක්කම් 01 යි. ටයිකොන්ඩෝ පිරිමි රන් පදක්කම් 03 යි. රිදී පදක්කම් 02 යි. ලෝකඩ පදක්කම් 01 යි. ටයිකොන්ඩෝ කාන්තා රන් පදක්කම් 02 යි.

[ ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා ]

රිදී පදක්කම් 02 යි. ලෝකඩ පදක්කම් 04 යි. ඇවිදීම තරඟය පිරිමි රන් පදක්කම් 01 යි. රිදී පදක්කම් 01 යි. ඇවිදීම තරගය කාන්තා රන් පදක්කම් 01 යි. පාපැදි පිරිමි රන් පදක්කම් 01 යි. පාපැදි කාන්තා රන් පදක්කම් 01 යි. මැරතන් පිරිමි රන් පදක්කම් 01 යි. මැරතන් කාන්තා ලෝකඩ පදක්කම් 01 යි. බර ඉසිලීමේ පිරිමි පදක්කම් 03 යි. බර ඉසිලීමේ කාන්තා 01 යි. බැඩ්මින්ටන් පිරිමි 01 යි. කාන්තා 01 යි. එකතුව -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා, ඔබතුමා එය සභාගත කරන්න. දීර්ඝ ලේඛනයක් නේ?

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

රන් පදක්කම් 39 යි. රිදී පදක්කම් 24 යි. ලෝකඩ පදක්කම් 26 යි. ඒ වාගේම පළමුවන වතාවට බස්නාහිර පළාත් සභාවේ අපේ ක්‍රීඩා අරමුදලෙන් අපේ මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා යෝජනා කරලා, ආසියානු කාය වර්ධන තරගාවලියට යවලා, අපි ටිකට් එකට අනුග්‍රහයක් දක්වලා අපට ශ්‍රී ලංකාවට රන් පදක්කම් දෙකක් ගන්න පුළුවන් වුණා. ඒ වාගේම ආසියානු කනිෂ්ට බැඩ්මින්ටන් තරගාවලිය ඕස්ට්‍රේලියාවේ පැවැත් වූයේ. රන් පදක්කම් 01 ක් ලංකා ඉතිහාසයේ පළමුවන වතාවට අපට ලබා ගන්න පුළුවන්කම ලැබුණා. ගරු සභාපතිතුමනි, අපේ මන්ත්‍රීවරුන්ට මේවා දැනුවත් කළේ මේගොල්ලෝ සමහර වෙලාවට මේවා පිළිබඳ දැනුවත් වීමක් නැති නිසයි. බොහොම ස්තූතියි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමා, මෙතුමා කිව්වා කාය වර්ධන ආසියානු තරගයට යවලා දායකත්වය දුන්නා කියලා. මොකක්ද දායකත්වය කියලා මම එතුමාගෙන් අහන්න කැමැතියි.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එතුමා කිව්වා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. හරි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

නැහැ. මොකක්ද දුන්න දායකත්වය කියලා කිව්වේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා ඒ ගැන පස්සේ කියයි. ගරු ඇමතිතුමා ඒවාට උත්තර දෙන්න යන්න ඕනෑ නැහැ.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමා, මෙතුමාට ඉයර් ෆෝන් දෙන්න දාලා අහන්න කියලා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එතුමාගේ අමාත්‍යාංශයෙන් දුන්න දායකත්වය මොකක්ද කියලා මම අහන්නේ. කිසිම දෙයක් දුන්නේ නැහැ. බොරු කියන්නේ.

# පෞද්ගලික පැහැදිලි කිරීම්
## PERSONAL EXPLANATIONS

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ගරු සභාපතිතුමනි, ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා. රජයට පමණක් නොවෙයි, විශේෂයෙන්ම බස්නාහිර පළාතේ ධීවර අමාත්‍යාංශයටත් මේ යෝජනාව ඉතා වැදගත් වෙනවා කියලයි මම හිතන්නේ. පළාත් සභාවේ ධීවර අමාත්‍යතුමා පසුගිය 08 වැනිදා සිදුවූ ඛේදජනකය පිළිබඳව මේ සභාවට ප්‍රකාශයක් කළා. ඉතාම හොඳ යෝජනා ගණනාවක් තිබුණා. නමුත් මේවා තවමත් ක්‍රියාත්මක කිරීම පිළිබඳව වර්තමානයේ ගැටළුවක් ඇති වෙලා තිබෙනවා. අපි ධීවරයන්ව හම්බ වුණාට පස්සේ ඒ අය ප්‍රකාශ කරනවා, මධ්‍යම රජයෙන්වත් පළාත් සභාවෙන්වත් තවම කිසිම ආධාරයක් ඒ අයට ලැබුණේ නැහැයි කියලා. එවැනි වැඩ පිළිවෙළක් තවම ක්‍රියාත්මක වෙලා නැති නිසා, විශේෂයෙන්ම ගෞරවයෙන් මම අපේ ධීවර ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඔබතුමා එදා ඉදිරිපත් කරපු යෝජනාව, විශේෂයෙන්ම අංශ කිහිපයක්ම තිබෙනවා. ඒ අංශ ඉතාම කඩිනමින් ක්‍රියාත්මක කරන්න කියන එකයි මම කරන ඉල්ලීම. ඒ වාගේම පසුගිය අට වැනිදා වුණු ඛේදජනකයේදී ඔක්කොම පවුල්වල උදව්ය නඩත්තු කරන්න යම්කිසි අරමුදලක් පිහිටුවන්න අවශ්‍යයි. ඒ අයට අඩු ගණනේ සහන දීමනාවක් දෙන්න පුළුවන් නම් හොඳයි. ඒ වාගේම මම එක නිවසකට ගිය වෙලාවේ - ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරනවා. ආබාධිත දරුවෙක් ඉන්නවා ගරු ඇමතිතුමනි. අන්න ඒ වාගේ උදව්ය පිළිබඳව සැලකිල්ලක් දක්වන්න. විපත වුණා. හදිසියේ වන විපතේදී ඒ උදව්ය ගලවා ගැනීම. පවුල නඩත්තු කිරීමේ වගකීම. බස්නාහිර පළාතේ ජනතාවක් හැටියට මම විශේෂයෙන්ම ඒකයි මතක් කළේ. අපේ ගරු ඇමතිතුමාගේ යෝජනා ටික ඉක්මණින් ක්‍රියාත්මක කරන්න කටයුතු කරන්න කියලා ඉල්ලනවා. ඒ අයට වහාම සහන ලබා දෙන්න. සමහර අයට පොඩි බෝට්ටු අවශ්‍යතාවයක් තිබෙනවා. සමහර අයට දැල් ආම්පන්න අවශ්‍යතාවයක් තිබෙනවා. ඒ නිසා පොදුවේ ප්‍රාදේශීය

ලේකම් කාර්යාලයෙන් මේ තොරතුරු ටික රැස් කර ගෙන, මෙන්න මේ ධීවර පවුල්වලට යම් සහනයක් ලබා දෙන්න පුළුවන් නම් - බස්නාහිර පළාතේ මිය ගිය පවුල් 15 ක් 20 ක් විතර ඉන්නවා. ඒ වාගේ පවුල්වල උදවියට ජීවත් වෙන්න ඕනෑ. ඒ වාගේම සුළඟ නිසා ඇති වුණු මේ විපත නිසා කුඩා බෝට්ටු, ඔරු විනාශ වූ උදවිය ඉන්නවා. මෙන්න මේ අය සම්බන්ධව ගරු සභාපතිතුමා මාර්ගයෙන් පළාත් ධීවර අමාත්‍යවරයා හැටියට අපේ ධීවර අමාත්‍යතුමාගේ අවධානය යොමු කරනවා. මධ්‍යම රජයෙන් ප්‍රකාශ කළා. දෙනවා කිව්වා. තවම ඒ කටයුතු ක්‍රියාත්මක වන්නේ නැති නිසා අපට ඉක්මණට කර ගන්න පුළුවන් වෙන්නේ, බස්නාහිර පළාත් සභාවෙන්. විශේෂයෙන්ම ඒක මම මතක් කරන ගමන්ම එදා බේරුවල ප්‍රදේශයේ, මරදාන ප්‍රදේශයේ තරුණයෝ, ධීවරයෝ තමන්ගේ ජීවිතය පරදුවට තබලා, ඒ ධීවර ජනතාව බේරා ගැනීමට සැහෙන උත්සාහ කරපු ඒ තරුණයන්ට මම විශේෂයෙන්ම ඔබතුමාගේ මාර්ගයෙන් ස්තුතිවන්ත වෙන්න ඕනෑ. එහෙම නම් අපි ජාතියක් හැටියට විතරක් නොවෙයි, මිනිස්සු හැටියට ඒ බේරා ගත් ඔක්කෝම සිංහල ධීවර ජනතාවයි. මුස්ලිම් තරුණයෝ ගිහිල්ලයි බේරා ගත්තේ. එවැනි ජාතික සමඟියක් තිබෙන රටේ අපි විශේෂයෙන්ම මෙන්න මේ ධීවර ජනතාව වෙනුවෙන් ඔබතුමාගේ මාර්ගයෙන් අපේ බස්නාහිර පළාතේ ධීවර ඇමතිතුමාගේ කැපවීම වහාම පටන් ගන්නය කියන එක ඉතා ගෞරවයෙන් ඔබතුමා මාර්ගයෙන් ඉල්ලීමක් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු එම්.එම්.එම්. අම්ජාඩ්**
Hon. M.M.M. Amjad

ගරු සභාපතිතුමනි, මට 36 (1) යටතේ පොඩි පෞද්ගලික පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. ඒ.එම්. යූසුෆ් ගරු මන්ත්‍රීතුමා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පෞද්ගලික පැහැදිලි කිරීම් බැහැ. ඔබතුමා වරප්‍රසාද ප්‍රශ්නය කියන්න.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එහෙම කොහොමද කථා කරන්නේ?

**ගරු එම්.එම්.එම්. අම්ජාඩ්**
Hon. M.M.M. Amjad

වරප්‍රසාද ප්‍රශ්නයක්. පෞද්ගලික පැහැදිලි කිරීම් යටතේ අපේ ඒ.එම්. යූසුෆ් මැතිතුමා කථා කරපු කථාවේදී - මම මේ අවස්ථාවේ මතක් කරන්නේ අපේ ධීවර අමාත්‍ය නිමල් ලාන්සා මැතිතුමා ක්ෂණිකව මැදිහත් වෙලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ පැහැදිලි කිරීම පිළිබඳව ඔබතුමාට ප්‍රශ්න දාන්න බැහැ. ගරු මන්ත්‍රීතුමා, 36 (1) යටතේ ඔබතුමාගේ වරප්‍රසාද කඩ වීමක් වෙලා නැහැ නේ? ඔබතුමා කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු එම්.එම්.එම්. අම්ජාඩ්**
Hon. M.M.M. Amjad

ක්ෂණිකව මැදිහත් වෙලා එතුමා life jacket (බාධා කිරීම්) 250 ක් අරන් දුන්නා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු එම්.එම්.එම්. අම්ජාඩ්**
Hon. M.M.M. Amjad

කැබිනට් එකට දාලා විශේෂ තීන්දුවක් ලබා දීලා, එතුමා අපට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා කරුණාකරලා වාඩි වෙන්න. ඔබතුමාගේ වරප්‍රසාද කඩ වීමක් වෙලා නැහැ.

**ගරු එම්.එම්.එම්. අම්ජාඩ්**
Hon. M.M.M. Amjad

මේවා ජනතාව දැන ගත යුතුයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා ඔබතුමා වාඩි වෙන්න. ඔබතුමන්ලා වරප්‍රසාද කඩ කිරීම් කියමින් එක එක්කෙනාට තෙල් ගාන්න යනවා නේ? කරුණාකරලා වාඩි වෙන්න.

මීළඟට සරත් සුමනසේකර ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව. සොබා කැකුළු - 2013 උත්සවය නිසා සිදුවූ අසාධාරණයක් පිළිබඳව සභාව දැනුවත් කිරීමට.

**ගරු සරත් සුමනසේකර**
Hon. Sarath Sumanasekara

ගරු සභාපතිතුමනි, පසුගිය ජූනි මාසේ 27, 28, 29 යන දිනවල බත්තරමුල්ල තලංගම උතුරේ එම්.ඩී.එච්. ජයවර්ධන ප්‍රාථමික විද්‍යාලයේ බස්නාහිර පළාත් කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත හා පරිසර අමාත්‍ය ගරු උදය ගම්මන්පිල මැතිතුමාගේ මග පෙන්වීමෙන් බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සහ බස්නාහිර පළාත් පරිසර අමාත්‍යාංශය විසින් 5 වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව කඩඉම ජය ගැනීම සඳහා සංවිධානය කරන ලද සොබා කැකුළු 2013 උත්සවය පවත්වනු ලැබුවා.

ගරු සභාපතිතුමනි, විශේෂයෙන් මේ උත්සවය කඩුවෙල අධ්‍යාපන කලාපය පුරා පැවැත්වුණේ. ඒ උත්සවය වෙනුවෙන් කඩුවෙල සෑම විද්‍යාලයකම - විශේෂයෙන්ම අපේ ජනාධිපතිතුමාගේත්, ගරු මහ ඇමතිතුමාගේත්, උදය ගම්මන්පිල

[ ගරු සරත් සුමනසේකර ]

ගරු අමාත්‍යතුමාගේත් ඡායාරූප සහ කඩුවෙල කොට්ඨාශය නියෝජනය කරන, කඩුවෙල ආසනය නියෝජනය කරන මන්ත්‍රීවරුන්ගේ ඡායාරූප සමඟ තමයි මේ බැනර් ප්‍රදර්ශනය කරලා තිබුණේ. එහෙත් ඒ බැනර්වල එකකවත් ගරු සභාපතිතුමනි, මගේ ඡායාරූපය තිබුණේ නැහැ. මොකද, මම තමයි කඩුවෙලින් වැඩිම ඡන්ද ප්‍රමාණයක් අරගෙන මේ සභාව නියෝජනය කරන්නේ. හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමාගේ, ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමාගේ, ප්‍රදීප් උඳුගොඩ ගරු මන්ත්‍රීතුමාගේ ඡායාරූප තිබිලා තිබුණා. මම වේලාසන මෙය දැක්කේ නැහැ ගරු සභාපතිතුමනි. හැබැයි, මගේ පාක්ෂිකයෝ දෙතුන් දෙනෙක් මට කථා කරලා ඇහුවා, මොකක්ද මේ වෙලා තිබෙන්නේ. ඔබතුමාගේ ඡායාරූපය මේ එකකවත් නැහැ. ඒ මොකද කියලා. මම එය එපමණ ගණන් ගත්තේ නැහැ. මට එය ප්‍රශ්නයක් නොවෙයි. ඒක ලොකු දෙයක් වුණේ නැහැ. ගරු සභාපතිතුමනි, කොහොම වුණත් මම ඒ පාසල්වලට කථා කළාම ඒ පාසල් දෙකකින් කිව්වේ, පාසල්වලින් නොවෙයි ඒ බැනර් ප්‍රදර්ශනය කළේ කියලා. අමැතිතුමා තමයි මේ දේවල් සකස් කරලා එව්වේ කියලා. ඉතින් මම ජුනි මාසේ 21 වැනිදා උදේ උදය ගම්මන්පිල ගරු අමාත්‍යතුමාගේ ජංගම දුරකථනයට කථා කළා. දෙතුන් පාරක්ම කථා කළා. Answer කළේ නැහැ. ඊට පස්සේ මම එතුමාගේ කාර්යාලයට කථා කළා. කාර්යාලයේදී මම හිතන්නේ, එතුමාගේ පිළිගැනීමේ නිලධාරිනියක් හෝ කවුරු හෝ මාව දැනුවත් කළා දැන් එතුමා සාකච්ඡාවක් ඉවර වෙලා ගියා විතරයි එහෙම නම් PSO මහත්මයාගේ දුරකථනයට ගන්න. කථා කරයි කියලා. මම ඒකටත් කථා කළා. PSO මහත්තයා Answer කළා. එතුමා කිව්වා, මම ඇමතිතුමාට කියලා ඔබතුමාට කෝල් එකක් ගන්නම් කියලා. හැබැයි, හවස පහ, හය වෙනකනුත් ඒ කෝල් එක නම් ආවේ නැහැ. මම 5.30 ට විතර නැවත වරක් එතුමාගේ ජංගම දුරකථනය ඇමතු වෙලාවේ එතුමා මට ඒකට උත්තර දුන්නා. මම එතුමාගෙන් ඇහුවා මේක වැරදීමක්ද? එහෙම නැත්නම් වෙන කරුණක්ද මෙතැන තිබෙන්නේ කියලා. මගේ ඡායාරූපය නැති වෙන්නත්, හැම පාසලකම මේවා ප්‍රදර්ශනය කරන්නත් හේතුව මොකක්ද කියලා. ගරු සභාපතිතුමනි, එතුමා මට උත්තර දුන්නා. මන්ත්‍රීතුමා, ඔබතුමාට මතකද දන්නේ නැහැ - ඊට ඉස්සෙල්ලා එතුමා කිව්වා, මන්ත්‍රීතුමා, මතක තියා ගන්න. මේ මාගේ ප්‍රතිපාදන. මේ ප්‍රතිපාදන කොහොමද? කා වෙනුවෙන්ද ඒවා වියදම් කරන්නේ? ඒවාට කැඳවා ගැනීමේ යුතුකම්, වගකීම් තිබෙන්නේ එතුමාට කියලා එතුමා කිව්වා. ඒ වාගේම එතුමා ඊට පස්සේ කිව්වා,

*"මන්ත්‍රීතුමා, ඔබතුමාට මතකද දන්නේ නැහැ. මම වෙනුවෙන් මේ සභාවේ විශ්වාසභංග යෝජනාවක් තිබුණා. එදා ඒ ඡන්දයට මට සහයෝගය දක්වන්න ඔබතුමා ආවේ නැහැ. මන්ත්‍රීවරු දෙන්නෙක් පැමිණියේ නැහැ. "*

ගරු සභාපතිතුමනි, ඒ දෙන්නාගෙන් එක්කෙනෙක් තමයි මම. මම කිව්වා, මට ඒකයි දැන ගන්න ඕනෑ වෙලා තිබුණේ. මට බොහොම සන්තෝෂයි. මොකද, ජාතිය ගැන, රට ගැන මහා කැක්කුමකින් කථා කරන මෙතුමන්ලාගේ හිත්වල තිබෙන වෛරය, ක්‍රෝධය, පළිගැනීම කොයි වාගේද කියන එක අද වන කොට ඔප්පු වෙලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, මම ඇත්තටම සන්තෝෂයි එදා මෙතුමා වෙනුවෙන් ඡන්දය නොදීම ගැන. මම සන්තෝෂ වෙනවා, එදා මම ඡන්දය දෙන්න නොපැමිණීම ගැන. තවත් එකක් කියන්න ඕනෑ. මම එදා එතුමාගේ ඡන්දයකට විතරක් නොවෙයි, උපාලි කොඩිකාර ගරු ඇමතිතුමාගේ ඡන්දයකටත් මම ඇවිල්ලා ඡන්දය දීලා තිබුණේ නැහැ. මගේ පුද්ගලික කාරණාවක් තිබුණු නිසා මට ඒ වෙලාවේ එන්න පුළුවන්කමක් තිබෙන්න නැතිව ඇති. හැබැයි, මම උවමනාවෙන් කරපු දෙයක් නොවෙයි. හැබැයි, මෙතුමා මගෙන් පළිගත්තේ උවමනාවෙන්. මේ මහජනතාව වෙනුවෙන් වියදම් කරන්න තිබෙන මුදල්වලින් තමයි මගෙන් පළිගන්න හැදුවේ. හැබැයි, කඩුවෙල එතුමාට ඒ දේ කරන්න හම්බ වෙන්නේ නැහැ. මොකද, කඩුවෙල ජනතාව හැමදාම මාත් එක්ක ඉන්නවා. ඒගොල්ලෝ ඇවිල්ලා යයි. මේ සභාවට එයි. ඡන්දයකට එයි. ඇවිල්ලා යයි. හැබැයි ඊට එහා දෙයක් කරන්න පුළුවන්කමක් නැහැ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

හක්කේ බුදුරැස්. බොක්කේ දඩ මස්.

**ගරු සරත් සුමනසේකර**
Hon. Sarath Sumanasekara

ගරු සභාපතිතුමනි, මට පුළුවන්කම තිබුණා, ඕනෑ නම් ඒ තිබුණු ඔක්කොම බැනර් කපලා දාන්න. මොකද, කඩුවෙල ඒවාගේ වැඩ කාරයෝ ඕනෑ තරම් ඉන්නවා. හැබැයි, මම ඒ තුච්ඡ දේශපාලනය කරන්නේ නැහැ. මම ඒ දේ කරන්න ගියේ නැහැ. මම මේ සභාව දැනුවත් කරන්න ආවේ ඒකයි. මෙතුමන්ලා සුදු පිරුවට දරාගෙන කරන මේ කර්තව්‍ය හරිද කියලා අහන්න. සන්ධානයේ මන්ත්‍රීවරයෙකුටම අද මේ දේ වෙනවා නම්, ඉදිරියේ කොයි තරම් දුරට මේගොල්ලෝ මේ දේශපාලනය කරයිද? ඊයේ පෙරෙයිදා අපි දැක්කා මහරගම බොදු බල සේනා, රාවණා එක්ක ඉඳගෙන ඉන්නවා. එතැන කථා කළේ මොනවාද? මේ පළාත් සභාව නැති කරන්න. පළාත් සභාව නැති කරන්න යන මේ ඇමතිතුමා මේ පළාත් සභාව ආරක්ෂා කරනවායි කියලා මෙතැන දිවුරුම් දීලා -

**ගරු සිසිර ජයකොඩි**
Hon. Sisira Jayakody

ගරු සභාපතිතුමනි, මේ වරප්‍රසාද ප්‍රශ්නයක් නොවෙයි.

**ගරු සරත් සුමනසේකර**
Hon. Sarath Sumanasekara

ඉතින් මට දැන ගන්න -

**ගරු සිසිර ජයකොඩි**
Hon. Sisira Jayakody

වරප්‍රසාද ප්‍රශ්නයක් නොවෙයි.

**ගරු සරත් සුමනසේකර**
Hon. Sarath Sumanasekara

දිට්ඨ ධම්ම වේදනීය කර්මය කියලා එකක් තිබෙනවා. අපි අදහන බුද්ධාගමේ හැටියට. මට මේකයි දැන ගන්න ඕනෑ ගරු සභාපතිතුමනි. මම ඒ කාරණය ගැන කථා කරන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වෙන ඒවාට යන්න දෙන්න බැහැ. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා මගෙන් ඉල්ලීම කරලා තිබෙන්නේ සොබා කැකුළු කාරණය සම්බන්ධව කථා කිරීමට.

**ගරු සරත් සුමනසේකර**
Hon. Sarath Sumanasekara

මට දැන ගන්න ඕනෑ මෙපමණයි. දැන් එතුමා මට ඒ පළිගැනීම කළේ මේ සභාව තුළින්. අනාගතයේ නුදුරු දිනයක මෙතුමා මේ සභාවේ යම්කිසි යෝජනාවකට විපක්ෂව කටයුතු කළොත් විශේෂයෙන් මහ ඇමතිතුමා ගන්නා තීරණය ගැන දැන ගැනීමේ අයිතිය මට තිබෙනවා. මම ඒ වෙනුවෙන් ඔබතුමාගෙන් යම් උත්තරයක් බලාපොරොත්තු වෙනවා. ඉදිරි කාලයේදී එවැනි දෙයක් සිද්ධ වුණොත්. මම හිතන්නේ එතුමාගේ ඉදිරි දේශපාලනය - මොකද, මම කාටවත් වෛර කරන්නේ නැහැ. වෛරයෙන් වෛරය සන්සිඳෙන්නේ නැහැයි කියලා අපි දන්නවා. එතුමාට එතුමාගේ දේශපාලනය සාර්ථක වේවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු සරත් සුමනසේකර**
Hon. Sarath Sumanasekara

එතුමාගේ කටයුතු සාර්ථක කර ගන්න ශක්තිය ධෛර්යය ලැබේවායි කියලා ප්‍රාර්ථනා කරනවා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** (කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත සහ පරිසර කටයුතු අමාත්‍යතුමා)
Hon. Udaya Prabhath Gammanpila (Minister of Agriculture, Agrarian Development, Minor Irrigation, Industries and Environmental Affairs.)

ගරු සභාපතිතුමනි, මගේ නම සඳහන් කරමින් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බැහැ. ගරු ඇමතිතුමා ඔබතුමාට උත්තර දෙන්න බැහැ මේ අවස්ථාවේදී.

**ගරු සරත් සුමනසේකර**
Hon. Sarath Sumanasekara

උත්තර දෙන්න ඕනෑ නැහැ. එතුමා මට උත්තර දීලා තිබෙන්නේ. මම දැනුවත් කිරීමක් විතරයි කළේ. මට එතුමාගෙන් උත්තර අවශ්‍ය නැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමතිතුමා, පෞද්ගලික පැහැදිලි කිරීම්වලට උත්තර දෙන්න බැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

දැන් මොනවාද? දැන් දැනුවත් කිරීමක් ඕනෑ නැහැ නේ?

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, මගේ නම සඳහන් වීම ගැන මම කථා කරන්නේ. (බාධා කිරීම්) ගරු සභාපතිතුමනි, මගේ නම සඳහන් කරමින් ප්‍රකාශයක් කරන්නට යෙදුණා. ඒ ප්‍රකාශය සම්පූර්ණයෙන්ම අසත්‍යයක්. ඒ ප්‍රකාශය පිළිබඳව ලබන සභාවේදී අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ යටතේ විශේෂ ප්‍රකාශයක් කරන්න බලාපොරොත්තු වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාට අවස්ථාව.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, ලෝකවාසී බෞද්ධ ජනතාවගේ මුදුන්මල්කඩ වූ බුද්ධගයාවට එල්ල වූ ප්‍රහාරය නිසා ලෝකවාසී සියලු බෞද්ධයෝ සංවේග වූ අවස්ථාවක මෙම අවස්ථාව ලබා දීම සම්බන්ධව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඇත්තටම මේ සම්බන්ධව අපි සියලුම දෙනා තරයේ හෙළා දකිනවා. මේ සම්බන්ධව අපි කථා කරනවා නම් බුදු රජාණන් වහන්සේ උපන් දේශයේ මෙවැනි සිදුවීමක් වෙනවා නම්, මෙහි වගකීම ඒ අදාළ රජය විසින් භාර ගත යුතු වෙනවා. මේ සම්බන්ධව බුද්ධි අංශ විසින් යම්කිසි අවස්ථා කිහිපයකම වාර්තා කරලා තිබුණත් මේ සම්බන්ධව විශේෂ ආරක්ෂාවක් ඒ ස්ථානයට ලබා නොදීම සම්බන්ධව අපේ විරෝධය අපි මේ වෙලාවේ ප්‍රකාශ කරන්න ඕනෑ. ඇත්තටම ඉන්දියාවේ තිබෙන සියලුම බෞද්ධ ස්ථානවලට මින් ඉදිරියට විශේෂ ආරක්ෂාවක් ලබා දෙන්නය කියලා අපි මේ වෙලාවේ ඉල්ලීමක් කරනවා. ඒ වාගේම මෙම මැර ප්‍රහාරය, මෙම ස්ථානයට වාගේම සියලුම ආගම්වලට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා සභාව නිශ්ශබ්ද වන්න. ගරු මන්ත්‍රීවරුන්ගේ පෞද්ගලික කථා බහ නතර කර සභාවට අවධානය යොමු කරන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා –** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධව අපි කථා කරනවා වාගේම, මෙම මැර ප්‍රහාර සියලුම ආගම්වලට එල්ල කරනවා නම් ඒක අපි තරයේ හෙළා දකිනවා. ඒ නිසා මේ සම්බන්ධව අපි විශේෂයෙන් කථා කරනවා නම්, මේ තුළින් තවත් පිරිසක් දේශපාලන වාසි ගන්න යනවා නම් ඒකත් හරි කැත වැඩක් කියන එකයි මම කියන්නේ. මේ සම්බන්ධව අපි දකිනවා යම්කිසි සංවිධාන, යම් ස්වාමීන් වහන්සේලා පිරිසක් 13 වන සංශෝධනය මුල් කර ගෙන, ප්‍රාන්ත රජයක් මුල් කර ගෙන මේ සම්බන්ධව කථා කරනවා. මෙය බුදු රජාණන් වහන්සේට කරන අගෞරවයක් වශයෙන් මම දකින්නේ. අපි දකිනවා, අවිහිංසාවාදයේ පියාණන් වූ බුදු රජාණන් වහන්සේ උපන් දේශයේ මෙම ම්ලේච්ඡ සිදුවීම සම්බන්ධව විශේෂ විධිමත් පරීක්ෂණයක් ඉන්දියාවෙන් කරන්නය කියන ඉල්ලීම අපි කරනවා. ඒ වාගේම මෙම ප්‍රහාරයෙන් ගරුතර ස්වාමීන් වහන්සේලාට සිදුවූ තුවාල, නැත්නම් රෝගී තත්ත්වය ඉක්මණින් සුව වේවායි කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම පසුගියදා බුද්ධගයාවට ත්‍රස්ත ප්‍රහාරයක් එල්ල වීම ගැන ප්‍රථමයෙන්ම මම ඒ පිළිබඳව හෙළා දකිනවා. විශේෂයෙන්ම බෞද්ධයන්ගේ ආගමික ස්ථානයක් වන ඉන්දියාවේ තිබෙන බුද්ධගයා ස්ථානයට ත්‍රස්ත ප්‍රහාර එල්ල වීම ගැන අද අපේ කනගාටුව විතරක් නොවෙයි, මගේ විරෝධයත් ප්‍රකාශ කරන්න කැමැතියි. මොකද, අපි දන්නවා, අද ඉන්දියාවේ ආගමික ජන කොටස් අතර විවිධ ප්‍රශ්න තිබෙන රටක්. විශේෂයෙන්ම ඉන්දියාවේ තිබුණා, බාබර් මස්ජිත් පල්ලිය. අවුරුදු 500 ක් වාගේ පැරණි ඒ මුස්ලිම් දේවස්ථානයත් මීට අවුරුදු ගණනාවකට කලින් ත්‍රස්ත ප්‍රහාර එල්ල කරලා, ඒවා සමතලා කරලා දැම්මා. අද ලෝකයේ නොයෙකුත් විධියේ, විශේෂයෙන්ම දකුණු ආසියානු කලාපවල ආගමික කොටස් අතර, ආගමික අන්තවාදී කොටස් අතර අද වන කොට විශාල වශයෙන්ම මේ ත්‍රස්ත ප්‍රහාර එල්ල කිරීම් අපට දවස ගාණේ දකින්නට ලැබෙනවා. අපි දන්නවා, අද අපේ රටත් යම්කිසි ප්‍රමාණයකට මේ ආගමික භේදභින්නවලට හා ආගමික ඝට්ටන ඇති කිරීමේ කුමන්ත්‍රණ හා ගැටුම් වර්ධනය කිරීමේ දිසාවට ගමන් කරන කාල පරිච්ඡේදයක අපි ජීවත් වන බව. ඒ නිසා මම විශේෂයෙන්ම මතක් කරන්න කැමැතියි. මේ සියලුම ආගමික ස්ථාන ත්‍රස්ත ප්‍රහාරවලින් හා ආගමික අන්තවාදී කොටස්වලින් අපි ආරක්ෂා කර ගන්න ඕනෑ. ඒක බෞද්ධ ස්ථාන වෙන්න පුළුවන්. හින්දු ස්ථාන වෙන්න පුළුවන්. ක්‍රිස්තියානි ආගමික ස්ථාන වෙන්න පුළුවන්. මුස්ලිම් ආගමික ස්ථාන වෙන්න පුළුවන්. ඒ සියලුම ආගමික ස්ථාන ආරක්ෂා කර ගැනීම හා ඒ ආගම ඇදහීමේ නිදහස ඒ ජන කොටස්වලට අපි ආරක්ෂා කර දිය යුතුයි. ඒ නිසා විශේෂයෙන්ම ඉන්දියාව වාගේ බහු ජාතීන් කිහිපයක් ජීවත් වන රටක මෙවැනි සිදුවීම් ඇති වීම ඉතාම කනගාටුදායකයි. මම හිතනවා, ඉන්දියානු රජයට මීට වඩා වගකීමක් තිබෙනවා. අද ඒ බෞද්ධ ස්ථාන හා අනෙකුත් ආගමික ස්ථාන ආරක්ෂා කිරීමේ වගකීම ඉන්දියානු රජයට පැවරෙනවා. ඒ වාගේම එදා ඒ ත්‍රස්ත ප්‍රහාරයෙන් තුවාල ලැබූ ඒ ගෞරවනීය ස්වාමීන් වහන්සේලා ඉතා ඉක්මණින් සුවපත් වේවායි ප්‍රාර්ථනා කරන අතර, අපි ඉන්දියානු රජයෙන් ඉල්ලා සිටිනවා. මේ ආගමික ස්ථානවලට ප්‍රහාර එල්ල කරපු ත්‍රස්තවාදී හා අන්තවාදී කණ්ඩායම් වහාම නීතිය හමුවට පමුණුවලා, ඔවුන්ට දඬුවම් ලබා දිය යුතුයි කියලා. ඒ ඉල්ලීම කරන්න කැමැතියි. බොහොම ස්තුතියි.

**පූජ්‍ය ගරු තෙබුවන පියනන්ද ස්ථවිර**
Hon. Revrn. Thebuwana Piyannada Thero

ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධයෙන් අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම සම්බන්ධව පළමුකොටම ස්තුතිය ප්‍රකාශ කරනවා. ඒ වාගේම මම සන්තෝෂ වෙනවා. ඇත්තටම බෞද්ධ නොවන මන්ත්‍රීවරු දෙන්නෙක් මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් මුලින්ම තමන්ගේ කනගාටුව ප්‍රකාශ කිරීම පිළිබඳව. බෞද්ධ ලෝකයේ මුදුන්මල්කඩ බුද්ධගයාව. ඉන්දියාවේ බිහාර් ප්‍රාන්තයේ පිහිටා තිබෙන මෙම ස්ථානය අපේ බුදු රජාණන් වහන්සේ සම්බන්ධයෙන් මීට අවුරුදු 2602 කට ඉහතදී අති පූජනීයත්වයට පත් වුණු ස්ථානය. මේ ස්ථානය ලංකාවාසී අපේ පමණක් නොවෙයි චීනය, ජපානය, කොරියාව, තායිලන්තය, මියන්මාරය, ඒ වාගේම වියට්නාම් ආදී සමස්ත ලෝකවාසී බෞද්ධ ජනතාවගේ මුදුන්මල්කඩ හැටියට සැලකෙන ස්ථානය. ඉතින් මෙම ස්ථානයට ත්‍රස්ත ප්‍රහාරයක් එල්ල වීම අපි සලකන්නේ සමස්ත බෞද්ධ ලෝකයටම එල්ල කරන ලද ප්‍රහාරයක් හැටියටයි. මේ වෙලාවේදී අපි මතක් කරන්නට ඕනෑ. මේ ස්ථානය ඓතිහාසිකව ඉන්දියාවට අයිති පූජනීය ස්ථානයක්. නමුත් අපි දන්නවා. මේ ස්ථානය වල් බිහි වෙලා තිබුණේ. විශේෂයෙන් අශෝක රාජ්‍ය සමයෙන් පස්සේ වල්බිහි වෙලා තිබුණු වෙලාවේ මේ ස්ථානය ලෝකවාසී බෞද්ධ ජනතාවගේ පූජනීයත්වය සඳහා විවෘත කරලා දුන්නේ, සකස් කරලා දුන්නේ, ශ්‍රී ලංකාවෙන් බිහිවුණු ශ්‍රේෂ්ට සිංහල බෞද්ධ ලංකා පුත්‍රයෙක් වුණු ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා. එතුමාගේ මැදිහත්වීම නිසා තමයි ලෝකයේ විවිධ බෞද්ධ නායකයින්ගේ සහයෝගය ලබාගෙන මේ ස්ථානය ලෝකයේම පූජනීය, වන්දනීය බෞද්ධ ස්ථානයක් බවට පත් කළේ. ඒ නිසා මේ ස්ථානය සම්බන්ධයෙන් යම්කිසි වගකීමක් ශ්‍රී ලංකාවේ බෞද්ධයින්ට සැබවින්ම තිබෙනවා. ඒ වාගේම තමයි, මේ ස්ථානය අපේ බෞද්ධයන්ට වටිනාම ස්ථාන වන ශ්‍රී මහා බෝධිය, ඒ වාගේම බුද්ධගයා විහාරය, ඒ වාගේම විශේෂයෙන් බුදු රජාණන් වහන්සේ සත් සතිය ගත කළ ස්ථාන

ආදී මේ සියල්ල මේ බුද්ධගයා පූජා භූමියේ තමයි තැන්පත් වෙලා තිබෙන්නේ. ඒ නිසා මේ වටිනා සිද්ධස්ථානයට මේ විදියේ ප්‍රහාරයක් එල්ල කිරීම පිළිබඳව ඇත්තටම අපි අපේ කනගාටුව, සංවේගය ප්‍රකාශ කරනවා වාගේම හෙළා දකින්නට ඕනෑ.

විශේෂයෙන්ම මෙහි තිබෙන කනගාටුදායකම තත්ත්වය තමයි, මේ ස්ථානයට තිබෙන තර්ජනය පිළිබඳව ඉන්දියාවේ බුද්ධි අංශ මගින් බිහාර් ප්‍රාන්ත පොලීසියට මේ පිළිබඳව වාර්තා කරලා තිබුණා. ඒ පිළිබඳව මාධ්‍යවල විවිධ ආකාරයෙන් සඳහන් වුණා. නමුත් බිහාර් ප්‍රාන්තයේ පොලීසියට මේ බුද්ධි අංශ ලබා දීපු තොරතුරු පදනම් කර ගෙන මෙම ස්ථානයට නිසි ආරක්ෂාවක් ලබා දීමට හැකියාවක් නොලැබීම පිළිබඳව අපි ඇත්තටම අපේ කනගාටුව ප්‍රකාශ කරන්නට ඕනෑ. මේක අවශ්‍යතාවයක් නැතිකමද? එහෙම නැත්නම් නොහැකියාවද කියන එක අපට කියන්න පුළුවන්කමක් නැහැ. අඩුම ගණනේ මාස හයකට කලින් මේ පිළිබඳව බුද්ධි අංශ වාර්තා කරලා තිබෙනවා. විශේෂයෙන්ම ඉන්දීය මුජාහිදීන් කණ්ඩායම් මේ ප්‍රදේශවලට ඇතුළත් වෙලා තිබෙනවා. මේ ස්ථානයට මේ විදියේ ත්‍රස්ත ප්‍රහාරයක් එල්ල විය හැකි අනතුරක් තිබෙනවාය කියන එක පිළිබඳව වාර්තා වී තිබෙනවා. නමුත් ඒ පිළිබඳව සැලකිලිමත් වෙලා නැහැ. ඒක ඇත්තෙන්ම කනගාටුවට කාරණයක්. ඒ නිසා අපි බිහාර් ප්‍රාන්ත පොලීසියට වාගේම ඉන්දීය රජයට අපේ බලවත් විරෝධය ප්‍රකාශ කරන්නට ඕනෑ. පිළිකුල ප්‍රකාශ කරන්නට ඕනෑ. මේ වටිනා බෞද්ධ සිද්ධස්ථානය ආරක්ෂා කර ගැනීමට කටයුතු නොකිරීම සම්බන්ධව.

ඒ වාගේම විශේෂයෙන් අපි යෝජනා කරන්නට ඕනෑ. මේ ස්ථානයට තවදුරටත් ආරක්ෂාව සපයා දීමට ඉන්දියානු රජයට හැකියාවක් නැත්නම්, විශේෂයෙන් මේ වෙලාවේ ඉන්දියාවේ ආරක්ෂක උපදේශකවරයා රවිශංකර් මෙනන් මහතා ලංකාවට ඇවිල්ලා තිබෙන වෙලාවේ අපි යෝජනා කරනවා, ඉන්දියානු රජයට මේ පිළිබඳව ආරක්ෂාවක් ලබා දීමේ හැකියාවක් නැත්නම් විශේෂයෙන් ලෝකයේ අංක එකේ ත්‍රස්තවාදීන් පරාජයට පත් කරපු ලංකාවේ ඉන්න - ලෝකයේ වටිනාම ආරක්ෂක අංශ අපේ රටේ ඉන්නේ. ඒ නිසා මේ ස්ථානයේ ආරක්ෂාව ඉන්දීය රජයට සැපයිය නොහැකි නම් ලංකාවේ ආරක්ෂක අංශයන්ට මේ ස්ථානයේ වගකීම භාර දෙන්නය කියන යෝජනාවත් අපි මේ වෙලාවේදී ඉන්දීය රජයට කරන්න කැමැති වෙනවා. ඒ නිසා මේ වෙලාවේදී විශේෂයෙන්ම අපේ පළාත් සභාවේ ගරු මහ ඇමතිතුමාගේත්, අමාත්‍ය මණ්ඩලයේත්, ඒ වාගේම සියලුම මන්ත්‍රීවරුන්ගේත් අතිශය කනගාටුව, මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් ප්‍රකාශ කරන අතර, දැඩි පිළිකුලෙන් යුක්තව මේ ත්‍රස්ත ප්‍රහාරය අපි හෙළා දකින බවත් මේ වෙලාවේදී ප්‍රකාශ කරනවා. තෙරුවන් සරණයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට ගරු ප්‍රධාන අමාත්‍යතුමාට අවස්ථාව රීති අත්හිටුවීමේ යෝජනාව ඉදිරිපත් කිරීමට.

# රීති අංක 107 යටතේ යෝජනාව
## MOTION UNDER RULE NO : 107

**ගරු ප්‍රසන්න රණතුංග** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂයය භාර අමාත්‍යතුමා)
Hon. Prasanna Ranathunga (Chief Minister and the Minister of Finance and Planning, Law and Order, Land, Education, Local Government, Provincial Administration, Manpower and Employment, Economic Promotion, Power and Energy and Trade Affairs)

ගරු සභාපතිතුමනි, *"පොදු වැදගත්කමකින් යුක්ත වූද, හදිසි වූ ද, පහත සඳහන් යෝජනාව සභාවට ඉදිරිපත් කිරීම පිණිස කාර්ය පටිපාටි රීති 107 යටතේ සලසා ඇති ප්‍රතිපාදනවලට අනුකූලව සහ ඊට ආනුෂාංගිකව කාර්ය පටිපාටි රීති 8(5), 8(6), 15(2), 15(5), 53(2), 53(3), 57(2), 57(3) හා 57(5) යන රීතීන් අත්හිටුවිය යුතු යැයි යෝජනා කරමි."*

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

***[විසින් ස්ථිර කරන ලදී]***
*[Seconded]*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, මෙම යෝජනාව සම්බන්ධව පොඩි රීති ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

ඔයාට තිබෙන්නේ ඔයාගේ පක්ෂය සමඟ ප්‍රශ්නයක්. ඒක විසඳා ගන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඒක මම බේරා ගන්නම් කෝ. මම කිව්වානේ ඔබතුමා එක්ක මම මින් ඉදිරියට රණ්ඩු කර ගන්නේ නැහැයි කියලා. ඉතින් මට මගේ පාඩුවේ ඉන්න දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර නිශ්ශබ්ද වන්න. ගරු ප්‍රධාන ඇමැතිතුමා රීති අත්හිටුවීමේ යෝජනාවක් ගෙනාවා. දැන් ඒක ස්ථිර කළා. දැන් මොකක්ද ඔබතුමාගේ ප්‍රශ්නය.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

මගේ රීති ප්‍රශ්නයක් තිබෙන්නේ. ගරු සභාපතිතුමනි, ගරු ප්‍රධාන අමාත්‍යතුමා රීති අත්හිටුවලා යෝජනාවක්

[ ගරු යූ. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ]

ගෙනැල්ලා තිබෙනවා. එම යෝජනාවේ පිටපත් සෑම ගරු මන්ත්‍රීවරයෙකුටම ලැබිලා නැහැ. මම ගත්තේ විපක්ෂ නායකතුමාගේ එක. ඒක එක හේතුවක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක දැන් ලැබෙනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

මම කියන්නේ ඒක නොවෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු සංවිධායකතුමා, තේරුම් ගන්න කෝ. ඒක ඒ තරම් බරපතළ ප්‍රශ්නයක් නොවෙයි.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඒක නොවෙයි රීති ප්‍රශ්නය. ඒක සම්ප්‍රදායේ දෝෂයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. නැහැ. සම්ප්‍රදායේ දෝෂයක් නොවෙයි. මුලින්ම අපි පක්ෂ නායකයන්ට ලබා දීලා තිබෙනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

නැහැ. නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැත්තේ මොකද? ඔබතුමා බොරු ප්‍රකාශ කරන්න එපා. විපක්ෂ නායකතුමාට -

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ගරු සභාපතිතුමනි, හැම මන්ත්‍රීවරයෙකුටම ඒක ලැබෙන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. අපි පක්ෂ නායකයන්ට ලබා දුන්නා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ඒක සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා තුනෙන්ම හැම මන්ත්‍රීවරයෙකුටම ලැබෙන්නට ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. හරි. දැන් ලබා දෙනවා. දැන් නේ යෝජනාව ගෙනාවේ. මෙතුමා දැනුයි යෝජනාව ගෙනාවේ.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු සභාපතිතුමනි, වැරදි අදහසක් ඉදිරිපත් කරන්නේ. යෝජනාව ඉදිරිපත් කළාට පස්සේ තමයි සියලුම මන්ත්‍රීවරුන්ට බෙදා දෙන්නේ. සියලුම ගරු මන්ත්‍රීවරුන්ට බෙදා දෙන්නේ අදාළ යෝජනාව ඉදිරිපත් කලාට පසුවයි. භාෂා තුනෙන්ම ලබා දෙනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ පාර්ලිමේන්තුව විසින් අද මේ සම්බන්ධයෙන් තේරීම් කාරක සභාවක් පත් කරලා තිබෙනවා. අද නීතියක් ක්‍රියාත්මක වෙනවා. අද හවස තුනට පටන් ගන්නා වෙලාවේ මේ වාගේ යෝජනාවක් - (බාධා කිරීම්)

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

ඒක තිබෙන්නේ තුනට.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

පළාත් සභාව හැල්ලුවට ලක් -

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

දැන් සභාව රැස් වෙලා තිබෙන්නේ. ඒක තුනට බලා ගන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඉසුර දේවප්‍රිය ගරු මන්ත්‍රීතුමා, කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

අපි නීතිය හදන තැන හැල්ලුවට ලක් කිරීමක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. ඒක වෙනම දෙයක්.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඒ නිසා අපේ විරෝධය ප්‍රකාශ කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කරුණාකරලා වාඩි වෙන්න. (බාධා කිරීම්) ඒක මෙතැනට අදාළ වෙන්නේ නැහැ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ගරු සභාපතිතුමනි, ඔබතුමාගෙන් පැහැදිලි කිරීමක් කර ගැනීමට අවශ්‍යයි. අද අපි මේ යෝජනාව මේ පළාත් සභාවේ සාකච්ඡා කරනවා. මේ සාකච්ඡා කරන යෝජනාව ස්ථිර වුණා නැතා - අපි දන්නේ නැහැ. ස්ථිර වුණාය කියලා හිතමුකෝ. මේකද බලවත් වෙන්නේ? අද හවස තුනට පාර්ලිමේන්තුවේ තේරීම් කාරක සභාවක් පත් කරලා ඉවර වෙලා ඒකෙන් ගන්න තීන්දුව ද වඩා බලවත් වෙන්නේ කියලයි අපි අහන්නේ.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

ඒක පාර්ලිමේන්තුවේදී ඉදිරියට වෙයි.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ඒක නම් බලවත් වෙන්නේ. මේ සභාවේ මේක කථා කරන එකේ තේරුම මොකක්ද?

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

පාර්ලිමේන්තුවේ කථා කළා කියලා අපි කථා නොකර ඉන්නේ නැහැ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ඔබතුමා පැහැදිලි තීන්දුවක් දෙන්න ඒකට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා නිශ්ශබ්ද වන්න. ගරු ප්‍රධාන අමාත්‍යතුමාට අයිතියක් තිබෙනවා යෝජනාවක් ගේන්න. එතුමා යෝජනාවක් ගෙනැල්ලා සාකච්ඡා කරලා සම්මත වුණාට පසුව ඒක අපි ඉදිරිපත් කරනවා. පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව වෙනම දෙයක්.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

මම අහන්නේ, කොයි එකද බලාත්මක වෙන්නේ කියලා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

පාර්ලිමේන්තුවේ කථා කරන එක.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

එහෙම නම් මේකේ කථා කරන එක තේරුමක් නැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක එතුමාගේ අයිතියක්.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

මේ පළාත් සභාවට මේ යෝජනාව ස්ථිර කළා කියලා කරන්න පුළුවන් බලපෑම මොකක්ද?

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

පුළුවන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා යෝජනාව ඉදිරිපත් කරන්න.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

යෝජනාවක් ඉදිරිපත් කිරීමේ අයිතියට කාටවත් බාධා කරන්න බැහැ. අපේ අදහස අපි ප්‍රකාශ කරන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මහ ඇමතිතුමා, යෝජනාව ඉදිරිපත් කරන්න.

## පෞද්ගලික මන්ත්‍රී යෝජනාව :
PRIVATE MEMBERS MOTION:

## පළාත් සභා ඒකාබද්ධ වීමට අවකාශ නොතැබීම, බහුතර පළාත් සභාවල කැමැත්ත ගැනීම ප්‍රමාණවත් බව හා ප්‍රජාතන්ත්‍රවාදී බලය ශක්තිමත් වන ආකාරයට පවත්නා පළාත් සභා ක්‍රමය ශක්තිමත් කිරීම

NOT LETTING SPACE TO MERGE PROVINCIAL COUNCILS, OBTAINING CONSENT OF THE MAJORITY OF PROVINCIAL COUNCILS TO BE SUFFICIENT AND STRENGTHENING THE PROVINCIL COUNCIL SYSTEM TO FORTIFY DEMOCRATIC POWER

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, *"1978 ස්ථාපිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ආණ්ඩුක්‍රම*

[ ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා ]

*ව්‍යවස්ථා සංශෝධනය ප්‍රකාරව බලය විමධ්‍යගත කිරීමේ අරමුණින් පළාත් සභා පිහිටුවන ලදී. එම පළාත් සභා දෙකක් හෝ කිහිපයක් ඒකාබද්ධ කිරීමක් සිදුවුවහොත් පළාත් සභා පිහිටුවීමේ මූලික අරමුණ ඉටු නොවන බැවින්, ඒ සඳහා අවකාශයක් නොතිබිය යුතු බවත්,*

*30 වසරක් තුළ රට අරාජික කරමින් පැවති යුද්ධය නිමා කරමින් රටේ ඒකීයභාවය සුරක්ෂිත කරමින් රට සීඝ්‍ර සංවර්ධන ප්‍රවේශයකට ගෙන ඒමට කටයුතු කිරීමේදී 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ පළාත් සභා ලැයිස්තුව යටතේ ඇති යම් යම් විෂයයන්ට අදාළ තීන්දු තීරණ ගැනීමේදී ජනසම්මතවාදයේ මූලික ඉගැන්වීම වන බහුතර මතයට එකඟව ක්‍රියාකරමින් සියලු පළාත් සභාවල එකඟතාවය ලබා ගැනීම වෙනුවට බහුතර පළාත් සභාවල කැමැත්ත මත එම තීන්දු තීරණ ක්‍රියාත්මක කිරීම ප්‍රමාණවත් බවත්,*

*රටේ ඒකීයභාවයට, භෞමික අඛණ්ඩතාවයට සහ ජාතික ආරක්ෂාවට හානියක් නොවන පරිදි නියමිත අරමුදල් සපයමින් සහ ව්‍යවස්ථාපිත බලය ලබා දෙමින්, සියලු පුරවැසියන් සතු ප්‍රජාතන්ත්‍රවාදී බලය උපරිම ලෙස ශක්තිමත් වන ආකාරයට පළාත් සභා ක්‍රමය තවදුරටත් පවත්වාගෙන යාමට පියවර ගැනීම සුදුසු බවත්,*

*මෙම ගරු සභාව රජය වෙත යෝජනා කරන්නීය."*

**ගරු රෙහෙන්සිරි වරාගොඩ**
Hon. Rehensiri Waragoda

***[විසින් ස්ථිර කරන ලදී]***
*[Seconded]*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

[ පූ.භා. 10.26 ]

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, මේ යෝජනාව ගෙනෙද්දී සිරිකමල් පිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා, අද තේරීම් කාරක සභාව පිළිබඳව මෙතැනදී ප්‍රශ්නයක් නැගුවා. රටේ මේ කාරණා පිළිබඳව අද සාකච්ඡාවකට අවස්ථාව උදා කරලා තිබෙනවා. එදා 13 වන ව්‍යවස්ථා සංශෝධනය ගේන කොට පාර්ලිමේන්තුවේ හිටපු මන්ත්‍රීවරුන්වත් දැන ගෙන හිටියේ නැහැ මොකක්ද ගේන්නේ කියලා. එදා කථානායකවරයා දැන ගෙන හිටියෙත් නැහැ. එදා ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා මේ යෝජනාව ගේන කොට මට මතකයි, ප්‍රේමදාස මහත්තයා පිටකොටුවේ පෙළපාළි ගියා මේකට විරුද්ධව. එතුමාගේ පින්තූරයක් - එතුමාගේ නියෝජිතයෝ පෙළපාළි ගියා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ගරු සභාපතිතුමනි, වැරදි ප්‍රකාශ කරලා ගරු ප්‍රධාන අමාත්‍යතුමා මෙම සභාව නොමග යවනවා.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

පොඩ්ඩක් ඉන්න. පොඩ්ඩක් ඉන්න.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ප්‍රේමදාස මැතිතුමා ගියේ නැහැ. හැබැයි, සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ගියා. මහින්ද රාජපක්ෂ මහත්තයාත් ගියා.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, අපි පිටකොටුවේ විරෝධතාවය පවත්වන කොට එදා ප්‍රේමදාස මැතිතුමාගේ හිතවාදීන් එක්කහු වෙලා පෙළපාළි ගියා. එතුමාගේ පෝස්ටර් අරගෙන ගියා. නමුත් අද වර්තමානයේ ව්‍යවස්ථා සංශෝධනයක් ගේන කොට ඒක සාකච්ඡාවට භාජනය කරන්න ඉඩ සකස් කරලා දීලා, ජනතාවගේ මත ප්‍රකාශ කරන්න ඉඩ දීලා, පාර්ලිමේන්තුවේ විතරක් නොවෙයි, මේ වාගේ පළාත් සභාවල මන්ත්‍රීවරුන්ට පවා තමන්ගේ අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාවක් ලබා දීලයි මේ පිළිබඳව සාකච්ඡා කරන්න කටයුතු කළේ. ඒ නිසා තේරීම් කාරක සභාවට යන කොට රටේ ජනතාවගේ මතවාදයත් එක්ක කථා කරන්න පුළුවන් මට්ටමක් ඇති කිරීම සඳහා තමයි ගරු සභාපතිතුමනි, මේ යෝජනාව ගේන්නේ. මේ යෝජනාවේ මම දකින්නේ නැහැ, එක්සත් ජාතික පක්ෂයට විරුද්ධ වෙන්න මොනම හේතුවක්වත් තිබෙනවාය කියලා. මේකේදී පළමුවන කාරණාව කියන්නේ ගරු සභාපතිතුමනි, *"පළාත් සභා දෙකක් හෝ කිහිපයක් ඒකාබද්ධ කිරීමක් සිදුවුවහොත් පළාත් සභා පිහිටුවීමේ මූලික අරමුණ ඉටු නොවන බැවින්"* කියන කාරණාව. ගරු සභාපතිතුමනි, මට මතකයි එදා ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා මේක අත්සන් කරපු අවස්ථාවේදී ප්‍රකාශයක් කරලා, මේ සම්බන්ධව ජනමතයක් තිබුණොත්, මේ ඒකාබද්ධ කිරීමට විරුද්ධව එතුමාත් ඡන්දය දෙනවාය කියලා ප්‍රකාශයක් කළා. ඒ වාගේ අවස්ථාවකදී මේකේදී අපි දකින්නේ ගරු සභාපතිතුමනි, මේ බස්නාහිර පළාතේ දිස්ත්‍රික්ක තුනක් තිබෙනවා. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ විශාල ප්‍රමාණයක් තිබෙනවා. යම් හෙයකින් මේක ඒකාබද්ධ කළොත්, උතුරු - නැගෙනහිර උදාහරණයකට දිස්ත්‍රික්ක අටක් පාලනය කිරීමට සිද්ධ වෙනවා. ඒ නිසා බලය බෙදීමේ මූලික අරමුණ ඉටු වෙන්නේ නැහැ. ඒ නිසා එක්සත් ජාතික පක්ෂය මේකට එකඟ නොවන්න හේතුවක් මම නම් දකින්නේ නැහැ.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, අපේ දෙවැනි යෝජනාවෙන් කියන්නේ, බහුතර මතයට - *"13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා*

*සංශෝධනයේ පළාත් සභා ලැයිස්තුව යටතේ ඇති යම් යම් විෂයයන්ට අදාළ තීන්දු තීරණ ගැනීමේදී ජනසම්මතවාදයේ මූලික ඉගැන්වීම වන බහුතර මතයට එකඟව ක්‍රියාකරමින් සියලු පළාත් සභාවල එකඟතාවය ලබා ගැනීම වෙනුවට බහුතර පළාත් සභාවල කැමැත්ත මත එම තීන්දු තීරණ ක්‍රියාත්මක කිරීම ප්‍රමාණවත් බවත්"* කියන එක. ගරු සභාපතිතුමනි, අපි පළාත් සභාව ගැන කථා කරන කොට ශ්‍රී ලාංකිකයෙක් හැටියට මේ රටේම දේවල් පිළිබඳව වගකීමක් අපට තිබෙනවා. ඒ වගකීමක් හැටියට බස්නාහිර පළාතද, උතුරු පළාතද, නැගෙනහිර පළාතද කියලා නොවෙයි. අපි මේ රටේ පුරවැසියෙකු හැටියට මේ ශ්‍රී ලංකාවේ සෑම තැනකම සිදු වෙන කරුණු කාරණා පිළිබඳව වගකීමක් අපටත් තිබෙනවා. ඒ නිසා තමයි මේ වාගේ යෝජනාවක් ගෙනාවේ. විශේෂයෙන් බහුතර කැමැත්ත ක්‍රියාත්මක වෙනවා නම්, පළාත් සභා කිහිපයක් එකඟ වෙනවා නම්, ඒක රටේ නීතිය බවට පත් කිරීමේ යෝජනාවක් ගේන්නේ ඒ නිසයි. මම හිතන්නේ නැහැ, ඒ පිළිබඳවත් අපට එකඟ නොවන හේතුවක් තිබෙනවාය කියලා.

ඒ වාගේම අපි තුන්වන කාරණාව කියන්නේ ගරු සභාපතිතුමනි, *"රටේ ඒකීයභාවයට, භෞමික අඛණ්ඩතාවයට සහ ජාතික ආරක්ෂාවට හානියක් නොවන පරිදි".* අද පළාත් සභාව ගැන කථා කරන කොට මේ පළාත් සභාවට විරුද්ධව කථා කරන සංවිධාන හා නියෝජිතයෝ කථා කරන්නේ මේ කාරණා තුන නිසා. මේ පළාත් සභා ක්‍රමයේ, මේ කාරණා ටික අපට රටේ ඒකීයභාවයට, භෞමික අඛණ්ඩතාවයට හා ආරක්ෂාවට හානියක් වෙනවා කියන කාරණාව නිසා තමයි අපි විරුද්ධ වෙන්නේ. ඒ නිසා තමයි අපි යෝජනා කරන්නේ, රටක් හැටියට රටේ මේ කාරණාවලට හානියක් නොවන පරිදි අපට අවශ්‍ය කරන අරමුදල් හා ව්‍යවස්ථානුකූල බලය අපට ලබා දීලා රටේ ජනතාවට, අදාළ පළාත් සභාවේ ජනතාවට සේවය කිරීමට අවශ්‍ය කරන බලය ලබා දෙන්න කියන කාරණාව. මේකෙන් නැති දේවල් ඉල්ලනවාට වඩා ගරු සභාපතිතුමනි, අපට අවශ්‍ය කරන්නේ ජනතාවට සේවයක් කරන්න නම්, ජනතාවගේ අවශ්‍යතා ඉටු කිරීමට අවශ්‍ය දේවල් තමයි අපි ඉල්ලන්නේ. හොඳම උදාහරණය. ඉඩම් බලතල ගැන අපි කථා කරනවා. පසුගිය කාලයේ එදා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව බලයට පත් වෙන කොට මේ පළාත් සභාව ඉඩම් පනත සංශෝධනය කළා. අද වන කොට එක ඉඩම් ඔප්පුවක් අපට දී ගන්න බැරි වුණා. නමුත් අනික් පළාත් සභාවල මේක ක්‍රියාත්මක වෙනවා. නමුත් අද අපි ඒ සංශෝධනය ගෙනැල්ලා මේ අවුරුද්ද අවසාන වීමට ප්‍රථම අපි ඉඩම් බෙදා දෙන්න කටයුතු කරනවා.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ඒ යෝජනාවට අපි සහයෝගය දුන්නා.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඉතින් ඒක තමයි මම කියන්නේ. කවුරු කළත්, හරි හෝ වැරදියි. ඒකෙන් මේ බස්නාහිර පළාතේ ජනතාවටයි අසාධාරණයක් සිදු වන්නේ. ඒක නිවැරදි කරන්න අපි අද කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම තමයි මම විශ්වාස කරනවා. ඔබතුමන්ලාත් නිහතමානීව තමන්ගේ අතින් වැරැද්දක් සිදු වුණාම මේක නිවැරදි කරන්න. දේශපාලනය ඉස්සරහාට දාලා නොවෙයි රට ගැන හිතලා කටයුතු කරන්නය කියන ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් යොමු කරනවා. ගරු සභාපතිතුමනි, අද දිනයේ පළාත් සභා රැස්වීම පැවැත්වෙන දිනයේ කොළඹ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව කැඳවලා තිබෙනවා. මේක බරපතළ ප්‍රශ්නයක්. අපගේ සංවර්ධන කටයුතු පිළිබඳව අපි සාකච්ඡා කරන්නේ සම්බන්ධීකරණ කමිටුවේදී.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඒකේ සම සභාපති නේ?

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

අපි දැනුවත්ව නොවෙයි දිනය දීලා තිබෙන්නේ.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

පළාත් සභාව රැස්වන දිනයක, මේ සභාව පවත්වන්න දිස්ත්‍රික් ලේකම්තුමා, දිසාපතිතුමා මේ රැස්වීම කැඳවලා තිබෙන්නේ. ඒකේ අපට බලපාන කාරණය තමයි අපේ ප්‍රශ්න කථා කරන්න තිබෙන අවස්ථාව. ඒ වාගේම මෙහි සම සභාපතීත්වය දරන්නේ අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා. ඉතින් ඒ නිසා කොළඹ දිස්ත්‍රික්කයේ ජනතාවගේ සංවර්ධන කටයුතු පිළිබඳව මේ මාසේ කථා කරන්න තිබෙන අවස්ථාව අපේ ගරු මන්ත්‍රීවරුන්ට අහිමි වෙලා තිබෙනවා. ඒ නිසා මම ගරු ඔබතුමා මඟින් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අවධානය මම යොමු කරනවා, අපේ ගරු මන්ත්‍රීතුමන්ලාගේ වරප්‍රසාද කඩ වීමක් හැටියට මේ සම්බන්ධව අවශ්‍ය පියවර ගන්නය කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු සංවිධායකතුමා ඉදිරිපත් කරන වරප්‍රසාද ප්‍රශ්නය ගරු ප්‍රධාන අමාත්‍යතුමාටත් බලපානවා. මොකද, එතුමා ඒකේ සම සභාපති. ඒ නිසා මම හිතන්නේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා මේ සම්බන්ධයෙන් -

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

සම්බන්ධීකරණ කමිටුවට ලියන්න මේ කාරණාව මතු වුණා කියලා.

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

කියන්න අපට නැවත දිනයක් දෙන්න කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඒ සම්බන්ධව සභා ලේකම්තුමාට උපදෙස් දෙනවා. ඒ වරප්‍රසාද ප්‍රශ්නය යොමු කරන්නය කියලා.

**ගරු අශෝකා ලංකාතිලක**
Hon. Asoka Lankathilaka

ගරු සභාපතිතුමනි, ඒ දවස දාන කොට බ්‍රහස්පතින්දා දවස දාන්න එපා කියලත් කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ කාරණා සම්බන්ධ අවශ්‍ය පියවර ගන්නය කියලා ලේකම්තුමාව දැනුවත් කරනවා. මීළඟට ගරු ජගත් අංගගේ අමාත්‍යතුමාට අදහස් දැක්වීමට ආරාධනා කරනවා.

[ පූ.භා. 10.34 ]

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ගරු සභාපතිතුමනි, මම ඔබතුමාට අතිශයින් ස්තුතිවන්ත වෙනවා මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන්. 1978 ස්ථාපිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය වත්මන් දේශපාලන වාතාවරණය තුළ කිනම් ආකාරයකින් ගලපා ගන්නවාද කියන එක, ශ්‍රී ලංකාවට ගැලපෙන ආකාරය කෙසේද කියන එක මේ සංවාදාත්මකව කථා කරන අවස්ථාවේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ගෙන එන ලද මෙම යෝජනාව සම්බන්ධයෙන් (බාධා කිරීමක්) ගරු සභාපතිතුමනි, මම අතිශයින්ම ස්තුතිවන්ත වෙනවා ගරු ප්‍රධාන අමාත්‍යතුමාට. ඉතාමත් කාලෝචිතව මේ යෝජනාව ඉතාමත් හොඳින් සකස් කරලා, විශේෂයෙන් අද දවසට ගැලපෙන ආකාරයට මෙම යෝජනාව මෙම සභාවට ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන්. විශේෂයෙන්ම මම අතිගරු ජනාධිපතිතුමාට මේ සභාවේදී විශේෂ ස්තුතියක් කරනවා. ලෝක ඉතිහාසයේ ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක කවදාවත් නොදකින තරමටම, මේ ප්‍රශ්නය පිළිබඳව කථා කරන්න තමන්ගේම දේශපාලන පක්ෂවලටත්, විරුද්ධ දේශපාලන පක්ෂවලටත් මෙවැනි මතවාද ඉදිරිපත් කරන්න විවෘත තත්ත්වයක් ඇති කර දීම සම්බන්ධව. අපි විවිධ අපහසුතාවයන්ට පත් වන තරමටම මේ ප්‍රශ්නය පිළිබඳව විවිධ මත ප්‍රකාශ කරන්න අපේ එකම දේශපාලන කණ්ඩායමක් තුළ සාමාජිකයනුත් අද ඉදිරිපත් වෙලා ඉන්නවා. ඒක ලෝක ප්‍රජාතන්ත්‍රවාදයේ මහා පුදුම ලක්ෂණයක් හැටියට තමයි මම දකින්නේ. ඒ නිසා අතිගරු ජනාධිපතිතුමාට මගේ ගෞරවය සහ ප්‍රසාදය මම පිරිනමනවා. මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී ස්වභාවය ලෝකයට පෙන්නුම් කරන්න මේ තිබුණු විවෘතභාවය පිළිබඳව.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සංශෝධනයක් හැටියට 1988 එන මෙම ව්‍යවස්ථාව පිළිබඳව - දැන් ගත වුණු යුධ සමය අපි 1983 ඉඳලා බලාගෙන සිටියා. දිගින් දිගටම මේ සිද්ධිය වුණා. නමුත් විවිධ අවස්ථාවලදී මේ සංශෝධන පිළිබඳව කථා කළා. මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ශ්‍රී ලංකාවට කොපමණ දුරට ගැලපෙනවාද? දේශපාලන විසඳුම් ක්‍රියාවලියකට යා යුතුයි නේද? කියලා කථා කරලා මංගල මුණසිංහ කොමිෂන් සභාවක් පත් කරනවා. 1990 දශකයේ. ඊට පස්සේ 2005 වන කොට මහාචාර්ය තිස්ස විතාරණ කොමිෂන් සභාව. එතුමාගේ සභාපතිත්වයෙන් යුක්ත සර්වපාක්ෂික සමුළුව. මේ සමුළුවේ දිගින් දිගටම මේ පිළිබඳව වාර්තා සකස් කරනවා. මම අද උදේත් තිස්ස විතාරණ මැතිතුමා සමඟ කථා කළා. මහාචාර්යතුමා සමඟ. එතුමන්ලා පැහැදිලිව කියනවා. මේ වාර්තාවේ ඇතුළත් කර තිබෙන - කෙටුම්පතක් වශයෙන් තිබුණේ. තවම සමස්ත වාර්තාව එළියට ආවේ නැහැ. ශ්‍රී ලංකාවට පොලිස් කොමිෂන් 10 ක් ඕනෑ නැහැ. ශ්‍රී ලංකාවේ පළාත් 09 ට කොමිෂන් 09 යි. මහ ආණ්ඩුවේ කොමිෂන් එකයි. කොමිෂන් 10 යි. ශ්‍රී ලංකාව ඉන්දියාවේ තිබෙන කුඩාම ප්‍රාන්තයටත් වැඩිය පුංචියි. දැන් ඉන්දියාව 1955 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඉන්දියාව මේ පළාත්, ප්‍රාන්ත ලෙස වෙන් කරලා ඒවායේ පාලන ක්‍රමය විමධ්‍යගත කිරීමක් සිද්ධ වුවත්, ඉන්දියාවේ 1955 ආරම්භ වුණු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සිය වතාවකටත් වැඩිය සංශෝධනය කරලා තිබෙනවා. සිය වතාවකටත් වැඩිය මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරලා තිබෙනවා. ඒ රටේ ප්‍රශ්නවලට ගැළපෙන විධියට. ඒ ඒ කාලවකවානුව අනුව. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කියන්නේ, දේව ලියවිල්ලක් නොවෙයි. ඒක සදාතනික ලියවිල්ලක් නොවෙයි. ඒ රටේ අවශ්‍යතාවය අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය වෙනවා. දැන් ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මේ සංශෝධනය පිළිබඳව තමයි මහ ආන්දෝලාත්මක ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙන්නේ.

ගරු සභාපතිතුමනි, මේ යුද්ධය ආරම්භ වුණු දවසේ ඉඳලා උතුරු - නැගෙනහිර ප්‍රශ්නයට විසඳුමක් හැටියට 1987, 1988 කාලවකවානුව තුළ ශ්‍රී ලංකාවට ඉන්දු - ලංකා ගිවිසුම ගෙනෙන ලද අවස්ථාවේ, මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සිද්ධ වෙන වෙලාවේ ජේ.ආර්.ජයවර්ධන ගරු ජනාධිපතිතුමාට අවබෝධයක් තිබුණේ නැහැ, එදා නිවැරැදිව මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳව. සාක්ෂියක් හැටියට ජේ.එන්. ඩික්සිත් එතකොට හිටපු ඉන්දීය මහකොමසාරිස්තුමා තමයි එවකට හිටපු කැබිනට් මණ්ඩලයට මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳව පැහැදිලි කිරීම් කරන්නේ, ලෝක වාර්තාවක් හැටියට. ලෝකයේ කිසිම කැබිනට් මණ්ඩලයකට විදේශ තානාපතිවරයෙක් ඒ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පිළිබඳව කවදාවක්වත් උපදෙස් දීලවත්, කරුණු පැහැදිලි කරලවත් නැහැ. ඒක ශ්‍රී ලංකාවේ වාර්තාවක්. ඒක ලෝක වාර්තාවක්. ඒ අනුව එදා ඇහුවා, ශ්‍රී ලංකා නිදහස්

පාක්ෂිකයා මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳව දන්නවාද? ඇයි ඒ ගොල්ලෝ විරෝධය ප්‍රකාශ කරන්නේ කියලා. අද වාගේ සංවාදයක් තිබුණේ නැහැ, මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය වෙන වෙලාවේ. සංවාදයක් තියා කිසිම ලාංකීය පුරවැසියෙක් දැනගෙන සිටියේ නැහැ, හෙට දවසේ වෙන්නේ මේ සංශෝධනය කියලා. ඒ ගොල්ලෝ ප්‍රාන්ත රාජ්‍ය හැටියට රට බෙදලා, රටේ වෙන වෙනම පොලිස් හමුදා හරිගස්සලා මහ විශාල විනාශයක් කරන්න යනවා කියන මතය තුළ රටේ බහුතර ජනතාව එදා විරෝධය පෑවා. ඒක බොහොම සාධාරණයි. අද මේ මතවාදය ගොඩනැගෙන එක සාධාරණයි. ඒ තුළ හැමෝම කථා කරනවා. මොකක්ද මේ වෙන්න යන්නේ? මොන පදනම මතද මේ 13 වැනි සංශෝධනයට තවත් සංශෝධන ගේන්න යන එක පිළිබඳව හැමෝම අද කථා කරනවා. මේ මත වාදය හොඳයි. ගරු ප්‍රධාන ඇමැතිතුමා මේ යෝජනාව තුළින් මේ සියල්ල ඉතා පැහැදිලි එකට කැටි කරලා තිබෙනවා. මම එතුමාට ස්තුතිවන්ත වෙනවා, මේ හැම අංශයක් ගැනම මෙහිදී පැහැදිලි කිරීම පිළිබඳව.

දැන් එතකොට ගරු සභාපතිතුමනි, පැහැදිලිව මහාචාර්ය තිස්ස විතාරණ මැතිතුමාගේ පක්ෂ 13 ක් ඒකාබද්ධව කරපු සර්වපාක්ෂික සමුළුවේදී ඒ ගොල්ලෝ තීන්දු කරනවා, ලංකාවේ සමස්ත පොලිසියේ බඳවා ගැනීම්, පොලීසියේ උසස්වීම් ආදී වශයෙන් සිදුවන කාරණාවලදී මහා විශාල අක්‍රමික භාවයක් ඇති වෙනවා. ඒ නිසා ලංකාවේ පොලිස් කොමිෂන් එකයි තිබෙන්න ඕනෑ. මධ්‍යම රජය යටතේ විතරයි කියලා. ඒ වාර්තාවේ එහෙම තියෙනවා. දැන් මේක හොඳ පසුතලයක්, අපට කථාබහ කරලා මේක ඉස්සරහාට යන්න. මම ඒකයි මේක සිහිපත් කළේ. ඉඩම් බලතල පිළිබඳව, පළාත් ඒකාබද්ධ කිරීම පිළිබඳව, විවිධ වූ කාරණා පිළිබඳව මේ වාර්තාවේ. පක්ෂ 13 ක් එකට එකතු වෙලා ගත්තු තීන්දුවක් හැටියට තමයි තිබෙන්නේ. 2005 වර්ෂයේ තිස්ස විතාරණ මැතිතුමාගේ නායකත්වයෙන් මේ කොමිෂන් සභාව ක්‍රියාත්මක වුණේ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ඒක තමයි එතුමාව තේරීම් කාරක සභාවටවත් අරගෙන නැත්තේ?

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ඒක අපි පස්සේ බලා ගන්නම්. ගරු සභාපතිතුමනි, එක පුද්ගලයෙක් ගැන කථා කරලා වැඩක් නැහැ. පක්ෂ 13 ක් එකතු වෙලා ගත්තු තීන්දුවක්. ඒ නිසා ගරු සභාපතිතුමනි, අපට මෙතැනදී එක ප්‍රශ්නයක් තිබෙනවා. මේ සියලු ප්‍රශ්න පිළිබඳව කථා කරන්න විවෘත අවස්ථාවක් දීලා තිබෙන්නේ, මේ පළාත් සභා මන්ත්‍රීවරුන්ට මඩ කන්නවත්, පාරේ බහින බැරි වෙන්නවත් නොවෙයි. ගරු සභාපතිතුමනි, අද අපට පාරේ බහින්න බැරි තරමටම මිලේච්ඡ විධියට මේ ප්‍රශ්නය පිළිබඳව පළාත් සභා මන්ත්‍රීවරයෙකුගේ ආත්ම ගෞරවය කෙළෙසන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, මේක අපට හරි වේදනාවක්. මේ වේදනාව අපේ පපුවේ කැකෑරෙනවා, පාරට බැහැලා මිනිස්සුන්ගේ මුහුණ දිහා බලනකොට. එක්තරා මට්ටමකින් ඒ තත්ත්වය පාලනය කරන්න මොකක් හරි ක්‍රමවේදයක් අවශ්‍යයි. එහෙම නැත්නම් ලොකු ප්‍රශ්නයකට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. මොකද, ඉදිරියේ මැතිවරණයක් එනවා. මේ මැතිවරණයේදී ආගමික අන්තවාදී ස්වභාවය, ජාතික අන්තවාදී ස්වභාවය - සිංහල බෞද්ධයෙක් හැටියට මම කථා කරන්නේ. මම සිංහල බෞද්ධයෙක්. මම පිළිබඳව ස්වාමීන් වහන්සේලා ඕනෑ තරම් දන්නවා. අපි මේ රටේ ජීවත් වන කොට අපේ ආගම ධර්මය අදහන්නේ කොහොමද? ප්‍රායෝගිකව ආගම ධර්මයත් එක්ක ක්‍රියාත්මක වෙන්නේ කොහොමද කියලා අපේ පළාත්වල ස්වාමීන් වහන්සේලා දන්නවා. නමුත් අපිත් අද ආගම් ද්‍රෝහීන් බවට පත් වෙලා. අපි ආගම් ද්‍රෝහියන් නොවෙයි. නමුත් හංවඩු ගහන්න හදනවා. මැතිවරණය වනකොට ජගත් අංගගේ අද මෙතැන, 13 වැනි සංශෝධනය පිළිබඳව කථා කළාම, පළාත් සභා ආරක්ෂා කරන්න ඕනෑය කියලා කථා කළාම ආගමික විරෝධියක්. පළාත් සභාව ආරක්ෂා කරන්න කථා කරන මනුස්සයා කොහොමද ආගමික විරෝධියෙක් වෙන්නේ. මේ රටට දේශපාලන විසඳුමක් ඕනෑය කියලා දිගින් දිගටම ඉතිහාසය පුරාම හිටපු හැම ජනාධිපතිවරයෙක්ම සර්වපාක්ෂික සමුළු, වෙන කොමිෂන් සභා පත් කරලා කියනවා මේකට දේශපාලන විසඳුමක් අවශ්‍යයි කියලා. රටට ගැලපෙන විධියට. ඉන්දියාවට පුළුවන් නම් සිය වතාවකට වැඩිය ඉන්දීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරන්න, අදාළ අංශ පිළිබඳව. ලංකාවට තිබෙන බාධාව මොකක්ද? මේකෙන්.

ඒ ඇරුණුකොට ගරු සභාපතිතුමනි, පොලිස් කොමිෂන් සභාව පිළිබඳව ප්‍රශ්නය දැන් ඒ ආකාරයෙන් මේ පක්ෂ 13 ක් එකතු වෙලා කථා බහ කරන්නේ. ඒ වාගේම අද වන කොට මේ ජනාධිපතිතුමා යුද්ධය දිනුවේ නැත්නම්, මේ කිසි ප්‍රශ්නයක් නැහැ. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට මේ යුද්ධය ජයග්‍රහණය කරන්න බැරි වුණා නම්, අදත් එල්.ටී.ටී.ඊ. එකයි, ශ්‍රී ලංකා හමුදාවයි එකිනෙකා මරාගෙන ජීවත් වුණා නම් මේ සංශෝධන ගැන කවුරුවත්වත් කථා කරන්නේ නැහැ. ඔය යන විධියට ඔහේ යයි. යුද්ධය ඉවර වුණු නිසා තමයි මේ සේරම ප්‍රශ්න. යුද්ධය ඉවර වුණු නිසා තමයි ජාත්‍යන්තර මානව හිමිකම් සංවිධාන, ජනාධිපතිවරයා සහ හමුදා නිලධාරීන්ව පෝරකයට එක්කන් යන්න කථා කරන්නේ. යුද්ධය ඉවර වුණු නිසා තමයි ඉතිරි කොටසට දේශපාලන විසඳුමක් දෙන්න ඕනෑය කියලා 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව දිහා ආපසු හැරිලා බලලා කථා කරන්නේ. ඒ නිසා මේක මහා තීරණාත්මක අවස්ථාවක්. මේ තීරණාත්මක අවස්ථාවේදී හැම පුරවැසියෙක්ම තමන්ගේ රට, ජාතිය, අනාගතය ගැන හිතලා තමයි කථා බහ කරන්න ඕනෑ. අන්තවාදී විධියට කථා කරලා, මිනිස්සුන්ගේ ඡන්ද පදනම හදාගන්න කරන උත්සාහවල් දැඩි ලෙස ප්‍රතික්ෂේප කිරීම, ඒක ජාතිද්‍රෝහී ක්‍රියාවක් හැටියටයි මම දකින්නේ. මොකද, ජාතීන් අතර, ආගම් අතර ගැටීම් ඇති කිරීම තුළ ඇති වෙන්නේ මහා විශාල සාපරාධී ක්‍රියාවලියක්. ඒ නිසා (බාධා කිරීමක්)

[ ගරු ජගත් අංගගේ- අමාත්‍යතුමා ]

කවුරු කොහොම කළත් එය ඕනෑම කෙනෙකුට පොදුයි. මම අහවලාට කියලා කථා කරන්නේ නැහැ. මම කියන්නේ, මේ රටේ අපි සහජීවනයෙන් ජීවත් වෙන්න ආසයි. හැම සියලු ජාතීන් එක්ක. සිංහල, මුස්ලිම්, බර්ගර්, මැලේ මේ හැම ජාතීන් එක්කම සහෝදරයෝ වාගේ ජීවත් වෙන්න බෞද්ධයෙකුට පුළුවන්කම තිබෙනවා. අපි බෞද්ධයෝ. භය නැතිව ඕනෑම තැනක කියනවා අපි බෞද්ධයෝ කියලා. බෞද්ධයෝ කියන්නේ, ලෝක ප්‍රජාව ඉදිරියේ බෞද්ධයා අවිහිංසාවාදයේ නායකත්වය ගන්නවා. ඒ නිසා මේ බෞද්ධ රටේ ඉපදුණු ශ්‍රී ලාංකික බෞද්ධයෙක් හැටියට මම කොයි ආගමටත්, කොයි දහමටත් ගරු කරලා, ඒ ආගම් ශාස්තෘන්වරුන්ට නින්දා අපහාස නොකර, ඒ ආගම් අදහන, ඒ මත ඉදිරිපත් කරන මිනිස්සු ජාතික ද්‍රෝහීන් හැටියට සලකන්නේ නැතිව මේ රටේ සාධාරණ පුරවැසියන් හැටියට හඳුනාගන්න පුළුවන් නම්, ඒක විශාල වාසනාවක්.

ඒ නිසා අතිගරු ජනාධිපතිතුමා මේ කරන්නේ මහා දැවැන්ත ප්‍රයත්නයක්. යුද්ධය අවසාන කළා. සමස්ත ලේ ගැලීම්. බෙලි කපා ගැනීම්, විනාශ කිරීම් නතර කළා. විනාශය ස්ථාපිත නොවෙන්න, එය නැවත මතු නොවෙන්න - ගරු සභාපතිතුමනි, මම පානදුර ඉස්පිරිතාලේ ඉඳලා කොළඹ මහ රෝහලට ගිලන් රථයකට රෝගියෙකුව දාලා සුක්කානම රියැදුරෙකුට භාර දෙනවා. මේ රියැදුරාට සුක්කානම භාර දෙන්නේ, ඉතාමත් ආරක්ෂා සහිතව කොළඹ මහ රෝහලට අරගෙන ගිහිල්ලා මේ රෝගියාගේ ජීවිතය ආරක්ෂා කරන්න. එයාට විශේෂ වරප්‍රසාද තිබෙනවා. පාරේ යනකොට හෝන් එකක් ගහන්න දෙනවා. සේරම වාහන අයින් කරගන්න ඕනෑ. එයාට නිදහසේ කොළඹ එන්න. රෝගියාගේ ජීවිතය බේරාගන්න. මේක හයක් හතරක් දන්නේ නැති මොකෙකුට හරි මේ සුක්කානම දුන්නොත් එහෙම ඌ මේ පාරේ යන දහයක් පහළොවක් මරනවා. ඉතින් ඒ බලය පවරන්න ඕනෑ - දැන් අපේ ගරු සභාපතිතුමනි, ආරක්ෂක ලේකම්තුමා දකුණේ පොලීසියේ තිබුණු ආයුධ ටික ගත්තා. අරගෙන කිව්වා, උඹලට ආයුධයක් හිමි නැහැ. උඹලා සාමය ආරක්ෂා කරන නිලධාරීන්. බැටන් පොල්ල අරගෙන රක්ෂාවට පලයන් කියලා. ගිහිල්ලා ටික දවසයි දෙන්නෙක් තුන්දෙනෙක් මැරුවා. මැරුවාට පස්සේ මොකද වුණේ? පොලිස් නිලධාරියාගේ ආරක්ෂාවට අර ආයුධ ටික ආපහු අතට දෙන්න ඕනෑ. උතුරටත් අපි ඕක දෙනවා. උතුරේත් දහයක් පහළොවක් මැරුවොත් එහෙම ආයුධ ටික ඒ මිනිස්සුන්ගේ අතටත් දෙන්න ඕනෑ. එතකොට පොලිස් හමුදාව. තවම මේ දෙපාර්ශවය අතර විශ්වාසය නිධන් වෙලා නැහැ. ලෙංගතුකම නිධන් වෙලා නැහැ. තවම ඒවා රැකිලා නැහැ. මේ හමුදා හදාගෙන තමයි රට පාලනය කරන්නේ. රට පාලනය කරන්න ඕනෑ ආයුධ සන්නද්ධව එක හමුදාවයි. ඒක ජාතික මට්ටමේ තියන්න ඕනෑ හමුදාවක්. ඒ නිසා මේ අවස්ථාවේදී අපි තීරණාත්මකව වගකීමෙන් යුතුව කටයුතු නොකොළොත් එහෙම ආනගතයේදී අපට ඉතාමත් අවදානම් තත්ත්වයක් තිබෙනවා. ගරු සභාපතිතුමනි, මම හිතන්නේ මගේ කාලය අවසන් වෙලා ඇති. ඔබතුමා තුන් හතර පාරක් මුහුණ දිහා බැලුවේ. මට මේ අවස්ථාව ලබාදීම පිළිබඳව අතිශය සන්තෝෂ වෙනවා. මගේ සහෝදර ආණ්ඩු පක්ෂයෙත්, විපක්ෂයේත් සියලු ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා. අපේ දේශපාලන මතවාදයන් පසක තියලා මේ රට ගැන, අනාගතයේ ඔබේ නුපන් දරුවා ගැන හිතලා මේ අවස්ථාවේදී කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිමින්, ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනා. මෙම අවස්ථාවේදී උදෑසන තේ විවේකය සඳහා විනාඩි 15 කට කල් තබනවා.

***ඊට අනුකූලව පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් පූ.භා. 11.30 ට යළිත් රැස්විය.***

*Sitting, accordingly suspened untill 11.30 a.m. and then resumed.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විපක්ෂය වෙනුවෙන් ඒ.එම්. යූසුෆ් ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 10 ක කාලයක් තිබෙනවා.

[ පූ.භා. 11.31 ]

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ගරු සභාපතිතුමනි, අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම අද මුළු රටේම අලුත් ගැටලුවක් හැටියට මතු වෙලා සංවාදයට භාජනය වෙලා තිබෙන මොහොතක්. පළාත් සභා ක්‍රමය පිළිබඳව පසුගිය දවස්වල අපි විවිධ අතිකුත් පළාත් සභාවල ගුටි කෙළි මැද්දේ, යම් යම් යෝජනා සම්මත කරගෙන නොයෙකුත් ප්‍රශ්නවලට මුහුණ දෙන්න සිදු වුණු බව අපි දැක්කා. නමුත් පළාත් සභාව මේ යෝජනාවල් ඉදිරිපත් කරන්නේ, අවුරුදු 25 න් අවුරුදු 20 ක්ම පාලනය කරපු පාලක මණ්ඩලය විසින්. පාලක පක්ෂය විසින් අද පළාත් සභාවට අර්ථ නිරූපණයන් ඉදිරිපත් කරන්න උත්සාහ කරනවා. මේ යෝජනාවල් ඉදිරිපත් කරනවා. ඒ වාගේම මේ යෝජනාව පිළිබඳව හරි අධ්‍යයනයක් කළාද? නැද්ද? කියලා ඊළඟට ප්‍රශ්නයක් වෙනවා. වර්තමාන පාලකයෝ, වර්තමාන රජය ඒ වාගේ පළාත් සභාවල 13 වැනි සංශෝධනය හරියට අධ්‍යයනය කරලා මුල් කාලයේදී මේක වැරැදියි කියලා හිතනවා නම්, එහෙමනම් 2/3 බලය තිබෙන නිසා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා පළාත් සභා ක්‍රමය අහෝසි කරන්න තිබුණා. නැත්නම් අද කථා කරන අපේ තටු හලන්න තිබුණා, පාර්ලිමේන්තුවට. වර්තමාන අපේ පාලක පක්ෂය අවුරුදු 20 කට පසුව ඇහැ ඇරලා තිබෙනවා, මේ පළාත් සභා ක්‍රමය පිළිබඳව දැන් සාකච්ඡා කරන්න. ඇයි මේ සාකච්ඡාවට, සංවාදයට අපි මුහුණ දෙන්නේ? නැගෙනහිර වාගේ, උතුර පළාත් සභා මැතිවරණය තියන්න රජය විසින් ඉන්දියාවට පොරොන්දු වුණා. ඒ වාගේම උතුරේ ජනතාවට

ප්‍රකාශ කළා, අපි මේ සැප්තැම්බර් මාසයේ මේ ඡන්දය පවත්වනවා කියලා. එහෙනම් මේ ප්‍රකාශයෙන් පසුව තමයි යම් යම් කණ්ඩායම් ඉදිරිපත් වෙලා, ඒක ආගමික කණ්ඩායමක්. ඒ වාගේම ජාතිවාදී හැඟීමක් තිබෙන දේශපාලන පක්ෂයක්. විවිධ පක්ෂ කථා කළේ උතුරට බලය දෙන්න එපා. අපි රටේ ජනතාවක් හැටියට ඒකීය භාවයෙන් කථා කරනවා නම්, ජාතික සමගිය කථා කරනවා නම්, දකුණේ ඉන්න මනුස්සයාත් කුමන ජාතියක් හෝ වේවා, උතුරේ ඉන්න මනුස්සයාත් කුමන ජාතියක් හෝ වේවා. දකුණේ තිබෙන අයිතිවාසිකම් උතුරේ ඔහුටත් තිබිය යුතුයි. ඒකයි අපි දරන මතය. ඒ නිසා තමයි පළාත් සභා ක්‍රමය එනකොට නොයෙක් දෙනා විරුද්ධ වුණත් එදා තිබුණු තත්ත්වය උඩ පළාත් සභා ක්‍රමය මේ රටට හඳුන්වා දීලා යෝජනා ක්‍රියාත්මක කරන්න පුළුවන් වුණු නිසා තමයි - අපේ සෞඛ්‍ය ගරු ඇමැතිතුමාගේ කථාවෙන් පෙණුනා, පළාත් සභා ක්‍රමය තිබෙන්න ඕනෑ. ඒ තිබෙන නිසා තමයි අපි ඇමැතිවරු හැටියට මෙතැන ඉන්නේ කියන එක එතුමාගේ මතය තුළ ප්‍රකාශ වුණා. ඔව්. ඇත්ත. පළාත් සභා ක්‍රමය තුළ ඉහළ දේශපාලනයට යන්න බැරි වුණු උදවියට මේ දේශපාලන ක්‍රමය තුළ යම් ස්ථානයක් මේ පළාත් සභාවේ ලැබෙනවා. පළාත් සභා ඇමැතිවරු පස්දෙනෙක් බිහි වෙනවා. මහ ඇමැතිතුමා ඇතුළුව. එහෙමනම් අද හතෙන්ම ගත්තාම 35 දෙනෙකුට හොඳ අවස්ථාවක් තිබෙනවා. හොඳ තැනක් ලබාගෙන තිබෙනවා. මේ පළාත් සභා ක්‍රමය තුළ.

ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ මාර්ගයෙන් මේ යෝජනාව ඉදිරිපත් කරපු ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් මම අහනවා. මේක රජයේ මතයක්ද? එහෙම නැත්නම් බස්නාහිර පළාතේ ගරු ප්‍රධාන ඇමැතිතුමා ඇතුළු කණ්ඩායමේ මතයක්ද? මේ යෝජනාව ගැන අපි සාකච්ඡා කරන්න ඕනෑ. ඒ පිළිබඳව එතුමාගේ පිළිතුරු කථාවේදී බලාපොරොත්තු වෙනවා, මෙය කාගේ මතයද කියලා ප්‍රකාශ කරන්න කියලා. රජයක්ද? එහෙම නැත්නම් පළාත් සභාවේ ප්‍රධානියා හැටියට ඉන්න ගරු ප්‍රධාන ඇමැතිතුමා ඇතුළු ඇමැති මණ්ඩලයේ සහ මේ කණ්ඩායමේ මතයද කියලා මම අහන්න කැමැතියි. අද මේ යෝජනාව සංවාදය කරනවා. ඊළඟට මේ පළාත් සභා ක්‍රමයට විරුද්ධව කථා කරන, මේ සභාවේ ඉන්න පක්ෂ තිබෙනවා. මන්ත්‍රීවරු ඉන්නවා. ඒ අයගෙන් මම අහනවා, මේ ගරු මහ ඇමැතිතුමා කියන තුන්වැනි ඡේදයට ඒ අයගේ කැමැත්ත දෙනවාද? පළාත් සභා ක්‍රමය ශක්තිමත්ව පවත්වාගෙන යන්න මේ යෝජනාවෙන් එනවා. එක පැත්තකින් තටු දෙක අරන් දාලා පියාඹන්න බැරිව, නිකන් ඇවිදින්න කකුල් දෙක විතරක් තියාගෙන කියනවා මේක ශක්තිමත් කරන්න කියලා. මේ ආර්ථික ශක්තියක් ගැන කථා කරනවා. ආර්ථික ශක්තිය ගැන කථා කරන්නේ කොහොමද? මේ බස්නාහිර පළාතේ දැන් වර්තමානයේ අපට තිබුණු, අපේ ප්‍රඥප්ති සම්මත කරගෙන ආර්ථික වර්ධනයක්, විශේෂයෙන්ම අපේ ආදායම් වර්ධනය පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනයේ පැහැදිලිව තිබෙද්දී අපි ප්‍රඥප්තියක් සම්මත කරගෙන අපි ආදායම් එකතු කළා. එහෙමනම් මේ ආදායම් එකතු කිරීම පවා අපට අහිමි කරලා තිබෙන්නේ. අහිමි වෙලා තිබෙන්නේ. ගොවිජන සේවා පනත හැටියට අපට අහිමි වෙලා තිබෙන අයිතිවාසිකම් විශාලයි. ගරු සෞඛ්‍ය ඇමැතිතුමා කථා කරනකොට කිව්වා, ඉඩම් පනත පිළිබඳව. එදා අපේ එක්සත් ජාතික පක්ෂය ආණ්ඩුව තිබෙද්දී, රාජිත සේනාරත්න ඇමැතිතුමා ඉඩම් ඇමැති වෙලා ඉන්න අවස්ථාවේදී එතුමා පළාත් සභාවේ ඉඩම් බලතල ආණ්ඩුව අතට ගන්න සූදානම් වෙනකොට බස්නාහිර පළාත් සභාවේ අපි යෝජනා කරලා ඉඩම් ප්‍රඥප්තිය සම්මත කර ගත්තා. ඉඩම් අයිතිය පළාත් සභාවට ලබා දිය යුතුයි කියලා පළාත් සභාව තුළ ඉඩම් ප්‍රඥප්තියක් සම්මත කළා. මේ සභාවේ යෝජනා සම්මත වෙලා තිබෙනවා. දැන් සමහරවිට කියනවා, අපි මේ යෝජනාව වැරදි විදියට - අපි නොවෙයි වැරදි විදියට ඉදිරිපත් කළේ. තමුන්නාන්සේලා. එහෙමනම් මේ යෝජනාව සම්මත කරන්න කාලයක් තිබුණා. අද වනතුරු සම්මත කර ගත්තේ නැහැ. ඒ අයිතිය අපි ලබා දීලා තිබෙනවා. ගොවිජන සේවා පනතේ හැටියට ගොවිජන සේවා මධ්‍යස්ථාන, ඒ විෂයයන් අපට පැවරිලා තිබෙනවා. නීතිපති අර්ථ නිරූපණ දීලා තිබෙනවා. මම එක අවස්ථාවකදී උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමාගෙන් ප්‍රශ්න කළා. මධ්‍යම ආණ්ඩුවයි අපියි ගැටුමක් ඇති වෙන්න ඕනෑ නැහැයි කියලා. අපි මෙහෙම ඔක්කෝම ගලවලා දීලා අවසානයට අපි යට ඇඳුම පිටින්ද ඉන්නේ. තටු හලන ක්‍රමයක් මේ හදලා තිබෙන්නේ. අද ගරු මහ ඇමැතිතුමාට මේ යෝජනාව ඉදිරිපත් කරන්න කියලා දීලා තිබෙන්නේ. මම පිළිගන්නවා. ඕනෑම දේශපාලන පක්ෂයක්, මේ කථා කරන මගේ පක්ෂය හරි කමක් නැහැ. ගරු සභාපතිතුමනි, අපි පක්ෂයක ඉන්නවා නම් පක්ෂයේ විනය රකින්න වෙනවා. අපි පක්ෂයක ඉන්නවා නම් පක්ෂ නායකයන් ගන්න තීරණයට අපි අවනත වෙන්න වෙනවා. මේ සභාවේ මේ පළාත් සභා ක්‍රමයට පටහැනිව ගෙනාපු මේ යෝජනාව පිළිබඳව විරුද්ධව අදහස් දක්වන මන්ත්‍රීරු බොහොමයක් ඉන්නවා. කරන්න දෙයක් නැහැ. අද ගොළුවා කසාය බීපු තත්ත්වයට ඒ අයට ඉන්න වෙලා තිබෙනවා. ඒ අය සැනසීමටත් එක්කද දන්නේ නැහැ, ඒ අය නොමහ යැවීමටත් එක්කද දන්නේ නැහැ මේ තුන්වැනි ඡේදයේ දාලා තිබෙනවා නේ. අරමුදල් සපයමින් ව්‍යවස්ථාපිත බලය ලබා දෙමින් සියලුම පුරවැසියන් සතු ප්‍රජාතන්ත්‍රවාදී බලය උපරිම ලෙස ශක්තිමත් වන ආකාරයට කටයුතු - එක පැත්තකින් කියනවා එපැයි කියලා. අනික් පැත්තෙන් කියනවා අපව ආරක්ෂා කරන්න කියලා. අපි උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමාගෙන් අහනවා. විශේෂයෙන්ම හෙළ උරුමයෙන් අහනවා.

**ගරු රෙහෙන්සිරි වරාගොඩ**
Hon. Rehensiri Waragoda

ඔබතුමා කියන්නේ මොකක්ද?

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

අපි කියන්නේ, මේ පළාත් සභා ක්‍රමය - තමුන්නාන්සේලා තමයි ඇඳුම් ගලවලා යට ඇඳුම පිටින් ඉන්න හදන්නේ. දැළි පිහිය අතට

[ ගරු ඒ.එම්. යූසුෆ් ]

දීලා තිබෙන්නේ, කිරි කන්න. අන්න ඒ තත්ත්වයට පත් කරලා. කරන්න දෙයක් නැහැ. මම පිළිගන්නවා, ගරු ප්‍රධාන ඇමැතිතුමනි. පක්ෂය කියන විධියට පක්ෂය තුළ ඉන්න ඕනෑ. පක්ෂයේ ප්‍රතිපත්ති රකින්න ඕනෑ. ඒ නිසා ඔබතුමාටත් කරන්න දෙයක් නැහැ. අද මේ යෝජනාව ඉදිරිපත් කරන්න වෙනවා. ඒකයි වෙලා තිබෙන්නේ. ආර්ථික වශයෙන් අපි බදු එකතු කිරීම අත්හැරලා තිබෙන්නේ. ගරු සෞඛ්‍ය ඇමැතිතුමනි හෙට අනිද්දා පානදුර රෝහල ජාතික ආණ්ඩුවට ගන්න ඕනෑය කිව්වාම, පළාත් සභාවට මොකුත් කරන්න විධියක් නැහැ. යෝජනා ඉදිරිපත් කරන්න ඕනෑ නැහැ. පළාතේ තිබෙන දෙයක් මධ්‍යම ආණ්ඩුවට පවරා ගන්න ඕනෑ කියලා එදා යම් යෝජනාවක් තිබුණා නම්, බස්නාහිර පළාත් සභාව හැටියට පළාත් සභාවට එවලා පළාත් සභාවේ කැමැත්ත ගන්න ඕනෑය කිව්වා.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

දැනුත් එහෙමයි.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

දැනුත් වෙන්නේ නැහැ නේ? මේ යෝජනාවේ හැටියට.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

නැහැ. නැහැ.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

දැනුත් කිව්වාට ඒ කියලා තිබෙන්නේ, නිකන් කියලා අපි දන්නවා නේ?

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඔබතුමා සභාව නොමඟ අරින්න එපා. එහෙම දෙයක් කියලා නැහැ.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

නැහැ. නැහැ. අපි නොමඟ යවනවා නොවෙයි. රජය අද ජනතාව නොමඟ යවනවා. ඒ අයට ලොකු හිසේ ඇම්මක් තමයි ගරු සභාපතිතුමනි. ගරු මහ ඇමැතිතුමාට මම කියන්න ඕනෑ. ඒ අය යම් යම් යෝජනාවල් ඉදිරිපත් කළා. පළාත් සභා විරුද්ධ වුණා. මධ්‍යම පළාත් සභාව විරුද්ධ වුණා. නැගෙනහිර පළාත් සභාව විරුද්ධ වුණා. අන්න ඒ නිසා තමයි අද අපට දැළි පිහිය දීලා තිබෙන්නේ. උඹගේ බෙල්ල උඹ කපා ගනින් කියලා. මේ යෝජනාවෙන් තේරුම් ගන්න ඕනෑ. මේක තේරුම් ගන්න ඕනෑ. පස්සේ කනවෝ කියලා කෑ ගහලා වැඩක් වෙන්නේ නැහැ. අවුරුදු 25 ක් තිස්සේ අත්දැකීම් හැටියට කල්පනා කරලා බලමු. මීට පස්සේ අපෙන් අහන්න ඕනෑ නැහැ. අපෙන් අහන එක මදි පුංචි කමක්. ගරු සෞඛ්‍ය ඇමැතිතුමා කිව්වා වාගේ පළාත් සභාවෙන් ඇසීම ගණන් ගන්නේ, මදි පුංචි කමක් යටතේ. අද Protocol එකක් නැහැ. සභාවකට ගියායින් පස්සේ ඇමැතිවරුන්ට හරි තැනක් නැහැ. පළාත් සභා මන්ත්‍රීවරු හැටියට අපට වාඩි වෙන්න තැනක් නැහැ. මේ තත්ත්වයට, රේඛීය අමාත්‍යවරුන්ට අද පළාත් සභාව ලොකු හිස රුදාවක් වෙලා තිබෙනවා. ඒකයි පළාත් සභාවේ තත්ත්වය. ඒ නිසා පළාත් සභා ක්‍රමය ස්ථාපිත කරනකොට - මට මතක් වෙනවා, අපේ ඉස්සරහා ඉන්න සහෝදරිය. ඒ සහෝදරිය පවා එදා හර්තාලයට සහභාගි වුණා. බෝ ගහ යට. නමුත් පක්ෂය ගත් යම් යම් තීරණය උඩ පළාත් සභාව එපාය කියලා ආවේ නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

සභාවේ සහෝදරියෝ නැහැ.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

සහෝදරියක් හා සමාන ගරු මන්ත්‍රීතුමිය. සමාවෙන්න. ඒ නිසා ගරු සභාපතිතුමනි, එදා විරුද්ධ වුණු අය. නමුත් ඒ පක්ෂය විසින් ගන්නා වූ තීරණය අද මේ සියලු දෙනා පළාත් සභාවේ වාඩි වෙලා ඉන්නවා. එදා ගිනි තිබ්බා. උද්ඝෝෂණය කළා. අද ජනතා විමුක්ති පෙරමුණ පවා එදා විරුද්ධ වෙලා අද සභාවට ඇවිල්ලා තවමත් ඒ අයගේ මතය ඒ අය පවත්වාගෙන යනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, යම් යම් අවස්ථාවලදී මේ පළාත් සභා ක්‍රමය - එදා ඉන්දියාව අපට බලපෑම් ඇති කළා. ඉන්දියාවේ බලපෑම් රජයට තිබුණා. එදා උඩින් ඇවිල්ලා උතුරට භාණ්ඩ සැපයුවා. එදා උතුරත් එක්ක ප්‍රභාකරන් එක්ක තිබුණු යුද්ධය අවසන් වෙන්න ඉතා ආසන්නව තිබියදී, ප්‍රභාකරන්ව කොටු කරන්න තිබුණු මොහොතක ගරු සභාපතිතුමනි, ඉන්දියාව බලපෑම් ඇති කරලා, ඒ බලපෑම් උඩ -

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

යෝජනාවේ නරක පැත්තක් කියන්න කෝ?

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

මම කියන්නේ, මේ යෝජනාවෙන් නරකක් තමයි අපි කරගන්න හදන්නේ. තිබෙන බලය දෙන්න හදනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමනි, කාලයේ ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු ඒ.එම්. යුසුෆ්**
Hon. A M Yoosuf

ගරු සභාපතිතුමනි, කාලය සීමාවක් නැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කාලය සීමාවක් නැහැ. නමුත් කථිකයන්ගෙන් සීමා කරන්න සිද්ධ වෙනවා.

**ගරු ඒ.එම්. යුසුෆ්**
Hon. A M Yoosuf

එදා එවැනි තත්ත්වයක් තිබෙන කොට පළාත් සභා ක්‍රමය ක්‍රියාත්මක වුණා. එක්සත් ජාතික පක්ෂය තුළත් යම් යම් උදවිය විරුද්ධ වෙන්න ඇති. පසුව මේක රටට ගැලපෙන විධියට - අද මේ රජය පවා කියනවා පළාත් සභාව කටු ගලවලා තියා ගන්න ඕනෑය කියලා. ඒ නිසා පොලිස් බලතල පිළිබඳව ජනතාවට භයක් ඇති කරගෙන තිබෙන්නේ. අවුරුදු 25 ක් තිස්සේ - එදා චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය මේ සභාවේ යෝජනාව සම්මත කළා. නමුත් 13 වැනි සංශෝධනයේ සමගාමී ලැයිස්තුව හැටියට ඒකේ බලතල පැවරීමේ ක්‍රමයක් තිබෙනවා. ඒකීය භාවයක් ප්‍රකාශ කරන්න මහ ඇමැතිවරයාට පුළුවන් වුණා නම් ඒක විසුරුවා හැරීම, ඒක අහෝසි කිරීමේ බලය 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පැහැදිලිව විධායක ජනාධිපතිවරයාට තිබෙනවා. ඒ නිසා පොලිස් කොමිෂන් හතක්ය. අරක අටක්ය කියලා මේ ජනතාව නොමඟ යවන්න රටේ යම් යම් උත්සාහයක් දරනවා නම් මම හිතන විධියට පළාත් සභා ක්‍රමය පිළිබඳව කනගාටුදායක තත්ත්වයකට අපි පත් වෙනවා කියලා මම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, මේ පොලිස් බලතල පිළිබඳව කථා කරනකොට 17 වැනි සංශෝධනය ඉදිරිපත් කළාම, 17 පැහැදිලිව තිබෙනවා එක පොලිස් කොමිෂමයි මුළු ලංකාවටම. එක මැතිවරණ කොමසාරිස්වරයයි. එක ස්වාධීන රාජ්‍ය සේවා කොමිෂමයි. මේ තුනම 17 වැනි සංශෝධනයේ තිබුණු එක ඇයි අපි අත්හිටෙව්වේ. ඒක තිබුණා නම්, එය ස්වාධීනව ක්‍රියාත්මක වෙනවා. ඒ අවස්ථාවට මේ කියන කථාවල් එකක්වත් නැහැ. ඒ නිසා පළාත් සභා ක්‍රමය තුළ අඩුපාඩුකම් ඇති වෙන්න ඇති. පෙනෙන්න ඇති. නමුත් මේ සභාවේ මන්ත්‍රීවරු හැටියට, විශේෂයෙන්ම ආණ්ඩු පක්ෂයේ හැට ගණනක් ඉන්නවා. පාර්ලිමේන්තු යන්න බැරිව ඊළඟ වටයට ඉන්න කොටසක් හැටියට ගෞරවනීය තනතුරක් තියාගෙන බව මතක් කරන්න ඕනෑ. ඇමැතිවරු පස් දෙනෙක් ඉන්නවා. එහේ ඇමැතිකම් නැති වුණත් කමක් නැහැ. මෙතැන ඇමැතිවරු හැටියට ගෞරවනීය විධියට ඉන්න පුළුවන්. මම දන්නේ නැහැ දකුණයි, නැගෙනහිරයි රහස් සාකච්ඡාවක් තිබුණාද කියලා. මේ අපේ ගරු මහ ඇමැතිතුමා එකඟ වෙනවාද දකුණේ මහ ඇමැතිකමට ඒකාබද්ධ කරලා තමන්ගේ මහ ඇමැතිකම නැති කරගන්න. දකුණේ මහ ඇමැතිවරයා කැමැති වෙනවාද එයාගේ තනතුර නැති කරගන්න. මේ සියලු දේවල්ම ජනතාවට නිකන් ලස්සනට -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

දකුණ ගැන නොවෙයි. උතුරයි, නැගෙනහිරයි ගැන කියන්නේ.

**ගරු ඒ.එම්. යුසුෆ්**
Hon. A M Yoosuf

ඒකාබද්ධ කිරීම්. අපි කියන්නේ. කවදාවත් නැගෙනහිර මුස්ලිම් ජනතාව උතුරට එකතු වෙන්න කැමැති වෙන්නේ නැහැ.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඇයි, උතුරයි නැගෙනහිරයි එක් කළේ?

**ගරු ඒ.එම්. යුසුෆ්**
Hon. A M Yoosuf

කළා. කරපු නිසා එක පැයකින් ඉවර කළේ. අධිකරණ තීන්දුවක් ලබා දීලා තිබෙනවා. ඒකාබද්ධ කරන්න බැහැයි කියලා. ගරු සභාපතිතුමනි, අපි හැමෝම මනුස්සයෝ හැටියට තිබෙන තනතුර වෙන අයෙකුට දෙන්න නැගෙනහිර මහ ඇමැතිවරයා කැමැති වෙන්නේ නැහැ. උතුර කැමැති නැහැ නැගෙනහිර මහ ඇමැතිවරයාට තැන දෙන්න. සුළු ජාතීන් වෙනුවෙන්. ඒකයි මෙතැන තිබෙන්නේ. නැගෙනහිර මුස්ලිම් ජනතාවගේ මහ ඇමැතිවරයෙක් බිහි වෙනකොට උතුරේ දෙමළ ජනතාවගේ ද්‍රවිඩ මහ ඇමැතිවරයෙක් බිහි වීමේ පදනම මත තමයි මෙතැන තිබෙන්නේ. ඒ නිසා එක කොටසකට එක විධියකට සලකන්න එපා. ඉන්දියාවත් එක්ක යම් යම් ගිවිසුම් ඇති කරගෙන පෙරේදා බැසිල් රාජපක්ෂ මැතිතුමා පවා ගිහිල්ලා ආවා. මොනවාද වුණේ? ඩික්සිත් කියන කථාවල්, ඉන්දියාව කියන කථාවල් දිහා අපි ගැඹුරට බැලුවේ නැත්නම් නැවත වරක් ජාත්‍යන්තර ප්‍රශ්නයක් හැටියට මෙය මතු වෙලා ඉන්දු - ලංකා මිත්‍රත්වයට පළුදුවක් ඇති වන බව මතක් කරමින්, කාලය ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

[ පූ.භා. 11.46 ]

**ගරු ගාමිණී තිලකසිරි**
Hon.Gamini Thilakasiri

ගරු සභාපතිතුමනි, ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ගෙනෙන ලද යෝජනාව පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ප්‍රථමයෙන් මම ස්තුතිවන්ත වෙනවා. බස්නාහිර පළාත් සභාවේ දීර්ඝ කාලයක් මන්ත්‍රීවරයෙක් හැටියට හිටපු කෙනෙක් හැටියට මමත් අර හෘද සාක්ෂියට එකඟව කථා කරනවා. අද මේ යෝජනාව අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඉදිරිපත් කළේ බොහොම සත්භාවයෙන්. අපි අවුරුදු ගණනාවක් මේ පළාත් සභාවේ හිටියා. ගරු සභාපතිතුමනි, මට බොහොම කනගාටුයි. මේ පළාත් සභාව නියෝජනය කරපු ජනාධිපතිවරු ඉන්නවා. අගමැතිවරු ඉන්නවා. කැබිනට් ඇමැතිවරු ඉන්නවා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ඉන්නවා. ඔය හැම කෙනෙක්ම එදා මේ පළාත් සභාවේ හිටපු කාලයේ කිව්වේ මොකක්ද?

[ ගරු ගාමිණී තිලකසිරි ]

පළාත් සභාවට බලතල මදියි කිව්වා. මම නම් වශයෙන් ප්‍රකාශ කරන්න යන්නේ නැහැ. අපි පාර්ලිමේන්තුවට ගියාම මීට වඩා පළාත් සභාවට බලතල ලබා දෙන්න කටයුතු කරනවයි කිව්වා. පක්ෂ විපක්ෂ හැම කෙනෙක්ම. මේ රටේ අපි දීර්ඝ කාලයක්, අවුරුදු 26 ක් කියන්නේ, පොඩි කාලයක් නොවෙයි. මට මතකයි. මීට අවුරුදු 26 කට ඉස්සෙල්ලා සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය අපේ පක්ෂයේ නායිකාව. එතුමිය අරගෙන ගිහිල්ලා, එදා මට මතකයි දිනේෂ් ගුණවර්ධන ගරු ඇමතිතුමාත් සිටියා. අපි විශාල ප්‍රමාණයක් සත්‍යග්‍රහයක යෙදුණා. පිටකොටුවේ බෝධිය ළඟදී. මමත් එතැන හිටපු පුද්ගලයෙක් හැටියට මම මේ කථා කරන්නේ. මෙතැන ඉන්න වැඩි මන්ත්‍රීවරු පිරිසක් අපිත් එක්ක සිටිය. හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා. ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන අමාත්‍යතුමා. හැම කෙනෙක්ම සිටියා. එදා කඳුළු ගෑස් ගහපු වෙලාවේ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය බොහොම අමාරුවෙන් කාර් එකට නැග්ගෙව්වේ. මම එතැන ළඟ සිටියා. මම කියන්නේ ගරු සභාපතිතුමනි, එදා මේ පළාත් සභා ක්‍රමයට මුලින්ම විරුද්ධ වුණේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි. අපි විරුද්ධ වුණා. අද විරුද්ධ වන ඇයෝ එදා ඡන්ද බලයක්වත් නොතිබුණු උදවිය. එදයි අපි විරුද්ධ වුණේ. මේ අවුරුදු 26 කට පස්සේ මොකක්ද මේකට විරුද්ධ වෙන්න හේතුව කියන එක මට දැනගන්න වෙලා තිබෙනවා. දෙවන පෙළ නායකත්වය බිහි කරන්නේ පළාත් සභාවෙන් කිව්වා. පසුගිය දවස්වල මම දැක්කා. අපේ ගරු අග්‍රාමාත්‍යතුමාගේ පුතාත් පළාත් සභාවට ඉල්ලනවා. ඇයි මේ පාර්ලිමේන්තුවට යන්න ඉස්සෙල්ලා මනුස්සයෙකුට පෙරහුරුවක් තියෙන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, අපි පළාත් සභාවට ආවේ ඇක්සයිස් පොත් දීලා, වෙන වෙන ජාති සෙල්ලම් බඩු දීලා, සංගීත තියලා නොවෙයි. අපි පළාත් සභාවට එන්න බැහැයි කිව්වා. මෙතුමායි මායි සභාපතිවරු. මම කැස්බෑව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා. අවුරුදු 1 1/2 යි එදා මට ඉන්න වුණේ. එක්සත් ජාතික පක්ෂයේ බලයක් තිබුණු කාලයේ අපි සභාපති වුණා. අවුරුදු 1 1/2 න් අපට යන්න කිව්වා. පළාත් සභාවට තරග කරන්න කියලා පක්ෂය තීන්දුවක් ගත්තා. ඒ තීන්දුවට අපට හිස නමන්න වුණා. අපි දෙන්නාම කිව්වා අපට යන්න බැහැ. අපට ප්‍රාදේශීය සභාව හොඳයි. මේක කාට හරි දෙන්න කියලා. අපි සංගීත සන්ධ්‍යාවල් තියලා අරවා මේවා තියලා නොවෙයි පළාත් සභාවට ආවේ. අපි පළාත් සභාවට ආපු ක්‍රමයක් තිබුණා. පසුගිය දවස්වල මැතිවරණ තිබුණා. ඔය මැතිවරණවලදී සමහර පක්ෂවලට ජන බලයක් නැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නොහිටින්න මන්ත්‍රීවරු වෙන්න ජන බලයක් නැහැ. එහෙමනම් අපිත් අද පාර්ලිමේන්තුවේ. මේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හින්දා.

මට කනගාටුයි ගරු සභාපතිතුමනි. ගරු සභාපතිතුමනි, අපටත් ආත්ම ගරුත්වයක් කියලා දෙයක් තිබෙනවා. අපි මොනදේ කළත් ආත්ම ගරුත්වයට පොඩ්ඩක් හානියක් වෙනවා නම්, මොනයම් දෙයකින්වත් අපි ඉදිරියට යන්නේ නැහැ. පහු බසිනවා. තමුන්නාන්සේ දන්නවා. පසුගිය දවස්වල මහරගම රැස්වීමක් තිබුණා. ගරු සභාපතිතුමනි, මට කනගාටුයි කියන්න. මට මේවා ඉදිරිපත් කරන්න අපහසු වුණත් ඉදිරිපත් කළ යුතුයි. මම ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක් හැටියට මේක කථා නොකොළොත් කථා කරන්න නවක මන්ත්‍රීවරු ඉදිරිපත් වෙන්නේ නැහැ. ඒ රැස්වීමේ ගහපු පෝස්ටරය මෙන්න. මම විශ්වාස කරනවා, මාත් එක්ක කිසි කෙනෙක් උරණ වෙන එකක් නැහැ. *"ඉවසුවා ඇති."* මෙහෙමද පෝස්ටර් ගහන්නේ? *"ඉවසුවා ඇති. පළාත් සභා එපා. මහරගමදී."* දෙයි හාමුදුරුවනේ මොකක්ද මේකෙන් ප්‍රකාශ වෙන්නේ? අපට අද පාරක යන්න පුළුවන් තත්ත්වයක් නැහැ. පළාත් සභා මන්ත්‍රීවරයෙක් හැටියට අපට පාරක යන්න පුළුවන්ද? මට විතරක්ද? ගරු ප්‍රධාන ඇමැතිතුමාටත් එච්චරයි. මේ මන්ත්‍රීවරුන්ටත්, සියලුදෙනාටම. අපේ වටිනාකම කියන එක තුට්ටු දෙකට ගිහිල්ලා. දෙයි හාමුදුරුවනේ පළාත් සභාවේ මන්ත්‍රී කෙනෙක් කියලා මිනිස්සු ගණන් ගැනීමක් තිබුණා. මේවා දැක්කාම මිනිස්සු කුපිත වෙනවා. පළාත් සභා මන්ත්‍රීවරයෙක් මහදී හම්බ වුණාම ගහයි. මරයි. වෙඩි තියයි. පෝස්ටරයක් ගහද්දී ඒක බොහොම ටිකක් කල්පනා කරලා ගහන්න ඕනෑ. ඉවසුවා ඇති. පළාත් සභා ක්‍රමය අහෝසි කරමු. අපි යන කොට මුන්ට වෙඩි තියලා දාන්න ඕනෑ. මුන්ව මරලා දාන්න ඕනෑ. ඉවසීම නැති වෙලා. පෝස්ටරයක් ගහද්දී පක්ෂයක් පොඩ්ඩක් බලන්න ඕනෑ මේ මොකක්ද කියන එක. ඒ නිසා අපි දීර්ඝ කාලයක් මේවා ආරක්ෂා කරගෙන සිටියා.

අපි දන්නවා. මේ පළාත් සභාව මැයි මාසයේ 26 වැනිදා මධ්‍යම රාත්‍රී 12.00 දක්වා තිබෙනවා. මේ සියලුම මන්ත්‍රීවරුන් මන්ත්‍රීවරියන් අස් වුණේ නැත්නම්. මැරුණේ නැත්නම්. ලබන අවුරුද්දේ මැයි මාසයේ 26 වැනිදා මධ්‍යම රාත්‍රී 12.00 වනතුරු අපි මන්ත්‍රීවරු. අපට මිනිස්සු ඡන්දය දුන්නා. මම කිව්වේ අර විශේෂ වරප්‍රසාද දීලා නොවෙයි, මිනිස්සු අපට ඡන්දය දුන්නේ. අපි පෞද්ගලිකව ජනතාවත් එක්ක ලෙංගතුකමක් තිබුනු හින්දා. මළ ගෙදරට, දාන ගෙදරට ඒ මිනිස්සුන්ගේ දුකට සැපට හිටියා. අපි මොනවක්වත් දුන්නේ නැහැ. ජරාව දීලා නොවෙයි අපි මේ මන්ත්‍රීකම් ගත්තේ. හදවතට එකඟව මිනිස්සු අපට ඡන්දය දුන්නා. ඉස්සරහාටත් එච්චරයි. අපට ආත්ම ගරුත්වයක් ඇතිව මේ පළාත් සභාවේ ජීවත් වෙන්න ඕනෑ. පක්ෂයක් හැටියට අතිගරු ජනාධිපතිතුමා තීන්දුවක් ගත්තොත් පළාත් සභා ක්‍රමය අහෝසි කරනවා කියලා. පක්ෂ නායකයා ගන්න තීන්දුවට අපි එකඟයි. මේ පළාත් සභා ක්‍රමය අහෝසි කළත් ඒකේ ප්‍රශ්නයක් නැහැ. කොන්ද කෙළින් තියාගෙන මනුස්සයෙක් හැටියට ජීවත් වෙන්න අයිතිය අපට දෙන්න ඕනෑ. ඒ තරම් තුට්ටු දෙකට අපේ පළාත් සභාව බැස්සා. අපි විතරක් නොවෙයි. මුළු පළාත් සභාවම. අපි පාසලකට ගියාම දරුවෝ මල් මාලාවක් දානවා. ගුරුවරුන්, ගුරු මහත්මීන් බුලත් දීලා අපිව පිළිගන්නවා. කොයිතරම් ගෞරවාන්විත තනතුරක්ද පළාත් සභා මන්ත්‍රීකම කියන්නේ. මේ පළාත් සභා මන්ත්‍රීකම තරම් වැඩ කරපු තනතුරක් මුළු ලංකා ඉතිහාසයේ මම දැකලා නැහැ. සමහරක් ඇයින්ට මේක සුදු අලියෙක්. එක උදාහරණයක් කියනවා. එකක්. මේ සෞඛ්‍ය ගැන කථා කරන්නේ. මීගමු රෝහල. සාමාන්‍යයෙන්

දරු ප්‍රසූති සංඛ්‍යාව මසකට 500 යි. 750 යි. වෛද්‍යවරු 10 යි ඉන්නේ. හෙදියන් 29 යි ඉන්නේ. කොළඹ කාසල් රෝහල. දරුවෝ 1250 ක්, 1500 ක් අතර බිහි කරනවා. වෛද්‍යවරු 66 ක් ඉන්නවා. දැන් මීගමු රෝහල ගණනේ බැලුවොත් 750 ට 10 යි. 1500 ට වෙන්න ඕනැ 20 යි. වෛද්‍යවරු 66 යි. හෙදියන් 317 යි. යකෝ පළාත් සභාවද සුදු අලියා? මහ ආණ්ඩුවද? කියලා මම අහනවා. පළාත් සභාවට සුදු අලියෙක් කියන්න පුළුවන්කමක් නැහැ. කවුරු හරි කියපු වචනයක්. මුළු රට පුරාම කියන්නේ, සුදු අලියා. මොකද, අපට ලක්ෂ ගණනක් පඩි නඩි දෙනවාද? අපි දවසකට රුපියල් 2000/- ක ඩීසල් ගහන්න ඕනැ, මිනිස්සුන්ගේ වැඩවලට යන්න. අපි ගෙවල්වල ඉන්නේ නැහැ නේ? සාමාන්‍ය ගණන මම මේ කිව්වේ. රුපියල් 8000/- ක් හම්බවෙනවාද අපට. අපි මේ හැම දෙයක්ම කරන්නේ ජනතාව වෙනුවෙන්. අපට මේක උත්පත්තියෙන්ම පිහිටලා තිබෙනවා. දේශපාලඥයන් වුණා. මම එකක් කියනවා, ගරු සභාපතිතුමනි. අපි මේ දේශපාලනයට පිවිසුණේ පන්සල්වල තිබුණු සම්බන්ධතා නිසා. බෙල්ලන්විලෙන් පටන් ගත්තා. බොහෝම දිගට පන්සල්වලට ලොකු ගෞරවයක් තිබුණා. ඒ පන්සල්වලින් හදා ගත්ත, ගොඩනගා ගත්ත දේශපාලනයක් අපි ළඟ තිබෙන්නේ. අපි කවදාවක්වත් ස්වාමීන් වහන්සේ නමකට කිසිම දවසක වචනයක් කියලා නැහැ. බොහොම ගෞරවාන්විතව අපි සලකන්නේ. නමුත් අද සමහර තැන්වල කරන ප්‍රකාශ දිහා බැලුවාම අපිව නිකන් බල්ලා මා(ර්)ක් තුට්ටු දෙකට දාලා තිබෙන්නේ. බත් බැලයෝ ගණනට දාලා තිබෙන්නේ. බත් බැලයෝ අපට කියන්නේ. මට විතරක් නොවෙයි. තමුන්නාන්සේලා මේ හැම කෙනෙකුටම. ඒක නිසා අපි දන්නවා. මේ පළාත් සභාව තුළ පසුගිය කාලසීමාව තුළ පොලිස් බලතල ක්‍රියාත්මක කළේ නැහැ. අපේ ගරු මහ ඇමැතිතුමා නම් තිබුණත් ඕවා ක්‍රියාත්මක කරන කෙනෙක් නොවෙයි. ඇත්තටම මම දන්නවා. මොකද වැඩි වශයෙන් අවශ්‍ය වෙන්නේ වැරැදි කරන අයට. වැරැදි කරන අයට තමයි ඕවා ඕනැ. මේ පළාත් සභාවට පොලිස් බලතල මෙපමණ කල් තිබුණේ නැහැ. ඉඩම් බලතල අපට තිබුණේ නැහැ. අපි ඒවා ගැන ක්‍රියාත්මක වුණේත් නැහැ. මේකේ හිටපු අය කියලා ගියා අපට පොලිස් බලතල ඕනැය. ඉඩම් බලතල ඕනැය කියලා. අද කියපු අය තමයි අපට පිටි පස්සෙන් ගිහිල්ලා කෙළින්නේ.

ඒ නිසා මේ යෝජනාව බොහොම කාලෝචිත යෝජනාවක්. මුළු රටම බලාගෙන ඉන්නවා. අපට මේ හන්දියක් හන්දියක් ගණනේ රැස්වීම් තියලා, පළාත් සභා ක්‍රමයට විරුද්ධව බැණලා - දැන් සමහර පක්ෂ කියනවා, පොලිස් බලතලයි, ඉඩම් බලතලයි හා පළාත් එකතු කිරීමයි අයින් කරනවා නම් අපි කැමැතියි කියලා. සමහර පක්ෂ කියන්නේ මුළුමනින්ම පළාත් සභා ක්‍රමය අහෝසි කරලා දාන්න කියලා. මේ තරම් දීර්ඝ කාලයක් තිස්සේ - මම දැක්කා අද උදේද කොහෙද කෙහෙළිය රඹුක්වැල්ල මැතිතුමා ප්‍රකාශයක් කළා. මේ පළාත් සභා ක්‍රමය අයින් කරන්න බැහැ. මේක ජනතාවත් එක්ක බද්ද වෙලා තිබෙන්නේ. ඔය කියන විදියට කරන්න පුළුවන්කමක් නැහැ. මේ රටට රාජ්‍ය නායකයෝ සියලු දෙනාම බිහි කරපු ස්ථානයක් මෙතැන. ඒ නිසා පළාත් සභා ක්‍රමය රටට අවශ්‍යයි කියන තැන මම ඉන්නවා.

අපි මේ පළාත් සභාවේ දීර්ඝ කාලයක් තිස්සේ මන්ත්‍රීවරු හැටියට සිටියා. මට මතක් වෙනවා, ගරු සභාපතිතුමනි. මේ පළාත් සභා ක්‍රමය නිසා අපේ මන්ත්‍රීවරු - එක්සත් සමාජවාදී පක්ෂයේ, එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු මම දැනුවත්ම 36 ක් නැත්නම්, 33 ක් ජීවිතක්ෂයට පත් වුණා. ග්‍රාමීය නායකයෝ අනන්ත අප්‍රමාණ ජීවිතක්ෂයට පත් වුණා. මේ සියලුම දෙනා මේ කැපවීම් කළේ, මේ පළාත් සභා ක්‍රමය වෙනුවෙන්. මම අනික් පළාත් සභා ගැන කථා කරන්න යන්නේ නැහැ. මේ බස්නාහිර පළාත් සභාවේ පසුගිය කාලසීමාව තුළ කරපු සේවාව මධ්‍යම රජයකින් කරන්න බැරි විශාල සේවාවක් මේ පළාත් සභාව තුළින් ජනතාවට ලබා දීලා තිබෙනවා. අධ්‍යාපන ක්ෂේත්‍රය බලන්න. කොයි පාසලකටද අද ගොඩනැගිල්ලක් අවශ්‍ය වෙන්නේ? ඒ වාගේම අපේ මහා මාර්ග ඇමැතිතුමා විශාල සේවාවක් - මම ඒවා ගැන දිගින් දිගටම කථා කරන්න යන්නේ නැහැ. කොඩිකාර ගරු ඇමැතිතුමා. සෞඛ්‍ය ගරු ඇමැතිතුමා. කවුරුත් මේ හැම කෙනෙක්ම විශාල වැඩ කොටසක් කළා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කථාව පොඩ්ඩක් කෙටි කරන්න.

**ගරු ගාමිණී තිලකසිරි**
Hon.Gamini Thilakasiri

ගරු සභාපතිතුමනි, මම අද උදේ එන්න ඉසසෙල්ලා අපේ පන්සලට ගියා. මම මේ පිළිබඳව කිව්වා. අපේ හාමුදුරුවනේ අද මම මෙහෙම ප්‍රකාශයක් කරනවා කියලා. හාමුදුරුවන්ට මම මේක කියලා යන්න ආවා. ඒක කියන්න. ඔය ගොල්ලෝ ඔහොම හිටියාම ඔයගොල්ලොත් මේකට කැමැත්ත ප්‍රකාශ කරලා ඉන්නවා වාගේ තත්ත්වයක් අද ඇති වෙලා තිබෙන්නේ. අපි නම් ඔය වාගේ රැස්වීම්වලට යන්නේ නැහැ. ඒ නිසා තැනින් තැන ප්‍රකාශ කරලා පළාත් සභාව හැල්ලුවට පත් නොකර, පක්ෂය තීන්දුවක් ගත්තොත් පළාත් සභා ක්‍රමය අහෝසි කරනවා කියලා අපි එකහයි. අපි යනවා. අපි ඕනෑම වේලාවක ලැහැස්තියි. මෙහෙම තැනක් නැතිව හන්දියක් හන්දියක් ගණනේ ගිහිල්ලා පළාත් සභා ක්‍රමය විවේචනය කරන්න එපා. මේ හැම කෙනෙකුටම ආත්ම ගෞරවය කියලා එකක් තිබෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, මම මීට වඩා දීර්ඝ වශයෙන් කථා කරන්නේ නැහැ. කළ යුතු දේ බොහෝ තිබුණත්. මේ පළාත් සභා ක්‍රමය ආරක්ෂා කර ගැනීම සඳහා ඉදිරියටත් යම් යම් දේවල් තිබෙනවා. ඒක පක්ෂය තීන්දුවක් ගනියි. ජනාධිපතිතුමා තීන්දුවක් ගනියි. අද පළාත් සභාවට නාම යෝජනා දීලා, දැන් පළාත් සභා ක්‍රියාත්මක වෙනවා. හෙට අනිද්දාට ඡන්දය එනවා. Interview කරනවා. මේ පළාත් සභා ක්‍රමය අහෝසි කරන්නලු. මේක පුදුම කථාවක් නේ? ඒ නිසා මේ කියන කරුණු සියල්ලම කිසිම ප්‍රයෝජනයක් වෙන එකක් නැහැ. දීර්ඝ කාලයක් මේ පළාත් සභාව තිබෙන කළු පැල්ලම් ඉවත් කරලා, ඉදිරියට යන්න කටයුතු කරයි කියලා මම විශ්වාස කරමින් ගරු සභාපතිතුමනි මා නිහඬ වෙනවා.

[ පූ.භා. 11.59 ]

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ගරු සභාපතිතුමනි, අපේ ගාමිණී තිලකසිරි ගරු මන්ත්‍රීතුමාගේ බොහොම සංවේදී කථාවෙන් පස්සේ මේ වැදගත් යෝජනාව පිළිබඳව අදහස් දක්වන්න ලැබීම පිළිබඳව එක අතකින් මම සන්තෝෂ වෙනවා. විශේෂයෙන්ම අද මේ හදිසියේ පළාත් සභාවට මෙම යෝජනාව ඉදිරිපත් කරන්න සිද්ධ වුණේ, මේ පළාත් සභා ක්‍රමය ආරම්භ කරලා අවුරුදු 25 කට විතර පස්සේ උතුරු පළාත් සභාවට ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම දෙන්න මැතිවරණයක් පවත්වන්න ජනාධිපතිතුමා තීරණය කරපු අවස්ථාවේදී, මේ පළාත් සභාවල බලතල මේ විධියටම ක්‍රියාත්මක කරනවාද? 13 වැනි සංශෝධනයෙන් ලැබුණු ඒ බලතල ඒ විධියටම ක්‍රියාත්මක කරනවාද? කියන ප්‍රශ්නය රට තුළ සාකච්ඡා කරන අවස්ථාවක් උදා වී ඇති නිසයි. ඒ නිසා තමයි මේ යෝජනාව මේ පළාත් සභාවේ සාකච්ඡා කරන්න තීරණය වෙලා තිබෙන්නේ. කොහොම වුණත් ගරු ප්‍රධාන ඇමැතිතුමා මේ යෝජනාව ටිකක් අමුතු විධියට තමයි ඉදිරිපත් කරලා තිබෙන්නේ. පළමුවැනි කාණ්ඩය. දෙවැනි කාණ්ඩය මේ පළාත් සභාවේ තිබෙන ශක්තිය හීන කරන, පළාත් සභාව කියන මේ යෝධ පුරුෂයාගේ, අවුරුදු 25 ක් ඉක්මව ගිය ඒ භද්‍ර යෞවනයේ ඉන්න පුරුෂයාගේ අතපය ගලවලා ඒ පළමුවැනි දෙවැනි යෝජනාවලින් එතුමාගේ කැමැත්ත දෙනවා. ඊට පස්සේ තුන්වැනි කැල්ලෙදී මේකට ටිකක් අයිසින් ටිකක් තවරලා අපට ලෙව කන්න පුළුවන් විධියට තමයි මේ යෝජනාව ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒ නිසා එතුමා ප්‍රසන්න රණතුංග කියන චරිතය දිහා කල්පනා කරනවා නම්, එතුමාගේ හෘදය සාක්ෂිය දන්නවා, මෙයින් මොකක්ද සිද්ධ වෙන්නේ කියලා. හැබැයි, එතුමා බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන ඇමැතිවරයා නිසා එතුමාව ක්‍රියාත්මක කරවන යෝධ හස්තයට හසු වෙන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒක තමයි අපේ දැනීම. ඒක නිසා තමයි එතුමාගේ මාර්ගයෙන් මේ යෝජනාව මේ පළාත් සභාවට ඉදිරිපත් වෙන්නේ. එතුමාගේ කණ්ඩායමේම ඉන්න, ආණ්ඩු පක්ෂයේම ඉන්න විවිධ මත දරන අය මේ යෝජනාව පිළිබඳව විවිධ අදහස් මතු කරනවා. මේ සභාවේදීත් මතු කරයි. මීට කලින් අපට යම් යම් තැන්වලදී ඒ අදහස් පළ කරලා තිබෙනවා.

මම කථා කරන්න කැමැතියි. ජීවිත පරිත්‍යාගයෙන් ඇති කරපු මේ පළාත් සභා ක්‍රමය, රේණුක පෙරේරා ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමන්ලාගේ පක්ෂය. මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමන්ලාගේ පක්ෂය, කීර්ති කාරියවසම් ගරු මන්ත්‍රීතුමන්ලාගේ පක්ෂය. මේ පළාත් සභාව නිර්මාණය කිරීමේදී මේ පක්ෂ සියල්ලේම, තමන්ගේ සගයන්ගේ ජීවිත මේ මහ පොළොවට දායාද කරන්න සිද්ධ වුණා. ඒ කුරිරු ත්‍රස්තවාදය නිසා එදා එහෙම මහ ලේ විලක් මැද ඒවා ජය අරගෙන තමයි, විශාල අභියෝගයක් භාර අරගෙන තමයි මේ පළාත් සභාව නිර්මාණය වුණේ. එක්සත් ජාතික පක්ෂය එදා ලංකාවේ උතුරු - නැගෙනහිර හැර අනෙක් ඉතිරි සියලුම පළාත් සභා ජයග්‍රහණය කරලා දෙවැනි වතාවේදී මේ පළාත් සභාවට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රධාන අනික් දේශපාලන පක්ෂත් එකතු වෙලා මේ පළාත් සභාවේ බලය අල්ලන්න තීරණය කළා. ඒක නිසා චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියට සිද්ධ වුණා, අලුත් සන්ධානයක් හදා ගන්න. එහෙම හදාගෙන මේ පළාත් සභාවේ මහ ඇමැතිනිය හැටියට එතුමියට එන්න වාසනාව ලැබුණා. එතුමිය මේ පළාත් සභාවේ අවුරුද්දක පමණ කාලයක් කටයුතු කෙරුවා. එදා මේ පළාත් සභාවේ ගාමිණී තිලකසිරි ගරු මන්ත්‍රීතුමා. හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා. ප්‍රසන්න රණතුංග අපේ ගරු මහ ඇමැතිතුමා. ගරු සභාපතිතුමනි, ඔබතුමාත් චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය මේ පළාත් සභාවේ මහ ඇමැති ධුරය දරන කාලයේ කටයුතු කෙරුවා. එතුමිය ඒ හිටපු අවුරුද්දේ එදා එක්සත් ජාතික පක්ෂ රජයෙන් ඉල්ලීමක් කෙරුවා, මේ පළාත් සභාවට දෙන්න ඕනෑ සියලු බලතල ලබා ගන්න විධියට. ඉඩම් බලතල. පොලිස් බලතල. මේවා බොහොම පැහැදිලිව තිබෙනවා. හැබැයි, ඒ අවුරුද්ද කාලසීමාවේ ඒ කථිකාවකට සීමා වුණාට එතැනින් එහාට ඒ යෝජනාව ගියේ නැහැ. එතුමිය මේ රටේ අගමැති වෙලා, මේ පළාත් සභාව හරහා ජනාධිපති වෙලා ගියා. ඉන් පස්සේ අර පොලිස් බලතලවත්, ඉඩම් බලතලවත් පිළිබඳවත් මම හිතන්නේ, කථිකාවක් වුණේ නැහැ.

එදා ඉඳලා අද වනතුරු මේ බස්නාහිර පළාත් සභාව තිබෙන්නේ, එක්සත් ජාතික පක්ෂයට නොවෙයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රධාන සන්ධානයට තමයි මේ පළාත් සභාවේ බලය තිබෙන්නේ. එතකොට එහෙම බලය තිබෙන වේලාවේ අර ගාමිණී තිලකසිරි ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ, අශෝකා ලංකාතිලක ගරු මන්ත්‍රීතුමියලා සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියත් එක්ක අපේ ෆවුසි මහත්මයලා එදා බෝ ගහ යට මේ පළාත් සභාව එපා කියලා එලෙස සටන් කරලා, කඳුළු ගැස් කෑවා. ගුටි කෑවා. එහෙම ඇති කරපු පළාත් සභාවේ දෙවැනි වතාවේත් බලය ලබා ගත්තාට පස්සේ මේ පළාත් සභාවේ නෛතිකව දීලා තිබෙන බලතල සියල්ලම ලබා ගන්න ඕනෑය කියලා කථිකා කරලා දැන් දිගින් දිගටම අවුරුදු 20 ක් මේ පළාත් සභාවේ බලය පවත්වාගෙන යනවා. එහෙම තිබෙන වේලාවක තමයි උතුරේ පළාත් සභා මැතිවරණය එන්නේ. උතුරු පළාත් සභා මැතිවරණය ගෙනැල්ලා කඩා දාන එකක් නොවෙයි. බොහොම පැහැදිලිව යුද්ධය අවසාන වන කොට අතිගරු ජනාධිපතිතුමා ඉන්දියාවට සහ ජාත්‍යන්තරයට බොහොම ප්‍රසිද්ධියේ පොරොන්දුවක් දුන්නා, උතුරේ පළාත් සභා ක්‍රමය ස්ථාපිත කරලා මැතිවරණය පවත්වන්න එතුමා තීරණය කරනවා කියලා. ඒක නිසා තමයි අද උතුරට නාම යෝජනා කැඳවන්න එතුමා විසින් නියෝග කරලා තිබෙන්නේ. එහෙම නාම යෝජනා කැඳවන්න, මැතිවරණය පවත්වන්න තිරණය කරපු අවස්ථාවක තමයි මේ පළාත් සභාවල තිබෙන බලතල අඩු කරන්න අද විවිධ පළාත් සභාවලින් යෝජනා ඉදිරිපත් කරන්නේ. මම හිතන්නේ නැහැ, එක අතකට අපි මේ යෝජනාව වැඩි ඡන්දයෙන් සම්මත කර ගත්තා කියලා ප්‍රයෝජනයක් ඇති වෙනවා කියලා. අද හැන්දෑවේ තුනට පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවේ - ඒක තමයි බලවත්. එතැනදී

ගන්න තීරණය තමයි මේ පළාත් සභාවේ බලය හැල්ලු කරනවාද නැද්ද කියන එක පිළිබඳව තීරණය කරන්නේ. ඒක නිසා මේක ගරු ප්‍රධාන ඇමැතිතුමා එතුමාගේ හිතසුව පිණිස මේ පළාත් සභාවට ඉදිරිපත් කරලා අපේ කැමැත්ත විමසනවා. අපේ කැමැත්ත තිබුණත් නැතත්, එතුමා කැමැති වුණත් අකැමැති වුණත් අතිගරු ජනාධිපතිතුමා තේරීම් කාරක සභාව හරහා මේ යෝජනාව ක්‍රියාත්මක කරනවා. හැබැයි, ජගත් අංගගේ ගරු ඇමැතිතුමා කථා කරනකොට එතුමාගේ කථාවේ දිගින් දිගටම තිස්ස විතාරණ කියන නම මන්තරයක් වාගේ කිව්වා. කියන්න කනගාටුයි. අද හවස තිබෙන තේරීම් කාරක සභාවට තිස්ස විතාරණ කියන ඒ ඇමැතිවරයා. ආණ්ඩුව නියෝජනය කරන ලංකා සම සමාජ පක්ෂයේ එතුමා තේරීම් කාරක සභාවේ සාමාජිකයෙක් නොවෙයි. හැබැයි, මේ පළාත් සභාවට එන්න ඕනෑ බලතල තේරීම් කාරක සභාවට එන්න ඉස්සෙල්ලා තිස්ස විතාරණ මැතිතුමාගේ මාර්ගයෙන් තමයි ඒ කමිටුවක් හදලා මොනවාද අයින් කරන්න ඕනෑ, මොනවාද දෙන්න ඕනෑය කියන එක පිළිබඳව තීරණය කෙරුවේ. ඒ පිළිබඳව තමයි ජගත් අංගගේ ගරු ඇමැතිතුමා පුන පුනා, පුන පුනා මේ සභාවට කිව්වේ. එහෙමනම් ඇයි ආණ්ඩුව අද එවැනි යෝජනාවක් ඉදිරිපත් කරපු, එවැනි නිර්දේශ ඉදිරිපත් කරපු ඒ විද්වතාව මේ තේරීම් කාරක සභාවට සාමාජිකයෙක් හැටියටවත් පත් කරලා නැත්තේ කියන කාරණාව අපි අහන්න ඕනෑ. ඒක නිසා -

**ගරු සිසිර ජයකොඩි**
Hon. Sisira Jayakody

ඔයගොල්ලන්ගේ නායකයා කරන -

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

තමුන්නාන්සේගේ නායකයාත් දෙබිඩි පිළිවෙතක් රකින්නේ. තමුන්නාන්සේගේ නායකයාත් මේ පළාත් සභා ක්‍රමය පිළිබඳව යම් අවස්ථාවලදී විශ්වාසනීයව කටයුතු කරන කෙනෙක්. තමුන්නාන්සේත් මේ පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් වෙලා ඇවිල්ලා ඉන්නෙත් මේ පළාත් සභාව පිළිගන්න නිසා. නමුත් තමුන්නාන්සේලාගේ පැවැත්මට අද මේ සඳහා විරුද්ධ වෙනවා. මම ප්‍රශ්නවල පැටලෙන්න කැමැති නැහැ. මීට මාස පහ හයකට ඉස්සෙල්ලා විශේෂ ප්‍රකාශයක් කෙරුවා. ගරු සභාපතිතුමනි, උදය ගම්මන්පිල ගරු ඇමැතිවරයා මේ පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයෙක් වෙලා ඉඳගෙනත් පළාත් සභාව පිළිබඳව පළාත් සභාවෙන් පිටත ගිහිල්ලා කරන ප්‍රකාශ පිළිබඳව. එදා අපි දෙන්නා අතර විශාල මම හිතන්නේ හිත් රිදවීමකුත් වුණා. නමුත් මම ඒ ගැන එතැනින් එහාට කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. නමුත් අපට තිබෙන ප්‍රශ්නය මේකයි. මම එදා කියපු දේ අදත් කියන්න කැමැතියි. මේ පළාත් සභා ක්‍රමය එපාය කියලා කියනවා නම් - අර ගාමිණී තිලකසිරි ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු පෝස්ටරය, ඇත්ත වශයෙන්ම ඒක පළාත් සභා මන්ත්‍රීවරුන්ට පාරේ යනකොට ඇදලා අරගෙන ගහපල්ලා කියලා නොකියා කියන කථාවක් තමයි ඒ පෝස්ටරයෙන් කියන්නේ. එතකොට එවැනි වේදිකාවල ගිහිල්ලා මේ පළාත් සභා එපා කියන තැනට තමන්ගේ නායකයොත් එක්ක කථා කරලා අද මේ පළාත් සභාවේදී එතුමා ඒ ඇමැතිකමේ සියලු වරප්‍රසාද භුක්ති විඳගෙන ඉන්නවා. මට තේරෙන්නේ නැහැ, මොකක්ද මේ කියලා. මම ඒක නිසා එදා කියපු උදාහරණය අද කියන්න යන්නේ නැහැ. තමුන්නාන්සේත් එක්ක මගේ පෞද්ගලික අමනාපයක් නැහැ.

නමුත් ගරු සභාපතිතුමනි, මේ පළාත් සභා ඇති කෙරුවේ ඇයි කියන එක පිළිබඳව අපි මොහොතක් කල්පනා කරලා බලන්න ඕනෑ. එදා උතුරු - නැගෙනහිර තිබුණු ප්‍රශ්නයට විසඳුමක් හැටියට තමයි ගරු ජේ.ආර්.ජයවර්ධන මැතිතුමා රජීව් ගාන්ධි මැතිතුමාත් එක්ක මේ ගිවිසුම අත්සන් කෙරුවේ. මම හිතන්නේ නැහැ, රටවල් දෙකක් අතර ඇති කරපු ගිවිසුමක් එහෙම ලෙහෙසියෙන් කඩන්න, ඒ වගන්ති අයින් කරන්න පුළුවන්කමක් තිබෙනවා කියලා. අපි ළඳ බොලඳයෝ හැටියට කල්පනා කරන්න නුවමනායි. මේක ජාත්‍යන්තරයට ගිය ප්‍රශ්නයක්. ඒක නිසා අපේ තිබෙන බලතල අඩු කරලා, අපේ තිබෙන අත පය කපලා, එහෙම අපි කොපමණ කිව්වත් ගරු ප්‍රධාන ඇමැතිතුමනි, මෙන්න මේ වැඩ කරන්න කියලා, අපට ඒ වැඩ කරන්න හම්බ වෙන්නේ නැත්නම්, මම හිතන්නේ මේ පළාත් සභාවෙන් ඇති ප්‍රයෝජනයක් නැහැ. නිමල් ලාන්සා ගරු ඇමැතිතුමා පිළිබඳව වර්ණනා කරලා කථා කෙරුවා. ඇත්ත. අපි පිළිගන්නවා. මධ්‍යම රජයේ සම්බන්ධකම් තිබෙන නිසා, රේඛීය අමාත්‍යාංශයේ අමාත්‍යවරයාත් එක්ක, ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාත් එක්ක සම්බන්ධ නිසා ඒ තිබෙන බලතල, එහෙම නැත්නම් ඒ වරප්‍රසාද ලැබෙන නිසා එතුමා හොඳට වැඩ කරනවා. එතකොට මේ පළාත් සභා හරහා තමයි මේ ඔක්කෝම කරන්නේ. පළාත් සභා ක්‍රමය එපා නම්, එපා වුණු දවසට අද මේ හදලා තිබෙන රාමුව, නිලධාරීන්ව කොයි පැත්තට විසි වෙනවාද? මේ පළාත් සභාවට ඇති කරපු සංයුතිය අනුව කටයුතු මොනවාද වෙන්නේ? රාජ්‍ය නිලධාරීන්ට? පළාත් පාලන ක්‍රමයට මොකද වෙන්නේ?

මම මේ කථාව කරන්න ඉස්සෙල්ලා උදේ වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කෙරුවා, තමුන්නාන්සේට. මේ පළාත් සභාව හරහා පළාත් පාලන ආයතන පාලනය කිරීමේ හා අධීක්ෂණය කිරීමේ පූර්ණ බලතල මේ පළාත් සභාවට තිබෙනවා. ඒ තිබෙන වරප්‍රසාද අපි පාවිච්චි කරන්න ඕනෑ. ඒවා නැතිව ගියොත් එහෙම, ඒවාත් අයින් කරලා දාලා මධ්‍යම රජයට ගත්තොත් එහෙම - දැන් අපි දන්නවා, සමහර වේලාවට රේඛීය අමාත්‍යාංශයේ මේ පළාත් සභාවේ තිබෙන විෂයයන් පිළිබඳව ඇමැතිවරු ඉන්නවා. කරන්නේ මොකක්ද කියන එක අපි දන්නේ නැහැ. රේඛීය අමාත්‍යාංශයේ ඕනෑ තරම් අමාත්‍යාංශ බෙදලා තිබෙනවා. මේ පළාත් සභාවේ විෂයයන්වලටම සම්බන්ධවන විධියට. ඉතින් ඒවා ඒ එක එක්කෙනාගේ පැවැත්මට කරපු වැඩ. හැබැයි, මේ පළාත් සභා ක්‍රමය අහෝසි කරපු දාට නැවත වතාවක්, එහෙම නැත්නම් මේ බලතල කප්පාදු කරපු දවසට - අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට මේ සියලුම පළාත් සභාවල බලය තිබෙන නිසා ඒ තරම්

[ ගරු සිරිකමල් පිලිෂියන් ද සිල්වා ]

ප්‍රශ්නයක් ඇති වෙයි කියලා කල්පනා කරන්නේ නැහැ. මේ ප්‍රශ්නය මතු වෙන්නේ උතුරේ පළාත් සභාව වෙනත් දේශපාලන කණ්ඩායමකට ගියොත් කියන ඒ සැකය තිබෙන නිසයි. ඒ සැකය තිබෙන කම් කවදාවත් මේ ඇති කෙරුවයි කියන සාමය උතුරු - නැගෙනහිරට ඇති කෙරුවයි කියන ජනවාර්ගික ප්‍රශ්න විසඳුම් ලැබෙන්නේ නැහැයි කියන එක මම මේ පළාත් සභාවේදී බොහොම වගකීමෙන් කියන්න ඕනෑ. ඒ හින්දා ඒ සැකයත් එක්ක ජීවත් වෙනවා නම්, ඒ සැකයත් එක්ක දිගින් දිගට කටයුතු කරනවා නම් මේ පළාත් සභා ක්‍රමය මම හිතන්නේ සාමාන්‍ය විධියට, අර කථා කරන විධියට සුදු අලියෙක් හැටියට තමයි නම් කරන්න වෙන්නේ. එහෙම නොවී මේ පළාත් සභා මන්ත්‍රීවරුන්ට පළාත් සභාවට බලතල ලැබිලා, පළාත් සභා මන්ත්‍රීවරුන්ව ශක්තිමත් කරලා අර පාරේ යනකොට ඇදලා අරගෙන ගහපල්ලා කියන තත්ත්වයට නොවෙයි. පළාත් සභා මන්ත්‍රීවරයා අධ්‍යාපනයට කරන සුවිශේෂී වගකීම, පළාතේ මාර්ගවලට කරන සුවිශේෂී වගකීම, පළාතේ ජනතාව වෙනුවෙන් කරන ඒ සුවිශේෂ කාර්ය භාරයට පළාත් සභා මන්ත්‍රීවරයාගේ දායකත්වය මොකක්ද කියලා මේ අවුරුදු 25 දිහා ආපසු හැරිලා බැලුවොත් එහෙම මම හිතන්නේ, ගරු ප්‍රධාන ඇමැතිතුමා හෘදය සාක්ෂියට එකඟව ගරු ප්‍රධාන ඇමැතිවරයා හැටියට එතුමාට මේ යෝජනාව ඉදිරිපත් කරන්න සිද්ධ වුණත්, ප්‍රසන්න රණතුංග කියන පුද්ගලයා හැටියට, කොන්දක් කෙලින් තියෙන පුද්ගලයෙක් හැටියට එතුමාගේ හෘද සාක්ෂිය දන්නවා. මේ බලතල කප්පාදු කරලා මේ පළාත් සභා ක්‍රමය ගෙනියන්න බැහැයි කියලා. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ පළාත් සභාවේ ආණ්ඩු පක්ෂය නියෝජනය කරන කොන්දක් තිබෙන, හෘද සාක්ෂියක් තිබෙන කීර්ති උඩවත්ත වාගේ, ගාමිණී තිලකසිරි වාගේ, හෙක්ටර් බෙත්මගේ වාගේ, මහේෂ් අල්මේදා වාගේ මන්ත්‍රීවරුන්ගෙන් මම ඉතාමත් ගෞරවයෙන් ඉල්ලනවා. තමන්ගේ හෘද සාක්ෂියට එකඟව මේ යෝජනාවේදී කටයුතු කරන්න කියලා ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා.

[ අ.භා. 12.12 ]

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි,

නපරේසං විලෝමානී - නපරේසං කථා කථං
අත්ත නෝව අවෙක්ඛෙය්‍යා- කථානි අකථා නිච

අනුන්ගේ අඩුපාඩු සොයන එක වෙනුවට තමන්ගේ අඩුපාඩු සොයා ගැනීම වඩා වැදගත්ය කියලා බුදුරජාණන් වහන්සේ ධම්ම පදයේ දේශනා කරලා තිබෙනවා. ගරු සභාපතිතුමනි,

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

සාදු සාදු! අනේ සාදු!

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, එවැනි පසුබිමකදී අද අපි සභාවේ කථා කරන මේ මොහොතේ ඉන්දියාවේ ජාතික ආරක්ෂක උපදේශක ශිවශංකර් මෙනන් මැතිතුමා ලංකාවට ඇවිත් ඉන්නවා. එතුමා අපේ මිත්‍රයෙක්. එතුමා මේ රටේ ඉන්දියානු තානාපතිවරයා වශයෙන් කටයුතු කළ සමයේ එතුමා ඉතා හිතවත්ව ලංකාව වෙනුවෙන් පෙනී සිටියා. එතුමා වසර තුනක් ලංකාව තුළ ඉන්දියාවේ තානාපති වුණා විතරක් නොවෙයි. පසුගිය සමයේ ඉන්දියාව තුළ ලංකාව වෙනුවෙන් පෙනී සිටින තානාපතිවරයෙක් බවට පත් වුණා. පසුගිය දිනවල ඉන්දියානු ආණ්ඩුව එක්සත් ජාතීන්ගේ සංවිධානයේදී ලංකාවට එරෙහිව ඡන්දය දුන්නු අවස්ථාවල ඊට එරෙහිව ලංකාව වෙනුවෙන් කථා කරපු ඉන්දියානු නිලධරයා තමයි ශිවශංකර් මෙනන් මැතිතුමා. ගරු සභාපතිතුමනි, කොපමණ ලස්සන සැරසිල්ලක් ඇතුළේ දවටා ගෙනාවත් බෝම්බය බෝම්බයමයි. ඒ නිසා ශිවශංකර් මෙනන් මැතිතුමා ශ්‍රී ලංකාවට පැමිණ අද අපට කියන්නේ, ශ්‍රී ලංකා ආණ්ඩුවට කියන්නේ, මේ පළාත් සභා ක්‍රමය තනියෙන් වෙනස් කරන්න යන එක වැරැදියි. මේ සංශෝධන ගෙනෙන එක වැරැදියි. මේක ඉන්දු - ලංකා ගිවිසුමේ ප්‍රතිඵලයක්. අපි දෙගොල්ලොම එකඟ වෙලයි මේක වෙනස් කරන්න ඕනෑ කියලා.

ගරු සභාපතිතුමනි, මේ යෝජනාවේ අන්තර්ගතයට එමට කලින් මේ යෝජනාවේ පසුබිම ගැන කථා කරද්දී ශිවශංකර් මෙනන් මැතිතුමන්ලාගේ ඉන්දියාවේ ස්ථාවරය ඉතා වැදගත් වෙනවා. ඇත්තටම ඉන්දු - ලංකා ගිවිසුම යනුවෙන් ගිවිසුමක් තිබෙනවාද? ජාත්‍යන්තර ගිවිසුම් නීතිය අනුව එවැනි ගිවිසුමක් තිබෙනවාද කියන කාරණය පිළිබඳව අපි මුලින්ම අවධානය යොමු කළ යුතු වෙනවා. ගරු සභාපතිතුමනි, ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාගේ නිල චරිතාපදානය මෙන්ම Colombo Assignment නමින් ලංකාවේ සිටිය ඉන්දියානු තානාපති ජේ.එන්. ඩික්සිත් ලියුව පොත්වල මෙම සිදුවීම ඉතා අපූරුවට විස්තර කරලා තිබෙනවා. ලංකාව කොටි ත්‍රස්තවාදය පරාජය කරන්න අවස්ථාව ලැබුණේ, 1987 මැයි මාසයේ විමුක්ති මෙහෙයුම ආරම්භ කළ දවසේ. වඩමාරච්චියේ කොටි බල කොටු එකින් එක, එකින් එක බිඳගෙන වැටෙද්දී උතුරේ ජනතාවට කන්න නැතය. උතුරේ ජනතාව බඩගින්නේය කියලා අපට පරිප්පු අරගෙන ආවා. අපේ නාවික හමුදාව පරිප්පු බෝට්ටුවලට බාධා කළාම ඉන්දියානු ගුවන් හමුදාවේ යානා ශ්‍රී ලංකාවේ අහස ආක්‍රමණය කරලා මේ පරිප්පු අහසින් බිමට දැම්මා. එදා ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා, එතුමා සිටිය මානසික වාතාවරණය තමන්ගේ චරිතාපදානයෙන් කියනවා.

ගරු සභාපතිතුමනි, 1971 දී ඉන්දියානු හමුදා පකිස්තානය ආක්‍රමණය කරලා නැගෙනහිර පකිස්තානය බංගලිදේශය නමින් වෙනම රටක් කළා. ඒ වාගේ ලංකාවට ඉන්දියානු හමුදාව ආක්‍රමණය කරලා උතුරු - නැගෙනහිර දෙමළ ඊළම පිහිටුවාවිද කියන භය ජනාධිපතිතුමාට ඇති වුණා. ඒ වාගේම 1975 දී

ඉන්දියානු හමුදා සිකීමය කියන පුංචි රට ආක්‍රමණය කරලා ඒ රට ඉන්දියාවේ 28 වන ප්‍රාන්තය විධියට ඈඳා ගත්තා. දෙමළ ඊළම හදනවාටත් වඩා භයානකයි සමස්ත ශ්‍රී ලංකාවම ඉන්දියාවේ ඊළඟ ප්‍රාන්තය විධියට ඈඳා ගනියි කියලා ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා බිය වුණා. ඒ නිසා ඒ ඇති කළ දැඩි පීඩනය නිසාම ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාට සිද්ධ වුණා ඉන්දියාව ඉස්සරහ දණ ගහලා මේ ගිවිසුමට අත්සන් කරන්න.

ගරු සභාපතිතුමනි, ගිවිසුම් නීතියට අනුව යම් කෙනෙක් පීඩනයක් යටතේ අත්සන් කරන ගිවිසුම නීතිය ඉදිරියේ වලංගු නැහැ. මම ඔබතුමාගේ හිසට පිස්තෝලයක් එල්ල කරලා ඔබතුමාගේ සියලුම දේපළ මගේ නමට දෙනවාය කියලා ගිවිසුමක් අද අත්සන් කළත් ඔබතුමා පීඩනයක් යටතේ අත්සන් කරන නිසා, බියට පත්ව අත්සන් කරන නිසා ඒ ගිවිසුමට නීතිය ඉදිරියේ කිසිම වලංගු භාවයක් නැහැ. ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාම කියනවා නම්, මම පීඩනයක් යටතේ මෙය අත්සන් කළේ කියලා, ජේ.එන්. ඩික්සිත් ඉන්දියානු තානාපතිතුමා ඊට සාක්ෂි සපයනවා නම් ඉන්දු - ලංකා ගිවිසුම වලංගු නැහැ ගරු මන්ත්‍රීවරුනි. අපි මොහොතකට හිතමු, ඉන්දු - ලංකා ගිවිසුම වලංගු ගිවිසුමක් කියලා. ඒ ගිවිසුමේ 2 (16) වගන්තියේ මෙන්න මෙහෙම කියනවා.

*"ශ්‍රී ලංකාව මෙම ගිවිසුම යටතේ තමන්ගේ බැඳීම් ඉටු කළ යුත්තේ, ඉන්දියාව විසින් මතු දැක්වෙන කාරණා පහ ඉටු කරන්නේ නම් පමණි."*

යම් ත්‍රස්තවාදී සංවිධානයක් පැය 120 ක් ඇතුළත ආයුධ බිම තැබුවේ නැත්නම් ඉන්දියාව මෙන්න මේ කාරණා පහ ඉටු කළ යුතුය කියලා ඉන්දු - ලංකා ගිවිසුමේ 2(16) වගන්තියේ සඳහන් වෙනවා. මොනවද මේ කාරණා පහ.

පළමුවැනි කාරණය. ඉන්දියානු භූමිය ශ්‍රී ලංකාවට එරෙහිව භාවිතා නොකරන බවට ඉන්දියාව වග බලා ගත යුතුය. ඉටු කළාද? නැහැ. මේ මොහොත දක්වාත් තමිල්නාඩුවේ ප්‍රාන්ත ආණ්ඩුව පවා ශ්‍රී ලංකාවට එරෙහිව තමන්ගේ භූමිය භාවිතා කළා. කොටි ත්‍රස්තවාදීන් තමන්ගේ ආයුධ ගෙනැල්ලා සඟවලා තබලා තමිල්නාඩුවෙන් තමයි ලංකාවට ගෙනාවේ. කොටි නායකයින් වෙඩි වැදී තුවාල වුණාම ප්‍රතිකාර ගන්න ගියේ තමිල් නාඩුවේ රෝහල්වලට. ඒ නිසා අපේ සාමාන්‍ය ජනතාව නොවෙයි. භික්ෂූන් වහන්සේලා පවා ඉන්දියාවේදී ප්‍රහාරයන්ට ලක් වුණා. මේ නිසා මේ පළමුවැනි කොන්දේසිය ඉන්දියාව ඉතා පැහැදිලිව කඩ කරලා තිබෙනවා.

දෙවැනි කොන්දේසිය තමයි, කොටි ත්‍රස්තවාදීන් ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ගමනා ගමනය කිරීම නැවැත්වීම සඳහා ඉන්දියානු නාවික හමුදාව ශ්‍රී ලංකාවේ නාවික හමුදාවට සහාය දැක්විය යුතුයි. ගිවිසුම අත්සන් කරපු දවසේ ඉඳන් 1990 ජූලි මාසය වනතුරු මේ සහයෝගය ලැබුණා. ඊට පස්සේ සහාය දෙන එක අත හැරියා. ඒ නිසා තමයි ඉන්දියාවෙන් ලංකාවට ආයුධත්, ලංකාවෙන් ඉන්දියාවට තුවාලකරුවෝත් කිසිම ප්‍රශ්නයක් නැතිව කොටි සංවිධානයට ගෙනි යන්න පුළුවන් වුණේ. දෙවැනි කොන්දේසියත් කඩලා.

තුන්වැනි කාරණය. ශ්‍රී ලංකා ආණ්ඩුවට අවශ්‍ය පරිදි ඉන්දියානු හමුදාවල සහාය ලංකාවට ලබා දෙනු ලැබේ. ඒ අනුව ඉන්දියානු හමුදාව ලංකාවට ආවා. හැබැයි, ලංකාවට අවශ්‍ය පරිදි නොවෙයි සහාය දුන්නේ. ඔවුන්ට අවශ්‍ය පරිදි ඔවුන් ක්‍රියාත්මක වුණේ. ඔවුන් ශ්‍රී ලංකාවේ ජනාධිපතිතුමාගේ අණ අහන්නේ නැති නිසා ප්‍රේමදාස ජනාධිපතිතුමාට සිද්ධ වුණා, ඉන්දියානු හමුදා 1990 ජූනි මාසයේ 30 වැනිදාට කලින් ලංකාවෙන් පිටත් වෙන්න කියලා නිල වශයෙන් ඉල්ලීමක් කරන්න. එදා ඉන්දියානු ආණ්ඩුව කිව්වේ, අපේ හමුදාව යන්නේ ඔබට ඕනෑ දවසට නොවෙයි. අපිට ඕනෑ දවසටයි කියලා. එහෙමනම් ඉන්දියාව තුන්වැනි කොන්දේසියත් කඩලා ඉවරයි.

හතරවැනි කොන්දේසිය. ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර පළාතේ ජීවත්වන සියලුම ජන වර්ගයන්ගේ ආරක්ෂාව ඉන්දියානු ආණ්ඩුව විසින් සහතික කරනවා කියලා. එහෙම කියලා 1987 අගෝස්තු මාසයේ ඉන්දියානු හමුදා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ දහස් ගණනින් සිංහලයන් මරා දාලා, දස දහස් ගණනින් සිංහලයන් හඹාරනට, කන්තලේට පන්නලා දාලා ඒකට එරෙහිව නැඟී සිටිය අපේ වීන වරායේ නායක හාමුදුරුවන්ව ඉන්දියානු හමුදාව විසින් ඝාතනය කරලා මේ කොන්දේසියත් කඩලා දැම්මා ගරු මන්ත්‍රීවරුනි. ආරක්ෂාව සපයන්න ආපු කෙනා තමයි ප්‍රහාරකයා බවට, ත්‍රස්තවාදියා බවට පත් වුණේ.

පස්වැනි කාරණය. සිරිමා - ශාස්ත්‍රී ගිවිසුම යටතේ ඉන්දියාවේ පුරවැසිකම් ඉල්ලා සිටි පන් ලක්ෂ හයදාහක ජනතාව නොපමාව ඉන්දියාවට ගෙන්වා ගන්නවාය කියල පොරොන්දුවක් වුණා. 1964 ඔක්තෝබර් 30 වැනිදා අත්සන් කළ සිරිමා - ශාස්ත්‍රී ගිවිසුම යටතේ මුලින්ම ලංකාව ලක්ෂ තුනක් භාර ගත්තා. ඉන්දියාව පන් ලක්ෂ විසි පන්දාහක් භාර ගත්තා. ඉතිරි එක් ලක්ෂ පනස් දාහ, හැත්තෑ පන්දාහ, හැත්තෑ පන්දාහ ගණනේ රටවල් දෙක භාර ගත්තා. ඒ අනුව ඉන්දියාවට ලක්ෂ හයක් යා යුතුයි. හැබැයි අයදුම් කළේ, පන් ලක්ෂ හයදාහයි. ලංකාව කිව්වා, කමක් නැහැ. බලහත්කාරයෙන් යවන්න ඕනෑ නැහැ. ඒ කට්ටියත් හිටපු දෙන්. මේ පන් ලක්ෂ හයදාහ ගෙන්න ගන්න. ඉන්දු - ලංකා ගිවිසුම අත්සන් කරන තුරුත් ඒ කාරණය සිද්ධ වුණේ නැහැ. ඊට පස්සේ සිද්ධ වුණෙත් නැහැ. අවසාන වශයෙන් 1986 පුරවැසි විශේෂ විධිවිධාන පනත ගෙනැල්ලා ඒ සියලු දෙනාටම ලංකාවේ පුරවැසිකම දීලයි රටක් නැති ජනතාවගේ ප්‍රශ්නය මේ ආණ්ඩුව විසඳුවේ. එහෙමනම් පස්වැනි කොන්දේසියත් කඩ කරලා හමාරයි. අපි නොවෙයි කියන්නේ. ඉන්දියාවයි කියන්නේ. ඉන්දියාව විසින් මේ කාරණා පහ ඉටු නොකරන්නේ නම් ලංකාව ගිවිසුමේ බැඳීම්වලට යටත් වෙන්නේ නැහැයි කියලා. මේ කාරණා පහෙන් එකක්වත් කරගන්න බැරි වුණු ඉන්දියාව අද ලැජ්ජා

[ ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල - අමාත්‍යතුමා ]

නැතිව ලංකාවට ඉන්දු - ලංකා ගිවිසුම ගැන මතක් කිරීමට ශිවශංකර් මෙනන් වාගේ හොඳ මහත්මයෙක් එවීම ගැන මම ඇත්තෙන්ම කනගාටු වෙනවා. ශිවශංකර් මෙනන් මහත්මයාට මේ රටේ ජනතාවගේ, මේ රටේ ආණ්ඩුවේ, අපි හැමෝගෙම පක්ෂ විපක්ෂ භේදයෙන් තොරව ගෞරවයක් තිබෙනවා. ඒ ගෞරවය කෙළසීම විතරයි, හොඳ මහත්මයෙක් නරක වැඩකට එවීමෙන් ඉන්දියාව කරගෙන තිබෙන්නේ.

ගරු සභාපතිතුමනි, ඊළඟට මම අවධානය යොමු කරන්නම්. එහෙමනම් මේක ස්වාධීන රටක් විධියට, සෛවරී රටක් විධියට අපේ රටේ ව්‍යවස්ථාවේ තිබෙන්නේ මොනවාද කියන එක තීරණය කරන්නේ මේ රටේ ජනතාවගේ නියෝජිතයන් ඉන්න පාර්ලිමේන්තුව මිසක් ඉන්දියානු ආණ්ඩුව නොවෙයි කියන එක අපි ඉතා වගකීමෙන් මේ සභාවේදී සිහිපත් කරන්න ඕනෑ. එහෙමනම් අපි මොනවාද කරන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, හරියටම මීට මාසයකට කලින් මම මේ සභාවේ විශේෂ ප්‍රකාශයක් කරමින් උතුරු පළාත් සභා මැතිවරණය පැවැත්වීමට පෙර පළාත් සභා ක්‍රමයට විය යුතු සංශෝධන පහක් ඉදිරිපත් කළා. පළමුවැනි කාරණය පොලිස් බලතල ඉවත් කිරීම. දෙක ඉඩම් බලතල ඉවත් කිරීම. තුන පළාත් දෙකක් සඳහා තනි පළාත් සභාවක් පිහිටුවීම. ජනප්‍රියව කියන විධියට ඒකාබද්ධ කිරීමේ විධිවිධාන ඉවත් කිරීම. හතරවැනි එක පළාත් සභා විෂයයක් සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ පනතක් ගෙන එන විට පළාත් සභා සියල්ලගෙන්ම ඇසිය යුතුයි කියන කාරණය වෙනුවට පළාත් සභා බහුතරයකගේ කැමැත්ත ඇතිව කළ හැකිය විධිවිධානය සංශෝධනය කිරීම. පස්වැනි එක පළාත් සභාවන්ට විධානයන් නිකුත් කිරීමේ බලය ආණ්ඩුවට ලබා දීම. මේ කාරණා පහ ගැන මම එදා යම් පැහැදිලි කිරීමක් කළා. අද අපේ ගරු මහ ඇමැතිතුමන් ඉන් කාරණා දෙකක් ඉදිරිපත් කරලා තිබෙනවා. මේ කාරණා දෙකේ දේශපාලන පසුබිම විස්තර කිරීම මගේ වගකීමක් වෙනවා.

ගරු සභාපතිතුමනි, 1951 දී ත්‍රිකුණාමලයේ පැවැති තමිල් අරුසු කච්චි පක්ෂයේ පළමුවැනි සම්මේලනයේදී යෝජනා 04 ක් සම්මත වුණා. මේ තමයි දෙමළ බෙදුම් වාදයේ පදනම. පළමුවැනි යෝජනාව තමයි ශ්‍රී ලංකාවේ වසන දෙමළ ජනයා අනන්‍ය වූ ජාතියකි. උතුරු සහ නැගෙනහිර පළාත් ඔවුන්ගේ නිජ බිමයි. තුන්වැනි එක. ශ්‍රී ලංකාවේ උතුරු - නැගෙනහිර අරඹයා දෙමළ ජාතියට ස්වයං නිර්ණය අයිතිය ඇත. හතරවැනි කාරණය. අද එච්චර අදාළ වෙන්නේ නැහැ. ශ්‍රී ලංකාවේ වසන සියලුම දෙමළ ජනතාවට මේ රටේ පුරවැසිභාවය ලැබිය යුතුය. ගරු සභාපතිතුමනි, දෙමළ ඊළම කියන කාරණය ලංකාවේ ආරම්භ වෙන්නේ තමිල් අරුසු කච්චි පක්ෂය මේ සම්මත කරන යෝජනාවත් එක්ක. මේ රටේ දෙමළ බෙදුම්වාදයේ පදනම තමයි උතුරු - නැගෙනහිර දෙමළ නිජ බිමයි කියන එක. අපි දන්නවා, වසර 300 ක කාලයක් යාපනය අර්ධද්වීපයේ පමණක් දෙමළ රාජ්‍යයක් තිබිලා සන්ගිලෙ අවසාන රජවරයා වශයෙන් සිටියා කියන එක. නමුත් ගරු සභාපතිතුමනි, ඒ යාපන අර්ධද්වීපයෙන් මෙහා තිබෙන උතුරු පළාතේ වේවා. නැගෙනහිර පළාතේ හෝ වේවා. කවදාවත් එහෙම එකක් තිබුණේ නැහැ. මේ උතුරු සහ නැගෙනහිර පළාත් අඳුන ගත්තේ 1833 සිට 1890 දක්වා ඉංග්‍රීසින් විසින් නිර්ණය කරන ලද පළාත් මායිම් අනුව. මේවා සුද්දා හදපු මායිම්. මේවා කිසිම ඓතිහාසික මායිම් නොවෙයි. මේ දෙමළ නිජබිම පිළිබඳව ඓතිහාසික, පුරාවිද්‍යාත්මක කිසිදු සාධකයක් නැහැ. එදා ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාට බලපෑම් කරලා - උතුර හා නැගෙනහිර නිජ බිම කියන වචනයට එතුමා විරුද්ධ වුණා. අත්සන් කරන්නම බැහැයි කිව්වා. ඕනෑම ප්‍රශ්නයකට මුහුණ දෙන්නම් කියලා එතුමා කිව්වා. අවසාන වශයෙන් ගාමිණී දිසානායක ඇමැතිතුමා මැද වචනයක් විධියට ඓතිහාසික වාස භූමි කියන වචනය ගෙනාවා. ඒක පදනම් කරගෙන තමයි උතුරයි නැගෙනහිරයි ඒකාබද්ධ කළේ.

ඉන්දු - ලංකා ගිවිසුම අත්සන් කරලා ඉවරවෙලා ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා මාධ්‍ය හමුවක් තිබ්බා. මේ මාධ්‍ය හමුවේදී එතුමා කියනවා, මම උතුරු සහ නැගෙනහිර පළාත් ඒකාබද්ධ කරනවාට විරුද්ධයි. කවුද කළේ? ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා. කවුද ඉන්දු- ලංකා ගිවිසුමට අත්සන් කළේ? ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා. ඊට පස්සේ එතුමා කියනවා මේ ඒකාබද්ධයට මම විරුද්ධයි. බලපෑමක් යටතේ ගිවිසුම අත්සන් කළා කියන්න මීටත් වඩා හොඳ සාක්ෂියක් තියෙනවාද? එතුමා කියනවා, උතුරු සහ නැගෙනහිර පළාත් වෙන් කිරීමට පවත්වන ජනමත විචාරණයේදී මමත් එක්සත් ජාතික පක්ෂයත් ඒකාබද්ධයට විරුද්ධව වැඩ කරනවා. ගරු සභාපතිතුමනි, ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා මිය ගියේ, ඒ සිහිනය ඉටු කර ගන්න බැරිව. ජනතා විමුක්ති පෙරමුණ අධිකරණය ඉදිරියට ගිහිල්ලා ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා එදා ගෙනාපු ඒ නියෝගය නීත්‍යානුකූල නැති බව පෙන්වලා දීලා, නියෝගය අහෝසි වුණාට ඒ.එම්. යූසුෆ් ගරු මන්ත්‍රීතුමාත් සඳහන් කළ ආකාරයට ඒකාබද්ධ කරන්න බැහැයි කියලා ශ්‍රේෂ්ඨාධිකරණය කියලා නැහැ. ශ්‍රේෂ්ඨාධිකරණය කිව්වේ, එදා 87 දී ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා ඒකාබද්ධ කළ ආකාරය නීති විරෝධියි. ඒ නිසා ඒකාබද්ධ වීම නිසි පරිදි සිද්ධ වුණේ නැහැ කියන එකයි. ආයිත් කරන්න බැරිකමක් නැහැ. එහෙමනම් මේ යෝජනාව තුළින් ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාගේ සිහිනයක් මේ ආණ්ඩුව ඉටු කිරීමක් කියන එක විපක්ෂයට අපි ඉතාම ගෞරවයෙන් සිහිපත් කරන්න කැමැතියි. ඒ වාගේම එක්සත් ජාතික පක්ෂයෙන් මේ රටට වුණු ඓතිහාසික අත්වැරැද්දක් නිවැරැදි කරන්න අපි උත්සාහ කරනකොට ඒ පිංකමට සම්මාදන් වෙන්න කියලා එක්සත් ජාතික පක්ෂයෙන් අපි ඉල්ලා සිටින්න කැමැතියි.

ගරු සභාපතිතුමනි, දෙවැනි කාරණය. පළාත් සභා සියල්ලේම එකඟතාවය ලබා ගැනීම වෙනුවට පළාත් සභා බහුතරයකගේ එකඟතාවය ලබා ගැනීම. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හැටියට ශ්‍රී ලංකාව ඒකීය රාජ්‍යයක්. එහෙම නම් අපේ පාර්ලිමේන්තුවට

පුළුවන් වෙන්න ඕනෑ කිසිම බලපෑමකින් තොරව සමස්ත ශ්‍රී ලංකාවටම නීති හදන්න. ඉන්දියාවේ තිබෙන්නේ ෆෙඩරල් ආණ්ඩුවක්. නමුත් ඉන්දියාවේවත් මෙවැනි ප්‍රතිපාදනයක් නැහැ. ෆෙඩරල් ඉන්දියාවේවත් මෙවැනි ප්‍රතිපාදනයක් නැහැ. ගරු සභාපතිතුමනි, මේ කාරණයේ තිබෙන භයානකකම මේකයි. අනාගතයේදී උතුරේ හරි වෙනත් පළාතක හරි එක පළාත් සභාවක් ආණ්ඩුවෙන් ගෙන එන යෝජනාවට එකඟ වුණේ නැත්නම් ඇති වන තත්ත්වය මොකක්ද? දිවි නැගුම පනත පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණ විවරණයේදී ශ්‍රේෂ්ඨාධිකරණය කියනවා, විදේශ කටයුතු, නාගරික කටයුතු ඈරෙන්න වෙනත් ඕනෑම විෂයයක් ග්‍රාමීය සංවර්ධනය කියන විෂයයට වැටෙන්න පුළුවන් කියලා. අපේ නිමල් සිරිපාල ඇමැතිතුමා, නිමල් සිරිපාල පදනම කියලා පදනමක් හදන්න කෙටුම්පතක් ගෙන ආවා. ජෝන් සෙනෙවිරත්න ඇමැතිතුමා, ජෝන් සෙනෙවිරත්න පදනම කියලා හදන්න කෙටුම්පතක් ගෙන ආවා. ඒ කෙටුම්පත් සියල්ලත් දැන් එනවා, සියලුම පළාත් සභාවලින් අදහස් ගන්න. එක පළාත් සභාවක් හරි විරුද්ධ වුණොත් ඒ පදනම හදන්න බැහැ. ඩග්ලස් දේවානන්ද ඇමැතිතුමා පදනමක් හදන්න ගෙනැල්ලා උතුරු පළාත් සභාව විරුද්ධ වුණොත් ඒ පදනම හදන්න බැහැ.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

නීතිය බොරු කරන්න එපා. බොරු කියනවා. නීතිය බොරු කරන්න එපා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** – අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ඔබතුමාගේ කථාවේදී ඔබතුමාගේ මතය කියන්න. ගරු සභාපතිතුමනි, මගේ අදහස මට කියන්න ඉඩ දෙන්න. එතුමාට එතුමාගේ අවස්ථාවේදී එය නිවැරැදි කරන්න පුළුවන්. ගරු සභාපතිතුමනි, මේක තුළින් සිද්ධ වෙන්නේ –

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

නීතිය විකෘති කරන්න එපා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** – අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

මගේ විකෘති කිරීම කරන්න, මට ඉඩ දෙන්න. ඔබතුමා දන්න දේ කියලා ඔබතුමාගේ කථාවේදී නිවැරැදි කරන්න. (බාධා කිරීම්) ගරු සභාපතිතුමනි, මේ බාධා කිරීම් නතර කරලා දෙන්න. මම කථාව අවසන් කරන්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බාධා කිරීම් කරන්න එපා. එතුමාට කාලය තිබෙනවා. මොකද, ආණ්ඩු පක්ෂයෙන් මට එතුමාට කාලය දෙන්න පුළුවන්. කාලය පිළිබඳව මම තීන්දු කරන්නේ. ඒ ගැන අභියෝග කරන්න බැහැ. ඔබතුමා කථා කරන්න. විනාඩි 10 ද, 15 ද, 20 ද ඒ සම්බන්ධව මමයි තීරණය කරන්නේ.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** – අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, මේ අනුව එක පළාත් සභාවක් විශේෂයෙන්ම උතුරු පළාත් සභාව විරුද්ධ වුණොත් මේ රටේ පාර්ලිමේන්තුව අකර්මන්‍ය කරලා මේ රටේ සමස්ත නීති සම්පාදන ක්‍රියාවලිය පාලනය කරන්න තනි පළාත් සභාවට අවස්ථාව ලැබෙනවා. වෙනත් වචනවලින් කියනවා නම් ගරු සභාපතිතුමනි, බල්ලා විසින් වලිගය නැටවීම වෙනුවට, නගුට විසින් බල්ලා නැටවීම –

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා නිශ්ශබ්ද වෙන්න. බාධා කිරීම් කරන්න එපා. ඔබතුමා බාධා කිරීම් කරන්න එපා. ආණ්ඩු පක්ෂයේ ඇමැතිවරයෙක් කථා කරන්නේ. ඔබතුමා මොනවාද මේ කියන්නේ?

**ගරු දයාකාන්ත පෙරේරා**
Hon. Dayakantha Perera

මම නොවෙයි බාධා කරන්නේ. මේගොල්ලෝ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි, හරි. ඔබතුමා නිශ්ශබ්ද වෙන්න. ගරු ඇමැතිතුමා ඔබතුමා කථා කරන්න.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** – අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ තනි පළාත් සභාවක් විසින් සමස්ත රාජ්‍යයම අකර්මන්‍ය කිරීමේ අවධානම නැති කරන්න ඉතාම ප්‍රජාතන්ත්‍රවාදී විධියට පළාත් සභා බහුතරයේ කැමැත්ත ලැබෙනවා නම්, එය පාර්ලිමේන්තුවේ සාමාන්‍ය බහුතරයෙන් සම්මත කළ හැකිය යනුවෙන් මේ පවතින විධිවිධානය වෙනස් කරන්නට ඉතාම කාලෝචිත යෝජනාවක් ගරු ප්‍රධාන ඇමැතිතුමා ඉදිරිපත් කරලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, මේ යෝජනා දෙකටම මම ඉතාම පක්ෂයි. ඒ වාගේම අපි ඉදිරිපත් කරපු යෝජනා පහෙන් දෙකක්. අපි මේ යෝජනා දෙකට පක්ෂ වෙන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, ජාතික හෙළ උරුමය බලය බෙදීමට විරුද්ධ නැහැ. බලය බෙදීමේ ඒකකය පිළිබඳවයි ප්‍රශ්නය තිබෙන්නේ. මේ රටේ බලය බෙදනවාට විරුද්ධ සමහර පක්ෂ තිබෙනවා. ජාතික හෙළ උරුමය බලය බෙදීමට විරුද්ධ නැහැ. තිස්ස විතාරණ ඇමැතිතුමාගේ සර්ව පාක්ෂික නියෝජිත කමිටුව ගැන කිහිප දෙනෙක්ම කථා කළා. ඒ කමිටුව නියෝජනය කළ

[ ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල- අමාත්‍යතුමා ]

මේ බස්නාහිර පළාත් සභාවේ ඉන්න එකම මන්ත්‍රීවරයා මමයි. කාලයක් කුමරගුරුබරන් ගරු මන්ත්‍රීතුමා හිටියා. ඊට පස්සේ යම් ප්‍රකාශයක් ගැන උරණ වෙලා එතුමා නැගිටලා ගියා.

**ගරු කුමරගුරුබරන්**
Hon. Kumaragurubaran

ඔබතුමන්ලා ගියාට පස්සේ ආවා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

එතුමා අපි ගියාට පස්සේ ආවලු. එතුමා සභාවෙන් නැගිටලා ගියා. කෙසේ වෙතත් ගරු සභාපතිතුමනි, සර්ව පාක්ෂික නියෝජිත කමිටුවට ශ්‍රී ලංකාවේ බලය බෙදීම සම්බන්ධයෙන් විස්තරාත්මක ලේඛනයක් ජාතික හෙළ උරුමය ඉදිරිපත් කළා. අපි විශ්වස කරන්නේ ජනතාවට සමීප වෙන්න නම්, ජනතාව බල ගැන්වෙන්න නම් බලය බෙදීමේ ඒකකය වඩාත් කුඩා විය යුතුයි කියලා. ඒ අනුව මේ යෝජනාවේ තෙවැනි කොටසට - පළමුවැනි කොටස් දෙකට මට එකඟ වෙන්න පුළුවන් වුණත් මගේ පක්ෂ මතය අනුව මට තුන්වැනි කොටසට එකඟ වෙන්න බැහැ. ඒ අනුව මේ යෝජනාවේ දෙකකට පක්ෂයි. විරුද්ධ වෙන්න බැහැ. තුන්වැනි කොටසට විරුද්ධයි. පක්ෂ වෙන්න බැහැ. ඒ අනුව මෙම යෝජනාවට ඡන්දය දීමෙන් මට වැළකී සිටින්නට සිද්ධ වෙනවයි කියන එක මේ සභාවට දැනුම් දෙමින් මම නිහඬ වෙනවා. සියලු දෙනාටම බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම දෙපක්ෂයේම කථික ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉතාමත් කාරුණිකව ඉල්ලා සිටිනවා පුළුවන් තරම් කථාව කෙටි කරන ලෙස. මොකද, කථා කරන්න ගරු මන්ත්‍රීවරු රාශියක්ම ඉන්නවා. මට කාලය සීමා කරන්නත් අපහසුතාවයක් තිබෙනවා. ඒ නිසා හැකිතාක් දුරට කථා කෙටි කරන්න. දිවා ආහාරයත් අපි ලැහැස්ති කරලා තිබෙනවා. මීළඟට වරුණ දීප්ති රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමාට -

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, ඇත්තෙන්ම මේ පළාත් සභාව තුළ වැදගත්ම යෝජනාවක් විධියට කථා කරන මේ මාතෘකාව පිළිබඳව විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ හදවතට එකඟව තමන්ට කථා කරන්න අවස්ථාව තිබෙන්න ඕනෑ. ඒ නිසා ඔබතුමා දැන් උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමා කථා කරනකොටත් කිව්වා, වෙලාව පිළිබඳව ප්‍රශ්නයක් නැහැයි කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඒ වෙලාව ආණ්ඩු පක්ෂයෙන් අඩු කරනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මේ සියල්ලටම අවශ්‍ය නම්, ගරු මන්ත්‍රීවරු කථා කරන්න අවස්ථාව ඉල්ලනවා නම් ඒ සඳහා ඔබතුමා අවස්ථාව ලබා දෙන්න කියන එකත් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු විපක්ෂ නායකතුමා ඒ පිළිබඳව මම අවධානය යොමු කරනවා. වැදගත් යෝජනාවක් කියලා මට මේ සභාව - කාලය පිළිබඳ ගැටළුවක් තිබෙනවා. මොකද, ගොඩක් වෙලා යන්න දෙන්න බැහැ. එහෙම නම් මට සිද්ධ වෙනවා, සභාව මොහොතකට අත්හිටුවලා දෙපැත්තේම සංවිධායකවරු දෙදෙනා එක්ක සාකච්ඡා කරලා කාලය වෙන් කිරීමක් කරන්න. මට එහෙම කාලය දෙන්න බැහැ. එහෙම නම් අපි සභාව විනාඩි 05 ක අත්හිටුවලා කාලය වෙන් කිරීමක් සිද්ධ කරමු. ආණ්ඩු පක්ෂයෙන් මට ලැයිස්තුවක් දීලා තිබෙනවා.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු සභාපතිතුමනි, මේ කාලය වැය වෙන්නේ කථිකයින් සඳහා. මේ කථිකයින්ගේ කථාවලදී කාලය වැය වෙන්නේ, අනවශ්‍ය බාධා කිරීම් හා මැදිහත්වීම් නිසා. ඒ නිසා අනවශ්‍ය බාධා කිරීම් නොකර සහ බාධා ඇති නොවන ආකාරයට කථාව ගෙනියනවා නම් ඒ පිළිබඳව ගැටළුවක් මතු වෙන්නේ නැහැ. ඒ නිසා පුළුවන් තරම් තමන්ගේ අවශ්‍ය කරුණු ඉදිරිපත් කිරීමටත්, අනවශ්‍ය බාධා කිරීම් වළක්වා ගැනීමටත් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගැටළුවක් නැහැ.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, සභා රීති අත්හිටුවලා යෝජනාව ගෙන එනකොටම කාලය පිළිබඳව තීන්දුවක් කරන්න බැරි තැනකට ගිහිල්ලා තිබෙනවා. ඒ නිසා ඔබතුමා ඒ පිළිබඳව අවධානය යොමු කරලා කටයුතු කරන්න. අනවශ්‍ය බාධා කිරීම්වලින් තොරව මේක ගෙනියන්න ඉඩ දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නමුත් මට තවම ඔබතුමන්ලාගෙන් කථික ලැයිස්තුවක් ලැබිලා නැහැ.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

කථික ලැයිස්තුවක් දෙන්න විධියක් නැහැ. මේ ඔක්කෝම කථා කරන්න ඕනෑ කියලා කියනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වරුණ දීප්ති රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට අවස්ථාව.

[ අ.භා. 12.36 ]

**ගරු වරුණ දීප්ති රාජපක්ෂ**
Hon. Waruna Deepthi Rajapakshe

ගරු සභාපතිතුමනි, දීර්ඝ නිහැඬියාවකින් පසුව තමයි පළාත් සභාවේ අදහස් දක්වන්නේ. බොහෝ විට පළාත් සභාවේ අදහස් දක්වන අවසන් අවස්ථාව වෙන්නත් පුළුවන්. නමුත් මේ යෝජනාව සම්බන්ධයෙන් අදහස් දක්වන්න මම විශේෂයෙන් අදහස් කළේ, පළාත් සභාවට මීට කලින් අදහස් දක්වන හැම අවස්ථාවකම මම දේශපාලන පක්ෂයක් නියෝජනය කළා. ඒ නිසා ඒ දේශපාලන පක්ෂයේ අදහස්වලට යටත්ව තමයි අදහස් දක්වන්න වෙන්නේ. නමුත් මේ අවසාන අවස්ථාවේදී වුණත් මට මේ රටේ ජාතික ප්‍රශ්නය පිළිබඳව මගේ ස්වාධීන අදහස ඉදිරිපත් කරන්න පුළුවන් අවස්ථාවක් උදා වී තිබෙනවා. ඉතින් ඒ නිසා මම මේක අවස්ථාවක් කර ගන්නවා, ඒ අදහස ඉදිරිපත් කරන්න. දැන් මේ පළාත් සභාවේ මේ යෝජනාව ගැන අදහස් ඉදිරිපත් කරද්දී ටිකක් ඉතිහාසයට යන්න ඕනෑ. මීට අවුරුදු 14 කට පමණ කලින් මේ පළාත් සභාවට මම මන්ත්‍රීවරයෙක් විදියට සම්බන්ධ වනකොට මේ පළාත් සභාවේ අතිශය බහුතරයක් මන්ත්‍රීවරු හිටියේ, බලය බෙදීමට නැත්නම් පළාත් සභා ක්‍රමයට පක්ෂව. ඒ වෙලාවේ මේ පළාත් සභාවේ හිටියා මට මතකයි වික්‍රමබාහු කරුණාරත්න මන්ත්‍රීතුමා, රේණුක පෙරේරා මන්ත්‍රීතුමා, මහේෂ් අල්මේදා මන්ත්‍රීතුමා, ආනන්ද තිස්ස කාරියවසම් මන්ත්‍රීතුමා -

**ගරු රේණුක දුෂ්‍යාන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ආනන්ද තිස්ස පෙරේරා

**ගරු වරුණ දීප්ති රාජපක්ෂ**
Hon. Waruna Deepthi Rajapakshe

ආනන්ද තිස්ස පෙරේරා මන්ත්‍රීතුමා. ඒ වාගේ විවිධ වාමාංශික දේශපාලන පක්ෂ නියෝජනය කරන මන්ත්‍රීවරු. එක වෙලාවක ඒ අය අතර තිබුණා වාම සාම කියලා එකතුවකුත්, පළාත් සභාවට පක්ෂව නැත්නම් බලය බෙදීමට පක්ෂව තමයි බහුතරයක් මන්ත්‍රීවරු අදහස් දැක්වූයේ. ඒ වෙලාවේ මම අදහස් දැක්වූයේ, පළාත් සභා ක්‍රමයට විරුද්ධව. නමුත් ඒ වෙලාවේදී පළාත් සභාව ඇතුළේ පළාත් සභා ක්‍රමය පිළිබඳව යම් වමේ පදනමක් සහිතව දේශපාලන අදහස් සංවාදයට ඇති වනකොට, ඒ පිළිබඳව හෘද සාක්ෂිය තුළ මම සතුටු වුණා. හැබැයි, අවුරුදු 10 කට පස්සේ අද පළාත් සභාව තුළ පළාත් සභා ක්‍රමය, බලය බෙදීම සහ ජාතික ප්‍රශ්නය ගැන සංවාද කරනකොට එය කලින් තිබුණු ස්ථාවරයන්ගෙන් ඒ සංවාදයන්ගෙන් අවසාන කෙළවරකට ඇවිල්ලා. ඉතින් මේ කෙළවරකට ඇවිල්ලා අද අපේ රට ඇතුළේ පළාත් සභාව ගැන, බලය බෙදා හැරීම ගැන, ජාතික ප්‍රශ්නය ගැන අතිශය ජාතිවාදී දේශපාලන ස්ථාවරයන් සාකච්ඡාවට ලක් වන ස්වභාවයක් තිබෙනවා. දැන් මේ තත්ත්වය නිර්මාණය වීම ගැන කෙටි අදහසක් ඉදිරිපත් කරන්න ඕනෑ. සමහර වෙලාවට මේක ඔබතුමන්ලා සංවේදී වන අවස්ථාවකුත් නොවෙන්න පුළුවන්. දැන් ලංකාවේ දේශපාලනය ඇතුළේ මේ වෙලාවේ අපේ රටේ දේශපාලනය තීරණය කරන්නේ, නලීන්ද සිල්වයි, ගුණදාස අමරසේකරයි කියලා මම කිව්වොත් එහෙම සමහර විට ඔබට හිනා යන්නත් පුළුවන්. මොකද, සමහර විට ඔබ ඒ දෙන්නා කවුද කියලා දන්නේ නැති වෙන්නත් පුළුවන්. බොහෝ අය දන්නේ නැති වෙන්න පුළුවන්. නමුත් ජාතික ප්‍රශ්නය ගැන ලංකාවේ දේශපාලනයේ සාමාන්‍යයෙන් පිළිගත්තු මත තුනක් තිබෙනවා. එකක් වාමාංශික මතය. අනෙක් එක තමයි ජාතිවාදී මතය සහ ලිබරල්වාදී මතය. එක්සත් ජාතික පක්ෂය, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වාගේ පක්ෂ ලිබරල්වාදී මතය තමයි සාමාන්‍යයෙන් දේශපාලනයේදී ඉදිරිපත් කළේ. ඒ නිසා අනෙක් තැන් ගොඩකදී වෙනස් වුණාට ජාතික ප්‍රශ්නයේදී පදනම්වලින් වෙනස් වුණත්, ක්‍රියාමාර්ගවලදී සාමාන්‍යයෙන් එක්සත් ජාතික පක්ෂයත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් සමහර විට වෙනස්කම් සහිතව, වාමාංශික පක්ෂයත් ජාතික ප්‍රශ්නයේදී බලය බෙදා හැරීම කියන එකට පක්ෂව අදහස් දැක්වූවා. එතකොට ජාතිකවාදී පදනමින් අදහස් දක්වන දේශපාලන ව්‍යාපාර තමයි බලය බෙදා හැරීමට නැත්නම් පළාත් සභා ක්‍රමයට විරුද්ධව අදහස් දැක්වූයේ. නමුත් කාලයත් එක්ක විශේෂයෙන්ම දේශපාලනය ඇතුළේදී - මම ඒකයි කිව්වේ නලීන්ද සිල්වයි, ගුණදාස අමරසේකරයි තමයි ලංකාවේ දේශපාලනය තීරණය කරන්නේ කියලා. ලංකාවේ ජාතික වාදය පිළිගන්න, ජාතිවාදී මත දරන ඒ අදහස් සමාජයට - සමහරක් හුදෙකලා පුද්ගලයෝ තමයි ඒගොල්ලෝ. ඒගොල්ලෝ ඉදිරිපත් කළ අදහස් අපේ රටේ විවිධ දේශපාලන ව්‍යාපාර තමන්ගේ දේශපාලන ජයග්‍රහණය වෙනුවෙන් අරගෙන ගිහිල්ලා, ඊට පස්සේ ජාතිවාදී දේශපාලන පක්ෂ අතර ඇති වන දේශපාලන තරගය, ජාතිවාදයේ කොඩිය වැඩියෙන්ම ඉහළින්ම ඔසවාගෙන සිටීමේ තරගය නිසා ඒ ඒ පක්ෂ විසින් මේ ජාතිවාදය, ආගම්වාදය ගෙනැල්ලා තිබෙන දුර විසින් අද අපේ සමාජය ආගම්වාදී සහ ජාතිවාදී කඳවුරුවලට බෙදෙමින් තිබෙනවා. ඒ අවියත් දේශපාලනයේ ප්‍රතිඵලය තමයි මම හිතන්නේ ගාමිණී තිලකසිරි ගරු මන්ත්‍රීතුමා පෙන්නපු පෝස්ටර් එක. බොදුබල සේනා, සිංහල රාවය වාගේ විවිධ සංවිධාන නිර්මාණය වෙන්නේ. එතකොට අද ඒ සංවිධාන විසින් වපුරන ජාතිවාදී වියරුවේ ප්‍රතිඵල අපට තව දශක ගණනකින් තමයි දකින්න ලැබෙන්නේ.

අපි දන්නවා, අද ලෝකයේ ගත්තොත් එහෙම විශේෂයෙන් මැදපෙරදිග කලාපය සියොන් වාදයට, අනෙක් පැත්තට විවිධ ජාතිවාදයන්, මුස්ලිම් ජාතිවාදී අන්තවාදයන් මේවා හරහා බෙදිලා විශාල කැළඹීම් සහගත තත්ත්වයක් තිබෙනවා. අනෙක් පැත්තෙන් අපි මියන්මාරය ගත්තොත්, ටිබෙටය ප්‍රදේශය ගත්තොත් ලෝකයේ හැමතැනම ආගම්වාදී, ජාතිවාදී ගැටුම් නිසා විශේෂයෙන්ම නැගෙනහිර යුරෝපයේ අතිවිශාල යුද්ධ බිහිසුණු වාතාවරණයක් ලෝකය තුළ නිර්මාණය වෙලා තිබෙනවා. අපේ රට ඇතුළේත් අප විසින්ම වපුරපු ජාතිවාදයක ප්‍රතිඵල, අපි

[ ගරු වරුණ දීප්ති රාජපක්ෂ ]

පසුගිය දශක ගණනක් තිස්සේ දැක්කා. දැන් එහි ඊළඟ අන්තය ආගම්වාදය අපේ සමාජයේ වපුරමින් ඉන්නවා. දැන් මේකට විරුද්ධව දේශපාලන පක්ෂවලට අදහස් දක්වන්න බැහැ. මම දැක්කා ජගත් අංගගේ ගරු ඇමැතිතුමා කථා කරද්දී එතුමාගේ හෘද සාක්ෂිය. එතුමා හැම වෙලේම කියනවා අපි පළාත් සභාවලට පක්ෂයි. හැබැයි ඒ වුණාට මම හොඳ බෞද්ධයෙක් කියලා. එහෙම කියන්න සිද්ධ වෙන්නේම දැන් කෙනෙක් බලය බෙදා හැරීම හරි, මොකක් හරි දෙයක් ගැන කථා කළොත් ඒ කථා කරන පුද්ගලයා ජාතිවාදියෙක් බවට පත් කරනවා. ඔහුට දේශපාලනය කරන්න බැරි වෙනවා. ඔහුට සමාජයේ පවතින්න බැරි වෙනවා. අන්න එහෙම දේශපාලන මතයක් සමාජයේ ගොඩනැගෙමින් තිබෙනවා. ඒ නිසා සමහර වෙලාවට පුද්ගලයෙක් විධියට දේශපාලන පක්ෂයක් විධියට හෝ සංවිධානයක් විධියට හෝ ජාතිවාදයට විරුද්ධව, ආගම් වාදයට විරුද්ධ, ලිබරල් අදහස් දරන, නැත්නම් වාමාංශික අදහස් දරන මිනිස්සුන්ටත් තමන්ගේ අදහස විවෘතව කියන්න බැරි, එහෙම කිව්වොත් ඔහු විශාල පීඩනයකට, ප්‍රහාරයකට ලක් වන බැවින් - දැන් මේ දවස්වල ටිකක් අඩුයි. මම දන්නේ නැහැ මොකද කියලා. පසුගිය දවස්වල තිබුණා මේ මහරගම පැත්තේ, මාලබේ පැත්තේ පාරේ යනකොට භය හිතෙනවා. පාරේ යද්දී භය හිතෙනවා. ඇඟිල්ල දික් කරනවා. කෑගහනවා. අතිශයින්ම බරපතළ ආගම්වාදී වියරුවක් නිර්මාණය වෙලා තිබෙනවා. විවිධ සංවිධාන. නමුත් දැන් ඒ සංවිධාන විවේචනය කරන්න භයයි. උදාහරණයක් විධියට බොදු බල සේනාව විවේචනය කරන්න කවුරුත් භයයි. සිංහල රාවය විවේචනය කරන්න කවුරුත් භයයි. මොකද, භය? විවේචනය කළොත් එහෙම ඒ විවේචනය කරන එක්කෙනා බෞද්ධ විරෝධියෙක් හරි මොකක් හරි කියලා ලේබල් වෙනවා. ඒ නිසා කවුරුත් භයයි. ඉතින් මේකේ ප්‍රතිඵලය අපට තව අවුරුදු 10 කින් 15 කින් තමයි ගන්න ලැබෙන්නේ.

ඉතින් ඒ නිසා මම හිතනවා, අපට සමාජයක් විධියට වගකීමක් තිබෙනවා, මෙන්න මේ කියන ජාතිවාදය, ආගම්වාදයේ වියරුව පරාජයට පත් කරන්න. එතැනදී මම හිතන්නේ, අන්න ඒ අර්ථයෙන් ගත්තොත් මේ යෝජනාව සම්බන්ධයෙන් මටත් ප්‍රශ්න කිහිපයක් තිබෙනවා. මේ යෝජනාවේ කොටස් තුනක් තිබෙනවා. ඒ කොටස් තුනේ එකිනෙකට වෙනස්කම් පරස්පරකම් තිබෙනවා. දැන් සරලව ගත්තොත් එහෙම මේ වෙලාවේ අපේ සමාජයේ අපි කවුරු කැමැති වුණත් අකැමැති වුණත් බලය පවත්වන්න - ඒකට අපි කැමැති නැහැ. අපි අකැමැති වුණාට මේ වෙලාවේ අපේ සමාජයේ බලය පවත්වාගෙන යන්නේ මම අර කියපු කිහිප දෙනා, නලීන්ද්‍ර සිල්වලාගේ, ගුණදාස අමරසේකරලාගේ නැත්නම් ඔය සිංහල රාවය, බොදු බල සේනා හතර පස් දෙනෙක් තමයි මේ සමාජය ගෙනියන්නේ. අපි හිතුවාට මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා තමයි පාලනය කරන්නේ කියලා. එහෙම නැත්නම් ආණ්ඩුව තමයි පාලනය කරන්නේ කියලා. නමුත් දේශපාලනය කොහේටද යන්නේ කියලා තීරණය කරන්නේ ඒගොල්ලෝ. ඒ නිසා ඒගොල්ලෝ අතිශය බලවත්. ඒ අය තමයි මේ සමාජය කොහොටද අරගෙන යන්නේ කියලා තීරණය කරන්නේ. ඉතින් ඒ නිසා අන්න ඒ අතිශය භයානක ජාතිවාදී දේශපාලන තක්කඩින්ගේ දේශපාලනය රජයන සමාජයක් ඇතුළේ පළාත් සභා අහෝසි කරන්න කියලා තරගයක් ඇවිල්ලා තිබෙනවා. දේශපාලන පක්ෂ අතර දැන් තරගයක් තිබෙනවා, පළාත් සභා අහෝසි කරන්න. පළාත් සභා එපා. හදිස්සියේ නින්දෙන් අවදි වෙලා වාගේ පළාත් සභා මැතිවරණය එනකොට තමන්ට මැතිවරණයට ඉදිරිපත් වෙන්න දේශපාලන සටන් පාඨයක් නැතුව ගිය ගමන් ගන්නවා, පළාත් සභා අහෝසි කරන්න. පළාත් සභා එපා. ඒ දේශපාලන සංවාදය පටන් ගන්නවා. එතකොට ඒක එක්කෙනෙක් පටන් ගත්තාම, ඒක විමල් වීරවංශ ඇමැතිතුමා පටන් ගත්තොත් එහෙම උදය ගම්මන්පිල ඇමැතිතුමාට ඊට වඩා වැඩිපුර කියන්න වෙනවා. ඒගොල්ලෝ ඊට වඩා වැඩිපුර කියනවා නම් අනෙක් අය තව ටිකක් වැඩිපුර කියනවා. ඉතින් මේ තරගය කෙළවර වෙන්නේ අවසානයේ නැවතත් ජාතිවාදය, ආගම්වාදය සමාජය ඇතුළේ තහවුරු වෙමින්.

ඒ නිසා ඒ ජාතිවාදය, ආගම්වාදය තහවුරු වෙලා තිබෙන සමාජයක් ඇතුළේ අඩුම තරමින් පළාත් සභා ක්‍රමය පවත්වාගෙන යෑම සුදුසුයි කියලා යෝජනාවක් ඉදිරිපත් කිරීම පවා ධෛර්ය සහගත කාරණාවක්. ඒ අර්ථයෙන් ගත්තාම මේ යෝජනාවේ තුන්වැනි කොටසකට මම පක්ෂ වෙනවා. මේ පළාත් සභාව පවත්වාගෙන යෑම සම්බන්ධයෙන්, අඩුම ගණනේ පළාත් සභා පවත්වාගෙන යන්න කියලා අදහසක් ඉදිරිපත් වෙනවා. මේ වෙලාවේ ඒකත් සාමාන්‍යයෙන් අමාරු වැඩක්. දැන් මේකේ පළමුවැනි කොටස ගත්තොත් මම හිතන්නේ, ඒ කොටස ඒ තරම් අදාළ නැහැයි කියලා. මොකද, දැනට ලංකාවේ තිබෙන නීති තත්ත්වයන් ඇතුළේ පළාත් සභාවන් ඒකාබද්ධ වෙන්න බැහැ. ඒ නිසා බැහැයි කියලා අමුතුවෙන් විශේෂ යෝජනාවක් අවශ්‍ය වෙන්නේ නැහැ. දෙවැනි කාරණය ගත්තොත් එහෙම ඇත්තටම අපි පළාත් සභා පිහිටුවන්නේ ඇයි? පළාත් සභාවට බලය දෙන්නේ ඇයි කියන කාරණය ගත්තොත් ඒ යෝජනාව එන්නේ ඒකේ දේශපාලන පදනමක් තිබෙනවා. ඒ තමයි වාමාංශික අදහසක් විධියට අපි ගත්තොත් ජාතීන්ගේ ස්වයං නිර්ණය අයිතිය කියන එක. ඒ කියන්නේ, කෙනෙක්ට තමන්ගේ අනන්‍යතාවය මත පදනම් වෙලා තමන්ගේ දේශපාලන බලය පිහිටුවා ගන්න ඔවුන්ට තිබෙන අයිතිය පිළිගන්නවා කියන කාරණාවයි. එතකොට ඒ කාරණය පදනම් වෙලා නම් පළාත් සභා කියන එක පිහිටුවන්නේ බලය බෙදා හැරීම කරන්නේ, ස්වයං නිර්ණය අයිතිය කියන දේශපාලන පදනමෙන් නම් ඒක එන්නේ, ජාතික ප්‍රශ්නය විසඳන්න මේ පළාත් සභා කියන ව්‍යුහය ප්‍රමාණවත් කියලා මම හිතන්නේ නැහැ. නමුත් ඒක නම් පදනම, එතකොට උතුරේ ඉන්න අයට තමයි උතුරේ පළාත් සභාව ගැන තීරණ ගන්න අයිතිය තිබෙන්නේ. එතකොට අපි පළාත් සභා නවයකින් හරි දහයකින් හරි බහුතරයකින් හරි තීරණය කරන්න ගියොත් එහෙම උතුරු පළාත් සභාවේ කොහොම එකක්ද වෙන්නේ කියලා. පළාත් සභා

පහෙන් තීරණය කරන්න ගියොත් එහෙම, එතකොට අපි ආපහු උතුරු පළාත් සභාවේ නැත්නම් නැගෙනහිර පළාත් සභාවේ නැත්නම් දකුණු පළාත් සභාවේ ඉන්න යම් සුවිශේෂ ජන කොටසකට තිබෙන අයිතිය අපි අහෝසි කරනවා. වෙනත් පළාත් සභා කිහිපයක් විසින් තීරණය කරනවා, ඒගොල්ලන්ගේ බලයේ සීමාව මොකක්ද කියලා. ඉතින් ඒ නිසා මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීමෙන් පළාත් සභාව ආරක්ෂා කරන්නයි, මේ තුන් හතර පැත්තම බලන්නයි සිද්ධ වෙලා තිබෙන්නේ අපි ජීවත් වන සමාජයේ ස්වභාවයත් එක්ක. ඒ නිසා මම හිතනවා, මේ යෝජනාව ගෙන එන එකේ, මේ සංවාදය ආපු එකේ වැදගත්කමක් තිබෙනවා. මේ යෝජනාවේ අවසාන අර්ථය ගත්තාම පළාත් සභාවේ තිබෙන බලය, බලය විමධ්‍යගත කිරීමේ ව්‍යුහය ආරක්ෂා කරන්න ඕනෑය කියන කාරණාව ඉදිරිපත් වීම නිසා මම ඒ යෝජනාවට පක්ෂ වෙනවා. හැබැයි, මේකේ දේශපාලන පදනම මීට වඩා ගොඩක් එහාට යන්න ඕනෑ. ඒ දේශපාලන පදනම එහාට ගෙන යෑම කියන එක අපේ රටේ දේශපාලනය ඇතුළේ සමාජයක් විධියට වගකීමක් තිබෙනවා. ඒ සමාජමය වගකීම ඉෂ්ට කිරීමේ කාර්ය භාරය පොදු සමාජයක් විධියට තිබෙනවා.

දැන් මේ පළාත් සභාව ආරක්ෂා කරන්න ඕනෑ කියලා විවිධ අදහස් ඉදිරිපත් වුණා. මේක දෙවන පෙළ පුහුණු කරන එක. මේකෙන් සුහසාධනය කරනවා. විවිධ අදහස්. මම හිතන්නේ, ඒ අදහස් හැම වෙලාවකම ආයතනයක ඉන්න කෙනෙක්ට ඒ ආයතනය සම්බන්ධයෙන් යම් මනෝ රාගයක් තිබෙනවා. තමන් ඉන්න ආයතනය, තමන් පවතින ආයතනය කියන අර්ථයෙන්. එතකොට මට ඒ අනුරාගය අදාළ වෙන්නේ නැහැ. මොකද, මම මේ පළාත් සභාවේ මෙතැනින් එහාට ඉන්න බලාපොරොත්තුවකුත් නැහැ. ඉතින් ඒ නිසා ගරු සභාපතිතුමනි, දේශපාලනය ඇතුළේ අපට සමාජමය වගකීමක් තිබෙනවා. දේශපාලනය කරන්නේ පාර්ලිමේන්තුවේ පළාත් සභාවේ විතරක් නොවෙයි. සමාජයේ. සමාජය ඇතුළේ දේශපාලන කාර්ය භාරයක් අපට තිබෙනවා. ඒ සමාජයේ දේශපාලන කාර්ය භාරය තුළ මම හිතනවා, අඩුම ගණනේ දේශපාලන පක්ෂ, අපේ දේශපාලන තරග, කොන්දේසි ඒවා ඔක්කෝම පැත්තකින් තිබ්බොත්, අපි සමාජමය වගකීමක් විධියට අඩුම තරමින් අපේ සමාජය තව අවුරුදු 10 කින්, 15 කින්, 20 කින් ජාතිවාදී, ආගම්වාදී, වර්ගවාදී යුද්ධයක බිහිසුණු අත්දැකීම් අපි දකින්න අකැමැති නම්, ඒ විවිධ ජනප්‍රජාවන්ගේ තිබෙන සංස්කෘතිමය, සමාජමය අනන්‍යතාවයන් විඳ දරාගන්න, වෙනස්කම් දරා ගන්න පුළුවන් විනයක් සහිත සමාජයක් නිර්මාණය කර ගැනීම වෙනුවෙන් සමාජ කථිකාවක් අවශ්‍යව තිබෙනවා. ඒක මේ පළාත් සභාවේ ඉන්න මන්ත්‍රීවරුන්ට, අඩුම ගණනේ පළාත් සභාව නියෝජනය කරන නිසා ඔවුන්ට ඒක කරන්න පුළුවන් නම් මම හිතනවා, එහි සුවිශේෂ කාර්ය භාරයක් තියෙනවා කියලා. අවසාන වශයෙන් මම කියන්නේ, ඒ කාර්ය භාරයට යනකොට ඒක ටිකක් අභියෝගාත්මකයි. මේ වෙලාවේ සමාජ බලය හොබවන විවිධ අයගේ ඇහිල්ල දික් වෙනවා. ජාතිවාදියෝ, ආගම්වාදියෝ අරගොල්ලෝ මේගොල්ලෝ කියලා. ඒකට බය වෙන්න හොඳ නැහැ. ඒකට බය නැතුව ධෛර්ය සම්පන්නව මුහුණ දෙන්න ඕනෑ. මොකද, ඔය අතිශය ආගම්වාදය ගැන කථා කරන, අතිශය ජාතිවාදය ගැන කථා කරන සමහර අය වෙන රටවල්වල පුරුවැසියෝ. සමහර අය ද්විත්ව පුරවැසියෝ. ජීවිතයේ විවිධ තක්කඩිකම් ඔක්කෝම කරමින් තමයි ඒගොල්ලෝ මේ ජාතිවාදය, ආගම්වාදය ගැන කථා කරන්නේ. ඉතින් ඒ නිසා මම හිතන්නේ - හැබැයි අපේ උතුරේ ඉන්න -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඕස්ට්‍රේලියාවේද?

**ගරු වරුණ දීප්ති රාජපක්ෂ**
Hon. Waruna Deepthi Rajapakshe

ඕස්ට්‍රේලියාවේ, නවසීලන්තයේ, යුරෝපයෝ ලෝකේ පුරා. ඒ නිසා මම හිතන්නේ අපේ රටේ යාපනයේ ඉන්න දෙමළ මනුස්සයාට, මඩකලපුවේ ඉන්න දෙමළ මනුස්සයාට, මුස්ලිම් මනුස්සයාට යන්න වෙන තැනක් නැහැ. ඒ නිසා ඒක තේරුම් අරගෙන ඒ අයගේ දේශපාලන අනන්‍යතාවයන් අගය කරන එක, ගරු කරන එක අපේ දේශපාලන වගකීමක් කියන අදහස ඉදිරිපත් කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

[ අ.භා. 12.52 ]

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු සභාපතිතුමනි, මේ රටේ ජාතික ප්‍රශ්නයට විසඳුමක් සෙවීම සඳහා අපේ ජීවිත කාලය තුළ, අපේ ජීවිත කාලයෙන් අඩකටත් වඩා වෙහෙසුණු කාරණයක් සම්බන්ධව අනාගතයේ නිශ්චිත උත්තරයක් තිබෙනවයි කියලා නොදැන වුණත්, ඒ උත්තරය සොයා ගන්න මහන්සි ගන්න කෙනෙක් හැටියට මම අද ඉතාමත් සතුටු වෙනවා, ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරමින් හිටපු වරුණ දීප්ති රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා තමන්ගේ හදවතට එකහව මේ රටේ ජාතික ප්‍රශ්නයට කෙබඳු පිළිතුරක් සොයා ගන්න ඕනෑද කියන ප්‍රශ්නය අද මේ සභාවේ අවධානයට යොමු කිරීමට උත්සාහ ගැනීම සම්බන්ධව. මම හිතන්නේ, මා විශාල සතුටක් ලබනවා. මේ පළාත් සභා ක්‍රමය සඳහා ඉන්දු - ලංකා ගිවිසුම අත්සන් කරපු මොහොතේ ඉඳලා මේ පළාත් සභා ක්‍රමය අර්ථවත් කරමින්, පළාත් සභා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා එදා තුවක්කුව හමුවේ, 88 පළාත් සභාවට සහයෝගය දැක්වුවොත් මරණවයි කියද්දී, පළමුවැනි ඡන්දය දුන් පස් දෙනාගේ අතපය කපනවා කියද්දී මම එදා ඒ මැතිවරණයේදී මගේ ඡන්ද පොළේ පළමුවෙන්ම මගේ ඡන්දය දාලා ඒ අභියෝගයන්ට මුහුණ දීලා, ඒ පළාත් සභා අපේක්ෂකයින්ගේ ජයග්‍රහණය සඳහා වේදිකාවේ ප්‍රධාන කථිකයෙක් හැටියට ගමක් ගමක් ගානේ ගිහිල්ලා, කොළඹ දිස්ත්‍රික්කය පුරා මේ ජනතාවගේ අයිතිය තහවුරු කරන්න උත්සාහ ගත්තු කෙනෙක් හැටියට මම අද ඒ ස්ථාවරයේම ඉඳිමින් මේ බලය බෙදා හැරීම පිළිබඳව මගේ අදහස් දැක්වීමට මම

[ ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ]

ඔබතුමාගෙන් කාලය ඉල්ලා සිටිනවා. ගරු සභාපතිතුමනි, මගේ වැඩිමහල් දරුවාගේ වයස අවුරුදු 23 යි. මගේ දෙවැනි දරුවාගේ වයස අවුරුදු 19 යි. මගේ වැඩිමහල් දරුවා අවුරුදු 19 ක්ම මේ රටේ ජීවත් වුණේ. පාසල් ගියේ. ඒ වාගේම පාසල් ගෙන ගියේ, ගෙන ආවේ හැම මොහොතකම මම. පාසලේ දරුවා ඉගෙන ගන්න තුරු පාසලේ ගේට්ටුව ළඟ දෙමාපියන් එකතු වෙලා පාසල ආරක්ෂා කරන්න තාත්තලා හැටියට අපි, දෙමව්පියෝ හැටියට අපි එය අපේ වගකීමක් හැටියට සලකා පාසල් ගේට්ටුවේ ඉඳගෙන අපි පාසල මුර කළා. කොහේ හරි බෝම්බයක් පිපිරුවාම අපි මොන වැඩේ තිබුණත් දුවගෙන ආවා. අපේ දරුවාව ආරක්ෂා සහිතව ගෙදරට ගෙනියන්න. අපේ සමහර සහෝදරවරු අපට අදත් මුණ ගැහෙනවා. අපට තවමත් මුණ ගැහෙනවා. අත පය අහිමි වෙලා, බෝම්බවලට පිච්චිලා, ඇස් අහිමි වෙලා. මේ ජීවිත කාලයේ ගත වුණු අවුරුදු 30 ක යුද්ධයේදී අපේ සහෝදරවරු අපේ රටේ පුරවැසියෝ අදත් දුක් විඳිනවා. ඒ වාගේම මේ යුද්ධය අවුරුදු 30 ක් තිබුණා. ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ වයසත් මම දන්න නිසා මම හිතන්නේ, ඔබතුමාගේ ජීවිතයේ අඩක්ම මේ යුද්ධයත් සමග තමයි (බාධා කිරීම්) ඔබට ජීවත් වෙන්න වුණේ.

ගරු සභාපතිතුමනි, අපි මේ සියල්ලටම මුහුණ දුන්නේ - අපේ රට දැන් අවුරුදු හතරකට කලින් නිදහස ලැබුවා. ඒ නිදහස ලබන්න මේ රටේ විරෝධාර රණවිරුවෝ තමන්ගේ අත් පා පූජා කළා. තමන්ගේ ජීවිත පූජා කළා. මේ සියලු දෙනා මහ විශාල කැප කිරීමක් කරලා අවුරුදු හතරකට ඉස්සෙල්ලා මේ රටේ නිදහසක් ලබා ගත්තා. නිදහස පිළිබඳව, නිදහසේ තේරුම ගැන කියනවා නම්, *"අභ්‍යන්තර කැරලි කෝළාහල හෝ සුළු ජාතීන්ට අකටයුතුකම් කිරීම හෝ පාගාගෙන සිටී නම් ස්වරාජ්‍ය යක්ෂයාට ගියාවේ කියලා"* - මම නොවෙයි කියන්නේ. 1958 අගෝස්තු 05 වැනිදා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නිර්මාතෘවර ගරු එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමා නිදහස පිළිබඳව 1958 අගෝස්තු 05 වැනිදා පාර්ලිමේන්තුවේදී කිව්වේ, *"නිදහසේ තේරුම අභ්‍යන්තර කැරලි කෝළාහල හෝ සුළු ජාතීන්ට අකටයුතුකම් කිරීම හෝ පාගාගෙන සිටීම නම් ස්වරාජ්‍ය යක්ෂයාටම ගියාවේ."* එතුමා කිව්වේ, එතුමාගේ කථාවකුත් නොවෙයි. ඉන්දියාවේ නිදහස් අරගලය වෙනුවෙන් මහ කැපකීරීමක් කරපු ජවහල්ලාර් නේරු මැතිතුමාගේ කථාවක් උපුටා දක්වමින් පාර්ලිමේන්තුවේදී එදා එතුමා එහෙමයි කිව්වේ. ඒ වාගේම භාෂා පනත, ද්‍රවිඩ භාෂා විශේෂ විධිවිධාන පනත ඉදිරිපත් කරමින් දෙවැනි වර කියැවීමේ විවාදයේදී ගරු බණ්ඩාරනායක මැතිතුමා ආයිත් කියනවා, සමහර අන්තවාදීන් ඉදිරිපත් කරන තර්කවල හැටියට නම් ප්‍රශ්නය බේරා ගන්න බැහැ. මේක අදටත් වලංගුයි. සමහර අය තමන්ගේ මතය තහවුරු කරන්න උගත් මිනිස්සු සමහරක් බොරු කියනවා. ඒ නිසා තමයි බණ්ඩාරනායක අගමැතිතුමා එදා කියපු දේ අදත් වලංගුයි කියලා මම මේ සභාවේදී කියන්නේ ගරු සභාපතිතුමනි.

සමහර අන්තවාදීන් ඉදිරිපත් කරන තර්කවල හැටියට නම් ප්‍රශ්නය බේරා ගන්න බැහැ. ප්‍රශ්නය තවදුරටත් උග්‍ර වෙනවා. දෙමළ අන්තවාදීන් වේවා, -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, එහෙම නම් ජනාධිපති ලේකම්තුමා කියපු දේට -

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

සිංහල අන්තවාදීන් හෝ වේවා -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

දැන් උත්තරයක් දෙන්න. ඒකට උත්තරයක් දෙන්න.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු සභාපතිතුමනි, මම ඔබතුමාගෙන් කරුණාවෙන් ඉල්ලා සිටිනවා. මෙතුමාට පොඩ්ඩක් වාඩි වෙන්න කියන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඒකට උත්තරයක් දෙන්න. ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග මැතිතුමා සුදු අලියෙක් කියනවා. -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර බාධා කිරීම් කරන්න එපා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඒකට උත්තරයක් දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විපක්ෂයේ සංවිධායකතුමා, බාධා කිරීම් කරන්න එපා. වාඩි වෙන්න.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු සභාපතිතුමනි, *"සමහර අන්තවාදීන් ඉදිරිපත් කරන තර්කවල හැටියට"* - මම නොවෙයි බණ්ඩාරනායක මැතිතුමා මේ 58 කියන්නේ. *"සමහර අන්තවාදීන් ඉදිරිපත් කරන තර්කවල හැටියට නම් ප්‍රශ්නය බේරා ගන්න බැහැ. ප්‍රශ්නය තවදුරටත් උග්‍ර වෙනවා. දෙමළ අන්තවාදීන් හෝ වේවා, සිංහල අන්තවාදීන් හෝ වේවා මෙම ප්‍රශ්නය බේරුම් කර ගැනීමට ඔවුන් ඉදිරිපත් කරන*

*අදහස් අනුව සිදු වන්නේ, ප්‍රශ්නය වඩාත් බරපතළ වන එකයි."* මේක එදාට වගේම අදත් වලංගුයි ගරු සභාපතිතුමනි. අපි මේ යුද්ධයේ කුරිරු බව අත්වින්ද මිනිස්සු. මම සූදානම් නැහැ, මම දේශපාලනයේ නිරත වෙමින් මගේ දරුවන්ට අවුරුදු 20 කදී, 30 කදී නැවතත් බෝම්බ පුපුරන සමාජයක, යුගයක ජීවත් වෙන්න ඉඩ දෙන්න. මගේ දේශපාලන වැරැදි නිසා ඒ දරුවන්ට ඒ සමාජය උදා කරන්න, තාත්තා කෙනෙක් හැටියට මම සූදානම් නැහැ. කිසිම කෙනෙකුට ඒ දේ කරන්න අපි සූදානමක් නැහැ. අපේ දරුවන්ගේ අනාගතය පිළිබඳව අපේ වගකීමක් තිබෙනවා. කාලකණ්ණි මනාප ක්‍රමයට මනාප හොයන්න හිහමනේ යනවාට වඩා හොඳයි ගෙදර ගිහිල්ලා දරුවාට ආදරණීය තාත්තෙක් හැටියට ගෙදර ඉන්නවා කියන එක මම මේ සභාවේදී කියනවා. මේ කාලකණ්ණි මනාප ක්‍රමයට - වරුණ දීප්ති රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා කිව්වා, මේ මනාප තරගය ගැන. එක්කෙනෙක් එක දෙයක් කිව්වාම ඊට වඩා දෙයක් කියන්නට ඕනෑ. ඒ තුළ තමයි මේ මනාප පොරය ඇවිල්ලා තිබෙන්නේ. මේ පටු ජාතිවාදය වපුරන්නේ. මේ ප්‍රශ්නයට උත්තරයක් අවශ්‍යයි. මේ ජාතික ප්‍රශ්නයට උත්තරයක් අවශ්‍යයි. ඒක තමයි 1927 බණ්ඩාරනායක මැතිතුමා උත්සාහ කළේ. 1957 උත්සාහ කළේ. මේ හැම වෙලාවකම - මොකක්ද මන්ත්‍රීතුමා?

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

1956 උත්සාහ අත අරිනවා.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

නැහැ. 1957 -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඔබතුමා ජනාධිපති ලේකම්තුමාට උත්තරයක් දෙන්න.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

මම එක දෙයක් කියන්නම්. ගරු සභාපතිතුමනි, ජනාධිපති ලේකම්තුමා -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

සුදු අලියෙක් කියලා කිව්වා.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

සුදු අලියෙක් කියලා කිව්වා. මම දන්නේ නැහැ ඒ ප්‍රකාශය එතුමා කළාද කියන්න. එතුමා එහෙම කියලා තිබෙනවා නම්, මම ඒකට එකඟ වෙන්නේ නැහැ. අනෙක් එක මම එතුමාගේ ප්‍රශ්නවලට උත්තර දෙන්න යන්නෙත් නැහැ. මොකද, එතුමා රාජ්‍ය නිලධාරියෙක්. අපි දේශපාලඥයෝ හැටියට කථා කරන්නේ දේශපාලන ප්‍රශ්නයට උත්තරයක්. කවුරු හරි කියනවා නම් මේ සුදු අලියෙක් කියලා ගරු සභාපතිතුමනි - අපි උතුරේ ජනතාවට මොකක්ද කිව්වේ? ඊළම ඉල්ලන කොට අපි කිව්වා, ඊළම දෙන්න බැහැ. ඒක අපි අදත් කියනවා. එහෙම නම් මේ ප්‍රශ්නයට උත්තරයක් අපි ලබා දෙන්න ලැහැස්තියි. ඒ උත්තරය මොකක්ද? බලය බෙදාහැරීමක්. ඒ බලය බෙදා හැරීම කොතෙක්ද? බලය බෙදා හරින්නේ කෙසේද? කියන කාරණය තමයි අපි සාකච්ඡා කළේ. එතැනදී අපි කැමැති වුණත්, අකමැති වුණත් යම් ප්‍රමාණයකට පළාත් සභාව කියන ආයතනය අද බලගැන්වීමක් කරලා තිබෙනවා. මේකේ අඩුපාඩු තිබෙනවා. අපි නැහැයි කියන්නේ නැහැ. අපට මේ 13 වැනි ව්‍යවස්ථා සංශෝධනයේම එල්ලිලා ඉන්න ඕනෑ කියලා අපි කියන්නේ නැහැ. හැබැයි, මේ බලය බෙදා හැරීමක් යම් ප්‍රමාණයකට කරලා මේ ජනතාවගේ බලාපොරොත්තු, ප්‍රශ්න විසඳන්න අපි උත්සාහ කරන්න ඕනෑ.

මම ඔබතුමාට ඉඩම් ප්‍රශ්නය පිළිබඳව එක උදාහරණයක් කියන්නම්. 1988 පළාත් සභා මැතිවරණයෙන් කොළොන්නාවේ මන්ත්‍රීවරු දෙදෙනෙක් අපි තෝරා පත් කර ගත්තා. කොළොන්නාව ආසනයේ අංගොඩ වෙළඳ සංකීර්ණයේ පොදු වැසිකිළියක් තිබුණේ නැහැ. ඒ වාගේම අංගොඩ මානසික රෝහල් හන්දියේ පොදු වැසිකිළියක් තිබුණේ නැහැ. ඒ අවස්ථාවේදී ඒ මන්ත්‍රීවරු දෙදෙනාත් සමග සමීපව දේශපාලනය මෙහෙයවපු කෙනෙක් හැටියට මම යෝජනා කළා, ඒ හන්දි දෙකට වැසිකිළි දෙකක් අපි ඉදි කරමුයි කියලා. ප්‍රාදේශීය සභා භූමියේ අංගොඩ හන්දියේ වැසිකිළියක් ඉදි කරන්න අපි මුදල් වෙන් කරලා ඒකට කටයුතු කළා. හැබැයි, මානසික රෝහල් හන්දියේ සියලුම තැන්වල තිබුණේ රජයේ ගොඩනැගිලි. රජයේ ඉඩම්. ඒ නිසා ඒ ප්‍රදේශයේ දේශපාලන බලධාරියා හැටියට ප්‍රාදේශීය ලේකම්වරයා ඒ අවස්ථාවේදී කොළඹ දිසා ඇමැතිවරයා නියෝජනය කළේ. ඔහුගෙන් විමසීමක් කළා. ඔහු මට දැනුම් දුන්නා. ඔහු ගත් කටටම කිව්වාලු ඕකුන්ට අපි ඕවා හදන්න දෙන්නේ නැහැයි කියලා. එකම ජාතිය. දේශපාලන පක්ෂ දෙකක් නිසා, වැසිකිළි යාමේ උවමනාව තිබුණේ ඒ ගමේ මිනිස්සුන්ට. හැබැයි, දේශපාලන පක්ෂ දෙකක් නිසා ඒ ජනතාවගේ ප්‍රශ්නය විසඳන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. එහෙම නම් ජාතීන් දෙකකට මේ ප්‍රශ්නය කොහොමද බලපාන්නේ? මේක මානුෂික ප්‍රශ්නයක්. ඉඩම් බලතල ලබා දීම කොතෙක් දුරට දිය හැකිද? මේක දෙන්නේම නැහැයි කියන එක නොවෙයි උත්තරය. අපට කොතෙක් දුරට යා හැකිද? සියලුම බලයන් පිළිබඳව අපට යා හැකි සීමාවක් තිබෙනවා. මේ ප්‍රශ්නයට උත්තරය තිබෙන්නේ ගරු සභාපතිතුමනි, කාගේවත් අතේ නොවෙයි. මේ රටේ ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක අතේ. කවුරුවත් කථා කරන්න අවශ්‍ය නැහැ. එක්සත් ජාතික පක්ෂයයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි එක මේසයකට ඇවිල්ලා මේ ප්‍රශ්නයට උත්තරය සොයනවා නම් වෙනත් උත්තර අවශ්‍ය නැහැ. වෙනත් දේශපාලන පක්ෂ කිසිම දෙයක් වැඩක් වෙන්නේ නැහැ. මොකද, කවුරුවත් ඕනෑ නැහැ. අපි පැහැදිලිව කියනවා -

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

මහජන පක්‍ෂය.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

නැහැ. මහජන පක්‍ෂයකුත් එපා. මම ඒකෙත් නැහැ. ගරු සභාපතිතුමනි, මේ හංගලා කථා කරන්න ඕනෑ නැහැ. හෙළ උරුමයට මේ රටේ මිනිස්සු කවදාවත් බලය දෙන්නේ නැහැ. ඒ වාගේම තමයි කොමියුනිට්ස්, සම සමාජ පක්‍ෂවලටත් මේ රටේ මිනිස්සු බලය දෙන්නේ නැහැ. අපි කාටත් නියෝජනයක් හම්බ වේවි. අනිකුත් පක්‍ෂවලට මේ රටේ නියෝජනයන් හම්බ වේවි. හැබැයි, මේ රට හැමදාම පාලනය කරන්නේ, එක්සත් ජාතික පක්‍ෂයයි, ශ්‍රී ලංකා නිදහස් පක්‍ෂයයි. මාරුවෙන් මාරුවට. ඒ නිසා මගේ අදහස මේ සියලුම පක්‍ෂ නොවෙයි. මේ පක්‍ෂ දෙක පොදු එකඟතාවයකට එනවා නම්, එකඟතාවයකට ඇවිල්ලා මුළු ලෝකයටම කියනවා නම් අපේ රටේ බලය බෙදා හැරීමට අපි එකඟයි. අපට බෙදා දිය හැක්කේ මෙවැනි, මෙතරම් බල ප්‍රමාණයක් විතරයි. අපි කවුරු ආණ්ඩු කළත් බලය බෙදීමක් මින් එහා කරන්නේ නැහැයි කියලා මුළු ලෝකයටම එකම පණිවිඩයක් මේ පක්‍ෂ දෙකට දෙන්න පුළුවන් නම් මේ ජාතික ප්‍රශ්නය අවසානයි කියන එකයි ගරු සභාපතිතුමනි මම කියන්නේ. වෙන විසඳුම් නැහැ. අවස්ථාවාදියෝ බලය ලබා ගැනීම සඳහා - මම හැමදාම කියන දෙයක් තමයි මේක බලය ලබා ගැනීම හෝ බලය පවත්වා ගැනීම සඳහා කරන මෙවලමක් හැටියට පාවිච්චි කරන්න එපාය කියන එක. බලයේ ඉඳීමට හෝ බලය ලබා ගැනීමට පාවිච්චි කරන මෙවලමක් නොවෙයි මේක. මේක භයානක සෙල්ලමක්. මේ සෙල්ලම කරන්නේ අපේ දුවා දරුවන්ගේ අනාගතයත් එක්කයි. මේ ප්‍රශ්නයට උත්තර දිය හැක්කෙත් වර්තමාන ජනාධිපති මහින්ද රජපක්‍ෂ ජනාධිපතිතුමාට විතරයි. මම එහෙම කියන්නේ, එතුමාගේ අනුගාමිකයෙක් නිසා නොවෙයි. දකුණේ විශ්වාසය දිනා ගත්තු නායකයෙකුට හැර උතුරේ ප්‍රශ්නයට විසඳුමක් දෙන්න පුළුවන්කමක් නැහැ. උතුරේ ප්‍රශ්නයට විසඳුම් දිය හැක්කේ දකුණේ ජනතාව විශ්වාස කරන නායකයෙකුට විතරයි. ඒ නිසා උතුරේ ප්‍රශ්නයට විසඳුමක් දෙන්න පුළුවන් දකුණේ විශ්වාසය දිනාගත් නායකයා මහින්ද රාජපක්‍ෂ මැතිතුමයි. ඒ නිසා එතුමාගේ නායකත්වයෙන් මේ ප්‍රශ්නයට සැබෑ උත්තරයක් සොයන්න ඕනෑ. එහෙම නැතිව හන්දි ගාණේ, කඩපිල් ගාණේ, සැරින් සැරේ පුවත්පත් සාකච්ඡා තියලා තමන්ගේ කටට එන ඕනෑම දෙයක් කියන එක නොවෙයි මේ ප්‍රශ්නයට උත්තරේ.

ගරු සභාපතිතුමනි, මේ රටේ මේ ප්‍රශ්න විසඳන්න සිය දහස් ගණනක් මිනිස්සු තමන්ගේ ජීවිත පූජා කරලා තිබෙනවා. මේ ප්‍රශ්නය සම්බන්ධව හොඳම කථාවක් ආචාර්ය ඇන්.එම්. පෙරේරා මැතිතුමා 1955 ඔක්තෝබර් 05 වැනිදා පාර්ලිමේන්තුවේදී ප්‍රකාශයක් කරනවා. අදත් එතුමාගේ කථාව වලංගුයි. එදා එතුමා කිව්වේ මොකක්ද? 1955 එතුමා කියනවා, ඔවුන්ගේ සැක දුරු කිරීමත්, ඔවුන් කෙරෙහි අපගේ හොඳ හිත මිස කහටක් නොමැති බවත්, ඔවුන් සමඟ සහෝදරත්වයෙන්, සාමයෙන් කටයුතු කිරීමට සූදානම් බවත් අප ඔවුන්ට ඒත්තු ගැන්විය යුතුය. නැතහොත් රටේ සුභ සිද්ධියට බරපතළ හානි කර එක්සත් ලංකාවක් වෙනු ඇත. අතිවිශාල ලේ වැගිරීම් වනු ඇත. අන්තිමේදී මෙයින් රටට කිසිදු සේවයක් නොවන අතර අප රට යටත් විජිතයක් හෝ ලෝක බලවතුන්ගේ කෙළි බඩුවක් බවට පත් වනු ඇත.

අද මේවා වෙලා නැද්ද ගරු සභාපතිතුමනි. අද මේවා වෙලා නැද්ද? ඉදිරියටත් මේ දෙයමද අපි බලාපොරොත්තු වෙන්නේ? මේ කාලකණ්ණි මනාපයක් අරගෙන පාර්ලිමේන්තු යන්න ගන්න උත්සාහය (බාධා කිරීම්) ගන්න කවුරුත්, ගරු සභාපතිතුමනි, මේ රට එක් ජාතියක් වශයෙන් පවත්වාගෙන යෑම සෑම මන්ත්‍රීවරයෙකුගේම බලාපොරොත්තුව යයි මම කල්පනා කරනවා. මේ රටේ වාසය කරන සියල්ලන්ගේම සුභ සිද්ධිය සඳහා අප එක්සත්ව වැඩ කළ යුතුයි. එහෙම නොවී මේ ජාතික ප්‍රශ්නයට උත්තර සොයන්න බැහැ. ගරු සභාපතිතුමනි, මම දන්නවා ඔබතුමා කාලය කෙටි කරන්න කියන්න හදන්නේ. මට පොඩ්ඩක් දෙන්න. මේ රටේ මෙවැනි ජාතිවාදීන් අද ඊයේ නොවෙයි ඉතිහාසය පුරා ජීවත් වුණා. රාජරත්න මහත්මයා කිව්වේ, අන්තිම දෙමළාගේ හමෙන් සපත්තුව මහනකම් මට නින්ද යන්නේ නැහැයි කිව්වා. මෙත්තානන්ද මහත්මයලාත් කිව්වා. අවසානයේ රාජරත්න මහත්තයාලා, මෙත්තානන්ද මහත්තයලා දේශපාලන කුණු කූඩයට තමයි ගියේ. ඒ එදා. ඊට පස්සේ 1988 තව හිටියා. කවුද? ඒ දෙන්නෙක් තමයි ජනතා විමුක්ති පෙරමුණේ වේදිකාවේ එදා සිටියේ. නුගේගොඩ. ඒ තමයි අපේ තිලක් කරුණාරත්න හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා. අද බොහෝ දෙනෙකුට අමතක වෙලා. අනික් එක්කෙනා රුක්මන් සේනානායක. එදා රාජරත්නලා දේශපාලන කුණු කූඩෙට ගියා වාගේ තමයි රුක්මන් සේනානායකලත්, තිලක් කරුණාරත්නලත් කුණු කූඩෙට ගියේ. අදත් මේ කාලකණ්ණි දේශපාලනයේ ජාති වාදය වපුරන දේශපාලන කාලකණ්ණිත් යන්නේ ඔය කුණු කූඩෙටයි ගරු සභාපතිතුමනි. ඒකේ කිසිම කථාවක් නැහැ. අද අපි මේ -

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්‍ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, දේශපාලන කාලකණ්ණි කියලා -

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

මම කථා කරන්නේ කරුණු සහිතව. අද ගරු සභාපතිතුමනි, ලෝකයම ආගම් වාදය, ජාති වාදය ප්‍රතික්ෂේප කරනවා. ලෝකයම ප්‍රතික්ෂේප කරනවා. අද ලෝකයේ ආයුධ නිෂ්පාදනය කරන සමාගම් ඔවුන්ගේ ආයුධ විකුණා ගැනීම සඳහා වෙළඳපොළ සකස් කරමින් ඉන්නවා. ලංකාවේ ඔවුන්ගේ වෙළඳපොළ ඔවුන්ට අහිමි වෙලා. ඒ නිසා ඔවුන් ඒ සඳහා මුදල් වියදම් කරනවා. ඒ ආයුධ වෙළඳාම් කරන සමාගම් විවිධ

සංවිධාන හරහා අපේ රටේ සංවිධානවලටත් මුදල් එවනවා. ඒකට තමයි කට්ටියක් නෝර්වේ ගෙනි යන්නේ. ඒකට තමයි කට්ටියක් ඇමරිකාවේ වන්දනාවේ ගෙනි යන්නේ. ඒ හරහා තමයි මේ රටේ ආයුධ වෙළඳපොළ හදන්නේ. ඒ නිසා ගරු සභාපතිතුමනි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු සංවිධායකතුමා, කථාව පොඩ්ඩක් කෙටි කරන්න.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

අද ගරු සභාපතිතුමනි, ආගම් යුද්ධයක් ඇති කිරීමේ උත්සාහයන් තිබෙනවා. ඒක තමයි ලෝකය පුරා අද සිද්ධ වෙන්නේ. අපේ ජාතිවාදී යුද්ධය අවසන් වුණා. හැබැයි, ආගම් යුද්ධයක් මේ රටේ ඇති කරන්න කැස කවනවා. මෙන්න මේ කාලකණ්නි උත්සාහය බලගැන්වීම වළක්වන එක තමයි රටට ආදරය කරන මිනිස්සුන්ගේ වගකීම, යුතුකම. මම කාටත් කියනවා ආගම්වාදයට අද ලෝකයේ හිමි වෙලා තිබෙන තැන. ඉරානය ආගම් මූල ධර්ම වාදය මහ ඉහළින් තිබුණු රටක්. ඉරානයේ ජනාධිපතිවරණයේ ඡන්ද ප්‍රතිඵලය බලන්න. ආගම් වාදය, මූල ධර්මවාදය අනුගමනය කරපු අපේක්ෂකයාට 16% යි. ඒ තරමම ආගම්වාදය, මූලධර්මවාදය දරපු රටක - මුජිබූර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා මගෙත් එක්ක ඔබතුමා එකඟ වෙනවා ඇති. 16% යි. ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනය වෙනුවෙන් පෙනී සිටිය අපේක්ෂකයා 50.57% යි. ආගම් වාදය, ජාති වාදය වපුරන්නම් තාවකාලිකව රූපවාහිනී මාධ්‍යවල -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු සංවිධායකතුමා, කථාව කෙටි කරන්න.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ලොකුවට බැබළෙන්නට පුළුවන්. හැබැයි ජනතාවාදී දේශපාලනයේ නියැලෙන මිනිස්සු සාදාකල් මිනිස්සු අතර ජීවත් වෙනවා. ගරු සභාපතිතුමනි, මේ ප්‍රශ්නයේදී මුනිවත රැකගෙන ඉන්න අපට පුළුවන්කමක් නැහැ. 13 වෙනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අපි පෙනී සිටියේ අපේ ජීවිත උකස් කරලා. අද පළාත් සභා පිහිටෙව්වේ අපේ ජීවිත උකස් කරලා. අද අපි ජීවත් වෙන්නේ බෝනස් එකට. අපි අද ජීවත් වෙන්නේ බෝනස් එකට. අපි විවිධ මත දරන්න පුළුවන්. හැබැයි, අපි එකක් අමතක කරන්න එපා. කාලකණ්ණි සතුටක් ලබන්න, පාර්ලිමේන්තු වන්දනාවේ යන්න අපේ ගෙදර ඉන්න දරුවාගේ අනාගතය අපි විනාශ කරන්න කාලකණ්ණි තාත්තෙක් වෙනවාද කියන කාරණය හදවතට තට්ටු කරලා අහන්න ඕනැ. ඒ නිසා ගරු සභාපතිතුමනි, මම සියලුම ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලීමක් කරනවා. එදා දුටුගැමුණු, දස මහ යෝධයෝ බිහි වුණා. ඊට පස්සේ මහින්ද රාජපක්ෂලා, ගෝඨාභයලා බිහි වුණා. හැබැයි, හැමදාම එවැනි මිනිස්සු ලෝකයේ බිහි වන්නේ නැහැ. කාලකණ්ණි යුද්ධයක් ඇති වුණොත් තවත් වසර ගණනාවක් අපි මේ යුද්ධයට මුහුණ දෙන්න වෙනවා. මෙන්න මේ අපරාධයෙන් අපේ රට බේරාගන්නට ඕනැ. අපේ දරුවන්ගේ අනාගතය සුරක්ෂිත කරන්න ඕනැ. අපේ දරුවන්ගේ අනාගතය සුරක්ෂිත වෙන්නේ, හදපු වරායවල් ආරක්ෂා වෙන්නේ, හදපු ගුවන් තොටුපළවල් ආරක්ෂා වෙන්නේ, හදපු අධිවේගී මාර්ග ආරක්ෂා වෙන්නේ කොහෙවත් බටහිර රක්ෂණ සමාගම්වලට රක්ෂණය දැම්මොත් නොවෙයි. මේ රටේ සියලු ජාතීන් අතර ජාතික සමගිය, මිත්‍රත්වය සහෝදරත්වය ගොඩනැංවීම තුළින් පමණයි කියමින්, අද ගරු ප්‍රධාන අමාත්‍යතුමා ගෙනාපු යෝජනාවේ පළමුවැනි, තුන්වැනි යෝජනා දෙකට එක පයින් අත්දෙක උස්සනවා. දෙකටත් සම්පූර්ණයෙන් එකඟ නොවුණත් මේ පළාත් සභා ක්‍රමය තවදුරටත් පවත්වාගෙන යමින් එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ බලය මේ රටේ තහවුරු කිරීමට අවශ්‍ය නිසා දෙවැනි යෝජනාවටත් කැමැත්ත පළ කරමින් මම මේ වේලාවේ නිහඬ වෙනවා. ගරු සභාපතිතුමනි, ඔබතුමාට ස්තූතියි.

[ අ.භා. 01.14 ]

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, 1996 දී චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය මේ රටේ ජනාධිපති වුණු වෙලාවේ මේ ආණ්ඩුවේ සියලුම ඇමැතිවරුත් -

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

97.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

96 දී වුණු සිදුවීමක් කියන්නේ. අනේ, කරදර කරන්න එපා. 1996 දී කළුතර ටැන්ජරීන් හෝටලයට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ සන්ධානයේ ඇමැතිවරු එකතු වුණා. සියලුම පළාත් සභා මන්ත්‍රීවරු එකතු වුණා. එකතු වෙලා ගරු සභාපතිතුමනි, දින තුනක් තිස්සේ වැදගත් සාකච්ඡාවක් කරනවා. ඒ සාකච්ඡාවට චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය විතරක් නොවෙයි, ඒ සාකච්ඡාවේ වාඩි වෙලා ඉන්නවා, අද අපේ වත්මන් ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාත්. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය එදා ඒකමතිකව තීන්දු කරනවා. 13 වැනි ව්‍යවස්ථා සංශෝධනයෙන් ඉදිරියට යා යුතුයි කියන ඒ ප්‍රතිපත්තිය, තීන්දුව එදා ටැන්ජරීන් හෝටලයේදී ගන්නවා විතරක් නොවෙයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මධ්‍යම කාරක සභාවටත් ඉදිරිපත් කරලා, ඒ වාගේම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ සම්මේලනයටත් ඉදිරිපත් කරලා අනුමත කර ගන්නවා ගරු සභාපතිතුමනි. අද අපේ ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන අමාත්‍යතුමා මේ යෝජනාව පළාත් සභාවට ගෙන එනකොටත් තවමත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඇතුළේ තිබෙන්නේ, 1996 දී එදා

[ ගරු නිරෝෂන් පාදුක්ක ]

චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය යටතේ අනුමත කර ගන්නා ලද 13 වැනි ව්‍යවස්ථා සංශෝධනයෙන් ඔබ්බට යා යුතුයි කියන ඒ දේශපාලන තීන්දුව කියන එක මේ සභාවට මතක් කරනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, අපි කවුරුත් ගරු කරන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නිර්මාතෘ එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමා 1926 ජූනි මාසේ 17 වැනිදා Morning Leader පුවත්පතට විශේෂ ලිපියක් ලියනවා. ඒ ලිපියේ එතුමා කියන්නේ, බණ්ඩාරනායක මැතිතුමා පැහැදිලිව අවධාරණය කර සිටියේ, ශ්‍රී ලංකාවට සුදුසු වන්නේ බලය බෙදීමේ ෆෙඩරල් ක්‍රමයක් බවයි. එමෙන්ම කිසියම් ස්වයං පාලනයක් අපේක්ෂා නොකරන ජාතියක් ලෝකයේ නොමැති බව, සිය ලිපියෙන් පෙන්වා දුන් එතුමා එවැනි ස්වයං පාලනයක් එක් ජාතිකයක් තවත් ජාතිකයකට ලබා නොදෙන්නේ නම්, එම ජාතිය ලෝකයෙන් කොන් වී යන බවද පැහැදිලි කළේය කියලා එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමා 1927 දී සඳහන් කරනවා ගරු සභාපතිතුමනි.

ඒ විතරක් නොවෙයි. එක්සත් ජාතික පක්ෂයේ නිර්මාතෘ, ජාතියේ පියා දිවංගත මහමාන්‍ය ඩී.ඒස් සේනානායක මැතිතුමා කියන්නෙත්, ශ්‍රී ලංකාවේ ජාතික නිදහස උරුම කර දුන් ජාතියේ පියා ඩී.එස්. සේනානායක මැතිතුමා කියා සිටියේත් ඕනෑම ජාතිකයකට, ඕනෑම ආගමකට, ඕනෑම කුලයකට අයත් පුද්ගලයින්ට මේ භූමිය තුළ අපේ භූමිය යැයි කියා මුළු ලොවටම කියන්නට නිදහසක් තිබිය යුතු බවයි. එසේ කියා සිටීමට සියලු ජාතීන්ට, සියලු ආගමිකයින්ට හැකියාවක් සේම නිදහසක් තිබෙන්නේ නම්, ඒ සියලු දෙනාම සිය ජන්ම භූමියට ආශිර්වාද වේවායි ප්‍රාර්ථනය කරන බවයි එතුමා සඳහන් කළේ. ඒ විතරක් නොවෙයි ගරු සභාපතිතුමනි. ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මැතිතුමා කියා සිටියේ, මහ ජාතිය සුළු ජාතීන්ට පහර දුන්නොත් කෙදිනක හෝ ඒ පහර ආපසු මහ ජාතියට එල්ල වන බවයි. මේ විදියට තමයි මේ රටේ හිටපු උගත් නායකවරු ඉතිහාසයේ කියා සිටියේ ගරු සභාපතිතුමනි. එහෙම විතරක් වෙන්නේ නැහැ. මෑත භාගයට එනකොට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අද නියෝජනය කරන රාජිත සේනාරත්න මහත්මයා. ඒ වාගේම රෙජිනෝල්ඩ් කුරේ අපේ හිටපු ප්‍රධාන ඇමැතිතුමා මොනවාද කියන්නේ? ඒ වාගේම ගරු සභාපතිතුමනි, 1996 දී - අද ලංකාවේ විදේශ ඇමැති මහචාර්ය ජී.එල්. පීරිස් මැතිතුමා මොකක්ද කියන්නේ? අවම මට්ටමේ බුද්ධියක් තිබෙන කෙනෙකුවත් මේ රටේ වාර්ගික ප්‍රශ්නයක් ඇතැයි කීමට හැකියාවක් නොමැති බවත් කියා සිටි විදේශ අමාත්‍ය ජී.එල්. පීරිස් මහතා වාර්ගික ප්‍රශ්නයට දේශපාලන විසඳුමක් නැතැයි කියන්නේ, දේශපාලන මන්ද බුද්ධිකයන් බව පැහැදිලිව කියා සිටියේය, මේ අපේ රටේ විදේශ ඇමැති ජී.එල්. පීරිස් මැතිතුමා. ගරු සභාපතිතුමනි, ඒ විතරක් නොවෙයි. රාජිත සේනාරත්න මැතිතුමා කියන්නේ - ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ බහුතරය. 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කරනවාට විරුද්ධ බව රාජිත සේනාරත්න මහත්මා සෘජුව ප්‍රකාශ කළ අතර යුධ ජයග්‍රහණය, ජයග්‍රහණයක් කිරීමට නම් එය ප්‍රමාණවත් නොවන අතර, මේ වාර්ගික ප්‍රශ්නය විසඳා ගැනීමට නම් දෙමළ ජනතාවගේ විශ්වාසය හා ආදරය දිනා ගත යුතු යැයි රෙජිනෝල්ඩ් කුරේ මැතිතුමා ප්‍රකාශ කළේය. මේක තමයි ගරු සභාපතිතුමනි, යථාර්ථය. මේක තමයි යථාර්ථය. හැබැයි ගරු සභාපතිතුමනි, මේ සියලු කාරණා මැද්දේ තමයි අද මේ 13 වැනි ව්‍යවස්ථා සංශෝධනය ගෙන එන්නේ. මගේ මිත්‍ර උදය ගම්මන්පිල මැතිතුමා ජේ.ආර්. ජයවර්ධන අපේ දිවංගත නායකතුමා පළාත් සභා ආයතන ටිකක් ඒකාබද්ධ කිරීම පිළිබඳව කථා කළා. එදා ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා කොළඹ ඉඳලා නුවරට පාගමන ගියේ, රට සභා ක්‍රමයේ පළාත් සභා ආයතන දෙකක් එකතු කිරීමට විරුද්ධව කියන එකට බව මම දිවංගත ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාට ගෞරවයක් විදියට මේ සභාවේ මතක් කරමින් එතුමා ඒ වෙනුවෙන් පෙනී සිටියේ, එක්දහස් නවසිය පනස් ගණන්වල සිටම කියන එකත් ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාට ගෞරවයක් විදියට ප්‍රකාශ කරනවා. එදා ගම්පහදී ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ ගමන නැවැත්වූයේ, එස්.ඩී. බණ්ඩාරනායක මැතිතුමා ගරු සභාපතිතුමනි. එතුමා කිව්වේ, රට සභා ක්‍රමයෙන් පළාත් සභා දෙකක් විතරක් නොවෙයි, පළාත් සභා තුනකටද එකතු වෙන්න පුළුවන්. අන්න ඒ වාක්‍යයට විරුද්ධ, එදා 1987 ඉන්දු - ලංකා ගිවිසුම එතුමා අත්සන් කළ වෙලාවේ වසන්තරාජා මහත්මයා එතුමාගෙන් ප්‍රශ්නයක් අහනවා. රට සභා ක්‍රමය ඒකාබද්ධයට විරුද්ධව ගිය ඔබ අද පළාත් සභා දෙකක් ඒකාබද්ධ කිරීමට දුන් තීන්දුව ඔබේ දෛවය ඔබට කළ සරදමක් නොවේද කියලා. එහෙම අහනකොට එතුමා වසන්තරාජාගෙන් අහන්නේ ඔබට වයස කීයද? එතකොට වසන්තරාජා කියනවා වයස. එතකොට කියනවා, ඒ වසර වනකොට ඔබ අවුරුදු 08 ක දරුවෙක්. ඔබ කියන්නේ, කවුරුත් කථා කරපු ඉතිහාසයක්. හරි ඉතිහාස කථාව කියවලා ඇවිල්ලා ආයිත් මගෙන් මේ BBC චැනලය හරහාම ඔබට ඒ ප්‍රශ්නය අහන්න අවස්ථාව ලබා දෙනවා කියලා.

ගරු සභාපතිතුමනි, මේ රටේ සිටි හැම නායකයාම මේ ප්‍රශ්නය විසඳීම සඳහා උත්සාහයක් ගත්තා. එදා සඟ, වෙද, ගුරු, ගොවි, කම්කරු පංච මහා බලවේගය දාගෙන බණ්ඩාරනායක මැතිතුමා නොසිතූ විදියට මේ රටේ යම් ප්‍රශ්නයක් නිර්මාණය කළා. හැබැයි බණ්ඩාරනායක මැතිතුමා අවබෝධ කර ගන්නවා තමන්ගේ අතින් සිදු වුණු වරද. ඒත් එක්කම එතුමා ක්‍රියාත්මක වෙනවා. කිසිදු භයක් චකිතයක් නැතුව බණ්ඩාරනායක - චෙල්වනායගම් ගිවිසුම අත්සන් කරලා තමන්ගේ අතින් වුණු වරද නිවැරදි කර ගන්නට බණ්ඩාරනායක මැතිතුමා ඉතහාසයේ උත්සාහ කරනවා. ඩඩ්ලි - චෙල්වනායගම් ගිවිසුම ඉතිහාසයේ එනවා. රජීව් ගාන්ධි, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා අත්සන් කරපු ඉන්දු - ලංකා ගිවිසුම එනවා ගරු සභාපතිතුමනි. මේ කිසිම රාජ්‍ය නායකයෙක් මේ රට දෙකඩ කරන්න ඉඩ දුන්නේ නැහැ. මම හිතන්නේ, මෙතැන ඉන්න කිසිදු මන්ත්‍රීවරයෙක් කැමැති වෙන්නෙත් නැහැ. හැබැයි ගරු සභාපතිතුමනි, මේ ඉතිහාස කතන්දරය හරහා එනකොට එදා ඉතිහාසයේ ලී ක්වාන් යූ කියන්නේ මොකක්ද?

ස්විස්ටර්ලන්තය විධියට තමයි එදා අපේ රට හඳුන්වලා දුන්නේ. ලී ක්වාන් යූ සිංගප්පූරුව දියුණු කළේ සියලු ජාතීන් එකතු කරගෙන. එකම අරමුණක් සඳහා ගිහිල්ලා.

ගරු සභාපතිතුමනි, මට මතක් වෙනවා. මම දේශපාලනයට ආපුම අවුරුද්දේ පිළියන්දල නගරයේ එක්තරා ව්‍යාපාරිකයෝ කණ්ඩායමක් එක්තරා ස්වාමීන් වහන්සේ නමක් එකතු කරගෙන සිංහල වෙළඳ සංගමය කියලා සංගමයක් හදන්න හැදුවා. කැස්බෑව ප්‍රාදේශීය සභාවට පත් වුණු නවක මන්ත්‍රීවරයා විධියට මම එදා ඒකට ගිහිල්ලා කුඩා ළමයෙක් විධියට මම ඒ හාමුදුරුවන්ගෙන් එක ප්‍රශ්නයක් ඇහුවා. අපේ හාමුදුරුවනේ පිටකොටුවට ගිහිල්ලා රුපියලක් වැඩියෙන් දීලා සිංහල මුදලාලිගෙන් බඩු ගේන වෙළඳ සංගමයේ සාමාජිකයෝ කවුද? කොළඹට ගිහිල්ලා රුපියලයක් අඩුවෙන් දීලා දෙමළ මුදලාලිගෙන් බඩු ගන්න සිංහල ව්‍යාපාරිකයෝ පිළියන්දල ඉන්නවාද? අද මහ ජාතිය විධියට සිංහල බෞද්ධයෝ පිළියන්දල හන්දියේ සිංහල වෙළඳ සංගමයක් දාගෙන වෙන් වෙනවාද? අපි මහ ජාතිය එහෙම වෙන් වෙනවා නම් සුළු ජාතීන්ට වෙන් වීමේ හැකියාව නැද්ද? ඒ නිසා කරුණාකරලා මේ වෙළඳ සංගමයේ නම එක්සත් වෙළඳ සංගමය කියලා දාන්න. දාලා මුස්ලිම් සහ ද්‍රවිඩ ව්‍යාපාරිකයන්ට පිළියන්දල නගරයේ සිංහල ව්‍යාපාරිකයෝත් එක්ක එකට ජීවත් වෙලා ඉන්න දෙන්න කියලා. එදා මගේ නිවසට කථා කරලා ඒ ස්වාමීන් වහන්සේ අපේ අම්මාගෙන් අහලා තිබුණේ මම කතෝලිකද කියලා.

හැබැයි ගරු සභාපතිතුමනි, අද මට කියන්න සතුටුයි. පිළියන්දල නගරයේ සියලුම මුස්ලිම් සහ ද්‍රවිඩ ව්‍යාපාරිකයෝ පෝය දාට පිළියන්දල නගරයේ ළෙල දෙන රුපියල් ලක්ෂ 14 ක් වටින බෞද්ධ කොඩි සියල්ලටම දායකත්වය දීලා තිබෙනවා විතරක් නොවෙයි, ඔවුන් වෙනම වෙන් වීමක් විනාඩියකටවත් හීනෙන් හිතන්නේ නැහැ. එහෙම තමයි ගරු සභාපතිතුමනි, ප්‍රශ්නයක් දිහා රටේ මහ ජාතිය බලන්න ඕනෑ. එහෙම තමයි මහ ජාතිය ක්‍රියා කළ යුත්තේ. ඇයි ගරු සභාපතිතුමනි, අපි ඉඩම් බලතලවලට භය? යන්න නැගෙනහිරට. යුද්ධයෙන් දිනා ගත්තු නැගෙනහිරට ගිහින් ත්‍රිකුණාමලයේ මුහුදට බහින්න. බැහැලා කිලෝ මීටර් 100 ක් ඕනෑ පැත්තකට යන්න. මොකක්ද භූමියට වෙලා තියෙන්නේ? කැබිනට් ඇමැතිවරු භූමිය බෙදාගෙන. 5% පොළියට BOI ව්‍යාපෘති දාගෙන. රජයේ ණය අරගෙන. සාමාන්‍ය මුදල්වල පිරිවැය 13% ක් වුණු රටේ 5% ට ණය අරගෙන -

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, මට වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, ඒ නිසා -

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ගැන මෙතැන සඳහන් කළා. 6% කොන්ත්‍රාත් ගන්නවා කියලා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔන්න තොප්පිය දාගත්තා.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

පාර්ලිමේන්තුවේ - පොඩ්ඩක් අහගන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මෙන්න මෙතුමා තොප්පිය දාගෙන.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

පොඩ්ඩක් අහගෙන්න ඉන්න. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

නැහැ, නැහැ. එහෙම කිව්වේ නැහැ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, උපාලි කොඩිකාර ඇමැතිතුමාට අහලක හෝ දේපළක් නැගෙනහිර පළාත් සභා භූමිය තුළ නැති බවද ප්‍රකාශ කරනවා. ගරු සභාපතිතුමනි, -

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

එහෙම නම් කොහේද තියෙන්නේ?

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

එතුමාට තියෙන්නේ බස්නාහිර පළාතේ. ගරු සභාපතිතුමනි, තමුන්නාන්සේ දන්නවා, යුධ ජයග්‍රහණයෙන් පස්සේ ජී.එල්. පීරිස් මැතිතුමා ඉන්දියාවේ ආරක්ෂක උපදේශකයාත් එක්ක අවබෝධතා ගිවිසුමක් අත්සන් කරනවා. අපි ඒකේ කියනවා, 13 වැනි ව්‍යවස්ථා සංශෝධනයෙන් ඔබ්බට යනවා කියලා. ඒ විතරක් නොවෙයි. ඒ ගිවිසුම අත්සන් කරලා දින දෙකකට පස්සේ එක්සත් ජාතීන්ගේ මහ ලේකම් ලංකාවට ඇවිල්ලා අපේ වත්මන් ජනාධිපතිතුමා තවත් අවබෝධතා ගිවිසුමක් අත්සන් කරනවා, අපි 13 වැනි ව්‍යවස්ථා සංශෝධනයෙන් ඔබ්බට ගිය දේශපාලන බලයක් සඳහා කැප වෙනවා, ක්‍රියා කරනවා කියලා ගරු සභාපතිතුමනි.

[ ගරු නිරෝෂන් පාදුක්ක ]

මේ බස්නාහිර පළාත් සභාව පසුගිය අවුරුදු හතරේදී මොකද කළේ? ඉඩම් බලතල ගැන කථා කරනවා. ප්‍රසන්න රණතුංග මැතිතුමාට මතක ඇති. ගරු සභාපතිතුමනි, ඔබතුමාට මතක ඇති. 2002 එක්සත් ජාතික පක්ෂ රජය ආවාම ඉඩම් ඇමැති විධියට රාජිත සේනාරත්න මැතිතුමා පත් කළාම ලසන්ත අලගියවන්න මැතිතුමා මේ පළාත් සභාවේ ඉඩම් ප්‍රඥප්තියක් ගෙනැල්ලා මධ්‍යම ආණ්ඩුවට ඉඩම් අල්ලන්න බැරි විධියට ඉතිහාසයේ ප්‍රඥප්තියක් සකස් කළා මතක ඇති. මේ අද වාඩි වෙලා ඉන්න සියලු මන්ත්‍රීවරු ඒක අහෝසි කරන්න කියලා අපේ ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන ඇමැතිතුමා මේ පළාත් සභාවටම යෝජනාවක් ඉදිරිපත් කළාත් අපට මතක ඇති. ඒක තමයි බලය තියෙනකොට තවත් න්‍යාය පත්‍රයකින් බලය බෙදනවා. බලය නැතිකොට තවත් න්‍යාය පත්‍රයකින් බලය බෙදනවා. ඒක තමයි වෙලා තිබෙන්නේ ගරු සභාපතිතුමනි. ඒ නිසා අද මේ රටේ අපි මේ කථා කරන මොහොත වනකොට සුවිශාල වූ වැදගත් මොහොතකට ඇවිල්ලා තිබෙනවා.

හැබැයි ගරු සභාපතිතුමනි, 1999 දී මම කැස්බෑව නගර සභාවේ කථා කරපු කථාවක පොඩි වාක්‍යයක් මතක් කරනවා. දකුණේ අන්තවාදී නායකයෝ කිසි කෙනෙකුට ප්‍රභාකරන් නැමැති මිනීමරුවා නියපොත්තකටවත් අලාභයක් නොකරන බව 1999 දී කැස්බෑව නගර සභාවේදී මම කිව්වා. එහෙම කිව්වේ ගරු සභාපතිතුමනි, එදා ප්‍රභාකරන්ට ඕනෑ වුණේ දකුණේ අන්තවාදය. එදා දකුණේ බලය බෙදීම ගැන නායකයෙක් කථා කළා නම් තමුන්ගේ ජීවිතයෙන් සමු ගන්න සිද්ධ වුණා. උතුරේ නායකයෙක් බලය බෙදන්න කථා කළා නම් ඒ හැම නායකයාම ප්‍රභාකරන් විසින් සමතලා කර දමනු ලැබුවා. හැබැයි අන්තවාදය, ජාතිවාදය සහ ආගම්වාදය වෙනුවෙන් පෙනී සිටින දකුණේ හැම ජාතිවාදී, අන්තවාදී නායකයෙක්ම ප්‍රභාකරන් තමන්ගේ දරුවන් ආරක්ෂා කරනවා වාගේ ඉතිහාසයේ ආරක්ෂා කළාය කියන එක ගරු සභාපතිතුමනි, මතක් කරනවා. යුද්ධය කාලේ වාහන පිටින් ආරක්ෂාව ඇතුව මේ රටේ ඇමැතිවරු යනකොට, සමහර ඇමැතිවරුන්ට කවුරුත් නැතුව යන්න පුළුවන්කම තිබුණා. ප්‍රභාකරන්ගේ ඝාතන ලැයිස්තුවේ ඒ අන්තවාදී නායකයෝ හිටියේ නැහැ ගරු සභාපතිතුමනි. ඒ නිසා අද මේ මොහොත වනකොට අපි ඇවිල්ලා තිබෙන්නේ කොතැනටද ගරු සභාපතිතුමනි? අපි හිතාගෙන ඉන්නවා. අපට පොඩි වැරැදීමක් තිබෙනවා ගරු සභාපතිතුමනි. අපි යුධ ජයග්‍රහණයෙන් පස්සේ ලබපු මේ නිදහස වැරැදි විධියට අර්ථ කථනය කරනවා සාමයක් කියලා. ගරු සභාපතිතුමනි, ඒක වැරැදියි. මේ අපි ලබපු නිදහස වර්ණවත් වෙන්න නම්, අර්ථවත් වෙන්න නම් සැබෑ සාමයක් මේ භූමිය තුළ ස්ථාපිත වෙන්න ඕනෑ. නිදහසයි, සාමයයි අතර ලොකු පරතරයක් තිබෙනවා ගරු සභාපතිතුමනි. ඒ නිසා පසුගිය කාලයේ බස්නාහිර පළාත් සභාවේ අපි බලාගෙන හිටියා, අපේ ප්‍රධාන ආදායම මධ්‍යම ආණ්ඩුවට දුන්නා. අපේ ප්‍රධාන ආදායම මධ්‍යම ආණ්ඩුවට දෙනකොට අපේ පළාත් සභාව - ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන ඇමැතිතුමාට ඒකට කරන්න දෙයක් නැහැ. මධ්‍යම ආණ්ඩුවෙන් එන නියෝගය. පළාත් සභාවේ ප්‍රධාන ආදායම අපි දුන්නා. අපි මුද්දර ගාස්තු ටික දුන්නා. ඊට අමතරව ඉඩම් ප්‍රඥප්තියත් අනුමත කර ගත්තා. අපි අපට ලබා දුන් සොච්චම් බලතල සියල්ලම මධ්‍යම ආණ්ඩුවට දෙනවා ගරු සභාපතිතුමනි. ඒ නිසා මේ පළාත් සභාවල ඉඩම් බලතල අයිති මධ්‍යම ආණ්ඩුවටද? පළාත් සභාවටද, කුමන ආයතනයටද අවසානයේ මේ ඉඩම්වල භුක්තිය විඳිය යුත්තේ, ශ්‍රී ලාංකීය ජනතාව කියන එක ගරු සභාපතිතුමනි, මම මේ සභාවට මතක් කර දෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, මම මතක් කළ යුතු තවත් වැදගත් කාරණයක් තිබෙනවා. දේශපාලන පක්ෂ දෙකේම මුස්ලිම් මන්ත්‍රීවරු මෙතැන ඉන්නවා ගරු සභාපතිතුමනි. අල්කයිඩා සංවිධානය නමැති මුස්ලිම් අන්තවාදය නිසාත්, ඒ වාගේම තලෙයිබාන් කියන අන්තවාදී මුස්ලිම් ජාතිවාදය නිසාත් අද ලෝකයේ අනන්ත අප්‍රමාණ දුක් විඳින්නේ, ඉස්ලාම් ආගම අදහන මිනිස්සු. යුරෝපීය රටවල්වල ඉස්ලාම් භක්තිකයෙක්ව ගුවන් තොටුපළක පැය දෙක තුන රස්තියාදු කරනවා. අද මුස්ලිම් භක්තිකයෙක් දැක්කාම මුස්ලිම් නොවන වෙනත් රටවල්වලට මතක් වෙන්නේ අල්කයිඩා සංවිධානය. එහෙම නැත්නම් තලෙයිබාන්. එහෙම නැත්නම් ඇෆ්ගනිස්ථානය. ඒ නිසා ගරු සභාපතිතුමනි, අද මේ රටේ අන්තවාදී ව්‍යාපාර තිබෙනවා. බල සේනා කියලා දාගෙන ඉන්නවා. රාවණා කියලා දාගෙන ඉන්නවා. විවිධ නම්වලින් එනවා.

ගරු සභාපතිතුමනි, මේ රටට සාමය අවශ්‍ය නම් මුලින්ම කළ යුත්තේ දේශපාලන පක්ෂවලට ආගම්වල නම් හෝ ජාතීන්වල නම් දාන එක වහාම නැවැත්විය යුතුයි කියලා මේ සභාවට යෝජනා කිරීමයි. මේ රටේ තිබෙන්න ඕනෑ එක්සත් ජාතික පක්ෂය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය. සම සමාජ පක්ෂය. ජනතා විමුක්ති පෙරමුණ. ඒ වාගේ නම් මිස ලංකාවේ මුස්ලිම් කොන්ග්‍රසය, ද්‍රවිඩ සන්ධානය, හෙළ උරුමය ආදී ආගම්, ජාතීන්ගේ නම් පාවිච්චි කිරීම මැතිවරණ කොමසාරිස් නැවැත්විය යුතුයි කියන එක මම මේ සභාවට මතක් කරනවා ගරු සභාපතිතුමනි. අපි මොකටද මේ එන්නේ? අපි එන්නේ, මොකටද ගරු සභාපතිතුමනි. තව ප්‍රභාකරන් කෙනෙක් හදන්න. මතක තියා ගන්න මැරුණු ප්‍රභාකරන් මැරුණා. අලුත් ප්‍රභාකරන් යුරෝපයේ ඉපදෙනවා. ඔහු එංගලන්තයේ හෝ ඇමැරිකාවේ හෝ ඩෙන්මාර්කයේ හෝ ස්විඩනයේ ඉපදෙනවා. මැරුණු ප්‍රභාකරන්ට බැරි ඉංග්‍රීසි ටික ඌ ඉගෙන ගන්නවා. මැරුණු ප්‍රභාකරන්ට බැරි වූ උපාධිය ඌ වෙන රටකින් ගන්නවා. අරගෙන ඇවිල්ලා දකුණේ අන්තවාදය නිසා මේ රටේ කැල්ලක් නොවෙයි. අනාගතයේ මේ රටම ඉල්ලන තැනට මේ රට පරිවර්තනය වෙයි ගරු සභාපතිතුමනි.

ඒ නිසා අපි ඔබතුමා හරහා ඉදිරිපත් කරන්නේ, එක්තරා කියමනක් තියෙනවා. තක්කඩියාගේ අන්තිම උත්සාහය ජාතිවාදය කියලා. තක්කඩියා බලනවා විවිධ ක්‍රමවලින් බලය ගන්න. ඒ හැම ක්‍රමයෙන්ම බලය ගන්න බැරි වුණාම උගේ

අවසාන මෙවලම තමයි අන්තවාදය, ජාතිවාදය සහ ආගම්වාදය. අද ඒක තමයි තියෙන්නේ. ගරු සභාපතිතුමනි, ගිය සතියේ මහරගම හන්දියේ එක්තරා බලසේනාවක් දිවුරුම් ප්‍රකාශයක් ගන්නවා, ශ්‍රී ලාංකීය ජනතාවගෙන්. ගරු සභාපතිතුමනි, මහරගම නගරයේදී ප්‍රකාශනයක් ගන්නවා. ඒ ප්‍රකාශනය ගන්න ඡායාරූපේ සිංහල බෞද්ධ නායකවරු ඉස්සරහ පේළියේ වාඩි වෙලා ඉන්නවා. ඒකේ දෙන්නෙක් හිටගෙන තමන්ගේ ප්‍රකාශය කරනවා. ගරු සභාපතිතුමනි, දෙන්නාම මිනිසකු පිට නැගි අසරුවෙකි. ඒ බර ගෙයි වහලට බරකී. රට සිංහල බෞද්ධයෝ ලක්ෂයකගේ පොකට් එකට ගහන දෙන්නෙක්. ඉස්සරහ පේළියේ වාඩි වෙලා ඉන්නවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

කවුද දෙන්නා? ඒක කියන්න.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

කොටයි. කොටයි. බැට් එකක් දුන්නොත් පාලනය ඉල්ලන්නේ. ක්‍රිකට් ගහන්න කැමති නැහැ. ගරු සභාපතිතුමනි, ඉස්සරහ පේළියේ වාඩි වෙලා ඉන්නවා. බුද්ධාගම සුරක්ෂිත කරන්න ඇවිල්ලා. සිංහල බෞද්ධයෝ ලක්ෂයකගේ පොකට් එකට රට ගහන අය.

[සභාවේ ඝෝෂා]

ගරු සභාපතිතුමනි, මෙහෙමයි කරන්නේ. මට කනගාටුයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ගැන. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අද අන්තවාදී සුළු පිරිසකගේ නිවාස අඩස්සියට වැටී ගෙන යනවා කියලා මට පේනවා. මම බලාපොරොත්තු වෙනවා. ඒ අන්තවාදී පක්ෂවල නිවාස අඩස්සියෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ගැලවේවා කියලා.

**ගරු රෙහෙන්සිරි වරාගොඩ**
Hon. Rehensiri Waragoda

නැහැ. එහෙම නැහැ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඒක හොඳයි වෙනවා නම්. ගරු සභාපතිතුමනි, ඒ නිසා මම කියන්නේ, මේ මනාප ක්‍රමය තුළින් කොළඹ දිස්ත්‍රික්කයේ සන්ධානයේ අන්තවාදී නායකයෝ තුන් දෙනෙක්, අන්තවාදී නායකයෝ තුන් දෙනෙක් ඉහළම මනාප ඡන්ද අරගෙන පාර්ලිමේන්තුවේ ඉන්නවා. මේ ඉන්නේ හතරවැනි අන්තවාදී නායකයාත් කොළඹ දිස්ත්‍රික්කයෙන් පාර්ලිමේන්තුවට යන්න. ඒකට පරිස්සම් වෙන්න. ඒ නිසා මම මීට

[සභාවේ ඝෝෂා]

වැඩිය කථා කරන්න යන්නේ නැහැ. මම වගකීමෙන් කියනවා, බොදු බල සේනා රැස්වීමක් බස්නාහිර පළාත් සභාවේ අමාත්‍යවරයෙකුගේ කාර්යාලයේදී මේ ළඟදි පැවැත්වුවා කියලා. මම කියනවා.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

කවුද ඒ?

[සභාවේ ඝෝෂා]

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඒ නිසා මම කියනවා ගරු සභාපතිතුමනි, මේ තත්ත්වය තුළ -

[සභාවේ ඝෝෂා]

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

එසේ නම් වහා හෙළි කරනු.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

කවුද ඒ?

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, අවසාන කොටස ගරු සභාපතිතුමනි. ජර්මනිය පළමුවැනි ලෝක යුද්ධය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ව්‍යංගයෙන් කියන්න එපා. අනෙක් ඇමතිවරුන්ට ප්‍රශ්නයක් වෙනවා. ඔබතුමා නමක් කියන්න. බස්නාහිර පළාතේ ඇමතිවරයෙකුගේ කිව්වාට පස්සේ අනෙක් ඇමතිවරුන්ට හානියක් වෙනවා ඒ තුළින්.

[සභාවේ ඝෝෂා]

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

බොදු බල සේනා කණ්ඩායමක් ඇවිල්ලා සාකච්ඡාවක් කළා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට උත්තරයක් දෙන්න පුළුවන්. ඔබතුමාගේ නම කිව්වා නේ.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල - අමාත්‍යතුමා**
Hon. Udaya Prabhath Gammanpila - Minister

මගේ අමාත්‍යාංශය තුළ බොදු බල සේනාවක් තියා ජාතික හෙළ උරුමයේ රැස්වීමක්වත් මම පවත්වලා නැහැ. පවත්වන්නේත් නැහැ කියන එක ඉතා වගකීමෙන් කියනවා. ඒ නිසා සභාවේ අපේ මන්ත්‍රීතුමන්ලා ප්‍රකාශ කරද්දි තමන් දන්න දේ මිසක් කේලම් මත ඇසුණු දේ ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටිය යුතුය කියලා මම යෝජනා කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා ඒක ප්‍රතික්ෂේප කරනවා. එහෙම දෙයක් කළේ නැහැ කියලා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

එතුමා තිබ්බෙ නැහැ කිව්වාට මම කියනවා තිබ්බා කියලා. ඔබතුමාට කැමති එකක් දා ගන්න. බලය ඔබතුමාගේ අතේ නේ? ඕනෑ හැන්දකින් බෙදන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා යම් යම් ප්‍රකාශ කරන කොට වගකීමෙන් ප්‍රකාශ කරන්න. මොකද? ..

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල - අමාත්‍යතුමා**
Hon. Udaya Prabhath Gammanpila - Minister

ඒක හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කළ යුතුයි. මොකද, ඇමතිවරයෙකුගේ නම කියලා සඳහන් කරන්න බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඉවත් කරනවා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

දැනෙන තැනකට දැනෙන්න, රිදෙන තැනකට රිදෙන්න, වදින තැනකට වදින්න මම කිව්වේ.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල - අමාත්‍යතුමා**
Hon. Udaya Prabhath Gammanpila - Minister

ඔබතුමා නම කියන කල් මම කථා කළේ නැහැ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඉතින් ඒක හරි නම් දාගත්තට ගමක් නැහැ. හරි හරි මන්ත්‍රීතුමා. හැබැයි ගරු සභාපතිතුමනි, ගිය සතියේ මම ලංකාදීප පත්තරේ කියෙව්වා. ඒක කියවන කොට එක්තරා ඇමතිවරයෙක් ලියලා තියෙනවා ලිපියක්. ඉන්දියාව කියන මැරයා ශ්‍රී ලංකාව කියන කාන්තාව දූෂණය කරනවා. දූෂණය කරලා බිහි වෙන අවජාතක දරුවා තමයිලු පළාත් සභාව. මේ මන්ත්‍රීවරයා පත්තරේට ලියල තිබුණු වචන සෙට් එක.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ඒ මන්ත්‍රීවරයා පළාත් සභාවේ ඉන්නවාද?

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

පළාත් සභාවේ ඇමති ධූරයක් දරනවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

කවුද ඒ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමා දිගින් දිගටම මේ වාගේ ප්‍රකාශ කරන්න එපා. ඔබතුමා පළාත් සභාවේ ඇමතිවරයෙක් කිව්වාම ඒක ප්‍රශ්නයක් වෙනවා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මගේ මිත්‍ර උදය ගම්මන්පිල ඇමතිතුමා. එතුමා එහෙම ලිව්වේ නැද්ද පත්තරේට?

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල - අමාත්‍යතුමා**
Hon. Udaya Prabhath Gammanpila - Minister

ලිව්වා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ලිව්වා. ඉතින් හරි නේ? ඉන්දියාව කියන මැරයා ලංකාව කියන කාන්තාව දූෂණය කොට බිහි කරන ලද අවජාතක දරුවා පළාත් සභාවයි. හැබැයි, ඒ අවජාතක දරුවා තුළ අමාත්‍ය ධූරයක් දරමින් සහ එකී මෙකී නොකී හැම සබ්බ සකලමනාවම ලබමින් මම විශ්වාස කරන්නේ, එතුමා ඒ අවජාතක දරුවාට බාල අපරාධකම් කරනවයි කියලා

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල - අමාත්‍යතුමා**
Hon. Udaya Prabhath Gammanpila - Minister

ලිපිය හරියට සම්පූර්ණයෙන් කියවන්න. ඔබතුමා ලිපිය කියවන්න.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඒ අවජාතක දරුවාට ඒ අමාත්‍යවරයා බාල අපරාධ කරනවා කියලා තමයි මට කියන්න තියෙන්නේ. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ රටේ බලය බෙදන්න -

[සභාවේ ඝෝෂා]

මේ රටේ අපි ඔක්කෝම -

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ගරු ඇමතිවරයෙකුට බාලාපරාධ කරනවයි කිව්වා. එතුමා සමලිංගිකයෙක් ද කියලා දැනගන්න කැමතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට අදාළ නැහැ. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කාලය ගොඩාක් ගත්තා. ඔබතුමා දැන් කථාව අවසන් කරන්න.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, අවසාන වශයෙන් මට කියන්න තියෙන්නේ අපි බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරු - මට ගාමිණී තිලකසිරි ගරු මන්ත්‍රීතුමාත් සමග එකඟ වෙන්න වෙනවා. අද පළාත් සභා මන්ත්‍රීවරයා ගැන කිව්වාම, සුනිල් ජයමිණි ගරු සභානායකතුමා දන්නවා, උත්සවයකට ගියාම බලන්නේ අමුතුම විදියකට. රුවිතෙට. ඇයි එහෙම බලන්නේ? සමහර මාධ්‍යවල කියන කථාවලට දාන්නේ මොක්කුද? ඔක්කොම පළාත් සභා එපා කියලා. හැබැයි, මේ ඔක්කොම පළාත් සභා ඉතිහාසයේ හිටියා. ඒ නිසා අද ඉඳලා මේ පළාත් සභා ක්‍රමය බාල්දු කරනවාට වැඩිය හොඳයි, ගරු සභාපතිතුමනි, අපි කැමති වුණත්, අකමැති වුණත් ගෙදර තාත්තා තාත්තමයි. අපි පොඩි කාලයේ තාත්තා අපව හදලා පෝෂණය කරලා මෙතැන්ට ගේනවා. හැබැයි, අපි අත පය ලොකු වුණාම තාත්තාගේ වැරදි දකිනවා. අපි තාත්තාගේ වැරදි දැකලා කියනවා, තාත්තා මෙතැන වැරදියි. තාත්තා මෙතැන වැරදියි කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, දැන් විනාඩි හතක් විතර ඔබතුමාගේ කථාව දික් ගැහුණා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

කොහොම කළත්,තාත්තා තාත්තමයි. ඒ වාගේ පළාත් සභාව කියන්නේ මේ රටේ බලය බෙදීම සඳහා ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක අද එකඟ වුණු න්‍යාය පත්‍රයක්. ඒ නිසා මේ පළාත් සභා ක්‍රමය ස්ථාපිත කරලා - මේ පළාත් සභාව පාවිච්චි කරනවා සමහරු පාර්ලිමේන්තුවට යනවා. ගියාට පස්සේ එක්කෙනෙක්වත් කථා කරන්නේ නැහැ. මේ පළාත් සභාව ජනාධිපතිතුමියක් බිහි කළා. එතුමියත් එතැන්ට ගිහිල්ලා පළාත් සභාවලට හරියට බලය බෙදීම දුන්නේ නැහැ. ඒ නිසා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

දැන් ලැබුණු සොච්චම් බලයත් කප්පාදු කරද්දි මේ ප්‍රසන්න රණතුංග මැතිතුමා දිවට හොරෙන් ගෙනැල්ලා තියෙන, උගුරට හොරෙන් ගෙනැල්ලා තියෙන, තමන්ගේ හෘද සාක්ෂියට එකඟ නොවී ගෙනැල්ලා තියෙන මේ යෝජනාවට මම පෞද්ගලිකවත්, එක්සත් ජාතික පක්ෂයේ අප සියලු දෙනාමත් විරුද්ධත්වය ප්‍රකාශ කරනවා ගරු සභාපතිතුමනි. ඒ වාගේම ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන අමාත්‍යතුමා අවසාන වශයෙන් එතුමාගේ සහෝදරයා 1996 ලෝක කුසලාන අවසාන තරගයට ක්‍රීඩා කරද්දි කාසියේ වාසිය දානකොට රවි ශාස්ත්‍රී අහනවා ඉම්රාන් ඛාන් ගෙන් කවුද මේ තරගය දිනන්නේ කියලා. එතකොට ඔහු කියනවා මගේ My Favorite Australia but My Heart for Sri Lanka මගේ ප්‍රියතම කණ්ඩායම ඕස්ට්‍රේලියාව. හැබැයි මගේ හදවත ලංකාව. ඒ වාගේම ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන අමාත්‍යතුමා දන්නවා. මගේ හදවත පළාත් සභාව. හැබැයි, මගේ මේ ලිපිය ජනාධිපතිතුමාව සැනසීම සඳහා පමණයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙම අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපති රංජිත් සෝමවංශ මැතිතුමා මූලාසනයේ අසුන් ගන්නවා ඇති.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [ සුනිල් විජේරත්න මහතා ] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [ රංජිත් සෝමවංශ මහතා ] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Ranjith Somawansa] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඊළඟට කුමරගුරුබරන් ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ අවස්ථාව.

[ අ.භා. 01.40 ]

**ගරු කුමරගුරුබරන්**
கௌரவ குமர குருபரன்

தலைமைபீடத்தில் தலைமை வகிக்கும் கௌரவ உறுப்பினர் அவர்களே, மற்றும் நண்பர்களே இந்த விவாதத்தில் இறுதி நேரத்திலே பேசுவதை இட்டு மகிழ்ச்சி அடைகின்றேன். ஏனெனில் இங்கு பேசியவர்கள் எல்லாம் எதை

[கௌரவ குமர குருபரன]

பேசிய பொழுதும், வடக்கு கிழக்கிலே வாழ்கின்ற மக்களுடைய இனப்பிரச்சனையை தீர்ப்பதற்காக இந்த மாகாண சபை என்கின்ற 13வது திருத்தம் கொண்டுவரப்பட்டது. அந்த வகையிலே அது பற்றிப் பேச வேண்டிய தேவை எனக்கு இருக்கின்றது, இந்த இடத்திலே பாரிய இனவாதம் பேசி இருக்க வேண்டிய எங்களுடைய கௌரவ ரேணுக பெரேரா போன்றவர்கள் இன்று இந்த மாகாண சபையினுடைய தேவையை உணர்ந்து இருக்கின்றார்கள், என்பதையிட்டு ஒரு வகையில் சந்தோஷப்பட்டேன். அத்தோடு JVP இற்கு சார்பாக பேசிய வருணதீப்தி ராஜபக்ஷ அவர்களுக்குக் கூட நான் நன்றி கூற கடமைப்பட்டிருக்கின்றேன்.

ஏனென்றால் சமுதாயத்தினுடைய தேவையையும் சமுதாயம் எப்படி இருக்க வேண்டும் என்பதனையும் புரிந்து கொண்டு இருக்கின்றார்கள். ஆனாலும் அன்று இனவாதம் பேசிய JVP யினர் இன்று நிலைமையைப் புரிந்து கொண்டிருக்கின்றார்கள் என்றால், தங்களைப் படித்தவர்களாகக் கருதிக் கொண்டும், எங்களுடைய நண்பர்களாக இருந்து கொண்டும், இனவாதம் பேசுகின்ற உதய கம்மன்பில போன்றவர்களை நான் எப்படிச் சொல்வது என்று எனக்குத் தெரியவில்லை. நண்பர் ரேணுக பெரேரா அவர்கள் கூறியது போல இன்றைக்கு இந்த நாட்டிலே ஏற்பட்டிருக்கும் பிரச்சனைக்கு தீர்வு காண்பதற்கு ஐக்கிய தேசியக் கட்சியும், ஸ்ரீலங்கா சுதந்திரக் கட்சியும் நினைத்தால் முடியும். ஆனால் நியாயமானவர்கள், நியாயமான சிந்தனை உள்ளவர்கள் என்று சொல்லிக் கொண்டு இந்த நாட்டைச் சீரழிப்பதற்காக மதவாதத்தைப் பயன்படுத்துகின்ற ஒரு நிலைமை தான் மிகவும் கவலையளிக்கின்றது. அந்த கவலையை நான் இங்கு பதிவு செய்தாக வேண்டும். ஏனென்றால் மக்களுடைய வாக்குகள் வேண்டும். இல்லை என்று சொல்லவில்லை - அந்த தவறைத் தான் உங்களுடைய தலைவர் எஸ்.டப்லிவ்.ஆர்.டி. பண்டாரநாயக்க அவர்கள் அன்று விட்டார், அன்று அவர் தனிச் சிங்களம் என்று சொன்னதனால் ஏற்பட்ட வினை இன்றைக்கு நீங்கள் மீண்டும் தனி பௌத்தம் என்று சொல்வதனால் ஏற்படப்போகின்றது. இன்றைக்கு நான் உங்களை மட்டும் கூறவில்லை காரணம் பொதுபல சேனா, ராவண இப்படியான அமைப்புக்கள் வந்துவிட்டன. ராவண அமைப்பு என்று சொல்லும் போது நான் சிரிப்பதுண்டு ஏனென்றால் ராவணன் ஒரு சுத்தமான இந்து, சைவன், சிவபூசை செய்தவன், சிவ பூசை செய்து சுடலையிலே சாம்பலைப் பூசிய காரணத்தினால் அவனுக்கு இறைவனுடைய வரம் கிடைத்தது, அப்படிப்பட்ட ஒரு இந்துவினுடைய பெயரிலே நீங்கள் ஓர் அமைப்பை வைத்திருக்கின்றீர்கள், விரும்புகின்றேன்.

ஏனென்றால் புத்தரும் கூட ஒரு இந்துதான். மதவாதம், இனவாதத்துக்கு அப்பால் நாங்கள் இலங்கையர்கள், நாம் ஒன்றுபட்டு வாழ வேண்டும். என்று சிந்தியுங்கள் என்பதனை தயவு செய்து நான் கேட்டுக்கொள்ள விரும்புகின்றேன். இச் சபையிலே பேசுவதை நான் விரும்பவில்லை, அதற்குக் காரணம் இன்று எங்களுடைய முதலமைச்சரை எடுத்துப் பாருங்கள், எங்களுடைய உறுப்பினர்கள் சொன்னது போல இரண்டு உள்ளங்கள், மாகாண சபை வேண்டும், நல்லவகையிலே நிர்வகிக்கின்றார்கள், ஏனைய கிழக்கு மாகாண சபையில் உள்ளது போல எந்தவொரு இனவாதப் பிரச்சினையும் மேல் மாகாணத்தில் இல்லை, தமிழ் பாடசாலைகள் சம்பந்தமாக எதைக் கேட்டாலும் அவரிடம் செய்யக்கூடியதாக இருக்கின்றது. எனவே இவ்வளவு நியாயமாக அரசியல் பரவலாக்கல் ஏற்பட்டு, அதிகாரப் பரவலாக்கலும், சிறந்த நிர்வாகமும் இடம்பெறுகின்ற ஒரு மாகாண சபையில் இருந்து, அதனுடைய அதிகாரங்கள் பறிக்கப்படுவதற்கு இன்று முதலமைச்சர் பிரேரணையை கொண்டுவர வேண்டிய ஒரு துரதிஷ்டவசமான நிலைக்கு தள்ளப்பட்டு இருக்கின்றார். இது தான் கவலைக்குரிய விடயம். இறுதியாக நாங்கள் இவற்றையெல்லாம் பேசிவிட்டு என்ன செய்யப் போகின்றோம். நாங்கள் வாக்களிப்பது கூடவா, நீங்கள் வாக்களிப்பது கூடவா என்று பார்க்கப்போகின்றோம். அதையெல்லாம் பகிடியாக்கக் கூடாது. எனக்கு இங்கு பேசுவதற்கு விருப்பம் இல்லை, ஏனென்றால் நாங்கள் நியாயத்தைப் பேசிவிட்டு என்ன செய்கின்றோம், நியாயங்களை எல்லாம் பேசிவிட்டு இறுதியாக எந்த உத்தரவு கிடைக்கப்பெற்றதோ அதற்கு அடிபணிய வேண்டிய ஒரு தேவை இருக்கின்றது. அதற்கு அடிபணிந்து எங்களுடைய மாகாண சபையின் அதிகாரங்களை குறைத்துக் கொண்டு போகின்றோம்.

மாகாண சபை அதிகாரங்கள், மாநகர சபை அதிகாரங்களாகின்ற வரை போகும் என்றால் இந்த நாட்டிலே மாகாண சபைகள் எதற்காக? அல்லது உண்மையாக சொல்லப் போனால் எதிர்க்கட்சியிலே இருந்து கொண்டு உங்களுடைய வரப்பிரசாதங்களுக்காக, நாங்கள் குரல் கொடுத்து இதைக் காப்பாற்ற வேண்டிய ஒரு நிலை ஏற்படும். 13வது திருத்தம் ஒரு பிரச்சனை அல்ல. 13வது திருத்தம் வரலாம் இன்று 18வது திருத்தம் வரலாம், 19வது திருத்தம் வரலாம், ஆனால் இந்த 13வது திருத்தம் எனப்படுவது இலங்கை இந்திய உடன்படிக்கையினால் ஏற்பட்டது. இந்த இலங்கை இந்திய உடன்படிக்கை என்பதை இல்லாமல் செய்ய முடியாது. நான் நினைக்கின்றேன் குறிப்பாக உதய கம்மன்பில அவர்களுக்கு தெரியும் இப்படியான Treatise இரண்டு நாடுகளுக்கு இடையிலே இனப்பிரச்சனைக்கான தீர்வை ஏற்படுத்தப்படுகின்ற உடன்படிக்கைகள் வேறு விதமாகப் பார்க்கப்படுகின்றன, இரண்டு நாடுகளும் இணைந்து ஒரு முடிவெடுத்தால் தான் முடியும். எனவே நீங்கள் அதிகாரங்களை எல்லாம் பறித்துக் கொண்டு போய் இறுதியாகிவிட்டாலும் கூட, இந்த நாட்டிலே இனப்பிரச்சனை இருக்கத்தான் போகின்றது. எனவே நான் கேட்பதெல்லாம் இனப்பிரச்சனைக்கான தீர்வை முன்வையுங்கள், அதன் பின்னர் 13வது சரத்தை இல்லாது செய்யுங்கள். இனப்பிரச்சனைக்கான தீர்வை முன்வைக்கும் வரை, அல்லது பாராளுமன்றத்திலே இன்றைக்கு ஒரு உப குழு அமைக்கப்பட்டிருக்கின்றது அது இனப்பிரச்சனைக்கான தீர்வைக் காணும் வரை, இப்படியான செயற்பாடுகளை நிறுத்துங்கள். இதை நான் உங்களுடைய உறுப்பினராக உங்களிடம் கேட்கவில்லை, உங்கள் கட்சியினுடைய தலைமையிடம் கேட்கின்றேன். ஏனென்றால் எதற்காக இந்த Brosess எல்லாம் தேவையில்லை, பாராளுமன்றத் தெரிவுக் குழு ஒன்று இருக்கின்றது என்று சொல்கின்றீர்கள், இனப்பிரச்சனைக்கான தீர்வு காணப்போகின்றீர்கள் எனவே தீர்வை காணும் வரைக்கும் இந்த மாகாண சபைகளை இயங்க விடுங்கள், அதனுடைய அதிகாரங்களை ஏன் பறிக்கின்றீர்கள் என்று கேட்க விரும்புகின்றேன்.

மிகவும் ஒரு தவறான கருத்து பொலிஸ் அதிகாரங்கள் சம்மந்தமாக எங்களுடைய கௌரவ அமைச்சர் ஜகத் அங்கசே அவர்கள், தான் திஸ்ஸ விதாரண அவர்களுடன் பேசினேன் என்று சொன்னார்கள் நான் 131 கூட்டங்களிலே கலந்து கொண்டிருக்கின்றேன். இறுதியான அறிக்கையையும் பார்த்திருக்கின்றேன். தயவு செய்து வாசித்துப் பாருங்கள் எந்த ஒரு இடத்திலாவது மாகாண பொலிஸ் அதிகாரம் அதீதமாக

இருக்கவில்லை. முழுமையாக ஆளுநரின் கட்டுப்பாட்டுக்குக் கீழ் தான் இருக்கின்றது. எந்தவொரு பிரச்சனையும் முதலமைச்சருடைய கட்டுப்பாட்டை மீறிப் போகுமானால் அல்லது முதலமைச்சர் நாட்டுக்குப் பாதகமான முறையிலே பொலிஸாரைக் கொண்டு செல்வாராக இருந்தால், ஆளுநரால் எந்த இடத்திலும் அதனைக் கட்டுப்படுத்தவும் முடியும் அல்லது மத்திய அரசாங்கத்தினுடைய பொலிஸினூடாக அதனைக் கட்டுப்படுத்தவும் முடியும். எந்த ஒரு கிராமத்துக்கும் எந்த ஒரு நகருக்கும் உள் பிரச்சினைகள் இருக்கின்றது. Law and order must be controlled அந்த Law and order must be Maintain பண்ண வேண்டுமாக இருந்தால் அந்த உள்ளூர் பொலிஸாரினுடைய தேவை பற்றி மிகவும் தெளிவாக APRC அறிக்கையில் இருக்கின்றது. எனவே ஒரு பொழுதும் நாட்டைப் பிரிப்பதற்கு இடமளிக்க முடியாது.

நாட்டைப் பிரிப்பதற்காக APRC அமைக்கப்படவும் இல்லை. APRC அறிக்கை நாட்டைப் பிரிப்பதற்கு வழிவகுக்கவும் இல்லை. எனவே இப்படியான பயம் பீதிகளை எல்லாம் நாட்டிலே பரப்புகின்ற துரதிஷ்டவசமான நண்பன் உதய கம்மன்பில சார்ந்த அமைப்புக்கள் அல்லது இந்த பொதுபல சேனா, இப்படியானவர்களைக் கண்டு நான் மிகவும் வெட்கப்படுகின்றேன். இந்த நாட்டிலே நாங்கள் பிறந்தோம், வளர்ந்தோம் நீண்ட காலமாக, எந்தவொரு தமிழ்த் தலைவரும் ஆரம்பத்தில் இனவாதம் பேசவில்லை. உங்களுக்குத் தெரியும் சேர் பொன்னம்பலம் ராமனாதன் அவர்கள் பௌதத்தை மதித்த ஓர் தலைவர், ஒல்கொட் அவர்களுடன் சேர்ந்து ஆனந்தா கல்லூரியிலே பௌதத்தை வளர்த்ததிலே சேர் பொன்னம்பலம் ராமனாதன் அவர்கள் முதன்மையானவர். இந்த நாட்டிலே பௌதத்துக்காக தன்னுடைய பணத்தைச் செலவிட்டார் என்று சொன்னால் அதிலே சேர் பொன்னம்பலம் இராமனாதன் அவர்களும் ஒருவர். அப்படிப்பட்டதாக நாங்கள் மதங்களை மதிக்கின்றோம். மக்களை மதிக்கின்றோம். நண்பர்களாக கொண்டிருக்கின்றோம். இப்படி இருக்கின்ற பொழுது இனப்பிரச்சனைக்கான தீர்வை ஏன் இழுத்தடிக்கின்றீர்கள். எதற்காக இழுத்தடிக்க வேண்டும். அல்லது கொடுக்கப்பட்டவற்றை ஏன் வெட்டி கப்பாது பண்ணுகின்றீர்கள் என்று நான் கேட்கின்றேன். சில வேளைகளில் சொல்கின்றார்கள் சமஷ்டியரசு, சமஷ்டி சொல்லாடல்கள் வேண்டாம். சொல்லாடல்கள் எங்களுக்குத் தேவையில்லை என்று வைத்துவிடுங்கள் இந்தியாவில் தான் சமஷ்டி, பிரித்தானியர்களினால் ஆனதா சமஷ்டி? பிரித்தானியாவில் கொடுக்கப்பட்டிருக்கும் அதிகாரங்களைப் பார்த்தீர்களாக இருந்தால், வேல்ஸ் மக்கள் கேட்டது தான் வேல்ஸ் இற்குக் கொடுக்கப்பட்டிருக்கின்றது. நெதர் ஐலன் கேட்டது தான் நெதர் ஐலந்திற்குக் கொடுக்கப்பட்டிருக்கின்றது. ஸ்கொட்லாந்து கேட்டது தான் ஸ்கொட்லாந்துக்குக் கொடுக்கப்பட்டிருக்கின்றது. இவை ஒன்றோடொன்று சமன் அல்ல அதற்காக அவர்களுக்கு கூடுதலாகக் கொடுக்கப்பட்டிருக்கின்றது என்றோ, வேல்ஸ் இற்கு குறைவாகக் கொடுக்கப்பட்டிருக்கின்றது என்றோ கேட்கவில்லை, பிரதமரைக் கேட்டார்கள் ok வைத்திருங்கள். கியூபெக் இற்கு என்ன நடந்து விட்டது, கியூபெக் தனிநாடாக விரும்பியது, சர்வஜன வாக்கெடுப்பை நடத்தினார்கள் இறுதியாக பிரிந்துவிட்டதா ? இன்னும் கனடா கொடியைத்தான் வைத்திருக்கிறார்கள். சம்மந்தனும் இலங்கைக் கொடியைத்தான் குறிப்பிட்டுக் காட்டினார் ஆனால் நீங்கள் நம்பத் தயாராக இல்லை, எனவே நம்புங்கள் ஒரே இலங்கைக்குள் நியாயமான அரசியல் தீர்வு கிடைக்குமானால் நீங்கள் எதிர்ப்பார்ப்பது போல நிச்சயமாக இந்த நாடு சிறந்த நாடாக சிங்கப்பூராக மாற முடியும். அதற்கு இனப்பிரச்சினைக்கான தீர்வு தேவை. தயவு செய்து இனவாதத்தை விட்டு, மதவாதத்தை விட்டு, கொடுக்கப்பட்ட அதிகாரங்களை வெட்டாது, வேண்டும் என்றால் கூடிய அதிகாரங்களோடு ஜனாதிபதி என்ன சொன்னார். யுத்தம் முடிந்ததும் 13 ப்ளஸ் ப்ளஸ் ப்ளஸ் அவருடைய மனதிலே சொன்னது 13 ப்ளஸ் தான் இந்த நாட்டை வாழவைக்கும் என்று. ஆனால் இந்த இனவாதிகளுடன் சுற்றி சுற்றி அவருடைய ப்ளஸ்(+) எல்லாம் மைனஸ்(-) ஆகிவிட்டது. அதனால் தான் சொல்கின்றேன் நியாயமான அதிகாரங்களை பகிர்ந்தளித்து இந்த நாட்டை வளமுள்ள நாடாக, சிறந்த நாடாக, பல்லினம் வாழும் நாடாக சிங்கப்பூர் போன்று காணக்கூடிய சூழலுக்கு தயவு செய்து இட்டுச் செல்லுங்கள். ஏனென்று சொன்னால் இன்னும் சில நிமிடங்களிலே சிரித்துக்கொண்டு நாங்கள் வெற்றிபெற்று விட்டோம் என்று சிறு பிள்ளைகளைப் போன்று போகப்போகின்றோம். அது தான் நிலைமை ஆனால் அதற்கு மாறாக நாங்கள் இனவாதம் இன்றி செயற்பட வேண்டும். இந்த குறிப்பிட்ட சட்ட மூலத்தைப் பற்றி பார்க்கின்ற பொழுது இன்றைக்கு நீங்கள் வடக்கு கிழக்கு இணைந்து விடும் என்ற பயத்திலே இந்த சட்டத்தைக் கொண்டிருக்கின்றீர்கள், வடக்கு கிழக்கு ஒரு காலத்திலே இணைக்கப்பட்டுவிட்டால் எவ்வாறு இந்த சட்ட மூலம் கொண்டுவரப்படும், ஆனால் ஏன் அப்படிப் பார்க்கின்றீர்கள் வடக்கு கிழக்கு இணைந்து அது ஒரு வளமுள்ள பூமியாக இருப்பது போல வடமேல் மாகாணமும் வட மத்திய மாகாணமும் ஏன் இணையக் கூடாது. அல்லது தென் மாகாணமும் அருகில் உள்ள ஒரு மாகாணமும் ஏன் இணையக் கூடாது. இவைகள் எல்லாம் பொருளாதாரத்திற்கும் இலங்கையின் அபிவிருத்திக்கும் வளமுள்ளதாக இருக்கும் என்றால் இரண்டு மாகாணங்களில் என்ன பிழை இருக்க முடியும். ஆதலினால் தான் நான் ஒட்டுமொத்தமாக இந்த தீர்மானத்தை எதிர்க்கின்றேன். ஐக்கிய தேசியக் கட்சி எதிர்க்கிறது, நாங்கள் எல்லோரும் எதிர்க்கின்றோம் என்றால் இதை வடக்கு கிழக்கை வைத்து மட்டும் பார்க்க வேண்டாம். எதிர்காலத்திலே வடமேல் மாகாணமும் வடமத்திய மாகாணமும் இணைய முடியுமானால் அல்லது ஊவா மாகாணமும் தென் மாகாணமும் இணையமுடியுமானால் ஊவாவும் சப்ரகமுவாவும் இணையமுடியுமானால் ஏன் இணைந்து வளம் வரக் கூடாது என்கின்ற கேள்வி அதற்கு வழி விட்டு At least to pawe way for other province the latter's not have this peace of legislation Thank you very much.

[ අ.භා. 01.52 ]

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ජනතා විමුක්ති පෙරමුණ විධියට අපේ ස්ථාවරය ප්‍රකාශ කරන්න යන්නේ. මේක තමයි ජනතා විමුක්ති පෙරමුණේ ස්ථාවරය. දැන් මේ යෝජනාව ගැන බලන කොට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාත් ඉදිරිපත් කළා මෙහි තියෙන පරස්පරය. මෙහි තියෙන අවුල් වියවුල් භාවය. දැන් අපේ ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන ඇමතිතුමාට හරි, එහෙම නැත්නම් මේ යෝජනාව එවපු අරලියගහ මන්දිරයට හරි සිදු වුණ වැඩේ තමයි, ඔබතුමා අහලා ඇති අර ගමක සිටි කට්ට කෛරාටික මිනිහෙක් පෝය දවසේ සිල් ගත්තා. සිල් අරගෙන මේ උපාසක සිල්ඇත්තා ගෙදර යන්න එන කොට ගමේ හිටපු කොල්ලෝ කුරුට්ටෝ ටිකක්

[ ගරු නිරෝෂන් පාදුක්ක ]

ඉබ්බෙක් මස් කරනවා දැක්කා. උපාසකයාව නලියනවා. කොල්ලෝ දන්නේ නැහැ ඉබ්බා පුච්චන විදිය. කොල්ලෝ කට්ට පැත්තෙන් ඉබ්බා පුච්චනවා. උපාසකකමත් තියාගෙන හැබැයි, කොල්ලන්ට කියන්න ඕනෑ ඉබ්බ මස් කරන විදිය. ඒ නිසා යන ගමන් කවියකින් කියා ගෙන ගියා, මොකක්ද?

*අපට මොකද අපි අට සිල් උපාසක*
*ඉබ්බන්ගේ පුච්චන්නේ අනෙක් පිට*

උපාසක කමත් තියා ගෙන ඉබ්බා පුච්චන විදිය ගැන කොල්ලන්ට කියපු හැටි තමයි ඒ. ඒ වාගේ වැඩක් තමයි මේ වෙලා තියෙන්නේ. දැන් මේක ගත්තොත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ආණ්ඩුවට මේ වෙලාවේ මේ 13 කියලා කියන්නේ, නිකම් ජිමිකානා එකක් වාගේ. ඇයි? අරෙහේ අනුරාධපුරේ, පොලොන්නරුවේ, අම්පාරේ ගොවියා පොහොර නැතුව පාරට බැහැලා උද්ඝෝෂණය කරනවා. පොහොර ගැන කථාවක් නැහැ. ආණ්ඩුව කියනවා, 13 ඕනෑද?, එපාද? අරහෙ දුම්රිය සේවකයෝ පැය හතළිස් අටක් වැඩ වර්ජනයේ. වැටුප් වැඩි කිරීමක් ඉල්ලලා. ඒකට සාකච්ඡාවක් නැහැ. ආණ්ඩුව කියනවා, 13 ඕනෑද? එපාද? විශ්ව විද්‍යාල ශිෂ්‍යයෝ -

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

පොහොර ගැන අහනවා. අස්වැන්න කොච්චරද මේ පාර?

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් තුන්සියකගේ පන්ති තහනම් කරලා. ශිෂ්‍යයෝ ඉල්ලනවා ඉගෙන ගැනීමේ අයිතිය. අරහෙ කියනවා 13 ඕනෑද? එපා ද?

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

කවුද ඕවා ඉගැන්වුවේ? කවුද විශ්ව විද්‍යාලයට, දුම්රියට ඕවා ඉගැන්වුවේ ?

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ආණ්ඩුවට මේක මේ වෙලාවේ ගෙනාපු ජිමිකානා එකක් වාගේ තමයි අපි දකින්නේ. දැන් අපි පක්ෂයක් විදියට ජනතා විමුක්ති පෙරමුණ පළාත් සභාවලට විරුද්ධයි. ඇයි? පළාත් සභා අපේ රටේ ජාතික ගැටළුවලට විසඳුමක් නොවේය කියන ස්ථාවරයේ අද නොවෙයි, මීට අවුරුදු විසිහතක, ඊටත් එහා කාලයක ඉඳන් අපි ඉන්නවා. 1987 මේ වාගේ මාසෙක ජුලි මාසයේ මේ පළාත් සභා ගේන කොට, ඉන්දු - ලංකා ගිවිසුම අත්සන් කර කොට, අපේ රට ඉන්දියානු හමුදා ආක්‍රමණය කරන කොට, ඒකට විරුද්ධව මත දැක්වූවා විතරක් නොවෙයි, ඒකට විරුද්ධව සටන් කරපු ව්‍යාපාරයක්.

[සභාවේ ඝෝෂා]

ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායිකාව විදියට ඒ අවස්ථාවේ කෙලින් ස්ථාවරයේ හිටියා. ඔබතුමන්ලා එදා 1987 ජුලි 29 වැනිදා ඉන්දු - ලංකා ගිවිසුමට විරුද්ධව කොටුවේ බෝගහ ඉදිරිපිට සත්‍යග්‍රහයට වාඩි වුණා. බොහෝ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ මන්ත්‍රීවරුත්. හැබැයි, එහෙම වාඩිවුණු අය අවුරුදු හතරක් පහක් යන කොට චන්ද්‍රිකා නෝනා ඇවිල්ලා, තව පොඩි පොඩි පක්ෂ ටිකක් එකතු කර ගෙන පොදු පෙරමුණ හදලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ස්ථාවරය වෙනස් කළා. දැන් ගිහිල්ලා තියෙනවා, බලය බෙදලා 13 න් එහාට යන ස්ථාවරයට. මේක තමුන්නාන්සේ පිළිගන්න. අපේ රට අවසන් වතාවටත් ආක්‍රමණය කළේ ඉන්දියාව. ගම්මන්පිල ගරු ඇමතිතුමා කිව්වා. ඇත්ත. අපේ ගුවන් සීමාව ආක්‍රමණය කළා. පරිප්පු දැම්මා. මුහුදු සීමාව ආක්‍රමණය කළා. බලහත්කාරයෙන් ඉන්දු - ලංකා ගිවිසුම අත්සන් කෙරෙව්වා. ඒ විතරක් නොවෙයි. ඉන්දියන් හමුදාවත් එව්වා. හරිනම් අපේ රටේ පාසල් පොත්වල ලියැවෙන්න ඕනෑ, කවුද අපේ රට අවසන් වරට ආක්‍රමණය කළේ කියලා ඇහුවොත් එහෙම, ඉන්දියාව කියලා කියන්න ලියා තිබෙන්න ඕනෑ. 1987 ඉන්දියානු ආක්‍රමණය. ඒකට එරෙහි වෙන්න ඕනෑ. හැබැයි, බලන්න කෝ? දැන් ආණ්ඩුව ඉන්දියාව ගැන විවිධ ප්‍රකාශ කරනවා. ගරු සභාපතිතුමනි, අපේ රටේ ඉතිහාසයේ ආක්‍රමණ ගොඩාක් තියෙනවා.

ඔබතුමා දන්නවා ක්‍රි. පූ. 236 සේන ගුත්තික අපේ රට ආක්‍රමණය කළා. එතැන් සිට ඉන්දියාව විතරක් නොවෙයි, චෝළ, පාණ්ඩ්‍ය වාගේ අධිරාජ්‍යයන් විතරක් නොවෙයි, පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රීසීන් අපේ රට ආක්‍රමණය කළා. 1987 ඉන්දියාව නැවත වතාවක් අපේ රට ආක්‍රමණය කළා. හැබැයි, අපේ රටේ කිසිම පාලකයෙක් ආක්‍රමණික හමුදාවක් වෙනුවෙන් ලංකාවේ ස්මාරක හදලා තියෙනවාද? නැහැ. සේන ගුත්තික රට ආක්‍රමණය කළා කියලා, කාලිංග මාඝ රට ආක්‍රමණය කළා කියලා, රාජ රාජ රාජේන්ද්‍ර රට ආක්‍රමණය කළා කියලා ඒ හිටපු රජවරු කවුරුත් ආක්‍රමණිකයාගේ පිළි රූ හැදුවේ නැහැ. එහෙම හැදුවා නම්, හැදුවේ සුද්දාගේ කාලයේ. ඇයි? සුද්දගේ ආණ්ඩුව. ඔවුන්ගේ ආණ්ඩුවෙන් ඔවුන්ගේ ආක්‍රමණිකයන් ගෞරවයට ලක් කරන්න නායකයන්ගේ පිළි රූ හැදුවා. ටොරිංටන් එක දැම්මා. දැන් බලන්න කෝ? ඉන්දියාව අපේ රට ආක්‍රමණය කළා. ඉන්දියානු හමුදාව එව්වා. දැන් මේ මහා දේශප්‍රේමී ආණ්ඩුව. මහින්ද රාජපක්ෂ මහත්තයාගේ ආණ්ඩුව. ගිහිල්ලා බලන්න. බත්තරමුල්ල, පැලවත්තේ ජනකලා කේන්ද්‍රය ළඟ. දැන් මේ ජනකලා කේන්ද්‍රය අයිති කාටද? විරවංශ ඇමතිතුමාගේ නියෝජ්‍ය ඇමතිතුමාගේ අමාත්‍යාංශය ඉදිරිපිට. කුඩා කර්මාන්ත

අමාත්‍යාංශය. වීරකුමාර දිසානායක. ඔන්න ඉස්සරහ හදලා තියෙනවා.

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔබතුමන්ලාගේ පැත්තෙනේ හිටියේ.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ඇත්ත. ඒක නිසා තමයි එලෙව්වේ. එතැන හදලා තියෙනවා, ඉන්දියානු ආක්‍රමණික හමුදාව වෙනුවෙන් ස්මාරකයක්. ඔන්න බලන්න. ආක්‍රමණික ඉන්දියානු හමුදාව වෙනුවෙන් මේ ආණ්ඩුව අපේ රටේ ස්මාරක හදලා තියෙනවා. ඉන්දියාව ඉස්සරහ දණ ගහලා තියෙන්නේ. එදා ජේ.ආර් ජයවර්ධන මහත්තයා, එතුමත් ඇහුවේ ඒක තමයි. අපි දන්නවා, සාමාන්‍යයෙන් අපේ රටේ හිටපු අනෙක් ජනාධිපති ආර්යාවන් වාගේ නොවෙයි. කවුද? හෙලේනා විජයවර්ධන මැතිනිය. ජේ.ආර්. ජයවර්ධන මහත්තයාගේ නෝනා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

වැරදියි. වැරදියි.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

දන්නේ නැති ඒවා කියන්න එපා. දන්න ඒවා කියන්න කෝ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔහොම නතර වෙන්න පොඩ්ඩක්. එක මන්ත්‍රී කෙනෙක් විතරක් පැහැදිලි කරන්න. ඔබතුමාට උදව්වක්. උඩවත්ත මන්ත්‍රීතුමා නම කියන්න.

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

රූපසිංහ මැතිනිය.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

එලීනා ජයවර්ධන. රූපසිංහ පිය වාසගම.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

එලීනා ජයවර්ධන මැතිනිය. සාමාන්‍යයෙන් අනෙක් ආර්යාවන් වාගේ නොවෙයි. වැඩිය ප්‍රසිද්ධියට ආවේ නැහැ. හැබැයි, ඉන්දු - ලංකා ගිවිසුම අත්සන් කරලා රටේ ආණ්ඩුව අස්ථාවර වේය කියලා, හිතලා එතුමිය ඩික්සිත් මහත්තයාගෙන් අහනවා, මේ ගිවිසුම අත්සන් කරලා ආණ්ඩුව වැටෙන්න ගියොත් එහෙම ඉන්දියාව මොකක්ද කරන්නේ කියලා. ගාලු මුවදොර ආසන්න මුහුදේ ඉන්දියානු යුධ නෞකා නතර කරලා තමයි ගිවිසුම අත්සන් කළේ. හරි නම්, අපි ඒ ඉන්දියානු ආක්‍රමණයට එරෙහිව වැඩ කරන ආණ්ඩුවක් නම්, දැන් මොකද කරන්න ඕනෑ? ඒ ආක්‍රමණයට නායකත්වය දීපු රජීව් ගාන්ධිට ගහපු නාවික භටයා රෝහණ විජිතමුණි. ඔහු පාවිච්චි කරපු තුවක්කුව අපේ කෞතුකාගාරයේ තියන්න ඕනෑ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඒකේ තියල නැත්තේ හොරකම් කරන හින්දා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

හොරකම් නොකරන කෞතුකාගාරයක වටිනා කෞතුක භාණ්ඩයක් විදියට තියන්න ඕනෑ. එහෙම නොවෙයි දැන්. යටවෙලා තියෙන්නේ. ඉන්දියාවට දණ ගහලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අවුරුදු තිහක යුද්ධයෙන් පස්සේ ගත වුණු අවුරුදු හතරෙදි ආණ්ඩුව කළ යුතු දේවල් ටිකක් තිබුණා. උතුරු නැගෙනහිර වෙනුවෙන් ආණ්ඩුව කරන්න ඕනෑ දේවල් ටිකක් තිබුණා. විශේෂයෙන් උතුරේ ජනතාව වෙනුවෙන්. ඒ දේවල් කළේ නැහැ.

දැන් බලන්න නිකම් එල්.ටී.ටී.ඊ එකක් බිහි වෙන්නේ නැහැ. එල්ටීටීඊ එක බිහිවෙන්න අවශ්‍ය පසුබිම නිර්මාණය වෙලා තිබුණා. ඒ ජනතාවට ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් දුන්නේ නැහැ. ඒ ජනතාවගේ අයිතිවාසිකම් අහිමි කළා. ඒ නිසා එල්.ටී.ටී.ඊ වාගේ පැසිස්ට් සංවිධානයකට පුළුවන්කම ලැබුණා, උඹලට කොළඹ ආණ්ඩුව සලකන්නේ නැහැ. උඹලට වෙනම ආණ්ඩුවක් ඕනෑ කියන මතය දෙමළ ජනතාවට ඒත්තු ගන්වන්න. ඒකෙන් තමයි අවුරුදු තිහක් හතළිහක් තිස්සේ වෙල්වනායගම්ලා, පොන්නම්බලම්ලා ගෙනාපු මතය තමයි එල්.ටී.ටී.ඊ ය තමන්ගේ සන්නද්ධ ව්‍යාපාරය සඳහා පාවිච්චි කළේ. හැබැයි, යුද්ධයෙන් පස්සේ ඒ දෙමළ ජනතාවට හැඟීමක් ඇති කළාද ආණ්ඩුව, ඒ ජනතාවත් මේ රටේ පුරවැසියෝ කියලා. නැහැ. ඒ ජනතාව අවතැන් කඳවුරුවල ගාල් කරලා තිබෙද්දි, වලිකාමම්වල විතරක් අක්කර හයදහස් තුන්සිය අසූ එකක් ආණ්ඩුව බලහත්කාරයෙන් පවරා ගත්තා. ජනතාව අවතැන් කඳවුරුවල. ආණ්ඩුව අක්කර හයදහස් තුන්සිය අසූ එකක් බලහත්කාරයෙන් ගන්නවා. ඒ ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදය අහිමි කළා. උදයන් පත්තරයට කී වතාවක් ගැහුවාද?

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

තමුන්නාන්සේලා නේ ගැහුවේ උදයන් පත්තරේට.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

අපි දෙමළ ජාතික සන්ධානයේ දේශපාලනය පිළිගන්නේ නැහැ.

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

තමුන්නාන්සේලා තමයි ගැහුවේ උදයන් පත්තරේට. ඒ කාලේ පළාත් සභා ගෙනෙද්දිත් මිනිස්සු මැරුවේ තමුන්නාන්සේලා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

අපි දෙමළ ජාතික සන්ධානයේ දේශපාලනය පිළගන්නේ නැහැ. හැබැයි, ඒගොල්ලන්ට දේශපාලනය කිරීම සඳහා උතුරේ අයිතියක් තිබෙනවා. කිළිනොච්චියේ රැස්වීම් තියන කොට ගැහුවා. අපේ සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා -

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක**
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

දේශපාලනය කිරිමේ අයිතිය 1987 පිළිනොගත්තේ ඇයි? 1987 අනෙක් පක්ෂවලට තියෙන දේශපාලන අයිතිය පිළි නොගත්තේ ඇයි? අපේ 117 ක් මරලා දැම්මේ ඒ දේශපාලන අයිතිය රකින්නද?

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

එදා පළාත් සභාවලට පක්ෂ වෙලා - පළාත් සභා ක්‍රියාත්මක කරන්න -

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

රජයේ දේපළ නැති කරපු එවුන්නේ?

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

පළාත් සභා කියාත්මක කරන්න ඉන්දු ලංකා ගිවිසුමට පක්ෂව එදා හිටපු ආණ්ඩුවෙන් ආයුධ අරගෙන පොඩි පොඩි කල්ලි හදා ගෙන විප්ලවකාරි රථ හමුදා කියලා ප්‍රා කල්ලි හදා ගෙන මිනී මරපු උදවිය. අද මොකද කරන්නේ? අරලියගහ මන්දිරයෙන් -

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

කවුද දන්නේ නැහැ?

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

අරලියගහ මන්දිරයෙන් එන කොට ලියවිල්ල, ඒකට අත උස්සනවා. හෘදය සාක්ෂිය පැත්තක - මම කියමින් හිටියේ, උතුරේ ජනතාවට දෙන්න ඕනෑ අයිතිවාසිකම් දුන්නේ නැහැ. ප්‍රජාතන්ත්‍රවාදය කප්පාදු කළා. අපේ සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා එහේ රැස්වීමක් තියන්න ගියාට පස්සේ ගැහුවා. ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රමානුකූලව අහිමි කර ගෙන ගියා. (බාධා කිරීම්) ආණ්ඩුව එල්ටීටීඊ එකේ නායකයෝ, කේ.පී. වෙන්න පුළුවන්. දයා මාස්ටර් වෙන්න පුළුවන්. තමලිනී වෙන්න පුළුවන්. මේ අයට සුර සැප දෙද්දි දයා මාස්ටර්ගේ අත්සන සහිත හැඳුනුම්පත තියා ගෙන හිටපු අවුරුදු දහඅට විස්ස දෙමළ තරුණයෝ බන්ධනාගාර ඇතුලේ. නිදහස දෙන්නේ නැහැ. හින්දු කෝවිල් ඩෝසර් කරනවා. මේ තත්ත්වය යටතේ තමයි දැන් -

[සභාවේ ඝෝෂා]

1970 ඉඳන් 1977 වෙන කල් ආණ්ඩු කරලා, 77 මැතිවරණයේදී කීයක් ගත්තාද? 70 ඉඳන් 77 වෙන කල් ආණ්ඩු කරලා 168 න් ගත්තේ හයයි. ඒ නිසා ඒවා ගැන කථා කරන්න එපා.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

2009 දි හම්බ වුණු තුන ආරක්ෂා කර ගන්න බැරිව ගියා.

[සභාවේ ඝෝෂා]

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ඒ නිසා -

[සභාවේ ඝෝෂා]

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ වාගේ ඇමතිලා නේ පළාත් සභාවේ ඉන්නේ.

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ඇමතිතුමා වාඩි වෙන්න.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

අපට -

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

[සභාවේ ඝෝෂා]

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

අන්න -

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

නැගිට්ටා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

බස්නාහිර පළාත් සභාවේ -

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

අන්න -

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

නැගිට්ටා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

අයියෝ, වාඩිවෙන්න වාඩිවෙන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ඇමතිතුමා වාඩි වෙන්න.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

අපට කථා කරන්න -

[සභාවේ සෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සරත් පතිරණ මන්ත්‍රීතුමා පොඩ්ඩක් මේක අහන්න. මම එකක් කියන්න ඕනෑ.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා මම කියන එක අහන්න.

[සභාවේ සෝෂා]

ගරු ඇමතිතුමා මම කියන එක පොඩ්ඩක් අහන්න. දැන් මම අහගෙන හිටියා ඉතාම අවධානයෙන්. මට පුළුවන් නිශ්ශබ්ද කරන්න. කථික මන්ත්‍රීතුමා උවමනාවෙන් ප්‍රතිපක්ෂයට අභියෝග කරන හැටි මම බලාගෙන ඉඳලා තියෙනවා, අත්දැකීමක් හැටියට. ගන්නවද කියලා ඇහුවා. කීයද කියලා ඇහුවා. ගාණ කීයද කියලා නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා ඇහුවා. ඉතින් අරහෙන් අහනවා දෙන්නද කියලා. ඉතින් මේ කැඳවීම කර ගත්තේ එතුමා. මේ ආරවුල ඇති කර ගත්තේ එතුමා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

මොන ගාණද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා මට කියන්න දැන් මම මොකද කරන්නේ? මම මූලාසනයේ ඉඳගෙන හොඳට බලාගෙන ඉන්නවා. මම සහෝදර සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමාට කියන්න ඕනෑ. මන්ත්‍රීතුමා, මෙතුමා දෙන්නද අහනවා. ගාණ කීයද අහනවා. අරහෙන් තුනක් දෙන්නද අහනවා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

මම අභියෝග කළේ නැහැ. මේගොල්ලන්ට අභියෝග කරලා වැඩක් නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සෝෂාව මෝරන කොට මූලාසනයට නැඹුරු වෙනවා. ඔබතුමා විතරක් නොවෙයි ගරු මන්ත්‍රීතුමන්ලා සියලු දෙනා මේ සෝෂාව කැඳවලා සෝෂාව මෝරන කොට මූලාසනයේ පිහිට පතන්න එපා. මේ රීතිය පිළිපදින්න. ඔබතුමා කථා කරන්න.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් වෙනස් මත තියෙනවා නම්, ඒ වෙනස් මත ඉදිරිපත් කිරීමේදී ඒක අහගෙන ඉන්න සදාචාරයක් තියෙන්න ඕනෑ. දැන් රට දැනගන්න ඕනෑ බස්නාහිර පළාත් සභාවේ ඉන්නේ මේ වාගේ -

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

ඇමතිවරුද කියලා. ජනතාව කීයටවත් මේකට දශමයක්වත් ඉස්සරහට යන්න ඉඩ දෙන්නේ නැහැ.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

දිස්ත්‍රික්කය බලා ගන්න. තමුන්නාන්සේ ඔට්ටුවක් දානවාද? ඇමතිකමට.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

මේ වාගේ - මොනවද මේ?

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

තමුන්නාන්සේ බොරුවට දෙමළ ජනතාව වෙනුවෙන් කහිනවා. තමුන්නාන්සේ ජනතාවට ආදරේ නම් තමුන්නාන්සේලා බස් ගිනි තියනවාද?

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

තමුන්නාන්සේ -

[සභාවේ ඝෝෂා]

දැන් මමද ගරු සභාපතිතුමනි?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ඇමතිතුමා වාඩි වෙන්න. සංවිධායකතුමා කරුණාකරලා වාඩි වෙන්න. නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා මගේ කථික ලැයිස්තුවේ තව ගොඩාක් නම් තියෙනවා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ඒක හරි. මට බාධා කරන්නේ කවුද? වැඩිපුරම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි -

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමා කථා කළාට පස්සේ මම කථා කළාද?

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

මොන රීතියෙන්ද කථා කරන්නේ?

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

මේ වාගේ -

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

නිසා තමයි පළාත් සභාව අහෝසි කරන්න කියලා මිනිස්සු කියන්නේ.

[සභාවේ ඝෝෂා]

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

ඔය ඉන්නේ -

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

මේ?

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඇමතිතුමා වාඩි වෙන්න. කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ඉස්සෙල්ලා -

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇයි මෙතුමාට තරහා යන්නේ? එතුමා අදහස් ප්‍රකාශ කළා. මම අදහස් -

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

එහෙම කොහොමද?

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

තමුන්නාන්සේට ඇයි තරහ යන්නේ? ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බලය නැතුව මෙහෙම නම් බලය තිබ්බා නම් කොහොමද?

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා ඔබතුමා තාවකාලිකව වාඩි වෙන්න. ඔබතුමා වාඩි වෙන්න. මම ඉතාම ස්තුතිවන්ත වෙනවා මූලාසනයට කීකරු වීම ගැන. ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමාට කථා කරන්න අවස්ථාව තියෙනවා. ගරු ඇමතිතුමා බාධා කරන්න එපා. රීති විරෝධී කථාවන් ටික ලේකම්තුමනි හැන්සාඩ් එකෙන් ඉවත් කරන්න ඕනෑ. දෙකම ඉවත් කරන්න ඕනෑ. ඔබතුමාට තව විනාඩි තුනක විතර කාලයක් තමයි මූලාසනයට දෙන්න පුළුවන්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඇත්ත කථා අයින් කරන්න එපා නියෝජ්‍ය සභාපතිතුමනි. .

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

එතුමාට කථා කරලා අවසන් කරන්න ඉඩ දෙන්න. ඒක එතුමාගේ අයිතිය.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ පළාත් සභා ක්‍රමය මේ රටේ ප්‍රශ්න විසඳන්න උත්තරයක් නොවෙයි කියන පදනමෙන් තමයි අපි මේකට විරුද්ධ වන්නේ. ඒ නිසා මේක අහෝසි කරනවා නම්, මේ එක එක දත් ගලවන්න නොවෙයි. මුළුමනින්ම අහෝසි කළ යුතුයි. දැන් බලන්න. මේ යෝජනාවේ හරය. පළමුවැනි යෝජනාවේ තියෙන්නේ මොකක්ද? පළාත් සභා පිහිටුවීමේ මූලික අරමුණ ඉටු නොවන බැවින් ඒක ඒකාබද්ධ කිරීමෙන් අයින් කරන්න ඕනෑය කියලා. උතුරයි නැගෙනහිරයි පළාත් සභා ජේ.ආර්. ජයවර්ධන මහත්තයා ඒකාබද්ධ කළේ, ඉන්දියාවේ වුවමනාවට. මේ බලය බෙදීමේ අරමුණට එකහඳ නැද්ද කියන කාරණාව මත නොවෙයි. ඒ උතුර - නැගෙනහිර තමයි දෙමළ ඊළමේ නිජබිම. එහෙම නැත්නම් ඓතිහාසික වාසභූමි කියලා හැඳින්වූයේ උතුර නැගෙනහිර. ඒ දෙක ඒකාබද්ධ කරන එක තමයි. නැත්නම් මේ බස්නාහිරයි සබරගමුවයි හරි, ඌවයි දකුණයි හරි ඒකාබද්ධ කරන්න අදහසක් තිබුණේ නැහැ. එදා ඒ දෙක එකතු කළේම ඒ නිජ බිම් සංකල්පය සාක්ෂාත් කරන්න. ඒ නිසා මේ තුළින් පළාත් සභා පිහිටුවීමේ මූලික අරමුණ ඉටු නොවන බැවින් - ඒක පට්ටපල් බොරුවක්. එහෙම නොවෙයි. අපි අධිකරණයට ගිහිල්ලා උතුරයි නැගෙනහිරයි වෙන්කරලා දුන්නේ ඇයි? ඒකෙන් එක පැත්තකින් ගත්තොත් එහෙම ඊළම සඳහා යන ගමනට ලොකු ප්‍රහාරයක් එල්ල කරන්න ඕනෑ නිසා. ඒ නිසා තමයි ඊයේ දිවයින කතුවැකියේ සඳහන් කරන්නේ *"13 වැනි ව්‍යවස්ථා සංශෝධනය මගින් එක පළාතක් පමණක් නොව, එක රටක් බවට පත්වීමට ඉඩ සලසමින් එකට එකතු කරන ලද උතුර හා නැගෙනහිර විසි අවුරුද්දකට පසු යළිත් දෙපළාතක් බවට පත් වන්නේ, ජනතා විමුක්ති පෙරමුණට පිංසිදු වන්නටය. ඔවුහු ඒ සඳහා උසාවි ගොස් නඩු කියා නියෝගයක් ලබා ගත්හ."* මේක මේ අද නොවෙයි, එදා කළ යුතු මොහොතෙදි අපි ඒක කළා. එහෙම නැත්නම් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ දෙක වෙන් කළේ නැත්නම් එහෙම, නැගෙනහිර ඡන්දෙ තියන්න හම්බ වෙන්නේත් නැහැ. ඒ නිසා දැන් මේ පළාත් සභා අර ගාමිණී තිලකසිරි ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ ඇත්ත සුදු අලියෙක් බවට පත් වෙලා තිබෙනවා. සුදු අලියෙක් විතරක් නොවෙයි. දැන් කවුරු හරි කියනවා නම් මේ පළාත් සභාවලින් මන්ත්‍රීවරු පුහුණු කරනවා කියලා. අපි යවනවා නම් ඉස්සෙල්ලා යවන්නේ, ඇමතිකම් දරන අය නේ? දැන් මේ වාගේ අය ද පාර්ලිමේන්තු යවන්න හදන්නේ? අඩු ගානේ පළාත් සභාවේ විනයක් සදාචාරයක් තියාගන්න බැරි උදවිය පාර්ලිමේන්තුවට යවලා රට පාලනය කරන්නද හදන්නේ. ඒ නිසා මේකෙන් එහෙම මොකක්වත් වෙන්නේ නැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා කථාව අවසන් කරන්න.

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි -

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ආණ්ඩුව -

[සභාවේ ඝෝෂා]

ඒ කැල්ල විතරක් - එහෙම නොවෙයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා කථාව අවසන් කරන්න

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ආණ්ඩුව උතුරේ ඡන්දෙ ගෙනාවේත් අවංක ඇත්ත අදහසකින් නොවෙයි. නොවැම්බර් මාසයේ මේ රටේ පැවැත්වෙන පොදු රාජ්‍ය මණ්ඩලීය නායක සමුළුවට ලෝකේ නායකයෝ ගෙන්න ගන්න ඉන්දියාවට දීපු පොරොන්දුවක්. ඒ පොරොන්දුව ඉෂ්ට කරන්නයි උතුරු පළාත් සභා ඡන්දය ප්‍රකාශයට පත් කළේ. ඒ නිසා මේ විධියට සෙල්ලම් කරලා උතුරෙයි නැගෙනහිරයි ජනතාව රවට්ටන්නේ නැතුව - පළාත් සභාව විසඳුමක් නොවෙයි. ඒ නිසා මේක අහෝසි කරන්න කියන යෝජනාව තමයි අපි කරන්නේ.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමාගේ කථාව අතරතුර මේ සභාවේ අදහස් හුවමාරු වෙද්දි සරත් පතිරණ මන්ත්‍රීතුමාගෙන් ප්‍රකාශයක් නිකුත් වුණා, අපි නැවත මරණවා කියලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ගරු මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව සැලකිල්ලට ගන්න සිද්ධ වෙනවා. මෙතුමා මේ සභාවේ පැහැදිලිව ප්‍රකාශක කළා නැවත මරණවා කියලා. ගරු සභාපතිතුමනි, ඒ නිසා මේ පිළිබඳව දැඩි අවධානය යොමු කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමාගේ ඒ ප්‍රකාශය හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කිරීමට නියෝග කරනවා.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරලා හරියන්නේ නැහැ. එතුමා තර්ජනයක් කළේ. මේ සභාවේ මන්ත්‍රීවරුන්ට තර්ජනයක් කළේ. හැන්සාඩ් එකෙන් ඉවත් කරලා හරියන්නේ නැහැ. ඒක බරපතල ප්‍රකාශයක්. අපි 89 බොහොම අමාරුවෙන් බේරුනේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා වාඩිවෙන්න. ඇමතිතුමාට කථා කරන්න ඉඩ දෙන්න.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමා හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න කිව්වා නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා කරපු ප්‍රකාශයත්, මම කරපු ප්‍රකාශයත්. නමුත් පිටිපස්සේ ඉඳලා සරත් පතිරණ මන්ත්‍රීතුමා දිගින් දිගටම කිව්වා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒක මට ඇහුනේ නැහැ ගරු ඇමතිතුමා.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

සරත් පතිරණ මන්ත්‍රීතුමා ඇඟිල්ල දික් කරලා දිගින් දිගටම මරණවයි කියලා අභියෝග කළා. ඒ නිසා තමයි මම කිව්වේ, මිනීමරුවා කියලා. ඉතින් ඒක තමයි එතුමා කියන්නේ කරුණාකරලා ඒ වචනය අයින් කරගන්න කියලා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මම කනගාටු වෙනවා. මූලාසනය හැටියටත්, සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමා වාගේ අත්දැකීම් බහුල මන්ත්‍රීතුමෙක් මෙවැනි ප්‍රකාශයක් හැඟීම්බරව - මම ඉල්ලීමක් කරනවා. වැරදීමකින් හරි සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමා අතින් එවැන්නක් වුණා නම් ඔබතුමා කරුණාකරලා ඒක ඉවත් කරගන්න. අපි මේ සභාවේ සහෝදර මන්ත්‍රීතුමන්ලා.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

- ඉල්ලා අස්කර ගන්න -

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම කථා කරගෙන-

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා අසුන් ගන්න.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ඒ කෑල්ල විතරක් - එහෙම නොවෙයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා අසුන් ගන්න.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

තමුන්නාන්සේට පිටි පස්සට ඇස් තියෙනවාද? දැන් මෙතුමාලා කථා කරන කොට අප අහගෙන හිටියා නේ?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඇමතිතුමා අසුන් ගන්න. ගරු ඇමතිතුමා, මම මේ කාරණාව සභා කටයුතු කාරක සභාවට යොමු කරනවා. මීළඟට මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

[ අ.භා. 02.15 ]

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු නියොජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා ගරු ප්‍රධාන අමාත්‍යතුමා කරපු යෝජනාවට අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාව සලසා දීම ගැන. විශේෂයෙන්ම, අද මේ යෝජනාවට අදහස් ප්‍රකාශ කරන්න සිද්ධ වෙන්නේ, වර්තමාන දේශපාලන පසුබිම ගැන තියෙන සතුටකින් වාගේම, යම්

කනගාටුවකුත් එකතු වෙලයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි සතුටු වෙන කාරණය තමයි, ඉතිහාසය විසින් මේ රටේ සියලු දේශපාලන පක්ෂවලට ඒ වාගේම මේ රටේ දේශපාලනඥයන්ට බල කර තිබෙනවා. නැවත වතාවක් මේ රට යුද්ධයකට ඇදී යන පරිසරය නිමා කරලා දාලා මේ රටේ දීර්ඝකාලීන සාමයක් ඇති කිරීම සඳහා කටයුතු කරන්න කියන බලකිරීම අද ලාංකීය දේශපාලන පරිසරය තුළ තියෙනවා. ඒ නිසා තමයි, පළාත් සභාව ශක්තිමත් කරමින් මේ රටේ අවුරුදු ගණනාවක් තිස්සේ දෙමළ අයිතිවාසිකම් සටන විධියට දේශපාලන බලයේ හවුල්කාරිත්වයට මේ රටේ දෙමළ ජනතාව ඉල්ලපු අයිතිය තහවුරු කරලා දෙන ක්‍රියා මාර්ගයකට ගිහිල්ලා තියෙන්නේ. අද අතිගරු ජනාධිපතිතුමා ගැසට් නිවේදනය අත්සන් කරලා තියෙනවා. 1987 ඉන්දු ලංකා ගිවිසුමට අනුව පළාත් සභා පිහිටුවද්දි එහි මූලික අරමුණ බවට පත් වුණේ, උතුරට පළාත් සභාවක් පිහිටුවන්න. උතුරේ පළාත් සභා පිහිටුවීමේ මැතිවරණය ක්‍රියාත්මක කිරීම සඳහා අද ගැසට් නිවේදනය අත්සන් කරලා තියෙනවා. ඒක මම හිතන්නේ, මේ රටේ ජාතික සමගිය වෙනුවෙන් කටයුතු කරන මේ රටේ නැවත වතාවක් බෝම්බ, වෙනත් බේදවාචක නිර්මාණය නොවීම බලපොරොත්තු වන සමස්ත ජනතාව ලබපු ජයග්‍රහණයක් විධියට තමයි අපි දකින්නේ.

ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි සඳහන් කරන්න ඕනෑ, මේ යෝජනාව ඉදිරිපත් වෙද්දි නැවත වතාවක් ඒක ඇතුලේ සඳහන් වෙලා තියෙනවා, උතුරේ ජනතාවට වාගේම දකුණේ ජනතාවටත් පළාත් සභාව විධියට තමන්ගේ බලඅධිකාරිවලට තමන්ට ස්වාධීනව තීන්දු ගන්න තියෙන ඉඩකඩත් අහුරා දැමීමේ ඉඩකඩක් තහවුරු වෙලා තියෙනවා. ඒ නිසා තමයි අපට තියෙන කනගාටුව. ඒ කාරණයත් ඇතුළත් කරලා තමයි මේ යෝජනාව මේ සභාවට ඇවිල්ලා තියෙන්නේ. ඒ කාරණය අපි මුලින්ම සඳහන් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද මේ සභාවේ කථා කරගෙන යද්දි අපි සතුටුවන ඊළඟ කාරණය තමයි, 1988 පළාත් සභා ක්‍රමය මේ රටේ බිහි වෙන කොට අපි දන්නවා, පළාත් සභා ක්‍රමය බිහිවීම වැළැක්වූයේ, කවුද කියලා. එදා ජනතා විමුක්ති පෙරමුණ තමයි මිනීමරලා, වෙඩි තියලා, බෝම්බ ගහලා පළාත් සභා ක්‍රමය බිහි වෙන එක, බලය බෙදීමේ බල ව්‍යුහයන් නිර්මාණය වෙන එක වළක්වාලීමට කටයුතු කළේ. ඒ ජනතා විමුක්ති පෙරමුණේ මේ පළාත් සභාවේ වැඩිම මන්ත්‍රීවරු සංඛ්‍යාවක් නියෝජනය කරන කාලසීමාවේ ඒ කණ්ඩායමට නායකත්වය දීපු නායකයා, අද මේ සභාව ඇතුලේ කරපු කථාවත් එක්ක අපි බරපතළ සතුටක් ලබනවා. ඔවුන් මාක්ස්වාදී දෘෂ්ටියට අනුව ජාතින් අතර සමගිය තහවුරු කරන දේශපාලන මාක්ස්වාදී දෘෂ්ටිය තේරුම් අරන් අද සභාවේ හැසිරීම ගැන අපි ඉතාම සතුටු වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මතක් කරන්න සතුටුයි. නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා නැවත වතාවක් අති ජාතිවාදයක් නිර්මාණය කරන කථාවක් මේ සභාවේ කළා. අපි ඉතාම කනගාටු වෙනවා, ඒ පිළිබඳව. මම මේ සභාවේ සියලු ගරු මන්ත්‍රීවරුන්ට මතක් කරලා දෙනවා. අද රෑට තමන්ගේ ගෙදරට ගියාට පස්සේ තමන්ගේ ගෙදර තියෙන පරිගණකය ක්‍රියාත්මක කරලා ඒකෙ You tube එකට යන්න. You tube එකට ගිහිල්ලා බලන්න. ඒකේ තියෙනවා සජීවී හඬපටයක්. 1982 ජනාධිපතිවරණයට ඉදිරිපත් වුණු රෝහණ විජේවීර මැතිතුමා මැතිවරණ ව්‍යාපාරය සඳහා යාපනයට යනවා. යාපනයේ මැතිවරණ ව්‍යාපාරයේදී ඔහු මැතිවරණ කථාව කරන්න පටන් ගන්න කොට උපතිස්ස ගමනායක මැතිතුමා ඉන්නවා විජේවීර මැතිතුමාගේ පිටිපස්සෙන්. දෙමළ මිනිස්සු ගල්වලින් ගහනවා වේදිකාවට. මේ ගලක් වදින්නේ රෝහණ විජේවීර මැතිතුමාගේ නාහය මුදුනට. නාහයෙන් ලේ ගලාගෙන වැටෙනවා. නාහයෙන් ලේ ගලාගෙන වැටෙද්දි රෝහණ විජේවීර මැතිතුමා කියනවා, මේ ගල් පාර අපි භාර ගන්නවා. ජාතීන්ගේ ස්වයං නිර්ණය අයිතිය අපි පිළිගන්නවා. ලෙනින්වාදී විසඳුම ජාතික සමගිය සඳහා ජාතීන්ගේ ස්වයං නිර්ණ අයිතිය පිළිගැනීමයි. ඒ පණිවිඩය අරන් තමයි අපි යාපනයට ආවේ කියලා රෝහණ විජේවීර කියනවා. මේක සජීවී හඬපටියක්. අද රෑට ගෙදර ඉඳන් බලන්න පුළුවන් මේ රටේ ජනතාවට. විජේවීර 1982 දී කියන්නේ ජාතීන්ගේ ස්වයං නිර්ණය අයිතිය පිළිගන්නවා කියලා. ලේ පෙරා ගෙන, ලේ පෙරී පෙරී වැටෙද්දී, මේ ගල් පාර භාර ගන්නවා කියලා එතුමා කියනවා. ඒ නිසා අපට කියන්න පුළුවන්ද මේ නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ, අපි ඉතිහාසයේ කවදාවත් ජාතීන්ගේ ස්වයං නිර්ණය අයිතිය පිළිගත්තේ නැති දේශපාලන පක්ෂයක් කියලා. ඒ නිසා පට්ටපල් බොරු කියලා, මේ රටේ ජනතාව රවට්ටලා නැවත වතාවක් ජාතිවාදය මේ රට තුළ අවුස්සන්න එපාය කියන කාරණයත් මතක් කරලා දෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රටක ජාතීන් අසමගි කිරීම තරම් දේශපාලන කාලකණ්ණිකමක් තවත් ඇත්තේ නැහැ. ඒ වාගේම තමයි ජාතිවාදය පාවිච්චි කරලා තමන්ගේ ඡන්ද මල්ල පාවිච්චි කරන්න උත්සාහ කරනවා නම්, ඒ තරම් දේශපාලන කුහකකමක් තවත් දේශපාලන තලයක නැහැ. ඒ නිසා මේ ජාතීන් අසමගි කරලා, ජාතිවාදය අවුස්සලා තමන්ගේ ඡන්ද මල්ල වැඩි කර ගෙන, තමන්ගේ ඡන්ද ගොඩ වැඩි කර ගෙන මේ බල ව්‍යුහයන් අතරට රිංගන්න හදන උත්සාහය මෙතැනින් ඉස්සරහට ලාංකීය දේශපාලන තලය තුළ කරන්න එපාය කියන ඉල්ලීම තමයි අපි කරන්නේ. පළාත් සභා එපා කියපු හැමෝම ඒ වැරැද්ද කළා. පළාත් සභාවට තරග කළා. මර මර, පළාත් සභා එපා කියපු අය පළාත් සභාව ඇතුළට ආවා. ඒකේ විවිධ තනතුරු ගත්තා. තනතුරු දැරුවා, වරප්‍රසාද භුක්ති වින්දා. භුක්ති විඳිනවා. ඒ සියල්ල කරමින් කියනවා පළාත් සභාව එපා කියලා. අද අනෙක් පළාත් සභා දෙකේ මැතිවරණ තියෙන කොට මේ දේශපාලන පක්ෂවලට පළාත් සභා මැතිවරණයට යන්න පුළුවන්ද? පළාත් සභා මැතිවරණයට ගිහිල්ලා තමන්ට ඡන්දෙ ඉල්ලන්න පුළුවන්ද? එහෙම ඉල්ලන්න පුළුවන්කමක් නැහැ. ඒ වාගේම උතුරේ පළාත් සභාවකට ගිහිල්ලා මොකක්ද

[ ගරු මහේෂ් අල්මේදා ]

කියන්නේ? අපි අභියෝග කරනවා පුළුවන් නම් ඔය දේශපාලන පක්ෂවලට උතුරට ගිහිල්ලා මැතිවරණෙන් ඡන්ද දෙකක්, අරගෙන පෙන්නන්න කියලා. ඡන්ද දෙකක් අරගෙන පෙන්නන්න කියලා අපි අභියෝග කරනවා. ඒ නිසා අද ජාතික සමගිය ඇතිවෙමින් යන කාල වකවානුවක් තියෙන්නේ. අපි විශේෂයෙන්ම මතක් කරනවා. ලෝක දේශපාලන බල තුලනයන් තේරුම් ගන්න කියලා. ඉන්දීය සාධකය අමතක කරලා මේ රටට ඉස්සරහට යන්න පුළුවන්කමක් නැහැ. අපි දන්නවා. ඉන්දියාවට එරෙහිව කටයුතු කරන්න ගත්ත හැම වෙලාවේම ඉන්දියාවේ බලහත්කාරකම අපේ රටට විරුද්ධව ක්‍රියාත්මක වුණා කියලා. උදය ගම්මන්පිල ඇමතිතුමාම කිව්වා. ඉන්දු ලංකා ගිවිසුම, ගිවිසුමක් විධියට පිළිගන්නේ කොහොමද? ඒ ගිවිසුමේ කොන්දේසි ඉන්දියාව විසින් කඩලා බිඳලා දැම්මා කියලා. හැබැයි, අපට මොනවාද කරගන්න පුළුවන් වුණේ. රටක් විදියට අපට පුළුවන් වුණාද? ඉන්දියාවට විරුද්ධව අද වෙන කල් ජාත්‍යන්තරයේ හඬක් මතු කරගන්න. අපට පුළුවන්ද ඉන්දියාවට විරුද්ධව අපේ මිලිටරි බලය පාවිච්චි කරලා යම් ප්‍රහාරයක් එල්ල කරන්න. යම් බලකිරීමක් කරන්න. එහෙම කරන්න පුළුවන්කමක් නැහැ. දැවැන්ත රටක් අභිමුව තියෙන රටක් විධියට අපි මේ දේශපාලන බල තුලනය තේරුම් ගත්තේ නැත්නම් අපට ඉස්සරහට යන්න පුළුවන්කමක් නැහැ. අපි දන්නවා, එල්ටීටීඊ සංවිධානය ගොඩ නැගුවේ, කවුද කියලා. එල්.ටී.ටී.ඊ සංවිධානය පුහුණුව දුන්නේ, කවුද කියලා අපි දන්නවා. එල්.ටී.ටී.ඊ සංවිධානයට ආයුධ දුන්නේ කවුද කියලා අපි දන්නවා. එල්.ටී.ටී.ඊ ය පෝෂණය කළේ, මොන රටද කියලා අපි දන්නවා. ඒ නිසා අදත් ඉන්දියාවට ඉඩ කඩ තියෙනවා, මේ දේශපාලන හතුරුකම අපේ රටට කරන්න. ඒ නිසා ඒ දේශපාලන හතුරුකම කරන්න ඉඩ දීලා අපි මේ රටේ ජාතිවාදය උත්සන්න කරනවා නම්, රටට විරුද්ධව දැවැන්තම හතුරුකම කරන්නේ ඉන්දියාව නොවෙයි. මේ රට ඇතුළේ ඉන්න ජාතිවාදීන් කියලා අපි කියනවා.

ඒ නිසා ජාතිවාදය හැම වෙලාවේම රටට එරෙහිව කරන ද්‍රෝහිකමක් රට තුළ නිර්මාණය කරනවා. වරුණ දීප්ති රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා කිව්වේ ඒකයි. තව අවුරුදු දහයකින් තමයි අද මතුවන ජාතිවාදයේ ප්‍රතිඵල අපට භුක්ති විඳින්න සිද්ධ වෙන්නේ කියලා. අපි විශ්වාස කරනවා නම්, අපි ජාතිවාදය දකුණේ අවුස්සන කොට උතුරේ ජාතිවාදයක් නිර්මාණය වෙන්නේ නැහැයි කියලා. ඒක මුලාවක්. මෙහි ජාතිවාදය අවුස්සන කොට ඒ ජාතිවාදය එහෙම පිටින්ම උතුරෙත් මතු වෙන්න පුළුවන්. උතුරේ දෙමළ ජාතිවාදීන් තමන්ගේ උද්ඝෝෂණය පටන් ගන්නවා. ඒක වෛරයක් බවට පත් වෙනවා. අවසානයේ ඒක යුද්ධයක් වෙනවා. මහා ලේ වැගිරීම් සිද්ධ වෙනවා. නැවත බේදවාදකයක් මේ රට ඇතුළේ නිර්මාණය වෙනවා. ඒ නිසා එවැනි දේශපාලන කුහකකමක් මේ රටට නැවත වතාවක් කරන්න එපා කියන ඉල්ලීම තමයි අපි කරන්නේ. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ වෙලාවේ අපි සතුටු වෙනවා. පළාත් සභාව ශක්තිමත් කිරීම සඳහා පළාත් සභාව ඇතුළේ යෝජනාවක් නිර්මාණය වීම ගැන. ඒ වාගේම අපි නැවත වතාවක් කියනවා. පළාත් සභා බහුතරයකගේ බලයෙන් පළාත් සභාවට අදාළ නීති සම්මත කරන්න පුළුවන් කියන කාරණය පළාත් සභාවල බලය හකුලා තැබීමක්. උතුරේ පළාත් සභාවට විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. අපේ පළාත් සභාවටත් - ජාතික රාජ්‍යයටත් පුළුවන්කම තියෙනවා, අපි ක්‍රියාත්මක කරන සමගාමී ලැයිස්තුවේ බලයක් අහෝසි කරන්න පුළුවන් විධියට අනෙක් පළාත් සභා පහක එකඟතාවයෙන් අපේ පළාත් සභාව තුළ නීති අයින් කරන්න. ඒ නිසා මේ කාරණාවට අපට එකඟ වෙන්නට පුළුවන්කමක් නැහැයි කියන කාරණායත් මතක් කරමින් ඔබතුමාට ස්තූතිවන්ත වෙමින් නිහඬ වෙනවා.

[ අ.භා. 02.25 ]

**ගරු අශෝකා ලංකාතිලක**
**Hon. Asoka Lankathilaka**

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අවස්ථාවේදී මටත් මේ යෝජනාව වෙනුවෙන් කථා කරන්න අවස්ථාවක් සලසා දීම පිළිබඳව මම හුඟාක් ස්තූතිවන්ත වෙනවා. මේ සභාවේ වාඩි වෙලා ඉන්දැද්දි මන්ත්‍රීවරියක නොවුණත්, දේශපාලනය කරපු කාන්තාවක් හැටියට, මේ පළාත් සභා ක්‍රමය එන කොට ලංකාවේ තිබුණු පසුබිම ගැන මගේ මතකයේ තවම තියෙනවා. එදා තිබුණේ මහා කර්කශ පාලන ක්‍රමයක්. අපි ඒ පාලන ක්‍රමය තුළ විශාල දුක් වේදනාවලට මුහුණ දුන්නා. ඒ විතරක් නොවෙයි. යුද්ධය රෝපණය වෙමින් පැවතුණු යුගයක් මේක. මේ වාගේ යුගයක දකුණේ විතරක් නොවෙයි. උතුරෙත් නොයෙකුත් ගැටළු ඇතිවෙමින් තිබුණා. ඒ අවස්ථාවේදි මට මතකයි. උතුරේ ජනතාවගේ සියලු අයිතින් උදුරා ගන්නා තත්ත්වයක් මේ රටේ පැලපදියම් වෙලා තිබුණා. ඒ අයට අවංකව ඡන්දය දෙන්න පුළුවන්කමක් ඒ කාලය තුළ තිබුණේ නැහැ. එක මැතිවරණයකදී ඒ ඡන්දය දුන්න අයගේ ඡන්ද පෙට්ටි සුභාෂ් හෝටලයේ ඇඳ යටවල්වල තිබිලා හමුවුණු නිසා උතුරේ ජනතාව මේ රටේ පාලන ක්‍රමය ගැන විශ්වාසයක් නොතියන, ඡන්ද ක්‍රමය ගැන විශ්වාසයක් නොතියන තත්ත්වයට පත් වෙලා තිබුණා. ඒ නිසා ජාතිවාදය අවුස්සන්නට එදා තිබුණු රජය කටයුතු කළයි කියන එක මම අවංකවම ප්‍රකාශ කරනවා. එදා ඒ අයට අවංකව ඡන්දය දීලා ඒ අයගේ අයිතීන් ශක්තිමත් කරගන්නට පුළුවන්කම තිබුණා නම්, අද රටේ මේ වාගේ තත්ත්වයක් නිර්මාණය වන්නේ නැහැයි කියන එක අපි පරණ දේශපාලනය කරපු අය හැටියට මන්ත්‍රීවරියක් වශයෙන් නොහිටියත් දේශපාලනය කරපු අය හැටියට, අපට මතක් වෙනවා. උතුරේ ජනතාවගේ අයිතිය ගණන් ගත්තේ නැති නිසා ඒ අයට සාධාරණව දේශපාලනය කරන්න පුළුවන් පසුබිමක් නොතිබුණු නිසා, ඒ අයට සාධාරණව සර්වජන ඡනදය පාවිච්චි කරලා ඒ අයගේ කැමති අය තෝරාගන්න පුළුවන්කම නොතිබුණු නිසා, ඒ ගොල්ලන්ට සාධාරණව රජයක් පිහිටුවන්න, ඒ අයගේ නියෝජිතයන් බලයට පත් කරන්න බැරි

වෙයි කියන මත තිබුණු නිසා තමයි උතුරේ මේ වාගේ භයානක ප්‍රතිඵල ඇති වුණේ. සමහරු ඒක බණ්ඩාරනායක අගමැතිතුමාගේ පිට පවරන්න හැදුවත්, එතුමා සිංහල භාෂාව රජයේ භාෂාව කළේ, එදා අධිරාජ්‍යවාදී අපේ රට යටත් කර ගෙන ඉංග්‍රීසීන්ට ගැතිකම් කරන ක්‍රමයක් තිබුණු නිසාත්, සිංහල ජනතාවට අද මේ වාගේ ඇවිල්ලා අපට කථා කරන්න පුළුවන් වාතාවරණයක් නොතිබුණු නිසාත්, අනෙක් සියලුම භාෂාවලට සාධාරණය ඉෂ්ට කරන අතර, මේ රටේ බහුතරය වූ සිංහලයාගේ අයිතීන් ආරක්ෂා කරන්නයි ඒක කළේ. නමුත් අනෙක් ජාතීන්ට කිසිම විධියකින් අඩුවක් පාඩුවක් වෙන්නට සැලැස්සුවේ නැහැ. නමුත් බමුණු මත දරපු එංගලන්තයට අධිරාජ්‍යවාදයට ගැතිකම් කරපු අය මේක නොයෙකුත් විධියට මේ රටට ඔබ්බවන්න උත්සාහ කළා.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

හරි හරි එහෙම නම් -

**ගරු අශෝකා ලංකාතිලක**
Hon. Asoka Lankathilaka

කොහොම හරි ඒ අවස්ථාවේදී එදා තිබුණු තත්ත්වය මම පැහැදිලි කළේ. ඔබතුමා එතකොට දේශපාලනයේ යෙදිල හිටියද, මේවා දැනගෙන හිටියාද කියන්න මම දන්නේ නැහැ. නමුත් අපට දැණුනු තත්ත්වය අපි මේ කිව්වේ. ඒ නිසා ඒ තත්ත්වය තුළ තමයි උතුරේ මේ කාලකණ්ණි අවශ්‍යතාවයන් මතු වුණේ. (බාධා කිරීමක්)

උතුරේ ඇතිවුණු ඒ කාලකණ්ණි ස්වරූපය තමයි අද දක්වා මේ ආකාරයෙන් විහිදී ගියේ. ඒ වාගේම අපි දන්නවා පළාත් සභා ක්‍රමය ඉතා අහම්බෙන් අප අතරට ආවේ. අපි විතරක් නොවෙයි, එදා පළාත් සභා ක්‍රමයට විරුද්ධ වුණේ. එක්සත් ජාතික පක්ෂයේ බොහෝ අය ඒකට විරුද්ධ වුණා. ප්‍රේමදාස මැතිතුමා පවා මේකට කැමති වුණේ නැහැ කියන එක ප්‍රසිද්ධ රහසක්ව තිබුණා. ඒ නිසා මේ සිටින මන්ත්‍රීවරුන්ව හෝටල්වල තියලා බස්වලින් ආරක්ෂිතව ගෙනැත් තමයි මේකට ඡන්දය ගත්තේ. (බාධා කිරීමක්)

ඒ වාගේම මේකේ විනිවිද භාවයක් තිබුණේ නැහැ. ඒ පක්ෂයේ අයටවත් මේවායේ ඇත්ත නැත්ත දැනගන්න, මේවා සාකච්ඡා කරන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. ඒ වාගේ ක්‍රමයකට තමයි පළාත් සභා අප අතරට ගෙනාවේ. ඒ නිසා අපි පළාත් සභා ක්‍රමයට විරුද්ධ වුණා. ගරු මැතිනියත් සමග මමත් ඒකට විරුද්ධත්වය දැක්වූවා. ඒ වාගේම එක්සත් ජාතික පක්ෂයේ බැටන් ප්‍රහාරවලට, ඒ වාගේම කඳුළු ගෑස්වලට මමත් මුහුණ දුන්නා. නමුත් අපි මේ පළාත් සභා ක්‍රමය මේ අය මොන හේතුවක් නිසා ගෙනාවත් හැමදාම බලයේ ඉන්න ක්‍රමයට ගෙනාවත් ඒ අයට ඒකේ වැඩිකල් බලයේ සිටින්නට පුළුවන්කම තිබුණේ නැහැ. ඊට පස්සේ අපි මේ පළාත් සභා ක්‍රමය සුදු අලියෙක් හැටියට හංවඩු ගහලා තිබුණාට මේ පළාත් සභා ක්‍රමයට අර්ථයක් දෙන්නට වැඩ කළාය කියලා මම භය නැතුව මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

ඒ වාගේම එක්සත් ජාතික පක්ෂය මේ ක්‍රමය ගෙනාවට උතුරේ ඡන්දයක් තියන්නටවත් එක්සත් ජාතික පක්ෂයට පුළුවන් වුණේ නැහැ. ඒ වාගේම මේ ක්‍රමය රඳවා ගන්න එක්සත් ජාතික පක්ෂයට පුළුවන්කමක් තිබුණෙත් නැහැ. ඒ නිසා අද මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ ඡන්දය පවත්වනවාට එක්සත් ජාතික පක්ෂය තුළ යම් කුකුසක් තියෙන්න පුළුවන්. නමුත් අපි කියනවා. අපේ ආණ්ඩුව මේ උතුරු පළාත් සභා මැතිවරණය විනිවිද භාවයෙන් යුතුව තියෙනවා. අපි ඒ වාගේ තියන්න පුළුවන් ක්‍රම හා විධි ගෙනැල්ලා තියෙනවා. තමුන්නාන්සේලාගේ ආණ්ඩු තියෙද්දී තමයි හොර ඡන්දවලට භය වෙන්න වෙලා තිබුණේ. (බාධා කිරීම්) මාල ක්‍රමයේ ඡන්දවලට භය වෙන්න වෙලා තිබුණේ. දැන් ප්‍රසිද්ධියේ හැඳුනුම්පත ඉදිරිපත් කරලා විනිවිද භාවයෙන් පෙනෙන මැතිවරණ ලැයිස්තු සකස් කරලා මේ කටයුත්ත කරන්න උතුරේත් දකුණේත් පුළුවන්කම තියෙනවා. ඒ නිසා තමුන්නාන්සේලාට මේ මැතිවරණ තිබෙන ක්‍රම ගැන භය වෙන්නට දෙයක් නැහැ. ඒ වාගේම අද සුදු අලියෙක් බවට පත් වෙලා තිබුණයි කියන මේ පළාත් සභා ක්‍රමයෙන් වැඩක් ගන්නට පුළුවන් කියන එක අද අපි තමුන්නාන්සේලා දෙගොල්ලම එකතු වෙලා ඔප්පු කරලා තියෙනවා. තමුන්නාන්සේලා දන්නවා. මහ ආණ්ඩුවේ විෂයක් දහම් පාසල් විෂය. අද අපි මුදල් දෙනවා, ලක්ෂ ගණනින් දහම් පාසල් ශක්තිමත් කරන්න. (බාධා කිරීම්)

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ලක්ෂයයි.

**ගරු අශෝකා ලංකාතිලක**
Hon. Asoka Lankathilaka

එක ලක්ෂයක් දෙනවා. ආසනයට ලක්ෂ කීයක් එනවාද? තමුන්නාන්සේලාගේ කාලයේ එහෙම දෙයක්වත් කරන්න බැරි වුණා නේ? මහ ආණ්ඩුවක්වත් කළේ නැහැ නේ ඒ වාගේ දෙයක්.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ප්‍රේමදාස මහත්තයාගේ කාලේ -

**ගරු අශෝකා ලංකාතිලක**
Hon. Asoka Lankathilaka

අපිත් ඉරිදා ඉස්කෝලේ ඒ කාලේ හිටියා. එහෙම ලක්ෂ ගණන් දුන්නේ නැහැ. අපි සියලුම ලියාපදිංචි දහම් පාසල්වලට ජාතියක්, ආගමක් බලන්නේ නැතුව හැම දහම් පාසලකටම අපි ලක්ෂය බැගින් දීලා තියෙනවා. (බාධා කිරීමක්)

ඒ වාගේම මහ ආණ්ඩුවටත් එහායින් ගිය ශක්තිමක් අධ්‍යාපන ක්‍රමයක් පළාත් සභාව තුළ ඇති කරන්න අපි වැඩ කරගෙන

[ ගරු අශෝකා ලංකාතිලක ]

යනවා. අද ජාතික පාසල්වලට වඩා ගම්බදව තියෙන පාසල්වලට විශාල සේවාවක් පළාත් සභා තුළින් කෙරෙනවා. අපේ පළාත් සභාවේ වුණත් අපි අධ්‍යාපනයේ විශාල පහසුකම් ඇති කරමින් විශාල වැඩ කොටසක් කරන බව තමුන්නාන්සේලාට අමුතුවෙන් කියන්න ඕනෑ නැහැ. (බාධා කිරීම්) ඒ නිසා අපි පළාත් සභා ක්‍රමය මේ වෙන කොට ශක්තිමත් කරන්නට කටයුතු කරලා තිබෙනවා. ඒ නිසා පළාත් සභා ක්‍රමය පිළිබඳ සැකයක් ඇති කරගන්න අවශ්‍ය -

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

දේශද්‍රෝහියෝ කියන්නේ චම්පික රණවකලා (බාධා කිරීම්)

**ගරු අශෝකා ලංකාතිලක**
Hon. Asoka Lankathilaka

ආණ්ඩුවල සිටින එක එක්කෙනා තුළ එක එක මත තියෙන්න පුළුවන්. තමුන්නාන්සේලාගේ පක්ෂය ගත්තොත් ඔක්කොම එක මතයක සිටිනවාද? (බාධා කිරීම්) තමුන්නාන්සේලා එකට ඉන්න අය අතරත් එහෙම දෙයක් නැහැ. ඒ නිසා අද මත තිබුණාට අපි එකට වැඩ කරනවා. ඒක දක්ෂකමක් කියලා හිතන්නේ නැද්ද? (බාධා කිරීම්) එතුමා මේ පළාත් සභාවේ දියුණුවට වැඩ කරන්නේ නැද්ද? (බාධා කිරීම්) පළාත් සභාවලට බලය බෙදීමට එතුමා - හැබැයි මම දකින හැටියට මේ රටේ අද ද්‍රවිඩ ජනතාවට කිසිම වරදක් කරන්නේ නැහැ. අපි ඒ කාලකණ්ණි යුද්ධය නිමා කරලා ද්‍රවිඩ ජනතාවට මේ රටේ ජීවත් වෙන්න පුළුවන්කම ලබලා දීලා තියෙනවා විතරක් නොවෙයි, අද නොමග ගිය ඒ එල්.ටී.ටී.ඊ සංවිධානයේ හිටපු දරුණු අපරාධකරුවන්ව පවා අද හොඳ තත්ත්වයට පත් කරලා මේ සමාජයට යොමු කරන්න වැඩ කටයුතු කරගෙන යනවා. අද අපේ ප්‍රදේශවල සිටින මුස්ලිම් ජනතාවට අපි විශාල සේවාවක් කරනවා. ඒ නිසා ජාතීන් අනුව අපට බෙදෙන්න ඕනෑ නැහැ. මම කියන්නේ, මේ රටේ සිංහල, ද්‍රවිඩ, මුස්ලිම් සියලු ජන කොටස්වලට එකට ජීවත් වෙන්න පුළුවන් ලංකාවක් හදන්න තමයි අපි වෙහෙසෙන්නේ. නමුත් ඒ නිසා මම මේ යෝජනාවට පක්ෂයි. ඒ වාගේම ඉදිරියටත් සිංහල, ද්‍රවිඩ, මුස්ලිම් හැටියටත් මේ රටේ සාධාරණව ජීවත් වෙන්න පුළුවන් තත්ත්වයක් දැනට ඇති වෙලා තියෙනවා. ඒක ආරක්ෂා කරන්න වැඩ කරමුයි කියලා ඉල්ලා සිටිනවා.

[ අ.භා. 02.35 ]

**ගරු එම්.එම්.එම්. අම්ජාඩ්**
Hon. M.M.M. Amjad

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට මේ සඳහා අවස්ථාව ලබා දීම පිළිබඳව මම මුලින්ම සන්තෝෂ වෙනවා. මගේ මතකයට එනවා, මුලසුනේ සිටින අපේ ගරු නියෝජ්‍ය සභාපති රංජිත් සෝමවංශ මැතිතුමා එදා ශිෂ්‍ය ව්‍යාපාරයේ අපත් සමඟ සම්බන්ධ වෙලා, 1987 දී පිටකොටුවේ මේ ඉන්දු - ලංකා ගිවිසුමට විරුද්ධව උද්ඝෝෂණය කරපු අවස්ථාව. ඒ අවස්ථාවේදී මට මතක් වෙනවා, ඒ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායිකාව, සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ නායකත්වය යටතේ - මට අදත් මතකයි. මේ රටේ විනාශය ළඟයි. ඒ නිසා අපි ආයාචනා කරනවා, සෑම පන්සලකම සන්ධ්‍යා නාදය නාද කරන්නය කියලා. කලු කොඩියක් ඔසවන්නය කියලා. ඒ පණිවුඩය ලබා දෙනවාත් එක්කම මට මතකයි කඳුළු ගෑස් ප්‍රහාරයන් එල්ල වෙලා, වෙඩි උණ්ඩ ප්‍රහාරයන් එල්ල වෙලා ජනතාව සීසී කඩ දුවන්න පටන් ගත්තා. අන්න ඒ වාගේ එදා ජනතාව 1987 දී පිටකොටුවේ උද්ඝෝෂණ ව්‍යාපාරවල නිරත වෙලා විශාල බාධක මැද්දේ තමයි මේ පළාත් සභාව නිර්මාණය වෙලා තිබෙන්නේ කියන එක අපි තමුන්නාන්සේලාට මතක් කරන්න ඕනෑ. ඒ වාගේ කටුක අත්දැකීම් මත අවුරුදු 30 ක ඉතිහාස ගමන් මගක් අද වන කොට මේ පළාත් සභාව තුළ අපි ලබා ගෙන තිබෙනවා. ඒ අවුරුදු 25 ක ගමන් මග තුළ මේ පළාත් සභා ව්‍යුහය තුළ තිබෙන්නා වූ දුර්වලකම් අපි දැක්කා. අපි තේරුම් ගත්තා. ඒ අඩුපාඩුකම් තේරුම් ගත්තා. ඒ අඩුපාඩුකම්, දුර්වලකම් තේරුම් අරගෙන අද වන විට සමාජයට ඔබින ආකාරයෙන් මේ පළාත් සභා යන්ත්‍රය කොයි ආකාරයෙන් ක්‍රියාත්මක විය යුතුද කියන මාතෘකාවේ තමයි අපි තමුන්නාන්සේලා සියලු දෙනාම අද ඉන්නේ. අන්න ඒ කරීකාව අද වාදයට ලක් වන මොහොතේදී, ඒ කරීකාව ජනතාවගේ සංවාදයට ලක් වන මොහොතේදී අද අපි දකිනවා, පළාත් සභා අහෝසි කළ යුතුයි කියන භූමිකාව රඟපාන අන්ත ජාතිවාදී, වර්ගවාදී ඒ වාගේම බෙදුම්වාදී සංවිධානයන්ගේ හඬ අද ලංකාව පුරා දෝංකාර දෙන තත්ත්වයක් උදා වෙලා තිබෙනවාය කියන එක. ඒ අන්ත ජාතිවාදී, අන්තවාදී, ආගම්වාදී සංවිධාන අද පළාත් සභා අහෝසි කරන්න ඕනෑය කියලා කියන්නේ, මේ පළාත් සභාව තුළින් සුළු ජාතීන්ට ලැබෙන්නා වූ අයිතිවාසිකම් නැති කරන්න ඕනෑය කියන චේතනාව මතයි. මේ පළාත් සභා බිහි කළේ, සුළු ජාතීන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් නම්, මේ පළාත් සභා නිර්මාණය වුණේ ජාතීන් අතර සංහිඳියාව ඇති කරන්න නම්, මේ පළාත් සභා නිර්මාණය වුණේ සියලු ජාතීන්ට එකට, එක්සත්ව, එක්සිත්ව ජීවත් වෙන්න පුළුවන් තත්ත්වයක් උදා කරන්න නම්, මේ අන්තවාදී සංවිධාන මේ මොහොතේදී කථා කරන්නේ පළාත් සභා අහෝසි කරන්න ඕනෑය කියලා නම් අපි මේ භූමිකාව පිළිබඳව කරුණු විග්‍රහ කරලා බලන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි දැක්කා පසුගියදා මහරගම රැස්වීමේදී බොදු බල සේනා සංවිධානයේ රැස්වීමක් තිබුණා. මේ ලංකාදීප පත්තරේ තිබෙන්නාවූ මේ වාර්තාවෙන් විශාල තොරතුරු රාශියක් අපට ලැබුණා. මේක මට ඉතාමත්ම කනගාටුදායක පණිවුඩයක්. මේ අවස්ථාවේදී මේ සභාවට ඉදිරිපත් කරන්න අපට හැකියාව ලැබෙනවා. මගේ හිතවත්, අපේ විශ්ව විද්‍යාල සහෝදර චම්පික රණවක මැතිතුමා, මගේ හිත මිත්‍රයෙක්. එහෙම වුණත් අද එතුමා අපේ ආණ්ඩුවේ ඉන්න වගකීමක් දරණ ඇමතිවරයෙක් වශයෙන් එදා මහරගම රැස්වීමේදී කරපු ප්‍රකාශයක් පිළිබඳව මම මේ සභාවේ අවධානය යොමු කරනවා. එතුමා කියලා තිබෙනවා, පළාත් සභා රකින හැම

කෙනෙක්ම රටේ ඉතිහාසයේ හතුරෙක් කියලා. එහෙම නම් අපේ ගාමිණී තිලකසිරි ගරු මන්ත්‍රීතුමාගේ කථාවේදී එතුමා පැහැදිලි කළා පස්වන පළාත් සභාව වන කොට, අද දක්වා මේ පළාත් සභාව නියෝජනය කරපු අපේ සහෝදර මන්ත්‍රීවරුන්, මන්ත්‍රීවරියන් 40 කට ආසන්න සංඛ්‍යාවක් ජීවිතක්ෂයට පත් වෙලා තිබෙනවාය කියලා. මම එතකොට අහනවා, මේ පළාත් සභා රකින හැම කෙනෙක්ම සතුරෙක් නම්, ද්‍රෝහියෙක් නම්, ජාති ද්‍රෝහියෙක් නම්, ඒ අභාවප්‍රාප්ත වූ සියලු දෙනාම ජාති ද්‍රෝහීන් වෙනවා. ඒ වාගේම මේ සභාවේ ඉන්න සියලුම මන්ත්‍රීවරුන් ජාති ද්‍රෝහීන් වෙනවා. ඒ වාගේම මේ සභාවේ හෙළ උරුමය නියෝජනය කරන අපේ උදය ගම්මන්පිල ගරු ඇමතිතුමාත් ජාති ද්‍රෝහියෙක් වෙනවා. මොකද, එතුමාත් මේ රැස්වීමට සහභාගී වෙලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, දැන් මේ සහෝදරාත්මක පළාත් සභාවක මම නම් කියන්නේ, ඔය වාගේ මට්ටමකට අදහස් ගෙනි යන්න එපා.

**ගරු එම්.එම්.එම්. අම්ජාඩ්**
Hon. M.M.M. Amjad

නැහැ. නැහැ. මට අවස්ථාව -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාගේ අවස්ථාව වෙන්න පුළුවන්. මට සභාවම පාලනය කරන්න ඕනෑ.

**ගරු එම්.එම්.එම්. අම්ජාඩ්**
Hon. M.M.M. Amjad

මගේ අදහස් මම කථා කරන්නේ. මේක කිවයුතු දෙයක්. මම කථා කරන්නේ මගේ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා මූලාසනයට කීකරු වෙන්න. මට සභාව පාලනය කරන්න ඕනෑ. මේ සභාව තුළ ඉන්න මැති ඇමතිවරුන්ට ජාති ද්‍රෝහී වාගේ ඒවා කියන්න එපා මෙතැන.

**ගරු එම්.එම්.එම්. අම්ජාඩ්**
Hon. M.M.M. Amjad

නැහැ. නැහැ. ඇමතිතුමා ජාති ද්‍රෝහියෙක් නොවෙයි. මගේ කථාව -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාගේ කථාව මට ඇහෙනවා නේ? එතකොට මේ සභාවක -

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

පත්තරේ තිබෙන දෙයක්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

පත්තරේ තිබෙන දෙයක් නම් මට පෙන්වන්න ඕනෑ. මම දන්නේ නැහැ නේ? සභාගත කරන්න ඕනෑ පත්තරේ.

**ගරු එම්.එම්.එම්. අම්ජාඩ්**
Hon. M.M.M. Amjad

මම ඒකයි කිව්වේ. මම කථා කළේ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නම් ප්‍රකාශ කරලා නේ මේ කියන්නේ.

**ගරු එම්.එම්.එම්. අම්ජාඩ්**
Hon. M.M.M. Amjad

එතුමා ද්‍රෝහියෙක් කියලා මම කිව්වේ නැහැ. ඒ රැස්වීමේ අපේ වගකිවයුතු ගරු ඇමතිවරයෙක් කියනවා නම් පළාත් සභා රකින හැම කෙනෙක්ම රටේ ඉතිහාසයේ හතුරෙක් කියලා මේ පළාත් සභා නියෝජනය කරන සැම මන්ත්‍රීවරයෙක්ම හතුරෙක් විය යුතුයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒක හරි. නමුත් අර ඔබතුමා නම් වශයෙන් කියපුවාම මේ සභාවේ ගැටුම්කාරී ස්වරූපයක් මතු වෙනවා.

**ගරු එම්.එම්.එම්. අම්ජාඩ්**
Hon. M.M.M. Amjad

ඒකයි මම කිව්වේ. එතුමා හතුරෙක් කියලා කිව්වේ නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි. ඔබතුමා කථා කරන්න.

**ගරු එම්.එම්.එම්. අම්ජාඩ්**
Hon. M.M.M. Amjad

එතුමා අපේ මිතුරෙක්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ආ. එහෙම කියන්න.

**ගරු එම්.එම්.එම්. අම්ජාඩ්**
Hon. M.M.M. Amjad

ඒ නිසා මම මේ අවස්ථාවේදී කියන්න කැමැතියි. අද අපේ පළාත් සභාව ගැන කථා කරන කොට

[ ගරු එම්.එම්.එම්. අමීජාඩ් ]

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි අපි දකිනවා, උතුරේ පළාත් සභා මැතිවරණය ක්‍රියාත්මක කිරීමට කැඳවලා තිබෙනවා. පියල් නිශාන්ත ගරු මන්ත්‍රීතුමා මේ පැත්තේ ඉඳගෙන, මම දකුණු පැත්තේ ඉඳගෙන -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඇයි මම?

**ගරු එම්.එම්.එම්. අමීජාඩ්**
Hon. M.M.M. Amjad

අපේ අතිගරු ජනාධිපතිතුමා පසුගිය සුමානේ අලුත්ගම මුස්ලිම් පල්ලියේ ඉඳගෙන බොදු සිරිත් විරිත් අනුව, ඒ නැකතට අනුව උතුරු දිශාව බලා පල්ලියේ ඉඳගෙන තමයි උතුරේ මැතිවරණය පවත්වන්න ඒ නියෝගය අත්සන් කළේ. අන්න ඒක තමයි ශ්‍රී ලාංකිකකම කියන්නේ. එතුමාගේ බොදු සිරිත් විරිත් පල්ලියක් තුළ ඉඳගෙන ඒ නැකතට අනුකූලව උතුර බලාගෙන අත්සන් කළේ, අලුත්ගම මුස්ලිම් සීනවත්ත පල්ලිය විවෘත කරන අවස්ථාවේදීයි. ඒ නිසා අපි ආඩම්බරයෙන්, අභිමානයෙන් කථා කරන මේ පළාත් සභාවේ උරුමය වෙනුවෙන් කථා කරන මේ මොහොතේදී සියලු දෙනාම අද පළාත් සභා ආරක්ෂා කරන්න ඕනෑ කියන ප්‍රතිපත්තිමය තීරණයේ ඉන්නවා. මේ අවස්ථාවේදී අපේ මහ ඇමතිතුමා මේ යෝජනා කරලා තිබෙන යෝජනා සියල්ලක්ම බලන කොට මම කථා කරපු විධියට අපේ අවුරුදු 25 ක පළාත් සභා ඉතිහාසයේ අපි දැක්ක, දුර්වලකම් මග හරවාගැනීමට මේ යෝජනාව තුළ යම්කිසි දායකත්වයක් පාදක වෙලා තිබෙනවාය කියන එක තමයි අපට කියන්න පුළුවන් වෙන්නේ. අවුරුදු 30 ක යුද්ධයක් තිබුණා. ඒ අවුරුදු 30 ක යුද්ධය තුළ අපි දැක්කා, අපේ රණවිරුවන් ඇට, මස්, ලේ, නහර පූජා කරනවා. තමන්ගේ ජීවිත පූජා කරනවා. 2009 මැයි මාසේ 18 වන කොට ඒ යුද්ධය නිසා රණවිරුවන් 26,678 දෙනෙක් ජීවිත පූජා කරලා තිබෙනවා. එහෙම නම් මේ අවුරුදු 30 තුළ එක දවසකට රණවිරුවෝ තුන් දෙනෙක් ජීවිතක්ෂයට පත් වෙලා තිබෙනවා. එක දවසකට රණවිරුවෝ දෙන්නෙක් තුන්දෙනෙක් ආබාධිතයන් වෙලා තිබෙනවා. එක දවසකට මේ රටේ ඉන්න අපේ සාමාන්‍ය අසල්වැසියන් අනාථ වෙලා තිබෙනවා. අන්න ඒ වාගේ යුද්ධයක් නිර්මාණය වෙලා, ඒ යුද්ධය අවසන් වුණාට පස්සේ, මේ මොහොතේ තමයි පළාත් සභාවේ අවශ්‍යතාවය අපට හොඳට තේරෙන්නේ. මේ මොහොතේ තමයි පළාත් සභාවේ ක්‍රියාකාරීත්වය හොඳයි කියන එක තේරෙන්නේ. එහෙම නම් අපි මේ මොහොතේදී එදාට වඩා හොඳින් මේ පළාත් සභා ක්‍රියාත්මක කරන්න ඕනෑ. ශක්තිමත් කරන්න ඕනෑ. ඒ ශක්තිමත් කිරීම, ඒ ක්‍රියා පටිපාටිය ඉදිරියට ගෙනියන්න අපට තිබෙන දුර්වලතා මග හරවා ගැනීමත් මේ අවස්ථාවේදී අප කළ යුතුයි. ඒ සියලු කර්තව්‍යයන් කරන කොට මම මේ අවස්ථාවේදී කල්පනා කරන්නේ අපි ජාතිවාදයට විරුද්ධව, වර්ගවාදයට විරුද්ධව, ආගම්වාදයට විරුද්ධව අපි සියලු දෙනාම හඬ නගන්න ඕනෑ කියලා. මේ කථිකාව කථා කරන්නේ, පළාත් සභා ඕනෑ නැහැයි කියලා කථා කරන්නේ ආගම්වාදීන්, අන්තවාදීන්. අපේ ආගමෙන් කියනවා නම් අන්තවාදය කියන්නේ හරාම්. ඒ වාගේම අපේ දේශප්‍රේමය කියන්නේ හලාල්. එහෙම නම් අන්තවාදය හරාම් නම්, දේශප්‍රේමය හලාල් නම් අද මුස්ලිම් ජාතිය වශයෙන් අපටත් ඒ වාගේම ක්‍රිස්තියානි ජනතාවටත් ක්‍රිස්තියානි ජනතාවගේ ඡන්ද ව්‍යාපාරය කරන්න, ඔවුන්ගේ සාමාන්‍ය කටයුතු කරන්න, ඒ වාගේම හින්දු ජනතාවට තමන්ගේ දෛනික කටයුතු කරන්න අද අපට විශාල බාධාවන් එල්ල වෙලා තිබෙනවා. ඒ බාධාවලට මූලික හේතුව වෙලා තිබෙන්නේ, අපේ බොදු බල සේනා වැනි සංවිධාන හරහා අපට කරන්නා වූ බලපෑම් නිසයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන් මම දැක්කා 13 වන ව්‍යවස්ථාව උගුරේ හිරවුණු කටුවක් වාගේ කියලා බොදු බල සේනා සමුළුව බදුල්ලේ කරපු ප්‍රකාශයක් මම මේ අවස්ථාවේදී ගෙනහැර පෙන්වන්න කැමැතියි. එහිදී කියන්නේ මුස්ලිම් ජනතාව ඉතාමත්ම නින්දිත පහත් ජනතාවක් විධියට පෙන්වා දීමට කටයුතු කිරීමට උත්සාහ ගත්තා. අපේ සංස්කෘතික උරුමයක් වන හිජාබ් ඡර්දාව ගලවා දැමීමට ඔවුන් ප්‍රකාශ කරනවා. අන්තවාදය නිරුවත් කරන්න නම් හිජාබය නිරුවත් කරන්න ඕනෑලු. ඡර්දාව නිරුවත් කරන්න ඕනෑලු. පොලීසියේ මහත්වරුන්ගෙන් ඉල්ලනවා, ටින්ටඩ් වාහනවල ඉන්න ගෝනිබිල්ලන්ගේ ඇඳුම ඉවත් කරන්නය කියනවා. මේ ගෝනිබිල්ලා ඇඳුම කියලා කියන්නේ, මුස්ලිම් ජනතාවගේ ඒ නීත්‍යානුකූල ඇඳුම ගලවන්න කියලා තමයි මේ බොදු බල සේනා වැනි අන්තවාදී සංවිධාන කියන්නේ. මෙන්න මේ වාගේ තත්ත්වයක් තුළ මේ අන්තවාදී සංවිධාන මුස්ලිම් ජනතාවට කරන මේ බලපෑම් හිරිහැර නිසා දේශපාලන වශයෙන් අප ඉතාම අසරණ තත්ත්වයට පත් වෙලා තිබෙනවා.

ඒ නිසා අද මේ වාගේ අවස්ථාවක් උදා කරලා, මේ වාගේ විවෘත අවස්ථාවක අපේ අදහස් ප්‍රකාශ කරලා, අපි කියන්න ඕනෑ අපේ අතිගරු ජනාධිපතිතුමා ශ්‍රී ලාංකිකයන් වශයෙන් මේ රටේ සියලු දෙනාට එක්සත්ව, එක්සිත්ව ජීවත් වෙන්න පුළුවන් පරිසරයක් නිර්මාණය වීම තුළ තමයි අද අපේ පළාත් සභාවේ මන්ත්‍රීවරුන් 65 ක්, 66 දෙනෙක් මේ සභාවේ ඉන්නේ කියන එක අපි මතක් කරන්න ඕනෑ. එහෙම නම් ඊළඟ පළාත් සභාවේත් මේ සංයුතිය අපි ලබා ගන්න ඕනෑ නම් සියලු දෙනාම එක්සත්ව, එක්සිත්ව ඒ සංහිඳියාව ආරක්ෂා කර ගන්න ඕනෑ. නමුත් අන්තවාදී සංවිධාන බලාපොරොත්තු වෙන්නේ, මුස්ලිම් ජනතාව, දෙමළ ජනතාව, ක්‍රිස්තියානි ජනතාව එක කඳවුරකට පත් කරන්නයි. ඒ කර්තව්‍ය පරාජය කරන්නට අපි සියලු දෙනාම අවබෝධයෙන් කටයුතු කරමුයි කියන එක මතක් කරමින්, මේ යෝජනාවට සම්පූර්ණ සහයෝගය ලබා දෙනවාය කියන එක මතක් කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව. මම ගරු මන්ත්‍රීතුමන්ලාට මතක් කරන්න ඕනෑ, දැන් මේ ලැයිස්තුව බැලුවාම රාත්‍රිය වෙයි. ඒ නිසා ඔබ විසින්ම මම හිතන්නේ කථාව විනාඩි 10 කට වාගේ සීමා කර ගන්න කියලා මූලාසනයෙන් ඉල්ලීමක් කරනවා.

[ අ.භා. 02.49 ]

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

බොහොම ස්තූතියි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. අද අපේ පළාත් සභා පිළිබඳ ගරු මහ ඇමතිතුමා ඉදිරිපත් කරලා තිබෙන යෝජනාව. අපි දන්නවා, එදා එක්සත් ජාතික පක්ෂය මේ පළාත් සභා ක්‍රමය යෝජනා කළේ, මේ පළාත් සභා ක්‍රමය ගෙනාවේ, උතුරේ පවතින ජනවාර්ගික ප්‍රශ්නයට යම්කිසි ආකාරයේ විසඳුමක් හැටියට බව. නමුත් මේ රටේ මේ ජාතික ප්‍රශ්නය වෙනුවෙන් මේ රටේ හිටපු හැම නායකයෙක්ම දේශපාලන විසඳුමක්, එහෙම නැත්නම් බලය විමධ්‍යගත කිරීමක්, බලය බෙදා හරින්න ඕනෑ කියන මතයේ සියලු දෙනාම ඉඳලා තිබෙනවා. බණ්ඩාරනායක මහත්මයාගේ ඉඳලා ඒ වාගේම ජේ.ආර්. ජයවර්ධන, ආර්. ප්‍රේමදාස, චන්ද්‍රිකා කුමාරතුංග ඒ දේශපාලන නායකයන් සියලු දෙනාම මේ රටේ ජනවාර්ගික අර්බුදයක් තිබෙනවාය කියලා පිළිගත්තා. ඒ පිළිඅරගෙන ඒකට විසඳුමක් හැටියට බලය බෙදා හැරීමක් කළ යුතුයි කියන අදහස සියලු දෙනාම දැරුවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නමුත් අපි දන්නවා ඉතිහාසය. මේ රට ඇවිල්ලා දූපතක්. හැමදාම මේ දූපතේ මේ රටේ වෙන්නේ අර මැරිගෝ රවුන්ඩ් එකක් ක්‍රියාත්මක වෙනවා වාගේ ක්‍රියාත්මක වෙලා, කැරකිලා කැරකිලා, අපි හැමදාම එකම තැනකටම තමයි එන්නේ. මොකද මේක අපි, අර අනිත් රටවල්වල මෙන් මායිම් නැති රටක් නිසා, වටේටම මුහුද තිබෙන නිසා, මේ රටේ හැමදාම දේශපාලනය වැඩ කරන්නේ අර මැරිගෝ රවුන්ඩ් එකක් හැටියට තමයි. ඒ නිසා අපි, වර්තමාන දේශපාලනය නැවත වතාවක් අතීතයට, ඉතිහාසයට ඇවිල්ලා තිබෙනවා. අපි අවුරුදු සිය ගණනක් කථා කරපු ප්‍රශ්නය නැවත වතාවක් මේ පළාත් සභාවේදී අපට කථා කරන්න සිද්ධ වෙලා තිබෙනවා. මේක කථා කරන්න සිද්ධ වෙලා තිබෙන දේ තමයි අද මේ පළාත් සභාවල ක්‍රියාත්මක වන බලතල අඩු කරන්න ඕනෑය කියලා මේ රටේ හැමදාම ජාතික සමගියට වින කරන, මේ රටේ ජාතීන් අතර එක්සත්කමට, ඒකට විරුද්ධව කථා කරන මේ රටේ බලය බෙදීමක් නොකළ යුතුයි කියන දේශපාලන නායකයන් මේ යුද්ධයේ ජයග්‍රහණයත් එක්ක අද දේශපාලන කරළියට ඇවිල්ලා තිබෙන නිසයි. අපි දැක්කා, මේ රටේ ඉතිහාසයේ මේ ප්‍රශ්න විසඳන්න පුළුවන් නායකයන් දෙන්නෙක් හිටියා. චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියට 1994 දී ඓතිහාසික ජයග්‍රහණයක් ලැබුණා. එතුමියට මේ රටේ ජනතාව 62% ක වරමක් දුන්නා. එදා ප්‍රභාකරන් උතුරේ ඉඳගෙන චන්ද්‍රිකා මැතිනියට ඡන්දය දාන්න එපා කියද්දී උතුරේ සහ නැගෙනහිර දෙමළ ජනතාව චන්ද්‍රිකා මැතිනියට ඡන්දය දාලා එදා චන්ද්‍රිකා කුමාරතුංග බණ්ඩාරනායක මැතිනිය මේ රටේ ජනාධිපතිවරිය කළා. එදා එතුමියට අනගි අවස්ථාවක් ලැබුණා. මේ රටේ දේශපාලන ප්‍රශ්නය විසඳන්න අනගි අවස්ථාවක් එතුමියට ලැබිලා, අපි කථා කරන ඒකාධිපති ව්‍යවස්ථාව කියලා සියලු දෙනාම කියන ඒ ව්‍යවස්ථාවත් වෙනස් කර ගෙන යන්න පුළුවන් බලයක් එදා චන්ද්‍රිකා මැතිනියට ජනතා වරමක් එදා ලැබුණා. නමුත් එතුමිය ඒක කළේ නැහැ. එතුමියත් මෙය දේශපාලන Game එකක් හැටියට සෙල්ලම් කළා. ඊළඟට අද යුද්ධය අවසාන කරලා. මේ යුද්ධය හරි හෝ වැරදි. මේ යුද්ධය අවසාන වෙලා තිබෙනවා. නැවත මේ රටේ දේශපාලන ජාතීන් අතර සුහදත්වය වර්ධනය කරලා, ඒ එක්සත්කම හදන්න බලය බෙදා හැරලා දෙමළ ජනතාවගේ විශ්වාසය දිනා ගන්න පුළුවන් පරිසරයක් උදා කරන්න මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට 2009 න් පස්සේ අවස්ථාව උදා වුණා. නමුත් ආණ්ඩුව අද ඒක කරන්නේ නැහැ. ජනාධිපතිතුමාට ඒ අවස්ථාව උදා වුණත්, ලැබුණත් ඒ ජනාධිපතිතුමා ඒ වරම පාවිච්චි කළේ නැහැ. අද වන කොට ජනාධිපතිතුමා මේ රටේ ඉන්න ජාතිවාදීන්ගේ, අන්තවාදීන්ගේ හිරකාරයෙක් බවට එතුමා අද පත් වෙලා ඉන්නවාය කියලා මම කියන්නේ ඉතාම කනගාටුවෙන්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එදා මේ සෙල්ලම බණ්ඩාරනායක මහත්මයාත් කරන්න හැදුවා. බණ්ඩාරනායක මහත්මයා එදා මේ රටේ ඉන්න අන්ත ජාතිවාදී පිරිස් එක්ක ගිවිසුම් ගහලා, 56 බලය අරගෙන එතුමා දැක්කා, මෙහෙම මේ රටට ඉස්සරහාට යන්න බැහැ. මේ රටේ ජාතික ප්‍රශ්නය විසඳන්න ඕනෑ. චෙල්වනායගම් එක්ක එදා ගිවිසුමකට ගියා. ගිවිසුමකට යන්න හදන කොට එදා මොකක්ද වුණේ? එදා ඒ ආණ්ඩුවේ හිටපු ආණ්ඩුව හදන්න උදව් කරපු ජාතිවාදී පිරිස්, ඒ ජාතිවාදී උන්මන්තකයින් බණ්ඩාරනායක මහත්තයාව ඝාතනය කරලා දැම්මා. අද ඒ පිරිස් නැවත මේ ආණ්ඩුවේ හොල්මන් කරනවාය කියන එක මම මතක් කරන්න කැමැතියි. ඒ නිසා එක පැත්තකින් මේ ආණ්ඩුව කරන්නේ ගින්දරත් එක්ක සෙල්ලම් කිරීමක්. මේ ජාතිවාදී පිරිස් එක්ක කරන ගණුදෙනු ඉතාම භයානකයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මොකද, මේවා කොහෙන් කෙළවර වෙයිද කියලා කාටවත් කියන්න බැහැ. මොකද, මේ පිරිස් කියන දේවල් අහන්නේ නැහැ. මේ අය නයි පොළොංගු වාගේ විෂ සෝර සර්පයෝ. මේගොල්ලෝ එක්ක දේශපාලන ගණුදෙනු තියා ගන්නවාය කියන්නේ තමන්ගේ ජීවිතය පවා අහිමි වෙන්න පුළුවන් කියන එක බව මම මතක් කරනවා. ඒක තමයි එදා බණ්ඩාරනායක මහත්තයාට වුණේ. ඒ අතීතයේ පාඩම් අපි කවුරුත් ඉගෙන ගෙන නැහැයි කියන එක තමයි අපට පෙනෙන්න තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද ආණ්ඩුව ගත්තත්, ආණ්ඩුවට අද ඒ දේශපාලන වාතාවරණය ලැබිලා තිබෙනවා. විසඳුමකට යන්න පුළුවන් ශක්තිය ලැබිලා තිබෙනවා. නමුත් ආණ්ඩුව ඒක ක්‍රියාත්මක කරන්නේ නැහැ. ආණ්ඩුව අද ඒ ජාතිවාදීන්ගේ

[ ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන් ]

උවමනා එපාකම් අනුව පළාත් සභාවලට තිබෙන බලතල අඩු කරන්න උත්සාහ කරනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මේක ඉතාම කනගාටුදායක තත්ත්වයක්. මොකද, මේ අපේ මහ ඇමතිතුමා ඉදිරිපත් කරලා තිබෙන අර පළාත් ඒකාබද්ධ කිරීමේ කියන යෝජනාව - ඒක 13 වන සංශෝධනයේ තිබෙනවා. ඒකේ තිබෙනවා පාර්ලිමේන්තුවේ නීති පනත් ගේන්න ඕනෑ. එහෙම ගේන්නේ නැතිව මේක ඒකාබද්ධ කරන්න බැහැයි කියලා 13 වන සංශෝධනයේ පැහැදිලිවම කියලා තිබෙනවා. ඒකේ අවශ්‍යතාවයක් නැහැ. නමුත් එහෙම නම් මේ කරන්නේ නැවත වතාවක් මේ රටේ ඉන්න අන්තවාදී පිරිස්වලට වුවමනා විධියට ආණ්ඩුව හැසිරවීමට අපි උදව් කරන එක තමයි අපි අවසාන වශයෙන් මේ කරන්නේ. මේක ඉතාම භයානකයි ගරු සභාපතිතුමනි. අනික් පැත්තෙන් ආණ්ඩුව පත් වෙලා දැන් අවුරුදු ගණනාවක් වෙනවා. 2009 දී යුද්ධය අවසාන වෙලා අවුරුදු ගණනාවක් වෙනවා. අද ආණ්ඩුවේ ඉන්නවා දෙමළ නායකයෝ. ඩග්ලස් දේවානන්ද මැතිතුමා. ඩග්ලස් දේවානන්ද මැතිතුමා ඊයේ පෙරෙයිදා ප්‍රකාශයක් කළා, 13 වන සංශෝධනයේ තිබෙන කිසිම දෙයක් අඩු කරන්න එපා. අපි පළාත් සභාවෙන් මේ ජනවාර්ගික අර්බුදයට විසඳුමක් සොයමුයි කියලා එතුමා කිව්වා. ප්‍රභාකරන් මැරෙන්න කලින් අපි සියලු දෙනාම කිව්වා ප්‍රභාකරන් ඉන්නකම් මේකට විසඳුමක් සොයන්න බැහැ. ප්‍රභාකරන් මැරුවාට පස්සේ තමයි අපි විසඳුමක් සොයන්න ඕනෑ කියලා එදා කිව්වා. අද ප්‍රභාකරන් නැහැ. එහෙම නම් අද අපට විසඳුමක් සොයන්න පුළුවන්. අපි විසඳුමක් සොයනවාද? නැහැ. අපි විසඳුමක් සොයන්නේ නැහැ. අපි නැවත වතාවක් දෙමළ ජනතාව තල්ලු කරනවා. කොහාටද අපි තල්ලු කරන්නේ. ඒ ප්‍රභාකරන්ගේ බෙදුම්වාදී හා ප්‍රභාකරන්ගේ අන්තවාදී ක්‍රියාදාමයට අපි දෙමළ ජනතාවට යන්න කියනවා.

මීට කලින් පළාත් සභා ඡන්දය තිබුණා. නැගෙනහිර පළාත් සභාවේ ඡන්දය තිබුණා. දකුණේ පළාත් සභාවල ඡන්දය තිබුණා. ඉඩම් ප්‍රශ්නය ගැන කවුරුත් කථා කළේ නැහැ. කවුරුවත් පොලිස් බලතල ගැන කථා කළේ නැහැ. අපි සියලු දෙනාම ඇවිල්ලා ඡන්දයට ඉදිරිපත් වුණා. නමුත් උතුරේ පළාත් සභාව තියන්න හදන කොට ඉඩම් ප්‍රශ්නය, පොලිස් බලතල ගැන අද කථා කරන්න පටන් අරගෙන තිබෙනවා. ඇයි ඒ? මොකද, ආණ්ඩුව දන්නවා, උතුර දිනන්න හම්බ වෙන්නේ නැහැ. එහෙම නම් දිනන්නේ TNA සංවිධානය. TNA සංවිධානයට බලය යනවාට එහෙම නම් ආණ්ඩුව විරුද්ධයි. එහෙම නම් ආණ්ඩුව කෙළින්ම කියන්න ඕනෑ අපි දෙමළාට කිසිම දෙයක් දෙන්න ලැහැස්ති නැහැ. ඒක කියන්න ඕනෑ පැහැදිලිව. මේක හංගාගෙන ගහන්න කිසිම දෙයක් නැහැ. මේකේ හංගන්න කිසිම දෙයක් නැහැ. මොකද, දෙමළ පළාත් සභාවක් හැදෙනවාට, දෙමළ කථා කරන පළාත් සභාවක් හැදෙනවාට ආණ්ඩුව විරුද්ධයි. ආණ්ඩුව කැමැති නැහැ, මේ රටේ ඉන්න දෙමළ ජනතාව මේ රටේ ආණ්ඩුවට, පරිපාලනයට සම්බන්ධ වෙනවාට. දෙමළ ජනතාව පාලනයට හවුල් කර ගන්න ආණ්ඩුව කැමැති නැද්ද කියන ප්‍රශ්නය තමයි මේකෙන් පැන නැගෙන්නේ. ඒ නිසා මේ ප්‍රශ්නය ජාත්‍යන්තරය ඉදිරියේ ඉතාම බරපතළ ප්‍රශ්නයක් බවට අද පත් වෙලා තිබෙනවා. ඒ නිසා අපි කථා කරනවා ජාත්‍යන්තර කුමන්ත්‍රණ ගැන. අපි ඉන්දියාව ගැන කථා කරනවා. අපි එංගලන්තය ගැන කථා කරනවා. අපි ඇමරිකාව ගැන කථා කරනවා. එහෙම නම් ඒ ජාත්‍යන්තර කුමන්ත්‍රණවලට ඒ විදේශ බලවේගවලට මේ රටට ඇතුළු වෙන්න ඒ අවකාශය හා ඒ ඉඩ ප්‍රමාණය හදලා දෙන්නේ අපි තමයි කියන එක අපි මතක් කර ගන්න ඕනෑ. මොකද, ඒගොල්ලන්ට මේ රටට ඇතුළු වෙන්න කාරණාවක් අපි හදලා දීලා තිබෙනවා. දෙමළ ඩයස්පෝරාවට කථා කරන්න පුළුවන් කාරණාවක් අපි හදලා දෙනවා. ඒ කාරණාව තමයි මේ රටේ ජීවත් වන ඒ දෙමළ කථා කරන ජනතාවගේ පරිපාලන පාලනය. ඔවුන්ව හවුල් කර ගන්න අපි ලැහැස්ති නැහැ. එකේදී අපි කියනවා, ඉඩම් බලතල, පොලිස් බලතල අපි දෙන්න කැමැති නැහැයි කියලා. ඒ උඩ එහෙම නම් අපි දෙමළ ජනතාවට මේ රටේ කිසිම බලයක් දෙන්න කැමැති නැහැයි කියන එක ජාත්‍යන්තරයට අපි පණිවුඩයක් දෙනවා. ඒ පණිවුඩය ඉතාම භයානකයි.

ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම කියන්න කැමැතියි. අවසාන වශයෙන්. ඩග්ලස් දේවානන්ද මැතිතුමා මේ ආණ්ඩුවත් එක්ක දීර්ඝ කාලයක් සම්බන්ධ වී සිටියා. දෙමළ ජනතාව පොදුවේ එතුමාව ද්‍රෝහියෙක් හැටියට තමයි පිළිගන්නේ. ඒ එතුමා පිළිගන්න විසඳුමක්වත් ආණ්ඩුවට ක්‍රියාත්මක කර ගන්න බැරි නම් කොහොමද අපි දෙමළ ජනතාව දිනා ගන්නේ? උතුරේ දෙමළ ජනතාව දිනා ගන්න බැහැ. අපි දන්නවා. ඩග්ලස් දේවානන්ද මැතිතුමා L.T.T.E සංවිධානයේ ඒ මරණ ලැයිස්තුවේ ඉහළින්ම හිටපු කෙනෙක්. එතුමාව මරන්න කිහිප වතාවක්ම උත්සාහ කළා. නමුත් බැරි වුණා. අද එතුමා කියනවා, 13 වන සංශෝධනය අයින් කරන්න එපා. ඒකේ බලතල අඩු කරන්න එපා. මේ ජනවාර්ගික ප්‍රශ්නයට තිබෙන අවම විසඳුම මේක තමයි. අපි මේකත් එක්ක ඉස්සරහාට යමුයි කියලා එතුමා කියනවා. එහෙම නම්, ආණ්ඩුව මේක පිළිගන්න ලැහැස්ති නැද්ද කියන ප්‍රශ්නය අද තමුන්නාන්සේලා ඉදිරියේ තිබෙනවා. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද මේ රටේ විවිධ ජාතීන් ජීවත් වෙනවා. විවිධ ජන කොටස් ජීවත් වෙනවා. විවිධ ආගම් අදහන උදවිය මේ රටේ ජීවත් වෙනවා. එහෙම නම් මේක විවිධත්වයෙන් පිරුණු රටක්. මේ විවිධත්වය තුළ තමයි අපට එක්සත්කම හදන්න පුළුවන් වෙන්නේ. ඒ විවිධත්වය තුළ එක්සත්කම අපට හදන්න බැරි නම් අපි එක එක ජනකොටස්වල අනන්‍යතාවයන්, අයිතිවාසිකම් අපට පිළිගන්න බැරි නම් කවදාවත් මේ රටේ සාමය හදන්න බැහැ. මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය හදන්න බැහැ. අද දෙමළ ජනතාවගේ ප්‍රශ්නය කියලා කියන්නේ මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයත් එක්ක බැඳුණු ප්‍රශ්නයක්. මේ රටේ මුස්ලිම් ජනතාවට කරදර වන, ඒ හිරිහැර වන ප්‍රශ්නය කියලා කියන්නේ, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයත් එක්ක තිබෙන ප්‍රශ්නයක්. ඒ නිසා අවසාන වශයෙන් ඒ විවිධත්වය පිළිගන්න පුළුවන් මනුස්සයෝ

හැටියට අපි ඒක පිළිගත්තොත් තමයි මේ රට සාමය හා නිදහස් ප්‍රජාතන්ත්‍රවාදී රටක් හැටියට ජාතික සමගිය හදාගෙන අපට ඉස්සරහාට යන්න පුළුවන් වෙන්නේ කියන එක මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[ අ.භා. 02.59 ]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි සියලු දෙනාම ඉපදෙන්නේ ඊර්ෂ්‍යාව, ක්‍රෝධය, වෛරය, තණ්හාව ඒ සියලු දේම හිමි කර ගෙන. හැබැයි, අපේ මේ ශ්‍රී ලංකාවේ බහුතරයක් ජීවත් වන ජනතාව අදහන ආගම අනුව, බුද්ධ ධර්මය අනුව - ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බුදුරජාණන් වහන්සේ අන්තිමට බුදු වුණේ, අපි උප්පත්තියෙන් ගෙනාපු සියලු දේ නැති කර ගෙනයි. ඉතින් එවැනි ධර්මයක්, එවැනි ආගමක් අද විනාශය කරා ගෙන යන පිරිසක් මේ රටට ආදරය කරන අය ඇතුළත ඉන්නවාය කියන එක මේ අවස්ථාවේදී මතක් කරලා දෙන්න ඕනෑ. අද බුද්ධාගම නමින්, බුද්ධාගම විකුණා ගෙන, බුද්ධාගම විනාශ කර ගෙන බලය ලබා ගන්න උත්සාහ කරන පිරිසක් අද දේශපාලනයේ නිරත වෙනවාය කියන එක අපි සැම දෙනාටම දකින්නට තිබෙන කරුණක්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පළාත් සභාව ගැන කථා කරන සමහර උදවිය, පළාත් සභාව අහෝසි කරන්න කථා කරන සමහර උදවිය මේ පළාත් සභාවේ මේ යෝජනාවේ පළමු කාරණය වන පළාත් සභා දෙකක් ඒකාබද්ධ වීම ගැන විරුද්ධ උදවිය මම හිතන්නේ, මේ පළාත් සභාවේ 13 වැනි සංශෝධනය ගැන, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය ගැන හරි අවබෝධයක් නැතිව කථා කරනවාය කියන එක තමයි මම හිතන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පළාත් සභා දෙකක් ඒකාබද්ධ කරන්න පුළුවන් ක්‍රම දෙකක් තිබෙනවා. එකක් තමයි මේ රටේ ජනාධිපතිතුමාගේ කැමැත්ත අනුව අවුරුද්දකට පළාත් සභා දෙකක් ඒකාබද්ධ කරන්න පුළුවන්. ඊට පසුව ඒ කාරණය කරන්න පුළුවන් පළාත් සභා දෙකේ ජනමත විචාරණයක් තියලා. ඒ බහුතර ජනතාවගේ කැමැත්ත අනුව. එහෙම කරන්න පුළුවන්. හැබැයි අද බොරුවට මේ ඉඩම් බලතල ගැන, එහෙම නැත්නම් පොලිස් බලතල ගැන විශාල ලෙස මේ රටේ ජනතාවට බියක් ඇති කරමින්, බියක් පෙන්වමින් මේ පළාත් සභා ක්‍රමය, ඡන්දය ලබා ගැනීමේ ක්‍රමයක් හැටියට භාවිතා කරමින් සමහර උදවිය අද මේ රට තුළ ක්‍රියාත්මක වෙනවා. විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. බහුතර බෞද්ධ ජනතාවක් ජීවත් වන මේ රටේ බෞද්ධ ජනතාව පවා මුලා කරමින්, බෞද්ධාගමට නැවත වරක් - බෞද්ධ ජනතාව අතර පමණක් නොව භික්ෂූන් වහන්සේලා අතරත් ජාති වශයෙන්, ආගම් වශයෙන් කෝපය ඇති කරමින්, බියක් ඇති කරමින් අවුරුදු 30 කට පස්සේ මුදා ගත් මේ රට නැවත වරක් බෙදීමට අවශ්‍ය පසුබිම සලසමින් බොදු බල සේනාව වැනි, එහෙම නැත්නම් අද පවතින අනෙකුත් අන්තවාදී සේනාවන් වැනි බලවේගවලට පිටුපස ඉන්නේ කවුරුත් නොව ජාතික හෙළ උරුමය සහ අපේ උදය ගම්මන්පිල ගරු ඇමතිතුමා ඇතුළු ඒ ජාතික හෙළ උරුමයේ අමාත්‍යවරුන් බව මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙතුමන්ලාගේ දේශපාලන පැවැත්ම ඇති වෙන්නේ මෙවැනි අර්බුදයක් මේ රට තුළ නිර්මාණය කළොත් පමණයි. අර වේලාසන කථා කරපු අය කිව්වා වාගේ මෙම දේශපාලන පැවැත්ම ඉදිරියට ගෙන යන්නට ජනතා විමුක්ති පෙරමුණත් දැරුවේ මෙවැනි දෙයක් තමයි. ජනතා විමුක්ති පෙරමුණත් 70 ගණන්වල, 80 ගණන්වල ඒගොල්ලොත් පෙළඹුනේ ජාතීන් අතර ගැටීම් ඇති කරලා, මිනී මරලා, මේ රටේ දේශපාලනය ප්‍රජාතන්ත්‍රවාදයෙන් ගන්න බැරි වුණාම බලහත්කාරයෙන් අතට ගන්න තමයි මේගොල්ලෝ ඒ උත්සාහය දැරුවේ. එවැනි සංවිධානයක් හැටියට ජාතික හෙළ උරුමය අද පත් වෙලා තිබෙන එක ගැන මම හිතන්නේ, බෞද්ධාගම ගැන කථා කරන මෙතුමන්ලා මම හිතන්නේ, තමන්ගේ ආත්ම ගරුත්වයක් තිබෙනවා නම් මේ පළාත් සභාවෙන් ඉල්ලා අස් විය යුතු බව මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න ඕනෑ. මේ පළාත් සභාවට මෙතරම් විරුද්ධ නම්, තැනින් තැන ගිහිල්ලා මේ පළාත් සභාව ගැන විවේචනය කරනවා නම් අද මේ පළාත් සභාවේ සිටීමට එතුමාට කිසිම සදාචාරාත්මක අයිතියක් නැති බව මම මතක් කරලා දෙන්නට ඕනෑ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සදාචාරාත්මක අයිතීන් ගැන කථා කරද්දී - ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම දකින පිළිවෙළට මේ පළාත් සභා ක්‍රමය විශේෂයෙන්ම වැදගත් වෙන්නේ උතුරේ දෙමළ ජනතාවටයි. මේ පළාත් සභා ක්‍රමය තුළින් විශ්වාස කළේ, මේ උතුරේ ජනතාවට තමන්ගේ අයිතීන්, තමන්ගේම ස්වයං පාලනයක්, තමන්ගේ කියන පාලනයක් සඳහා අවකාශය ලබා දීමට බවයි. ඒ සඳහා තමයි මේ පළාත් සභා ක්‍රමය ඇති කළේ. ඒ එක්කම මේ දකුණේ ජනතාවටත් ඒ අයිතිය ලැබුණා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ජා -ඇළ අපේ හිතවත් හාමුදුරු නමක් එක්ක මම කථා කරන වෙලාවේ මට කිව්වා, මන්ත්‍රීතුමා, ඔබතුමා දන්නවාද සිංහල ජාතිය තමයි මේ ලෝකයේ සීඝ්‍රයෙන්ම වඳ වී ගෙන යන ජාතිය කියලා. මමත් දැනගෙන හිටියේ නැහැ. නමුත් ඒ හාමුදුරුවෝ මට එහෙම ප්‍රකාශ කළාම මම ඇහුවා ඇයි එහෙම කියන්නේ කියලා. එතකොට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, උන් වහන්සේත් එක්ක දිගටම කථා කර ගෙන යද්දී මට තේරුණා, අපි මේ ලංකාව තුළ බහුතරයක් වුණාට, ආසියාව තුළත්, ලෝකය තුළත් අපි ඉතාමත් සුළුතරයක් කියන එක. අපි දෙමළ ජනතාව වගේ දවසක වැඩි කල් යන්න ඉස්සෙල්ලා, තව අවුරුදු 20 ක් වෙන්න පුළුවන්. 25 ක් වෙන්න පුළුවන්. ජාත්‍යන්තරයේ පිහිට පතන්න වෙන්නේ සිංහල ජාතියට අපට. සුළුතරයක් වශයෙන් අපට ඒ පිහිට පතන්න වෙනවා. තව අවුරුදු 25 ක් 30 ක් යද්දී අපට පිහිටට ඒ ජාත්‍යන්තරය අවශ්‍ය වෙනවා තමුන්නාන්සේලා සියලු දෙනාම දන්නවා. අනෙකුත් ජාතීන් අද සීඝ්‍රයෙන් වර්ධනය වේගෙන යද්දී සිංහල ජනතාව අද ටිකෙන් ටික අඩු වේගෙන යනවා කියලා. ඒක රහසකට කරුණක් නොවෙයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ජාත්‍යන්තරයට බණින, ඉන්දියාවට බණින, අන්තවාදී

[ ගරු ශ්‍රීනාත් පෙරේරා ]

ඇමතිවරුන්ට මම හිතන්නේ මතක් කරලා දෙන්න ඕනෑ, මේ සිංහල ජාතියටත් ඒ පිහිට පතන්න ඉදිරි කාලයේදී සිදු වෙනවාය කියලා. අන්න ඒක අමතක නොකර, මම හිතන්නේ, මේ පළාත් සභා ක්‍රමය තුළින් උතුරේ දෙමළ ජනතාවටත් ඒ අයිතිවාසිකම් ලබා ගන්න, තමන්ගේ පාලනයක් ගෙන යන්න අපි කියන්නේ නැහැ ඒගොල්ලන්ට ආයුධ දෙන්නය කියලා. අපි කියන්නේ නැහැ මේ රට වෙන් කරලා දෙන්න කියලා. නමුත් ඒකීය රටක් තුළ තමන්ගේ අයිතිවාසිකම්, සංස්කෘතිය, තමන්ගේ ජාතිය අගය කර ගෙන ජීවත් වෙන්න පසුබිම හදලා දෙන්න මම හිතන්නේ, මේ පළාත් සභා ක්‍රමය ඉතාමත් වැදගත් වෙනවාය කියලා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම ස්තුතියි. කථාව අවසන් කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තව විනාඩි දෙකක් දෙන්න මට.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සමාවෙන්න. වෙලාව පිළිබඳව ලොකු ගැටළුවක් තිබෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

වෙලාව ඕනෑ තරම් තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ පළාත් සභා ක්‍රමය අපේ ගම්මන්පිල ගරු අමාත්‍යතුමා කිව්වා බලහත්කාරයෙන් මේ රටට, මේ ජනතාවට පටවපු එකක් කියලා. හැබැයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම එතුමාට මතක් කරලා දෙන්න කැමැතියි. මේ පළාත් සභා ක්‍රමය දැන් අවුරුදු 25 ක් තිස්සේ ඉදිරියට ඇවිල්ලා, පසුගිය අවුරුදු 25 තුළ මේ රටේ ජනතාව ඡන්දය දීලා ප්‍රජාතන්ත්‍රවාදයෙන් අනුමත කරලා තිබෙනවාය කියලා එතුමාට මතක් කර දෙන්න කැමැතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හොඳමයි. ඔබතුමා කථාව අවසන් කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ කථාව මීට වඩා කර ගෙන යන්න ඔබතුමා ඉඩ දෙන්නේ නැති බව -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නැහැ. ඔබතුමා ඉතා හොඳින් කථා කළා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඉතා හොඳට කථා කළාට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම හිතන්නේ අර සමහර අයට විනාඩි 10 ක් දුන්නා රබර් වාගේ. ඒක නිකම් කොයි වෙලාවේ ඉවර වෙනවාද කියලා අපට තේරුණේ නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා හොඳින් කථා කළා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අර ගම්මන්පිල අමාත්‍යතුමා කථා කරද්දී තියෙන තරම් වෙලාව දුන්නා, කථා කරන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා හොඳින් කථා කළා. මට ඕනෑ හොඳින් කථාව අවසන් කරන්න. බොහොම හොඳයි අද. බොහොම ස්තුතියි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඔබතුමාට මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වෙනවා, මට කාලය ලබා දීම ගැන.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නැහැ, නැහැ. ඔබතුමා හොඳින් කථා කළා. මට ඕනෑ හොඳින්ම කථාව අවසන් කරන්න. අද බොහොම හොඳයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

හොඳමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඔබතුමාට මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වෙනවා කාලය ලබා දීම ගැන.

[ අ.භා. 03.10 ]

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස්නාහිර පළාතේ ගරු ප්‍රධාන ඇමැතිතුමා ඉදිරිපත් කරන්නට යෙදුණු යෝජනාව සම්බන්ධයෙන් අපට අදහස් ඉදිරිපත් කරන්න අවස්ථාව ඉඩකඩ ලබා දීම පිළිබඳව අපි ස්තුතිවන්ත වෙනවා. අපි දන්නවා ශ්‍රී ලංකාව සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් වැනි සියලු ජාතීන් ජීවත් වන රටක් බව. මෙවැනි රටක සියලු ජාතීන්ට එක සමාන අයිතිවාසිකම්, එක සමාන භුක්තීන්, එක සමාන ආරක්ෂාව, සමානාත්මතාවය තියාගෙන කටයුතු කරන්න පුළුවන් වුණොත් තමයි අපට රටක්

හැටියට සුහදත්වයෙන් යුතුව ජීවත් වෙන්න වාගේම සංවර්ධිත රටක් කරා යන්න පුළුවන් අවස්ථාව උදා කර ගන්න ඉඩ ලැබෙන්නේ කියන එකයි අපේ විශ්වාසය වෙන්නේ. මා නියෝජනය කරන ලංකා සමසමාජ පක්ෂය ප්‍රමුඛ ලාංකික වාමාංශික ව්‍යාපාරය හැමදාමත් සියලුම ජාතීන්ට එක සමාන තත්ත්වයක් තිබිය යුතුය කියන ස්ථාවරයේ පිහිටා ක්‍රියා කළා. සිංහල, දෙමළ භාෂා දෙකටම එක සමාන තත්ත්වයන් සැලසෙන්නේ නම්, එක රටක් වශයෙන්ද, එක් භාෂාවකට පමණක් ඉඩකඩ සැලසෙන්නේ නම් රට තුළ දෙකඩ වීමක් වාගේම ලේ ගංගාවක් ගලා යාමට හේතු වෙනවාය කියන කාරණාවත් එදා අපි පැහැදිලිව ප්‍රකාශ කළා වාගේම, අපේ රට තුළ එවැනි තත්ත්වයක් ඇති වුණු බවත් අපට පසුගිය අත්දැකීම්වලින් දකින්න පුළුවන් වුණා. ඒක නිසා අපේ රටේ එක්සත් භාවය රැකගෙන සියලුම ජන කොටස්වලට වඩාත් යහපතක් වන විදියට පරිපාලන ක්‍රමවේදයක් ඇති කරගෙන, වැඩ කටයුතු පහසු වන විදියට කර ගන්න බලය බෙදා හැරීම තුළ මේ පළාත් සභා ක්‍රමය, ඒකට එක්තරා ප්‍රමාණයක විසඳුමක් හැටියට කරුණු ඉදිරිපත් වුණාය කියන එක අපි පෙන්නුම් කරන්න ඕනෑ. බලය බෙදීම පිළිබඳව බණ්ඩාරනායක මැතිතුමා ප්‍රමුඛ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, එක්සත් ජාතික පක්ෂය වාගේම මේ රටේ බොහෝ දේශපාලන පක්ෂ විවිධ යෝජනා වරින් වර ඉදිරිපත් කරලා තිබෙනවා. පළාත් සභා ක්‍රමය, එවැනි හදිස්සියේ පැට වූ එකක් නොවෙයි. රට සභා ක්‍රමය වෙන්න පුළුවන්. ෆෙඩරල් ක්‍රමය වෙන්න පුළුවන්. දිස්ත්‍රික් සභා ක්‍රමය වෙන්න පුළුවන්. විවිධ අවස්ථාවල, විවිධ කාලරාමු තුළ, විවිධ දේශපාලන සමාජයීය උවමනාකම් උඩ මේ බලය බෙදීමේ අවශ්‍යතාවය රට තුළ දීර්ඝ කාලයක් තිස්සේ සාකච්ඡාවට භාජනය වුණු කාරණාවක් හැටියට අපි විශේෂයෙන්ම පෙන්නුම් කරන්න ඕනෑ. 1983 කළු ජූලිය ඇති වුණාට පස්සේ, පළාත් සභා ක්‍රමය 1987 නිකම්ම ඉන්දියාවෙන් පැට වූ එකක් හැටියට අපට පිළිගන්න පුළුවන්කමක් ඇති වෙන්නේ නැහැ.

අපි දන්නවා. ජේ.ආර්. ජයවර්ධන මහත්මයා එදා සර්ව පාක්ෂික සම්මේලනයක් පවත්වලා කොහොමද මේ ප්‍රශ්නයට අපි විසඳුමක් සොයන්නේ කියන එක ගැන දීර්ඝ සාකච්ඡාවක් ආරම්භ කරපු අවස්ථාවේ, අපි සමසමාජ පක්ෂය හැටියටත්, වමේ ව්‍යාපාරය හැටියටත් පැහැදිලිව බලය බෙදා හැරීම තුළ මේ ප්‍රශ්නයට විසඳුමක් සොයන්න පුළුවන් වෙනවයි කියන කාරණාව අපි පැහැදිලිව ඉදිරිපත් කරන්නට යෙදුණා. ඒ ආකාරයට එදා බලය බෙදීමේ ක්‍රමවේදයක් හැටියට පළාත් සභා ක්‍රමය අපේ රටට ආවා මිසක් මේක ඉන්දියාව අපට බලෙන් පැට වූ එකක් හැටියට කොහොමටවත් පිළිගන්න පුළුවන්කමක් ඇති වෙන්නේ නැහැයි කියන කාරණාව මතක් කරන්න ඕනෑ. ඒ විදියට ඉන්දියාව අපට මේක බලෙන් පැට වුවා කියනවා නම්, අපට 1948 නිදහස දීපු සෝල්බරි ආණ්ඩුක්‍රමයත් අධිරාජ්‍යවාදීන් අපට ගෙනැත් දීපු එකක් හැටියට කවුරුවත් මේ නිදහස දීපු දවසේ ඉඳලා ඒකට විරුද්ධව කථා කරන්න ඉදිරිපත් වුණේ නැහැ. ඒකත් එහෙම නම් අපට බලෙන් පැට වූ එකක් කියලා පිළිගන්න සිද්ධ වෙනවයි කියන එකත් විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ.

මේ පළාත් සභා ක්‍රමය එදා අපේ වමේ ව්‍යාපාරය වෙන්න පුළුවන්. නැත්නම් මේ රටේ සමාජවාදී ව්‍යාපාරය වෙන්න පුළුවන්. එදා සිටිය සිය ගණනකගේ ජීවිත පරිත්‍යාග කරලා ගොඩ නඟපු එකක් හැටියට අපි විශේෂයෙන්ම සිහිපත් කරන්න ඕනෑ. මෙම තත්ත්වය යටතේ පිහිටවපු පළාත් සභා ක්‍රමය අද වනකොට අවුරුදු 25 කට වැඩි කාලයක් ක්‍රියාත්මක වෙලා තිබෙනවා. මේ අවුරුදු 25 ක කාලය තුළ කවුරුත් ඉදිරිපත් කළේ නැහැ, මේක අහෝසි කරන්න ඕනෑ කියන මතයක්. එහෙම නැත්නම් මේකේ බලය, කැලි ගලවන්න ඕනෑය කියලා කවුරුත් කියන්න ආවේ නැහැ. නමුත් අද උතුරු ඡන්දය පවත්වන්න සූදානම් වන අවස්ථාවේ මේක මේ විදියට ගෙන ඒම ජාතිවාදී උවමනාවක් ඉෂ්ට කරන්නට කටයුතු කිරීමක් හැටියටයි අපට සඳහන් කරන්න වෙන්නේ. අපි දන්නවා අපේ උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමා සඳහන් කළා එතුමන්ලා මේකට විරුද්ධයි කියලා. මම දන්න තරමට එතුමා සර්ව පාක්ෂික කමිටුවේ සමාජිකයෙක් හැටියට හිටපු කෙනෙක් විදියට එතුමා බලය බෙදීමට සම්පූර්ණයෙන් එකඟ වුණා. ඒ විතරක් නොවෙයි. අවසානයක් වන තුරුම එතුමා එතැනදී පළාත් සභාව ක්‍රමයටත් විරුද්ධ වුණේ නැහැ. සමගාමී ලැයිස්තුව අහෝසි කිරීමේ කාරණාවට විතරයි එතුමාට එදා විරුද්ධත්වය දක්වන්න පුළුවන් වුණේ. අද නැවත වතාවක් තමන්ගේ ඡන්ද පදනම හදා ගන්න, තමන්ගේ පාර්ලිමේන්තු සිහිනයන් ඉෂ්ට කර ගන්න මේ විදියට මේ පළාත් සභා ක්‍රමයට විරුද්ධ වෙනවාය, මේ වාගේ ජාතිවාදී මත ගොඩ නඟලා ඒ තුළ මනාප ක්‍රමය සකස් කර ගන්න කරන උත්සාහය මම හිතනවා අපි සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරන්න ඕනෑය කියන එක තමයි අපේ අදහස වෙන්නේ කියන එක විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ. ඒ වාගේම පළාත් සභා ක්‍රමය සුදු අලියෙක් කියලා කිව්වත් කොහොමටත් අපට මේකට එකඟ වෙන්න පුළුවන්කමක් ඇති වෙන්නේ නැහැ.

අපි දන්නවා පළාත් සභා ක්‍රමය සුදු අලියෙක් වෙලා නැහැ. විශේෂයෙන්ම ගමේ ඉන්න මිනිස්සු හැටියට අපි දන්නවා අපේ ගමට කොපමණ සේවයක් මේ පළාත් සභා ක්‍රමය හරහා කරන්න පුළුවන් වෙලා තිබෙනවාද කියලා. මම උපන් ගමට කවදාවත් කාපට් පාරක් එයි කියලා අපට හිතන්න ඉඩකඩක් තිබුණේ නැහැ. අද අපේ ගමේ පාරත් කාපට් පාරක් වෙලා තිබෙනවා. ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ නායකත්වය යටතේ අපේ පාසල් හොඳ දියුණු තත්ත්වයකට අපට ගෙන එන්න පුළුවන්කම ඇති වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමාත් අපේම ප්‍රදේශයේ කෙනෙක් හැටියට එතුමාත් මේකට සාක්ෂි දරනවා ඇතියි කියලා අපි විශ්වාස කරනවා. ඒ නිසා පළාත් සභාව සුදු අලියෙක් වෙලා නැහැ. පළාත් සභාවට ඕනෑ කරන මුදල් දීලා නැහැ. අවශ්‍ය කරන බලය නියම විදියට දීලා නැහැ. හරියට ක්‍රියා කරන්න ඉඩකඩ සලසා නැති නිසා තමයි මේකෙන් නිසි ප්‍රයෝජනයක් ගන්න බාධාවක් ඇති වෙලා තිබෙන්නේ කියන එක අපි සඳහන් කරන්න ඕනෑ. ඊට වැඩිය සුදු අලියෙක් හැටියට අපට මහ ආණ්ඩුව සලකන්න පුළුවන්. දූෂණය, නාස්තිය ඉහවහා ගිහිල්ලා තිබෙනවා. මනාප ක්‍රමය ගෙනැල්ලා තිබෙනවා. රටට

[ ගරු කීර්ති කාරියවසම් ]

ගැළපෙන්නේ නැති ජනාධිපති ක්‍රමය ගෙනැල්ලා තිබෙනවා. මේ ආකාරයට මහ ආණ්ඩුව තමයි අද සුදු අලියෙක් බවට පත් වෙලා තිබෙන්නේ කියන එක අපි විශේෂයෙන්ම සඳහන් කරන්න වෙනවා.

ඒ නිසා අද ආරක්ෂාව පිළිබඳ භය ඇති කර ගන්නවා. පොලිස් බලය දුන්නොත් අපට හානියක් වෙයි කියලා භයක් ඇති කර ගන්නවා. බුද්ධගයාවට අද පහර දෙනකොට කියනවා ප්‍රාන්තවලට තිබෙන පොලිස් බලය ප්‍රමාණවත් වුණු නැති නිසා, ඒ අය ඉදිරිපත් වුණු නැති නිසා බුද්ධගයාවට පහර දෙන්න පුළුවන් වුණාය කියලා. එතකොට අපේ දළදා මාලිගාවට ගහනකොට මහ ආණ්ඩුවේ පොලීසිය නොවෙයිද ලංකාවේ තිබුණේ? මහ ආණ්ඩුවේ පොලීසිය තමයි දළදා මාලිගාවට පහර දෙන වෙලාවෙත් තිබුණේ. මේක ත්‍රස්තවාදයේ ස්වභාවය මිසක් බලයේ ස්වභාවයවත්, බලය බෙදීමේ අඩුපාඩුවක් හැටියටවත් අපට සලකන්න කිසිසේත්ම පුළුවන්කමක් වෙන්නේ නැහැයි කියන එක තමයි අපි විශේෂයෙන්ම සඳහන් කරන්නේ. ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පළාත් සභා ක්‍රමය අහෝසි කරන්න එක්සත් ජනතා නිදහස් සන්ධානයේ කිසිම තීන්දුවක් ඇත්තේ නැහැ. මහින්ද චින්තනය තුළ එවැනි තීන්දුවක් ඇත්තේ නැහැ. මහින්ද චින්තනය තුළ පැහැදිලිව සඳහන් කරලා තිබෙන්නේ, පළාත් සභා ක්‍රමයේ යම් වෙනසක් කරන්න ඕනෑ නම්, අපි ඒක සියලු පක්ෂ අතරේ සාකච්ඡාවකට යන්න ඕනෑය කියන කාරණාවයි. ඒ වාගේම උතුරේ ඡන්දය අද පවතින නීතිය යටතේ පවත්වන්න ඕනෑය කියන එක මහින්ද චින්තනය තුළ ඉතාම පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා. ජනාධිපතිතුමා 13 Plus දෙන්න ලැහැස්තියි කියලා ඉන්දියාවට කියලා තිබෙනවා. ආණ්ඩුව තුළ එවැනි තීන්දුවක් නැහැ. කැබිනට් මණ්ඩලය තුළ තීන්දුවක් නැහැ. අපි පැහැදිලිව දන්නවා, කැබිනට් මණ්ඩලය තුළ මේ කාරණා තේරීම් කාරක සභාවකට යොමු කරනවා මිසක්, මෙවැනි තත්ත්වයක් අරගෙන නැහැයි කියන කාරණාව අපි පැහැදිලිව දන්නවා. එවැනි තත්ත්වයක් තුළ මේ රටේ ජාතිවාදය උසි ගන්වන්න, ඒ තුළින් ප්‍රයෝජන ගන්න උත්සාහ ගන්නා කොටසකගේ උවමනා ඉෂ්ට කරන්න අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ අපේ පක්ෂ මේකට යට වෙන්න ලැහැස්ති වෙනවා නම් එහෙම ඒක මේ රටට කරන විශාල හානියක් හැටියටයි අපට කල්පනා කරන්න සිද්ධ වෙන්නේ කියන කාරණාව විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ. ඒක නිසා අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමා අද මේ ගෙනැල්ලා තිබෙන යෝජනා එක්ක අපට එකඟ වෙන්න පුළුවන් කාරණා තිබෙනවා.

අපි දන්නවා පළාත් දෙකක් එකට එකතු කරන එක අද පවතින නීතියක් බවට පත් වෙලා නැහැ. 13 වෙනි සංශෝධනයේ පැහැදිලිව කියලා තිබෙන්නේ මේ පිළිබඳව පාර්ලිමේන්තුව නීති සකස් කළ යුතුයි කියලයි. එහෙම නැතුව පාර්ලිමේන්තුව මේක නීතියක් බවට පත් කරලා නැහැ. නීතියක් බවට පත් කරන්න නම් නීති සකස් කළ යුතුව තිබෙනවා. අද මේ නැති දෙයක් තමන්ගේ අවශ්‍යතාවය ඉෂ්ට කර ගන්න විතරක් උසි ගන්වන කාරණාවක් බවට මේක පත් වෙලා තිබෙනවා. අද ඒ නිසා මේ සභා දෙකක් එකට එකතු කිරීම සම්බන්ධව ජනාධිපතිතුමා ප්‍රකාශ කළාට පස්සේ යම් කාලසීමාවක් තුළ ඒ ප්‍රදේශවල ජනතාව කැමැත්ත දීලා ඒක අනුමත කරන්න ඕනෑ. එහෙම නැතුව පුළුවන්කමක් ඇති වෙන්නේ නැහැ. අද ඒ නීතිය තහවුරු කරලා තිබෙනවා. ඒක බලයේ පවතින පැවැත්මේ නැති දෙයක් හැටියට අපි සලකනවා. පැවැත්මේ නැති දෙයක් හැටියට සලකන දේ අද මෙතැන යෝජනාවක් හැටියට ගෙන ඒම ගැන අපට විරුද්ධ වෙන්න කාරණාවක් නැහැයි කියන දෙය තමයි අපට සඳහන් කරන්න වෙන්නේ. ඒ වාගේම මේ යෝජනාවේ අවසානයේ පළාත් සභාව තවදුරටත් ශක්තිමත් කරන්න එතුමා යෝජනා කරලා තිබෙනවා. අපි ඒකට එකඟ වෙනවා. නමුත් අවාසනාවට ප්‍රජාතන්ත්‍රවාදය කියලා කාටවත් යමක් බලෙන් පටවන්න අපට පුළුවන්කමක් ඇත්තේ නැහැ. ජේසුස් වහන්සේව ඇණ ගහලා මරන්න තීන්දු කළෙත් ප්‍රජාතන්ත්‍රවාදය. නමුත් වැරදි දෙයක් කරන්න ප්‍රජාතන්ත්‍රවාදයට පුළුවන්කමක් ඇත්තේ නැහැ. තවත් ජාතියකට තවත් කොටසකට බලෙන් පටවන්න පුළුවන්කමක් නැහැ. ඒක ප්‍රජාතන්ත්‍රවාදය වෙන්නේ නැහැ. ඒක නිසා බහුතර පළාත් සභාවකට තීන්දුවක් අරගෙන තවත් කෙනෙක්ට ඒක බලෙන් පටවන්න අපට එකඟ වෙන්න පුළුවන්කමක් ඇත්තේ නැති නිසා මේ යෝජනාවේ දෙවැනි කොටසකට අපට එකඟ වෙන්න පුළුවන්කමක් නැති බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[ අ.භා. 03.21 ]

**ගරු සිසිර ජයකොඩි**
Hon. Sisira Jayakody

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තිස් අවුරුද්දක අවාසනාවන්ත යුද්ධයක් පසු කරලා අපි සිටින්නේ. ඒ වාගේම උතුරු ඡන්දය පැවැත්වීමට රජය සූදානම් වන මොහොතක ජාතික සමගිය වඩාත් අවශ්‍යයි කියලා කථා කරන මොහොතක අපි පසුවෙන්නේ. ඒ නිසාම අපේ රටේ සිංහල, දමිළ, මුස්ලිම් සියලු ජාතීන් සමගිව සිටීමේ අවශ්‍යතාවය අද රටක් වශයෙන් ඉල්ලා සිටින මොහොතක් මේ. අප කිසිසේතම එකඟ නොවන කරුණක් කීර්ති කාරියවසම් ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා. 1977 ජේ.ආර්. ජයවර්ධන පාලනය විසින් ගෙන ගිය බටහිර ගැති, ඇමරිකන් ගැති විදේශ සහ ආර්ථික ප්‍රතිපත්තිය, ඒ වැරදි ආර්ථික ප්‍රතිපත්තිය නිසා තමයි ඉන්දියාව අපේ රටට බලපෑම් කළේ. එතුමා බටහිරට විරුද්ධයි. ඒ ආර්ථික ප්‍රතිපත්තියට විරුද්ධයි. නමුත් ඊට එරෙහිව ඉන්දියාව ගත්තු ක්‍රියා මාර්ගය සම්බන්ධයෙන් එතුමා අමතක කරනවා. ඉන්දියාව මේ ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා අනුගමනය කරපු වැරදි බටහිර ගැති, ඇමරිකානු ගැති විදේශ පිළිවෙත නිසාම අපේ රටට බලපෑම් කළා. ඔබතුමාට මතක ඇති ඉන්දු - ලංකා ගිවිසුම. ඉන්දු - ලංකා ගිවිසුම ගොඩ නැඟුවේ මේ රටේ බහුතර ජනයාගේ අකමැත්තකින්. ගරු සිරිමාවෝ

බණ්ඩාරනායක මැතිනිය ඒ වාගේම මහජන එක්සත් පෙරමුණේ අපේ නායක දිනේෂ් ගුණවර්ධන මැතිතුමා පිටකොටුවේ බෝගහ හන්දියේදී ඉන්දු - ලංකා ගිවිසුමට එරෙහිව මහ සත්‍ය ක්‍රියාවක් සිදු කළා. ඒ ඉන්දු - ලංකා ගිවිසුමෙන් ප්‍රකාශ කර තිබුණු වැරැදි අර්ථ නිරූපණ රාශියක් හේතු කරගෙන. ඒ නිසා ඒ තුළින් ගොඩ නැඟුණු 13 වැනි සංශෝධනයේ තිබෙන අයහපත් ලක්ෂණ ඉවත් කිරීමේ කාර්යය අපට අද පැවරිලා තිබෙනවා. ඒ නිසා අතිගරු ජනාධිපතිතුමා ඒ සඳහා සියලු දේශපාලන නායකයින්ට කැඳවීමක් කරලා තිබෙනවා, සර්ව පාක්ෂික සමුළුවක් සඳහා. තමුන්නාන්සේලාගේ අදහස් ඉදිරිපත් කරන්න කියලා. ඒ තුළින් රට තුළ විවිධ දේශපාලන මත දරන පුද්ගලයින්ට, තැනැත්තන්ට නිදහසේ තමුන්ගේ අදහස් ඉදිරිපත් කිරීමේ අවකාශය සැලසිලා තිබෙනවා. බොහෝ දේශපාලන ව්‍යාපාරවලට සහ සංවිධානවලට අද චෝදනා කරනවා සිංහල ජාතිවාදීන් කියලා. අප කිසිසේත් අමතක කරන්නේ නැහැ. උතුරු පළාත ද්‍රවිඩ ජාතිවාදී සංවිධානවලට බලය ගියොත් ඇති වන අනතුර ගැන කථා කරන්න මේ සභාවේ බොහෝ පිරිස් නිහඬ වෙලා තිබෙනවා. ඒ අතින් ඉන්දු - ලංකා ගිවිසුමේ කොන්දේසි කඩ කරපු අවස්ථා පිළිබඳව උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමා ඉදිරිපත් කරපු කරුණු මම හිතන්නේ, අද ආරක්‍ෂක උපදේශකතුමා වශයෙන් ඉන්දියාවේ සිට මෙහි පැමිණි ශිවශංකර් මෙනන් මැතිතුමාට කවුරු හරි පුවත්පතකින් හරි පෙන්වා දෙනවා නම් - අදහස් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ඒ ගෞරවය අපි උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමාට හිමි කර දෙනවා. ඒ නිසා ජාතිවාදයේ ස්වරූපය සිංහල වෙන්න පුළුවන්. ද්‍රවිඩ වෙන්න පුළුවන්. මුස්ලිම් වෙන්න පුළුවන්. ඒ සියල්ල අපි ප්‍රතික්ෂේප කළ යුතු වෙනවා.

ඒ නිසා අපි විශේෂයෙන්ම දකිනවා අද වනවිට පාර්ලිමේන්තුව සතු ව්‍යවස්ථාදායකගේ බලය, උත්තරීතර නීති පැනවීමේ බලය අද ක්‍රමිකව අහිමි වෙලා තිබෙනවා 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ තිබෙන පරස්පරතාවයන් නිසා. ඒ නිසා පාර්ලිමේන්තුව සතු ඒ ස්වාධීන බලය ව්‍යවස්ථාදායකගේ උත්තරීතර අයිතිය හිමිකර දීම අත්‍යවශ්‍ය වෙනවා. ඒ නිසා අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමා ඉතාම උවමනාවෙන් මේ යෝජනාව තුළින් ඉදිරිපත් කරලා තිබෙනවා, විශේෂයෙන්ම 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පළාත් සභා ලැයිස්තුවේ යම් විෂයයන් සම්බන්ධයෙන් නීති පැනවීමේදී බහුතර පළාත් සභාවල අනුමැතිය ප්‍රමාණවත් කියන කාරණය. මේ කාරණය මත මේ රටේ එක් එක් ජාතිවාදී දේශපාලන කණ්ඩායම්වලට තමුන්ට අවශ්‍ය පරිදි පළාත් සභාව හැසිරවීමේ බලය අවම කිරීමේ හැකියාව තිබෙනවා. අතිගරු ජනාධිපතිතුමා ඉතා දූරදර්ශීව දැකලා, මේ කරුණට අවශ්‍ය මැදිහත්වීම සිදු කරලා තිබෙනවා. ඒ නිසා විශේෂයෙන් මේ යෝජනාවට පක්‍ෂපාතීත්වය අපි එකඟතාවය පළ කරනවා.

ඒ වාගේම විශේෂයෙන්ම සාම්ප්‍රදායික නිජභූමි සංකල්පය මත පිහිටා තමයි උතුරු - නැගෙනහිර එකාබද්ධ කළ යුතුයි කියන අදහස ඉදිරිපත් වුණේ. සංකල්පයක් වශයෙන්ම එය වැරැදියි. මේ අවස්ථාවේ අපි උතුරු - නැගෙනහිර සැබෑ නිජ භූමිය කාගේද කියන තර්කය ගැන මත ඉදිරිපත් කරන්න උත්සාහ කරන්නේ නැහැ. සිංහල, ද්‍රවිඩ, මුස්ලිම් ජනතාව සියලු දෙනාම මේ පළාත්වල දීර්ඝ කාලයක් නිදහසේ ජීවත් වුණු අය. සාම්ප්‍රදායික නිජ බිම කිසිම ජාතියකට නැහැ. ඒ නිසා මේ වැරැදි අර්ථ නිරූපණය තමයි බෙදුම්වාදය සඳහා වූ ප්‍රධාන තර්කය වුණේ. ඒ බෙදුම්වාදය සඳහා වූ තර්කය තමයි බොරු ස්වයං නිර්ණය අයිතිය වැනි න්‍යායවාදී තර්කවලින් බෙදුම්වාදය අනුමත කිරීමේ අන්තර්ජාතික වශයෙන් තිබෙන බටහිර ඩොලර්වල උවමනාව මේ රටේ පැතිරුවේ. ද්‍රවිඩ ජාතිවාදී සංවිධානවලට උත්තේජනයක් වුණේ, මේ නිජභූමි සංකල්පයයි. ඒ නිසා මේ ව්‍යවස්ථාපිත බලය පාර්ලිමේන්තුව තුළ තිබෙන අවස්ථාවේ මේ වැරැදි සංකල්පය ප්‍රතික්ෂේප කිරීම සඳහා වූ යෝජනාව පළාත් ඒකාබද්ධ කිරීම සඳහා ගන්නා වූ ක්‍රියා මාර්ගය වෙනස් කළ යුතුය කියන අදහස අපි අතිශයින් අගය කරනවා. ඒ නිසා ඒ යෝජනාවටත් අපි අපේ පක්‍ෂපාතීත්වය හෙළි කරනවා.

විශේෂයෙන්ම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ශ්‍රේෂ්ඨාධිකරණය එදා 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මේ කරුණට 2/3 ක ව්‍යවස්ථාපිත බලයකට අමතරව ජනමත විචාරණයකුත් ඉල්ලා සිටියා. ශ්‍රේෂ්ඨාධිකරණයේ බහුතර විනිශ්චයකාරවරු විවිධ වෙනස් මත තමයි දැරුවේ. විවිධාකාරයට තමයි මේ ව්‍යවස්ථා කෙටුම්පත පිළිබඳව අර්ථ නිරූපණය කළේ. එහිදී මධ්‍යස්ථව හිටපු විනිශ්චයකාරතුමෙකුගේ අදහස් මත තමයි ජනමත විචාරණය කියන කාරණය අමතක කරලා, ඒ කරුණු පදනම් කරගෙන ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කෙරුණු පෙත්සම් පවා විභාග නොකොට ඉවත දමමින් යුක්තියේ මූල ධර්ම පවා නොසලකමින් ප්‍රජාතන්ත්‍ර විරෝධී ආකාරයට තමයි 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පාර්ලිමේන්තුවට ගෙනාවේ. ඒ විධියට තමයි මේ 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට ඉඩකඩ එදා ජේ.ආර්. ජයවර්ධන පාලනය විසින් සියතට ගත්තේ. ඊට අභියෝග කරමින් සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ඉදිරිපත් කරපු පෙත්සම පවා විසි කරලා දැම්මා. එදා නඩුව ඇහුවේ නැහැ. එදා එවැනි නීති විරෝධී විධියට තමයි ඉන්දු - ලංකා ගිවිසුමත්, 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇතැම් සංශෝධනත් අනුමත කළේ. ඒ නිසා මේ නිජභූමි සංකල්පය පිළිබඳව වැරැදි අර්ථ නිරූපණය මේ ව්‍යවස්ථාපිත බලය හමුවේදී වඩාත් ජනයාට සාධාරණ ලෙස, බහුතර ජනයාට අවාසි සහගත නොවන ලෙස සංශෝධනය කිරීමේ අවශ්‍යතාවයක් අද පැන නැඟිලා තිබෙනවා. ඒ නිසා අවසාන වශයෙන් ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ යෝජනාවේ සඳහන් වෙලා තිබෙනවා, පළාත් සභා ක්‍රමය ශක්තිමත් කළ යුතුය කියලා. මේ පිළිබඳව විවිධ ගැටළු පැවතුණත් පළාත් සභා ක්‍රමයට එරෙහිව දීර්ඝ කාලයක් අදහස් ඉදිරිපත් කළත් මහජන එක්සත් පෙරමුණ විධියට අපි දන්නවා, මේ යෝජනාවේ මූලික හරයන් ලෙස පළමුවැනි දෙවැනි යෝජනාවන් ඉෂ්ට කර ගැනීම සඳහා වූ ඉඩකඩ සඳහාත් වඩා නම්‍යශීලී වූ මාවතකට අපි නැඹුරු වෙලා මේ යෝජනාව සමස්තයක් වශයෙන් සලකා අනුමත කරන්න අපේ එකඟතාවය පළ කරනවා.

[ ගරු සිසිර ජයකොඩි ]

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි දන්නවා අපේ රටේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව එනතුරු පළාත් කියන වචනයවත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කිසිම තැනක තිබුණේ නැහැ. 78 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පළාත් කියන වචනය නැහැ. ඊට කලින් රටේ පරිපාලන ව්‍යුහයන් තිබුණා. 78 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පළාත් කියන වචනය නැහැ. දිස්ත්‍රික්කය පදනම් කරගත්තු සංවර්ධන ඒකකය තමයි තිබුණේ. 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් තමයි ප්‍රථම වතාවට පළාත් කියන වචනය ඇති වුණේ. උතුරේ ගැටළුවට විසඳුම් දෙන්න හදපු පළාත් සභාව අද අපි දකුණේ ඇණ කොටාගෙන වාද විවාදවලට ලක් කර ගන්නවා, උතුරේ ගැටළුවලට විසඳුම් දෙන්න හදපු පළාත් සභා තුළ ඉඳගෙන. ඒ නිසා ඊට වඩා නම්‍යශීලී වූ දිස්ත්‍රික් මට්ටමේ බලය විමධ්‍යගත කිරීමක් සඳහා වැඩ පිළිවෙළකට ගමන් කළ යුතුය කියන යෝජනාව කරනවා. විශේෂයෙන්ම මේ ඡන්ද ක්‍රමය වෙනස් කිරීම් පිළිබඳව අපි විශාල ජයග්‍රහණයක් කළා. පළාත් පාලන ආයතනවල ග්‍රාම සේවා වසම් මට්ටමෙන් ඡන්දයක්. ඒ වාගේම අපි යෝජනා කර සිටියා කොට්ඨාශ මට්ටමෙන් පළාත් සභා හෝ ඒ ගොඩ නහන බල ව්‍යුහය තුළ මහජන නියෝජිතයින් තෝරා ගැනීමේ වැඩ පිළිවෙළක්. ව්‍යවස්ථාදායක සභාව පාර්ලිමේන්තුව නියෝජනය කරන දිස්ත්‍රික් මට්ටමේ ඡන්ද ක්‍රමයක් දක්වා අපේ ඡන්ද ක්‍රමය හැසිරවීමේ නව ඒකක ගොඩ නහා ගැනීමේ අවශ්‍යතාවයක් අපේ රට තුළ මේ මැතිවරණ සදාචාරය ගොඩ නැඟීමේ අවශ්‍යතාවය තුළ තිබෙනවා. ඒ නිසා මේ යෝජනාවේ සමස්ත හරය සැලකිල්ලට අරගෙන අද අප බොහෝ වෙලාවට සැලකිල්ලට ගන්නවා විවිධ දේශපාලන පක්ෂවල විවිධ මත තිබෙනවා. ඒ නිසා පළාත් සභා ව්‍යුහය ගැන විවිධ විරෝධයන් අප හමුවේ තිබුණත් ඒ ව්‍යුහයේ වැරැදි ආකෘතීන් පිළිබඳ කරුණු රාශියක් පැවතුණත් මේ යෝජනාව ජයග්‍රහණය කරවීම අත්‍යවශ්‍ය වන නිසා, ඒ සඳහා වැඩි බහුතරයකගේ සහාය ලබා දීමේ අවශ්‍යතාවය නිසා අපි ඒ සඳහා එකඟතාවය පළ කරමින් නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ අවස්ථාවේදී අශෝකා ලංකාතිලක ගරු මන්ත්‍රීතුමිය මූලාසනාරූඪ වෙනවා ඇති.

***ඊට අනුකූලව ගරු නියෝජ්‍ය සභාපතිතුමා [රංජිත් සෝමවංශ මහතා ] මූලාසනයෙන් ඉවත් වූයෙන් අශෝකා ලංකාතිලක ගරු මන්ත්‍රීතුමිය මූලාසනාරූඪ විය.***

*Accordingly the Hon. Deputy Chairman [Mr. Ranjith Somawansa] left the Chair and Hon. Asoka Lankathilaka M.P.C took the Chair*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

චන්ද්‍රසෝම සරණලාල් ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට අවස්ථාව.

[ අ.භා. 03.33 ]

**ගරු යූ.පී. චන්ද්‍රසෝම සරණලාල්**
Hon. U.P. Chandrasoma Saranalal

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, පළාත් සභා ක්‍රමය මේ රටට හඳුන්වලා දීලා වසර 25 ක් ගත වන මේ අවස්ථාවේදී විශේෂයෙන්ම රටේ ජනතාව බලාපොරොත්තු වෙනවා මූලික පළාත් සභාව හැටියට බස්නාහිර පළාත් සභාව බලය විමධ්‍යගත කිරීම පිළිබඳව කටයුතු කරන්නේ කුමන ආකාරයෙන්ද කියලා. ඒ නිසා මේ සභාව නියෝජනය කරන සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාට මේක ඉතාමත් වැදගත් අවස්ථාවක් හැටියටයි මම දකින්නේ. ඒ වාගේම අද මේ සභාව නියෝජනය කරන ආණ්ඩු පක්ෂයේ බහුතර මන්ත්‍රීවරු සංඛ්‍යාවක් තම කථාවලින් ප්‍රකාශ කළේ, විශේෂයෙන්ම ඔවුන්ගෙන් කියැවුණේ, මේ රට තුළ ජාතිවාදය හා ආගම්වාදය කියන මේ දෙක ගැනයි. ඒ ගැන තමයි වැඩිපුර කථාවට භාජනය වුණේ. මම මේ අවස්ථාවේදී පෙන්වා දෙනවා. විශේෂයෙන්ම, අතිගරු ජනාධිපතිතුමා බහුතර බලයක් මේ රට තුළ ලබා ගත්තේ, මේ ජාතිවාදය හා ආගම්වාදය කියන දෙක ඉදිරියට ගෙන ඒම තුළින් කියලා. ඒක මම මේ අවස්ථාවේදී ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාට පෙන්වලා දෙනවා. ඒ විතරක් නොවෙයි. මේ සභාවේ ආණ්ඩු පක්ෂයේ ඉන්න බහුතර මන්ත්‍රී සංඛ්‍යාවකට මේ සභාවට නියෝජනය කරන්න අවස්ථාව ලැබුණේ, පසුගිය මැතිවරණවලදී ජාතිවාදය හා ආගම්වාදය ඉදිරියට ගෙනැල්ලා කටයුතු කිරීම තුළ කියන එක මම මේ අවස්ථාවේ මතක් කරන්න කැමැතියි. ඒ විතරක් නොවෙයි.

විශේෂයෙන්ම අපට මතකයි මේ පළාත් සභාව, ඒ වාගේම එක්සත් ජනතා නිදහස් සන්ධානය කියන මේ ආණ්ඩුව, පොදුජන එක්සත් පෙරමුණ කියන ආණ්ඩුව නිර්මාණය වුණේ, 1993 දී මේ පළාත් සභාවේ බලය ලබා ගැනීම තුළ කියන එක මම නැවතත් මතක් කරන්න උත්සාහ කරනවා. ඒ වාගේම එක්සත් ජාතික පක්ෂය හැටියට අපි හැම අවස්ථාවකදීම උත්සාහ කරලා තිබෙන්නේ, බලය මධ්‍යගත කිරීමට නොවෙයි. බලය විමධ්‍යගත කරන්න. ඒ වාගේම තමයි වසර ගණනාවක් තිස්සේ තිබුණු ජනවාර්ගික ප්‍රශ්නයට, ඒ යුද්ධයට විසඳුමක් හැටියට තමයි අපි මේ පළාත් සභා ක්‍රමය හඳුන්වලා දුන්නේ. ඉතින් මෙතැනදී මේ පළාත් සභා ක්‍රමය තුළ යම් ගැටළු තිබෙන්න පුළුවන්. ඒක අපි හැම කෙනෙක්ම පිළිගන්න දෙයක්. නමුත් අපි අද මේ රට තුළ මේ පළාත් සභාවල බලය ගැන එහෙම නැත්නම් බලතල ලබා දීම පිළිබඳව කථා කරන්න හේතු සාධක වුණේ ඇයි කියන එක පිළිබඳව අද මේ රටේ බහුතර ජනතාව දන්න දෙයක්. අපි දැක්කා, උතුරු - නැගෙනහිර මැතිවරණය වෙලාවේදී. ඒ වාගේම ගිය ජනාධිපතිවරණය වෙලාවේදී කථා කළේ, 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැනයි. ඒ වාගේම 13 Plus කියලා කිව්වා. ඉන්දියාවට ගිහිල්ලා ජනාධිපතිවරයා මේ බව ප්‍රකාශ කරලා එදා ඒ මැතිවරණවලදී බහුතරය එක්සත් ජනතා නිදහස් සන්ධානය ලබා ගත්තා. එහෙමනම් අද මොකද වෙලා තිබෙන්නේ? අදත්

ඒ වාගේ තත්ත්වයකට තමයි ගිහිල්ලා තිබෙන්නේ. ඉන්දියාවට කිව්වා, උතුරේ පළාත් සභා මැතිවරණය පවත්වනවා කියලා. ඉතින් මේ අවස්ථාව අද යොදාගෙන තිබෙනවා. ආණ්ඩුව ඒකාන්තයෙන්ම දන්නවා උතුරු පළාත් සභා මැතිවරණයෙන් ආණ්ඩුව පරාජයට පත් වන බව. මේක තමයි තිබෙන සත්‍ය තත්ත්වය. ඒ මත තමයි අද උත්සාහ කරන්නේ, මේ රට තුළ යම් ප්‍රශ්නයක් ඇති කරලා, යම් මතවාදයක් ගොඩ නහලා ඒ තුළින් නැවතත් උත්සාහ ගන්නේ අර කිව්ව ආකාරයට ජාතිවාදය ඉදිරියට ගෙනැල්ලා මේ මැතිවරණ ජයග්‍රහණය ලබා ගැනීමට තමයි අද ආණ්ඩුව උත්සාහ කරන්නේ. මේක තමයි ආණ්ඩුවේ බලාපොරොත්තුව.

ඒ නිසා විශේෂයෙන්ම අපි දකිනවා, අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමා එතුමාගේ හෘදය සාක්ෂියට එකඟව නොවෙයි මේ යෝජනාව ගෙනැල්ලා තිබෙන්නේ. මොකද රටේම පළාත් සභාවල අපි දැක්කා, පසුගිය කාල සීමාව තුළ මේ පිළිබඳව මතයක් ගොඩ නහන්න කටයුතු කරනවා. ඒ වාගේම මේ සභාව තුළ සම්මත කරලා, ඒක ආණ්ඩුවට වාසියක් වන ආකාරයට ඒ පළාත් සභාවල කටයුතු කරලා තිබෙනවා. එක්සත් ජනතා නිදහස් සන්ධාන ආණ්ඩුවේ නායකයින්ගෙන් ලැබුණු තීන්දුවලට අනුව තමයි අද අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමා කටයුතු කරන්නේ. අපි දකිනවා එතුමාටත් ගම්පහ දිස්ත්‍රික්කය තුළ ඉදිරි කාලයේදී මොන වාගේ බාධකද තිබෙන්නේ කියන එක පිළිබඳව. අපි දකිනවා, අද මහ ඇමැතිවරයෙක් හැටියට කෙනෙක් ආසනය පුරා, දිස්ත්‍රික්කය පුරා කාන්තාවක් යනවා. ඉතින් මේ වාගේ වාතාවරණයක තමයි එතුමා කටයුතු කරලා තිබෙන්නේ. ඒ නිසා ඒ පිළිබඳව කිසිම ගැටළුවක් නැහැ. මොකද, එතුමා රජයේ නියෝජිතයා හැටියට, ප්‍රධාන අමාත්‍යවරයා හැටියට අද මේ යෝජනාව ගෙන එන්න ඕනෑ. එතැන සාධාරණත්වයක් තිබෙනවා. මම හිතන්නේ, අපේ නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා එතුමාගේ කථාවේ අවසානයේදී මෙතුමාගේ සහෝදරයා ලංකාවේ ක්‍රිකට් නායකයා හැටියට කටයුතු කරපු අවස්ථාවේදී ඒ කරපු ප්‍රකාශය එළියට ගෙනහැර දැක්වූවා.

ඒ නිසා මම විශේෂයෙන්ම මේ අවස්ථාවේදී ඉල්ලීමක් කරනවා. මේ වාගේ පටු ආකල්පවලට මැදි නොවී අපේ ස්වයං අයිතිය, ඒ වාගේම අපි තුළ තිබෙන ස්වාධීන අදහස් ප්‍රකාශ කරලා විශේෂයෙන්ම, උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමා, එතුමාට අද ලොකු අභියෝගයක් වෙලා තිබෙනවා ආණ්ඩුව තුළ කටයුතු කරගෙන යැමේදී මේ ජාතිවාදී, ආගම්වාදී කණ්ඩායම්වලින් මේ එක්සත් ජනතා නිදහස් සන්ධානය නිර්මාණය වීම තුළ ඒ අය කටයුතු කළේ කොහොමද කියන එක පිළිබඳව අපි දැක්කා. ඒ එකතු වීම තුළ, ඒ කරපු කැපවීම තුළ තමයි මෙවැනි බහුතර මතයක් එක්සත් ජනතා නිදහස් සන්ධානය හැටියට ලැබුණේ කියන එක අපි මේ අවස්ථාවේ ආණ්ඩු පක්ෂයට මතක් කරලා දෙනවා. එහෙම නම් අද මේ අයට බෝඩ් ලෑලි ගහලා, ජාතිවාදීන්, ආගම් වාදීන් හැටියට නම් කරලා ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා කථා කෙරුවා අපි දැක්කා, මේක මම දකින්නේ, ඉතාමත් අවාසනාවන්ත තත්ත්වයක් හැටියටයි. මොකද, තුන්වැනි, හතරවැනි පළාත් සභා නියෝජනය කරපු මන්ත්‍රීවරයෙක් හැටියට අපි දැක්කා එදා කොහොමද මේ පළාත් සභාවේ කටයුතු සිදු වුණේ කියලා. පළාත් සභාව තුළ ගරු මන්ත්‍රීතුමන්ලා කථා කළේ කොහොමද කියන එක පිළිබඳව. කොයිම මොහොතකවත් ජාතිවාදය, ආගම්වාදය ඇදගෙන මේ සභාව තුළ ඒ කාලසීමාව තුළ කටයුතු කරලා නැහැයි කියන එක මම මේ අවස්ථාවේ මතක් කරමින්, මට අවස්ථාව ලබා දීම පිළිබඳව විශේෂයෙන්ම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියට මම ස්තුතිවන්ත වෙනවා.

[ අ.භා. 03.40 ]

**ගරු රෙහෙන්සිරි වරාගොඩ**
Hon. Rehensiri Waragoda

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, බස්නාහිර පළාත් සභාව හැටියට අද ජාතික දේශපාලනයේ තිබෙන්නා වූ ඉතාමත් වැදගත් ප්‍රස්තුථයක් හේතු කොටගෙන, අපේ ගරු මහ ඇමැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව සම්බන්ධව අද උදේ ඉඳලා ගරු මන්ත්‍රීතුමන්ලා සෑහෙන පිරිසක් කථා කළා. අපි සියලු දෙනාම එකට, අවංකව, හෘද සාක්ෂියට එකඟව පිළිගන්න ඕනෑ ප්‍රශ්නයක්. 1948 මේ රට නිදහස දිනා ගත්තේ, ජාතික සංගමයක් හැටියට. ඩී.එස්. සේනානායක මැතිතුමා, ඩී.බී. ජයා මැතිතුමා, ජී.ජී. පොන්නම්බලන්, පොන්නම්බලන් අරුනාචලම් ඒ සියලු දෙනා එකතු වෙලා සුද්දාට විරුද්ධව මේ රටට නිදහස දිනා ගත්තා. මේ කියන්නා වූ ඊනියා නිදහස. නමුත් එදා ඉඳලා බලයට පැමිණි සියලු පක්ෂ, සියලු දෙනා එකතු වෙලා ආණ්ඩුව ගෙන ගියේ නැහැ. රට පාලනය කළේ නැහැ. විශේෂයෙන් උතුරු ප්‍රදේශය, ඒ සශ්‍රීක පොළොව, ඒ උගත් ජනතාව, ඔවුන්ගේ අදහස්, ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහයට අරගෙන මේ රටේ ජාතික සැලසුම්වලට එකතු කරලා ගියේ නැති අර්බුදය නිසා තමයි ප්‍රභාකරන්ලා බිහි වුණේ. දැන් මේ වරද නිවැරැදි කරන්න අතිගරු ජනාධිපතිතුමා අවුරුදු 30 ක් පැවැති යුද්ධය තමන්ගේ නීත්‍යානුකූල හමුදාව හරහා මුළු ලෝකයටම ආදර්ශයක් වෙමින්, ජාතිකත්වය ඇති දකුණෙන් බිහි වුණු නායකයා විධියට ඒ යුද්ධය අවසන් කළා. බහු ආගමික රටක් හැටියට, බහු වාර්ගික රටක් හැටියට විවිධ මත තිබෙන සන්ධාන ආණ්ඩුවක නායකයෙක් හැටියට එතුමා මේ පිළිබඳව සියලු දේශපාලන නායකයින්ට මේ අවස්ථාව ලබා දීලා තිබෙනවා, උතුරු - නැගෙනහිර පිළිබඳ මේ ප්‍රශ්නය විසඳන්න.

අද මේ යෝජනාවේදී අපේ විපක්ෂයේ මන්ත්‍රීවරු මේ සර්ව පාක්ෂික සමුළුව ගැන කථා කළා. ඔවුන් හැමදාම නගන චෝදනා මුඛයෙන්ම කථා කළා. තමන් ඉදිරිපත් කරන වැඩ පිළිවෙළ එතැනට ගිහිල්ලා, පාර්ලිමේන්තුවේ තේරීම් කාරක සභාවට සම්බන්ධ වීම තුළින් තමන්ගේ හැකියාව, තමන් පෞරුෂය ඉදිරිපත් කරන්න කියලා මම ගෞරවයෙන් ඉල්ලනවා. ඒ අවස්ථාවේදී තමන්ගේ දායකත්වය මේ ජාතික අර්බුදය විසඳන්න ප්‍රජාතන්ත්‍රවාදීව ඉදිරිපත් වුණාය කියන තමන්ගේ

[ ගරු රෙහෙන්සිරි වරාගොඩ ]

යුතුකම ඉටු කළා වෙන්නේ. මේ ප්‍රශ්නය හරියට තේරුම් ගත්තු අපේ ගරු මහ ඇමැතිතුමා කරුණු තුනක් මුල් කරගෙන අද ඉදිරිපත් කරපු යෝජනාව තුළින් බස්නාහිර පළාත් සභාවේ මහ ඇමැතිතුමා හැටියට, මේ සියලු පළාත් සභාවලින් එකඟතාවය ලබා දීලා තිබෙන අවස්ථාවක බස්නාහිර පළාත් සභාව හැටියට, වැඩිම ජනතාවක් සිටින පළාත් සභාව හැටියට, ඒ වාගේම පළාත් සභා සුදු අලියෙක් නොවෙයි කියලා ඔප්පු කරපු පළාත් සභාවක් හැටියට මෙවැනි අර්බුදකාරී ප්‍රශ්නයකට මුහුණ දෙන්නේ කෙසේද කියන කරුණු ඇතුළත් යෝජනාවලියක් අද එතුමාගේ මේ යෝජනාවේ අන්තර්ගත වෙලා තිබෙනවා.

විශේෂයෙන්ම පළාත් සභාව අවශ්‍යයි කියන මතය තමයි මෙයින් ගම්‍ය වෙන්නේ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රචණ්ඩකාරී පක්ෂයක් නොවෙයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සියලුම ජාතීන්ට ගරු කරන පක්ෂයක්. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් නොවෙයි යාපනයේ පුස්තකාලය ගිනි තිබ්බේ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් නොවෙයි, කළු ජූලිය ඇති වුණේ. ඔය පුස්තකාලය ගිනි තිබ්බ නිසා තමයි ප්‍රභාකරන් හට ලෝකයට ගිහිල්ලා කියන්න පුළුවන් වුණේ මේ රටේ ජාතීන් ද්‍රවිඩ ජනතාවගේ බුද්ධියට ගිනි තිබ්බා කියලා. පස්සේ අර ලක්ෂ්මන් කදිරගාමර් ඇමැතිතුමා තමයි ඒ වෙනස ඇති කළේ. ඒ නිසා ශුද්ධ වූ අයිතියක්, ශුද්ධ වූ උරුමයක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට තිබෙනවා, මේ ප්‍රශ්නය වෙනුවෙන් කථා කරන්න. අපේ හිටපු සදාදරණීය නායිකයාව සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ඒ අවස්ථාවේදී ඒ විධියට ක්‍රියා කරපු එක ඇත්ත. නමුත් භාවිතයේදී අද පළාත් සභා ජනතාව අතරට ගිහිල්ලා ඉවරයි. ජනතාවාදී වෙලා ඉවරයි. ජාතික දේශපාලන දේහය තුළ පළාත් සභා ශරීරගත වෙලා ඉවරයි. පළාත් සභා තුළින් අපි කළා වූ සේවය අපට දැනිලා ඉවරයි. මේ පළාත් සභා මන්ත්‍රීවරු තමයි ජනතාවගේ දුක කඳුළු අතර සිටින්නේ. ඔවුන් තමයි මේ ප්‍රධාන පක්ෂ දෙකේ සුක්කානම හරියට අරගෙන යන්නේ. මෙතැනදී අද හොඳ කථාවක් කියැවුණා. මේ ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකට තමයි මේ වගකීම තිබෙන්නේ. මේ පක්ෂ අවුල් කළා වාගේම විසඳන්න. රටට ආදරය කරන නායකයින් මේ පක්ෂ දෙකේ එකතු වෙලා මෙම අර්බුදයට විසඳුමක් දුන්නොත් ඊළඟ පරම්පරාව යුද්ධය ඉවර කළ ජනාධිපතිතුමාට සලකනවා වාගේ මේ පක්ෂ දෙකේ නායකයන්ට සලකාවි.

ඒ නිසා ගරු ප්‍රධාන ඇමැතිතුමනි, ඔබතුමා බොහොම අත්දැකීම් ඇතුව බොහොම ඉවසීමෙන් සියලු දේ අධ්‍යයනය කරමින් අපේ පළාත් සභාවේ අභිමානය පළාත් සභා අතරට ගෙන එන්නේ කෙසේද කියලා බොහොම හිතලා කරපු යෝජනාවක්. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එක්සත් ජාතික පක්ෂය පැහැදිලිව කියන්න ඕනෑ මේ පළාත් සභා ක්‍රමය පිළිබඳව. අද හරියට පැහැදිලිව කළේ නැහැ. ජනතා විමුක්ති පෙරමුණට මම ස්තුතිවන්ත වෙනවා. උතුරු - නැගෙනහිර උසාවි ගිහිල්ලා වෙන් කරලා දීම පිළිබඳව. හැබැයි පළාත් සභා පිහිටුවන අවස්ථාවේදී කරා වූ ඒ ඝාතනවලින් කිසිදාක ඒ ලේවලින් අත් සෝදාගන්නට බැහැ. මෙන්න මේ විධියට තමයි එදා සහ අද පළාත් සභා ව්‍යුහය, ඒ ව්‍යවස්ථාපිත ඒකකය පිළිබඳව, බලය බෙදා හැරීම පිළිබඳව මේ රටේ ජනතාව අතර තිබෙන මතය. ද්‍රවිඩ ජනතාව, මුස්ලිම් ජනතාව, අපේ රටේ සහෝදර ජනතාව, ශ්‍රී ලාංකික ජනතාව හැටියට අපි සියලු දෙනාගේම ශ්‍රී ලංකා දීපය කියන ආකල්පය ගොඩ නඟමින් මේ ප්‍රශ්නය විසඳන්නට අතිගරු ජනාධිපතිතුමා ඇරෙන්නට පේන තෙක් මානයක වෙන නායකයෙක් නැහැ.

[සභාවේ ඝෝෂා]

මෙවැනි ජාතිකත්වය ඇති නායකයෙකු තුළින් 2/3 බලය ඇති අද වැනි කාලයක ඇරෙන්න, සියලු පක්ෂ එකතු වෙලා ගෙන යන සන්ධාන ආණ්ඩුවකින් විසඳුවොත් ඇරෙන්න විසඳන්නට ලැබෙන්නේ නැහැ කියමින් ඒ සඳහා පටු දේශපාලන වාද භේද හැඟීම් අමතක කරලා, රටක් හැටියට හිතලා, ඊළඟ පරම්පරාව ගැන හිතලා සහයෝගය දෙන්නය කියලා කියමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[ අ.භා. 03.47 ]

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, පළමුකොට මා සන්තෝෂයට පත් වෙනවා පළාත් සභාව, මේ 13 වැනි සංශෝධනය කියන එක මේ ජාතිවාදී සහ ආගම්වාදී කල්ලි විසින් තැනින් තැන කථා කරනවාට වැඩිය මේ වාගේ බුද්ධිමත් සභාවකට අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමා ඉදිරිපත් කිරීම ගැන මා පළමුකොට ස්තුතිවන්ත වෙනවා. නමුත් මේ යෝජනාවේ අන්තර්ගතය ගැන කථා කරන්න ගොඩක් දේවල් තිබෙනවා. නමුත් මෙවැනි දෙයක් මේ සභාවේ සාකච්ඡාවට ලක් කිරීම ඉතාම වැදගත් කාරණාවක් හැටියට මා ප්‍රකාශ කරන්න කැමැතියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මෙම කාරණාව කියන්නේ, මේ රටට බලපාන නීතිය. එහෙම නැත්නම් මේ ජනතාව පාලනය කරන උත්තරීතර නීතිය ඉදිරියට ක්‍රියාත්මක කරන්නේ කොහොමද? යම්කිසි සංශෝධනයක් කරන්න ඕනෑද කියන කාරණාව තමයි අද සාකච්ඡාවට බඳුන් වෙන්නේ. ගරු ප්‍රධාන ඇමැතිතුමා ඉදිරිපත් කරලා තිබෙන යෝජනාවේ පළමුවැනි කොටසේ කියනවා, මෙම පළාත් සභා දෙකක් හෝ කිහිපයක් ඒකාබද්ධ කිරීමක් සිදු වුවහොත් පළාත් සභා පිහිටුවීමේ මූලික අරමුණ ඉටු නොවන බැවින් කියන කාරණාව. මා ඉතාම ගෞරවයෙන් මෙම සභාවට පෙන්වා දෙන්න කැමැතියි. අපේ පවතින ව්‍යවස්ථාවේ 154 (අ) (3) ව්‍යවස්ථාව කියනවා,

*මේ ව්‍යවස්ථාවේ ඉහතින් විධිවිධානයන්ට පටහැනිව කුමක් සඳහන් වුවත් එකිනෙකට යාබද පළාත් සභා දෙකකට හෝ තුනකට එක් ආණ්ඩුකාරවරයෙක්, එක් ප්‍රධාන*

*අමාත්‍යවරයෙක්ගෙන්, එක් අමාත්‍ය මණ්ඩලයකින් සහ තෝරා පත් කර ගන්නා ලද එක් පළාත් සභාවකින් යුත් එක් පරිපාලන ඒකකයක් බවට පත් වීමටද එකී පළාත් එක් එක් පරිපාලන ඒකකයක් වශයෙන් පරිපාලනය කරනු ලැබීමටද දිගටම පවත්වාගෙන යා යුතුද, නැතහොත් ඒ එක් එක් පළාත් වෙනම ආණ්ඩුකාරවරයෙක්, ප්‍රධාන අමාත්‍යවරයෙක් සහ අමාත්‍ය මණ්ඩලයක් සහිතව ස්වකීය වෙනම පරිපාලන ඒකකයක් වශයෙන් සකස් විය යුතුද යන කාරණය නිශ්චය කිරීමේ ආකාරය පිළිබඳවද විධිවිධාන පාර්ලිමේන්තුව විසින් යම් නීතියක් මගින් හෝ නීතියක් යටතේ සැදිය හැක්කේය.*

එහෙම නම් මේ නීතිය හදන බලය තිබෙන්නේ පාර්ලිමේන්තුවට. දැන් පළමුවැනි යෝජනාවෙන් කියන්නේ මේ පාර්ලිමේන්තුවට තිබෙන බලය අයින් කරන්න කියන එකද කියලා ප්‍රශ්නයක් තිබෙනවා. මේ පළාත් සභාවේ 13 වැනි සංශෝධනය කියන්නේ, මේ බලය තිබෙන්නේ පාර්ලිමේන්තුවට. පාර්ලිමේන්තුවට තිබෙන බලයක් අමුතුවෙන් වෙනස් කරන්න අවශ්‍ය නැහැ. මේ පළාත් සභාවක් සම්පූර්ණයෙන් 13 වැනි සංශෝධනයම අහෝසි කරනවා නම් අහෝසි කරන්නත් බලය තිබෙන්නේ පාර්ලිමේන්තුවට. පාර්ලිමේන්තුවට 2/3 ක බලයක් තිබෙනවා. එතකොට සත්‍ය වශයෙන්ම වැදගත් නැති කාරණාවක් ඉදිරිපත් කරලා තිබෙන්නේ.

දෙවැනි කාරණාව තමයි පළාත් විෂයයන් අදාළ තීන්දු තීරණ ගැනීමේදී පාර්ලිමේන්තුවේ බහුතර ඡන්දයකින් අනුමැතියක් ලබා ගැනීම ඇතිද කියන කාරණාව.

තුන්වැනි කාරණාව තිබෙනවා, රටේ ඒකීයභාවයට, භෞමික අඛණ්ඩතාවයට, ජාතික ආරක්ෂාවට කටයුතු කරන්න ව්‍යවස්ථාපිත බලය සහ අරමුදල් ලබා දීලා මේ පළාත් සභාව ශක්තිමත් කරන්න ඕනෑ කියන කාරණාව.

ඉතින් මේ පළාත් සභාව ශක්තිමත් කරනවා නම්, මේ බහුතර බලයකින් හැම තිස්සේම යමක් වෙනස් කරනවා නම් මේ පළාත් සභාව ශක්තිමත් කරන්න බැහැ. එහෙම නම් ඒ යෝජනා දෙකම පරස්පරයි. තුන්වැනි කාරණාවෙන් කියනවා ශක්තිමත් කරන්න ඕනෑ කියලා. දෙවැනි කාරණාවෙන් කියනවා බහුතර බලයකින් වෙනස් කරන්න පුළුවන් කියලා. එහෙම නම් ඒ යෝජනා දෙක එකිනෙකට පරස්පරයි. තර්කානුකූලව කිසිම වැදගත් යෝජනාවක් නොවෙයි අද ඉදිරිපත් වෙලා තිබෙන්නේ. ඒත් එක්කම නීතිමය තත්ත්වය ගත්තොත් 13 වැනි -

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ඔබතුමිය ඉස්සෙල්ලා කිව්වා හොඳයි කියලා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මෙය කථිකාවක් බවට පත්වීම ඉතාම හොඳයි. මොකද, තැනින් තැන කථා කරනවාට වැඩිය, ජනතාව නොමඟ අරිනවාට වැඩිය ඇත්ත කථා කරන එක ඉතාම වැදගත්. ඒත් එක්කම මෙම 13 වැනි සංශෝධනය සම්බන්ධයෙන් අපේ ශ්‍රේෂ්ඨාධිකරණයට යන්න පුළුවන් යම්කිසි පනතක් සම්මත කරලා, එය ව්‍යවස්ථාවට අනනුකූල නම් ශ්‍රේෂ්ඨාධිකරණයට යන්න පුළුවන්. ජනාධිපතිවරයාට යම්කිසි පළාත් සභාවක බලතල අතට ගන්න පුළුවන්කම තිබෙනවා. පාර්ලිමේන්තුව යටතට පත් කරන්න පුළුවන්කම තිබෙනවා. මෙහෙම තිබෙන කොට, ශ්‍රී ලංකාවේ උත්තරීතර ආයතන තුනට පරිපාලනය කිරීමේ අයිතිය තිබෙන කොට, ඇයි අපි මේ උතුරු පළාත් සභා ඡන්දය තියන්න ගිහිල්ලා, අමුතු ආකාරයකට මේ රටේ ආන්දෝලනයක් ඇති කරලා, නැති ජාතික ප්‍රශ්න ඇති කරලා, මොකක්ද මේ කරන්න යන විනාශය කියන එක ගැන පක්ෂ, පාට කණ්ණාඩිවලින් බලන්නේ නැතුව මේ රටේ හැම පුරවැසියෙක්ම තමුන්ගේ කකුළු දෙකෙන් හිටගෙන මේ දිහා විමර්ශනාත්මකව බලන්න කියන එක මා මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න කැමැතියි.

ඒත් එක්කම මේ 13 වැනි සංශෝධනයෙන් 154 ඒ, ඔ, ඕ කියන වගන්තිවල පැහැදිලිවම දක්වලා තිබෙනවා මේ සම්පූර්ණ බලය අපේ පාර්ලිමේන්තුවට යටත් කියන එක. ඒ එක්කම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි පසුගිය කාලෙම අහගෙන සිටියා. මේ පවතින ආණ්ඩුව කිව්වා, 13 න් එහා ගිය විසඳුමක් මේ ද්‍රවිඩ ජාතික ප්‍රශ්නවලට උත්තරයක් හැටියට දෙනවා කියලා. අද කථිකාවක් බවට පත් වෙලා තිබෙනවා. මේ තිබෙන 13 වැනි සංශෝධනයේ තිබෙන යම් යම් බලතල ඉවත් කිරීම ගැන. අපි ඇත්ත වශයෙන්ම මන්ත්‍රීතුමන්ලා හැටියටත්, රටේ පුරවැසියන් හැටියටත් අපි කල්පනා කරන්න ඕනෑ. රාජ්‍ය නායකයෙක් හැටියට තවත් රටක් එක්ක ගනුදෙනු කරන කොට හෝ තමුන්ගේ රටේ තවත් පිරිස් එක්ක, විවිධ ජාතීන් නියෝජනය කරන පිරිස් එක්ක කටයුතු කරනකොට හෝ යම්කිසි වැදගත් ප්‍රතිපත්තියක් අනුගමනය කරන්න ඕනෑ. අපි දෙන්න පුළුවන් දේ දෙන්න පුළුවන් කියන්න ඕනෑ . දෙන්න බැරි දේ බැහැයි කියන්න ඕනෑ. අද එක තැනකට ගිහිල්ලා දෙනවා කියනවා. තව තැනකට ගිහිල්ලා කට්ටියකට කියනවා, මේකට විරුද්ධව කථිකාවක් ඇති කරන්න. මේක දෙන්න හොඳ නැහැයි කියනවා. එහෙමනම් ජාතික ප්‍රතිපත්ති තීන්දු ගැනීමේදී ඒ රාජ්‍ය නායකයන් හෝ ඒ වගකිවයුතු අය කරන ප්‍රකාශය සහ ඒ අය ගිහිල්ලා තමුන්ගේ නොදන්නාකමට හරි නොහැකියාවට හරි කර ගන්න දේවල්වලට උත්තර, අද ජනතාවට සොයන්න වෙලා තිබෙන්නේ. ඒ නිසා මේ සම්බන්ධයෙන් අපි හැම කෙනාම ඇස් ඇරලා බලන්න ඕනෑ. මේක තමයි සැබෑ තත්ත්වය.

ඒ එක්කම තවදුරටත් කියනවා. අපේ මේ උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමා මේ යෝජනාව ගැන කථා කරද්දී බොහොම භයානක පැති කීපයක් අරගෙන පෙන්වනවා. මේ ජාතීන් අතර මේ මේ විධියේ ප්‍රශ්න ඇති වුණාලු. ගහ මරා ගැනීම් ඇති වුණාලු. නමුත් අද අපට බොහොම සාමකාමී වටපිටාවක ඉඳලා මේ ප්‍රශ්නය විසඳන්න පුළුවන්කම තිබෙනවා. දැන් මෙතැන

[ ගරු රෝස් ප්‍රනාන්දු ]

ඉන්න කොට අහස කඩා වැටෙයි කියලා අපට හෙල්මට් දාගන්න කියනවා වාගේ කථා කියලා වැඩක් නැහැ. එහෙමනම් අපි සියලුදෙනාම අවබෝධයෙන් ඉන්න ඕනෑ කරන්නේ මොකක්ද කියලා. අද එහෙම අවබෝධයක් නැතිවයි මේ ජාතිවාදය අවුස්සලා මේ රටේ සංවර්ධනය කරා යන ගමන - එහෙම නැත්නම් මේ රට හැමදාම නොදියුණු රටක් විදියට තිබෙනවා. මේ රට දියුණු කරගන්න, මේ රටේ තිබෙන සම්පත් ප්‍රයෝජනයට ගන්න ඒ ක්‍රමයට යන්න නොදී මේක හැමදාම ජාතීන් අතර, එහෙම නැත්නම් ආගම් අතර ප්‍රශ්නයක් බවට පත් කරලා මෙතැන කුළල් කා ගන්න සැලැස්සුවොත් අපට කවදාවත් ඉදිරි ගමනක් යන්න ලැබෙන්නේ නැහැ. අද එහෙම අවශ්‍යතාවයක් නැති වෙලාවක තමයි මේ ප්‍රශ්න අරගෙන ඇවිල්ලා, ජනතාව ආන්දෝලන තත්ත්වයකට පත් කරලා තිබෙන්නේ. උදාහරණයක් වශයෙන් කිව්වොත් මේක හරියට ළමයෙක් හබ්වෙලා ඉස්කෝලේ යනකොට ඒ ළමයා හම්බ වුණු කාලයට ප්‍රසූත නිවාඩු අනුමත කරන්න ඉල්ලුවා වාගේ කථාවක් මේක. දැන් පළාත් සභා බිහි වෙලා, පළාත් සභාව අවුරුදු 25 ක් ගමන් කරලා තිබෙන කොට පළාත් සභාවේ යම් යම් අඩුපාඩු, එහෙම නැත්නම් මේ ක්‍රියාත්මක වෙද්දී තිබෙන අඩුපාඩු, එහෙම නැත්නම් බලතලවල අඩුපාඩු ගැන කථා කරනවා. මේ පළාත් සභා ක්‍රමය අවුරුදු 25 ක් ක්‍රියාත්මක වෙලා තිබෙනවා.

තමුන්නාන්සේලා මේ පළාත් සභාව ගෙනෙන වේලාවේ කිව්වා. මේක සුදු අලියෙක්. ක්‍රියාත්මක කරන්න බැහැ. වැඩක් වෙන්නේ නැහැයි කියලා. අද අපි අහගෙන සිටියා, ආණ්ඩු පක්ෂයේ බහුතරයක්, වැඩි පිරිසක් කථා කෙරුවේ මේ පළාත් සභාව ජනතාව සමඟ ඉතාමබද්ධ වෙලා තිබෙන, ජනතා සේවාවන් සලසන වැදගත් ආයතනයක් කියලා. එහෙමනම් තමුන්නාන්සේලා අද බලතල අඩු කරන්න හදන්නේ උතුරේ ඡන්දය තිබෙන කොට යම්කිසි භයක් හිතිලා නම් මේකත් මේ තිබෙන තත්ත්වයම යටතේ කිසිම වෙනසක් නොකර ඡන්දය තිබුණොත් - අද ජනතා විමුක්ති පෙරමුණ ආයුධ අරගෙන 87 කැරලි කෝලාහල කරලා අද ජනතා ප්‍රවාහයට අසු වෙලා, මන්ත්‍රීවරු වෙලා අද සභාවල්වල කථා කරනවා. මේ වාගේම දෙමළ පක්ෂවල අයත් ඒ තමන්ගේ නියෝජනය ඡන්දයෙන් ලබාගෙන ඇවිල්ලා ඒ අඩුපාඩු කථා කරලා තමන්ගේ මතය නියෝජනය කරලා ඒ තමන්ට අවශ්‍ය කරන දේවල් ලබා ගත්තාම ඒ ගැටලු ඉබේම විසඳෙනවා. එහෙම නැතිව අහස කඩන් වැටෙයිද කියලා ගමනක් යන්න එළියට බහින්නේ නැතිව හෙල්මට් එකක් දාගෙන ගෙදරට වෙලා ඉන්නවා වාගේ කථාවක් මෙතැනට ගැළපෙන්නේ නැහැ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

කාලවේලාව ඉක්මව ගිහින් තිබෙන නිසා කථාව කෙටි කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඒ නිසා තමුන්නාන්සේලා වැදගත්, බුද්ධිමත් මන්ත්‍රීවරු හැටියට අපේ සභාව හැටියත් අපි කල්පනා කරන්න ඕනෑ. කාගෙවත් අයිතිවාසිකම් කප්පාදු කරන්න පළාත් සභාවට අයිතියක් නැහැ. තවත් පළාතක ජනතාවගේ අයිතිවාසිකම් කප්පාදු කරන්න අපිට තිබෙන අයිතිවාසිකම් නැතිව තව කොටසකට අඩුවෙන් දෙන්න කියලා කියන්න අපට අයිතියක් නැහැ. අපි 87 ඉඳලා මේ වනතුරු මේ 13 වැනි සංශෝධනය යටතේ පළාත් සභා ක්‍රමය පවත්වාගෙන ආවා නම් ඒ අයිතිවාසිකම ද්‍රවිඩ ජනතාවටත් දෙන්න ඕනෑය කියන මතයේ අපි ඉන්නේ. එම නිසා තමුන්නාන්සේලාට අපි කියන්න කැමැතියි. තමුන්නාන්සේලාගේ ඉතිහාසය තමුන්නාන්සේලා දන්නවා. තමුන්නාන්සේලාගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ මේ සියලුම සහෝදරවරු විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න පෙළපාළි ගියා. පෙළපාළි ගිහිල්ලා බලයට පත් වෙලා ජනාධිපතිකම ලබා ගත්තා. දැන් ජනාධිපතිකම ලබාගෙන විධායක ක්‍රමය අහෝසි කෙරුවේ නැහැ. තව සැරයක් ඡන්දය ඉල්ලන්න පුළුවන් විදියට 19 වැනි සංශෝධනයක් ගෙනාවා. බලය වැඩි කරගත්තා. ඉතින් එහෙමනම් මේ රට විහිළු සපයන්නන්ගේ දේශයක් බවට පත් කරන්නේ නැතිව බුද්ධිමත් මිනිසුන්ගේ දේශයක් බවට පත් කරන්න තර්ක විතර්ක කරන්න කියමින් මේ යෝජනාවට විරුද්ධත්වය ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

[ අ.භා. 04.00 ]

**ගරු සුගත් මතුගමගේ**
Hon. Sugath Mathugamage

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඉදිරිපත් කරන ලද යෝජනාව සම්බන්ධයෙන් අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ප්‍රථමයෙන්ම ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා. පළමුව මම කියන්න ඕනෑ, එක්සත් ජනතා නිදහස් සන්ධානයේ සහෝදර පක්ෂයක් හැටියට ජාතික නිදහස් පෙරමුණ ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද මේ සුවිශේෂ යෝජනාව සම්බන්ධයෙන් අපි එකඟතාව පළ කරන සිටිනවා. අපි දේශපාලන ව්‍යාපාරයක් වශයෙන් ජාතික සමඟිය හා සහජීවනය ගරු කරන දේශපාලන ව්‍යාපාරයක්. හැබැයි අපි අවධාරණයෙන් කියන්න ඕනෑ. අපි බෙදුම්වාදය හෙළා දකින දේශපාලන ව්‍යාපාරයක්. මේ අර්ථයෙන් තමයි අපට පළාත් සභාව සම්බන්ධයෙන් විවේචනයක් තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේක තේරුම් ගන්නත් ඔළුව විතරක් තිබිලා මදී. මොළේ තිබෙන්න ඕනෑ. ඒක නොතේරෙන අය සම්බන්ධයෙන් අපට කනගාටුයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අවුරුදු 30 ක් තිස්සේ මේ රටේ පැවැති බෙදුම්වාදී යුද්ධය විරෝධාර රණවිරුවන්ගේ ජීවිත පූජාව හා අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ නිවැරැදි දේශපාලන නායකත්වය යටතේ තීරණාත්මක වූ පරාජයට පත් කරලා, මේ රට එක්සේසත් කරන්න පුළුවන්කම ලැබුණා කියලා අපි

කවුරුත් දන්නවා. හයවැනි පරාක්‍රමබාහු රජ්ජුරුවන්ගෙන් පස්සේ, ඒ කියන්නේ අවුරුදු 600 කට පස්සේ මේ රට එක්සේසත් කරනු ලැබුවේ, එතුමාගේ දේශපාලන නායකත්වය යටතේ. ඒ ලබා ගත්ත ජයග්‍රහණ, ඒ ලබා ගත් යුධ ජයග්‍රහණ ආපස්සට හරවන්න දෙන්න බැහැයි කියන ස්ථාවරය තුළ තමයි අපි ඉන්නේ. අපි විශ්වාස කරනවා. අපේ සහෝදර ගරු මන්ත්‍රීවරුන් කරනු ලැබූ සමහර ප්‍රකාශයන් තුළ අප සම්බන්ධයෙනුත් යම් ප්‍රකාශයන් කියැවුණා. අපි පළාත් සභාවට විරුද්ධ, ඒ වාගේම බලය බෙදීමට විරුද්ධ දේශපාලන ව්‍යාපාරයක්ය කියන එක පිළිබඳව ඍජුව සහ වක්‍රව ප්‍රකාශ කරනු ලැබුවා. අපි බොහොම පැහැදිලිව කියනවා. අපි පළාත් සභාවටවත්, බලය බෙදීමටවත් විරුද්ධ නැහැ. හැබැයි, බෙදුම්වාදය ශක්තිමත් කරන, බෙදුම්වාදයට උඩගෙඩි දෙන පළාත් සභා ක්‍රමයකටත්, ඒ වාගේම බෙදුම්වාදය ශක්තිමත් කරන බලය බෙදීමකටත් අපි විරුද්ධයි. ඒ හැරුණු කළ පළාත් සභා ක්‍රමය සම්බන්ධයෙන් හෝ බලය බෙදීම සම්බන්ධයෙන් වඩාත් අර්ථාන්විත විද්‍යාත්මක බලය බෙදීමකට පළාත් සභා හෝ වෙනත් බල ව්‍යුහයකට අපේ කිසිම විරෝධතාවයක් නැහැයි කියන එක පිළිබඳව මේ අවස්ථාවේ මතක් කරන්න ඕනෑ. අන්න ඒ අර්ථයෙන් තමයි ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද මේ යෝජනාවට අපි පක්ෂපාතීත්වය ප්‍රකාශ කරනු ලබන්නේ.

අපි විශ්වාස කරනවා, අද මේ වෙනකොට තිස් වසරක් තිස්සේ පැවැති බෙදුම්වාදී යුද්ධය තීරණාත්මකව පරාජයට පත් කරනු ලැබුවත් අපට පරාජයට පත් කරන්න ලැබුණේ බෙදුම්වාදී යුධ පෙරමුණ පමණයි. බෙදුම්වාදී දේශපාලන පෙරමුණ නැවතත් ශක්තිමත්ව හිස ඔසවමින් ඉන්නවා. ඒ සඳහා නිදසුනක් මම ඉදිරිපත් කරන්නම්, මගේ අත්දැකීමෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. මීට දින කීපයකට පෙර මට මගේ පැරැණි මිත්‍රයෙක් මුණ ගැසුණා. මාගේ ගුරුවරයෙක් හැටියට පොළොන්නරුව දිස්ත්‍රික්කයේ උගන්වද්දී මා සමඟ එකට උගන්වපු දෙමළ ජාතික ගුරුවරයෙක්. ඔහු දැන් සිංගප්පූරුවේ පදිංචි වෙලා ඉන්නේ. ඔහු ලොකු ව්‍යාපාරිකයෙක්. ඒ වාගේම ඔහු දෙමළ ඩයස්පෝරාව නියෝජනය කරන ප්‍රබල ක්‍රියාකාරිකයෙක්. ඔහු මා සමඟ සාකච්ඡා කරද්දී මට කිව්වා, අපි අවුරුදු 30 ක් තිස්සේ මේ රටේ දෙමළ ජනතාවට වෙනම රාජ්‍ය නිර්මාණය කර ගැනීම සඳහා ගෙන ගිය ඒ අරගලය දකුණේ සිංහල ආණ්ඩු විසින් ලෙයින්, යකඩින් මර්දනය කරනු ලැබුවා. නමුත් අපි අපේ අරමුණ වෙනස් කරගෙන නැහැ. හැබැයි, අපි අපේ උපාය මාර්ගය වෙනස් කරගෙන තිබෙනවා කියලා. ඔහු කියනවා, අපි දැත්වල ලේ තවරා ගන්නේ නැතිව, එකම ජීවිතයක්වත් දෙන්නේ නැතිව දකුණේ ආණ්ඩු විසින් දීලා තිබෙන 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය භාවිතා කරලා ඒ ව්‍යවස්ථාපිත බලය හරහා ඊළාම් රාජ්‍ය නිර්මාණය කර ගැනීමේ අරගලය කරා අපි යනවා. ඒක අපි දැන් පටන් අරගෙනයි තිබෙන්නේ කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ අනුව පැහැදිලියි. අද උතුරේ අන්තවාදීන් මේ පළාත් සභා භාවිතා කරන්න උත්සාහ ගනු ලබන්නේ, කුමක් සඳහාද කියන කාරණය. ඒ නිසා පළාත් සභාවට විරුද්ධ නොවුණත් අපි, උතුරේ වෙනම දෙමළ රාජ්‍යයක් නිර්මාණය කර ගැනීම සඳහා බලපැවැත්වෙන ආකාරයේ බෙදුම්වාදී බලතල මේ පළාත් සභා බල ව්‍යුහය ඇතුළේ තිබෙන නිසා ඒවා ඉවත් කර ගන්නා වූ ඕනෑම යෝජනාවකට අපි පක්ෂපාතීයි. අන්න ඒ අර්ථයෙන් තමයි මේ බෙදුම්වාදය බෙලහීන කරන, බෙදුම්වාදය නිර්වින්දනය කරන ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඉදිරිපත් කරලා තිබෙන මේ යෝජනා තුන සම්බන්ධයෙන් අපේ පක්ෂපාතීත්වය අපි ඉදිරිපත් කරන්නේ. මෙහි පළමුවැනි සහ දෙවැනි යෝජනා සම්බන්ධයෙන් කිසිඳු පැකිළීමකින් තොරව, කිසිඳු කොන්දේසියකින් තොරව අපි අපේ පක්ෂපාතීත්වය, අපේ සහයෝගය පිරිනමනවා. තුන්වැනි යෝජනාව සම්බන්ධයෙනුත් පොඩි අර්ථකථනයක් සහිතව අපි සහයෝගය පළ කරනවා.

මේ වගන්තියේ මෙහෙම එනවා.

*"රටේ ඒකීයභාවයට, රටේ භෞමික අඛණ්ඩතාවයට සහ ජාතික ආරක්ෂාවට හානියක් නොවන පරිදි නියමිත අරමුදල් සපයමින්, ව්‍යවස්ථාපිත බලය ලබා දෙමින් සියලු පුරවැසියන් සතු ප්‍රජාතන්ත්‍රවාදී බලය උපරිම ලෙස ශක්තිමත් වන ආකාරයට පවත්නා පළාත් සභා ක්‍රමය ශක්තිමත්ව තවදුරටත් පවත්වාගෙන යාමට පියවර ගැනීම සුදුසුය කියන එක. "*

මෙහි මෙන්න මේ පළාත් සභා ක්‍රමය තවදුරටත් ශක්තිමත්ව පවත්වාගෙන යාම කාරණය පිළිබඳව පුංචි වෙනසක් තිබිය යුතුයි. මම හිතන්නේ ගරු ප්‍රධාන ඇමැතිතුමා ඒ නිවැරැදි අදහසින් වෙන්න ඕනෑ මෙය ඉදිරිපත් කරලා තිබෙන්නේ. බෙදුම්වාදී බලතල රහිත, බෙදුම්වාදී බලතල නැති ශක්තිමත් පළාත් සභාවක් කියන අර්ථයෙන් විය යුතුයි එතුමා මෙය ඉදිරිපත් කරලා තිබෙන්නේ. එතුමා එසේ ඉදිරිපත් කරලා ඇතැයි කියන විශ්වාසය තුළ අපි ඉන්නවා. ඒ නිසා බෙදුම්වාදී බලතලවලින් තොර, එහෙත් ශක්තිමත් පළාත් සභාවක් කියන අර්ථයෙන් නම් මේ කාරණාව ඉදිරිපත් කරලා තිබෙන්නේ - අපි විශ්වාස කරනවා ඒ අර්ථයෙන් කියලා. ඒ අනුව මේ යෝජනාව සම්බන්ධයෙන් අපි අපේ සහයෝගය පළ කර සිටිනවා.

අපේ විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා තමන්ගේ කථාවන් ඉදිරිපත් කරද්දී, විශේෂයෙන් අපේ ඒ.එම්. යූසුෆ් ගරු මන්ත්‍රීතුමාත්, ඒ වාගේම රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියත් ප්‍රකාශ කරනු ලැබුවා. ශක්තිමත් පළාත් සභාවක් කියන කාරණාව තුන්වැනි වගන්තියේ තිබෙනවාය. හැබැයි, ඒක පළමුවැනි හා දෙවැනි වගන්තිවල මේ කියලා තිබෙන කාරණා තුළින් නිශේධ වනවාය කියලා. ඇත්තෙන්ම මේ ශක්තිමත් පළාත් සභාවක් හා බෙදුම්වාදී බලතල නිෂ්ක්‍රීය කරන පළාත් සභාවක් කියන්නේ දෙකක්. මේ දෙකම එකක් නම්, ශක්තිමත් පළාත් සභාවක් සහ බෙදුම්වාදී බලතල සහිත පළාත් සභාවක් කියලා නම් මේකේ තිබෙන්නේ, අපි එකඟ වෙන්නේ නැහැ. හැබැයි බොහොම පැහැදිලිව මේකේ කියන්නේ, මේ පළමුවැනි හා දෙවැනි කාරණාවලින් කියන්නේ, බෙදුම්වාදී බලතල නිෂ්ක්‍රීය කරන එහෙත් ශක්තිමත් පළාත්

සභාවක්. ශක්තිමත් පළාත් සභාවක් මෙහෙම නොවෙයි නම්, දුර්වල ක්‍රියාකාරිත්වයකින් යුක්ත වූ පළාත් සභාවක් නම් එහෙම පළාත් සභාවක් වැඩක් නැහැ. ඒ හරහා සිදු වන්නේ මහජන මුදල් නාස්තිවීමක් පමණයි. ඒ නිසා පළාත් සභා ශක්තිමත් කිරීම කියන එක නම් මෙයින් අදහස් කරන්නේ, පැහැදිලිවම බෙදුම්වාදී බලතල රහිත, එහෙත් මූල්‍ය බලතල හා අනිකුත් බලතල පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වන පළාත් සභාව කියන අර්ථයෙන්. ඒ නිසා ඒ පිළිබඳව ගැටලුවක් ඇති කර ගැනීම අවශ්‍ය නැහැයි කියන කාරණාවයි අපි මෙතැනදී ඉදිරිපත් කරන්නේ. අපේ ජනතා විමුක්ති පෙරමුණේ නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා එතුමාගේ කථාවේදී එතුමා ලඝු කරනවා, මේ පළාත් සභා සම්බන්ධයෙන්, 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධයෙන් ගෙන එන සංශෝධන රටේ පවතින ජනතා ප්‍රශ්න යට ගහන්න මේ වේලාවේ පාවිච්චි කරන එකක්ය කියලා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ඇත්ත නේන්නම්.

**ගරු සුගත් මතුගමගේ**
Hon. Sugath Mathugamage

ඇත්තෙන්ම කනගාටුයි. මම දකින විධියට එතුමන්ලා තමයි මේ සටනේ මීට වැඩිය ඉදිරියෙන් ඉන්න ඕනෑ. 13 වැනි ව්‍යවස්ථා සංශෝධනය ගෙනෙන මොහොතේ තමන්ගේ සගයෝ දහස් ගණනක් ජීවිත පූජා කළා, මේ ඉන්දියානු බලහත්කාරයට එරෙහිව මේක ආපස්සට හරවන්නට. එහෙම කථා කරපු ජනතා විමුක්ති පෙරමුණ අද මේ සටන අතහැරලා මේ සටන ගෙන යන අයට දැන් කියනවා මේ මහජන ප්‍රශ්න යට ගහන්න මේවා ගේනවා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට මතකයි ඒ දවස්වල පෝස්ටරයක තිබුණා. "අවසන් දේශද්‍රෝහියා අවසාන ඉන්දියානු සෙබලාගේ බඩ වැලෙන් එල්ලන තුරු සටනේ කියලා" කියපු ජනතා විමුක්ති පෙරමුණ අද සටන අතහැරලා -

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ඔබතුමා ඒ කාලයේ කොහෙද සිටියේ?

**ගරු සුගත් මතුගමගේ**
Hon. Sugath Mathugamage

ඒ සටන සම්බන්ධයෙන් අද කරනු ලබන ප්‍රකාශ සම්බන්ධයෙන්. ඒක තමයි අපට වේදනාව තිබෙන්නේ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ඔබතුමා ඒ කාලයේ කොහෙද සිටියේ?

**ගරු සුගත් මතුගමගේ**
Hon. Sugath Mathugamage

ඒ නිසා තමයි වේදනාව තිබෙන්නේ. පැහැදිලිවම. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ චන්ද්‍රසෝම සරණලාල් ගරු මන්ත්‍රීතුමා කරපු ප්‍රකාශයක් සම්බන්ධයෙන් පොඩි මතක් කිරීමක් කරන්න ඕනෑ. එතුමාගේ කථාවේදී එතුමා කියනවා. අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා විශාල ජනතා ජයග්‍රහණයක් ලබා ගත්තේ ජාතිවාදය හා ආගම්වාදය භාවිතා කිරීම තුළින්ය කියලා. ඒ වාගේම මේ සභාවේ බහුතරයක් ගරු මන්ත්‍රීවරු ජයග්‍රහණය කරනු ලැබුවේ, ජාතිවාදය හා ආගම්වාදය පාවිච්චි කිරීම නිසාය කියලා. මේ ප්‍රකාශ අපි හෙළා දකිනවා. ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා මහා දැවැන්ත ජයග්‍රහණයක් අත්පත් කර ගත්තේ බෙදුම්වාදී ත්‍රස්වාදය දණගස්සවලා, ශ්‍රී ලංකාවට නිදහස ලබා දීමේ ප්‍රතිඵලයක් හැටියටයි. ඒ නිදහස් සටනේ පුරෝගාමී කාර්යය භාරයක් මේ සහෝදර මන්ත්‍රිවරු කරපු නිසා, එකට ජනතා උපහාර පිදීමේ ප්‍රතිඵලයක් හැටියට තමයි මේ සහෝදර මන්ත්‍රිවරුන් අද මේ සභාව නියෝජනය කරන්නේ කියන කාරණාව මතක් කරමින් බෙදුම්වාදී බලතල නිෂ්ක්‍රීය කරන, නිර්වින්දනය කරන, මේ යෝජනාවට පරිබාහිරව අපි දකිනවා, පොලිස් බලතලත්, ඉඩම් බලතලත් ඉවත් කරන සංශෝධන සඳහා රජය යොමු විය යුතුයි කියන කාරණාවත්. විශේෂයෙන් අපි දන්නවා, මේ පොලිස් බලතල ලබා දීම හරහා පුනරුත්ථාපනය කළ එකොළොස්දාහක් කොටි අද උතුරේ ඉන්නවා. එදා උතුරේ වෙනම පොලිස් රාජ්‍යයන් නිර්මාණය වීම හේතු කොට ගෙන, මේ කොටි, පොලිස් හමුදාවට බැඳීම හේතු කොට ගෙන කොටින් අතට නැවතත් ආයුධ ගලාගෙන එනවා. ඒ නිසා මේ පොලිස් බලතලත් මේකෙන් ඉවත් කරන්න කියන කාරණය අපි මතක් කරනවා. ඒ වාගේම ඉඩම් බලතල සම්බන්ධයෙනුත් විරුද්ධයි. ඒ නිසා ඉඩම් බලතල සහ පොලිස් බලතල-

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

කොටි ඉන්න ආණ්ඩුවේ -

[සභාවේ ඝෝෂා]

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

කාලය ගැන හිතන්න.

**ගරු සුගත් මතුගමගේ**
Hon. Sugath Mathugamage

කියන යෝජනාව ද ගෙනා යුතුයි කියන කාරණය මතක් කරමින්

[සභාවේ ඝෝෂා]

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

අද විමල් විරවංශයි, කරුණයි එකට කන්නේ.

**ගරු සුගත් මතුගමගේ**
Hon. Sugath Mathugamage

යෝජනාවට පක්ෂපාතිත්වය ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

මේ අවස්ථාවේදී ගරු සභාපතිතුමා මූලාසනාරූඪ වෙනවා ඇති.

***ඊට අනුකූලව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය [අශෝකා ලංකාතිලක මෙනෙවිය] මූලාසනයෙන් ඉවත් වූයෙන් ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා ] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Presiding Member [Miss Asoka Lankathilaka] left the Chair and Hon. Chairman [Mr. Sunil Wijeratne] took the Chair.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ශ්‍රීනාත් ම. පෙරේරා ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට අවස්ථාව.

[ අ.භා. 04.12 ]

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ගරු සභාපතිතුමනි, මේ අවස්ථාව සලසා දීම පිළිබඳව මුලින්ම මා ඔබතුමාට මගේ ගෞරවය හා ස්තූතිය පුද කරනවා. මම මේ පිළිබඳ කථා කරන්න ඉස්සෙල්ලා මට උදේ ඉඳන් තිබුණු ගැටළුවක් තියෙනවා. මේ මොහොතේ ඇයි මේ වගේ යෝජනාවක් මේ සභාවට ඉදිරිපත් කළේ ? මම හිතනවා, අපට යෝජනා සම්මත කරලා රජයට යම් යම් යෝජනා ඉදිරිපත් කළ හැකියි. නමුත් මේ යෝජනාව මේ මොහොතේ ඉදිරිපත් කරන්නේ ඇයි කියන කාරණාව ගැන මට තාම හරියට තේරුම්ගන්න බැරි වුණා. කාගේ අවශ්‍යතාවක් සඳහා, කිනම් කාරණාවක් සඳහා - (බාධා කිරීමක්)

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

කථා කරන්නේ අපරාදේ.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

පොඩ්ඩක් ඉන්නකෝ. කථා කරන්න දෙන්න කෝ.?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර බාධා කිරීම් කරන්න එපා. එතුමාට බාධා කිරීම් කරන්න එපා. කරුණාකර සභාව නිශ්ශබ්දවන්න.

[සභාවේ සෝෂා]

එතුමා බාධා කිරීම් කරන මන්ත්‍රීවරයෙක් නොවෙයි එතුමා. එතුමාට අවස්ථාව ලබා දෙන්න. ඔබතුමා කථා කරන්න.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

මොකද, යථා කාලයේ දී රජය මේ වෙනස්කම් සංශෝධනය කරන්නට තිරණය කළොත් - මා විශ්වාස කරනවා, ගරු ජනාධිපතිතුමා විසින් මේ කාරණයම මේ සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමේ හැකියාවක් තියෙනවා. එතකොට අපි අද උදේ ඉඳලා හැන්දෑව වනතුරු කරපු මේ සාකච්ඡාවෙන් කරලා තියෙන්නේ, කාලය නාස්තිය කිරීමක් විතරයි කියලයි මම හිතන්නේ. කෙසේ වෙතත්, අද මේ සභාවේ ගරු මන්ත්‍රීවරුන් ප්‍රකාශ කළ කරුණුවලට වඩා ටිකක් වෙනස් කරුණක් පිළිබඳව මගේ අදහස් ප්‍රකාශ කරන්නට ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ අවසරය ඉල්ලා සිටිනවා. ගරු සභාපතිතුමනි, මේ රටේ අතිවිශාල ප්‍රශ්න ගණනාවක් ඇති වෙලා තියෙනවා. විදුලි බිල වැඩි කරලා තියෙනවා. (බාධා කිරීමක්)

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ඕක යෝජනාවට අදාළ නැහැ නේ.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

පොඩ්ඩක් ඉන්න කෝ කථා කරන්න දෙන්න කෝ?

[සභාවේ සෝෂා]

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

ඕවා යෝජනාවට අදාළ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බාධා කිරීම් කරන්න එපා එතුමාට.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ජලය සඳහා මුදල් වැඩි කරලා තියෙනවා. බස් ගාස්තු වැඩි කරලා තියෙනවා. ඉන්ධන ගාස්තු වැඩි කරලා තියෙනවා.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

කාලය නාස්තියක්.

**ගරු උපාලි කොඩිකාර** – අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

කොහේද වැඩි කරලා තියෙන්නේ ?

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

පනින්නේ නැතිව වාඩිවෙලා ඉන්න කෝ මහත්තයෝ.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

කාලය නාස්තියක් -

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

මේ සියළු ප්‍රශ්නවලින් ජනතාව මිරිකිලා ඉන්න අවස්ථාවේ දී ජනතාවගේ අවධානය වෙනත් කාරණාවක් සඳහා යොමු කරලා, එමගින් මේ පීඩනයට පත් වෙලා ඉන්න ජනතාගේ මනස වෙනත් මඟකට යොමු කිරීමේ ප්‍රමුඛ අරමුණක් ඇතිව මේ ප්‍රශ්නය ආණ්ඩුව සමාජගත කරනවා කියන එක මම විශ්වාස කරනවා. අද මිනිස්සු විදුලි බිල ගැන කථා කරන්නේ නැහැ. අද මිනිස්සු කථා කරන්නේ, 13 වන සංශෝධනය, සංශෝධනය කිරීම ගැන. ගරු සභාපතිතුමනි, මා වගකීමෙන් යුතුව කියනවා,

[සභාවේ ඝෝෂා]

පොඩ්ඩක් ඇහුන්කන් දීලා තේරුම් ගන්න හදන්න. යමක් වටහා ගන්න හදන්න. නොතේරෙනවා නම්. (බාධා කිරීම්) ගරු සභාපතිතුමනි, මෙම ප්‍රශ්නය මත දැන් අපි මොකක්ද මේ යෝජනා කරන්නේ? මේ යෝජනා කරන සංශෝධනය කරන්න අවශ්‍යතාවක් නැහැ. මේ නීතිය, අදත් කරන්න බලාපොරොත්තු වෙනවයි කියන සංශෝධනය නොකළත්, තියෙන නීතිමය තත්ත්වය ගැනමයි අපි මේ අද කථා කළේ. ඇයි මම එහෙම කියන්නේ? මේ යෝජනාව යටතේ කාරණා දෙකක් යෝජනා කරනවා. එකක් තමයි යාබද පළාත් දෙකක් හෝ තුනක් යා කිරීම සඳහා තියෙන විධිවිධාන සංශෝධනය කිරීම.

දෙවන කාරණය තමයි පළාත් සභා පිළිබඳ සඳහන් වන 17 ඒ කියන පරිච්ඡේදය මේ ව්‍යවස්ථාවේ තියෙන සහ නවවන ලැයිස්තුවේ තියෙන විධිවිධාන වෙනස් කිරීමේ දී සියලු පළාත් සභාවල අවසරය ලබා ගත යුතුයි කියන කාරණය සංශෝධනය කරලා, බහුතර පළාත් සභාවල අනුමැතිය ඇතිව පමණක් එය කරන්න හැකි වන ආකාරයට 13 වන සංශෝධනය, සංශෝධනය කළ යුතුය කියලයි මේ යෝජනා කර ඇත්තේ. මේකේ පළමුවන කාරණාව අරගෙන බලමු. පළමුවන කාරණාව තමයි, පළාත් දෙකක් යාබද තියෙන පළාත් දෙකක් හෝ තුනක් ඒකාබද්ධ කරන්න කියන විධිවිධානය. දැන් අපි ව්‍යවස්ථාවේ, ව්‍යවස්ථාව කියවලා නැත්නම් ව්‍යවස්ථාවේ 154 අ යන්න තුළින් කියනවා, ව්‍යවස්ථාව යටතේ පළාත් දෙකක් හෝ තුනක් යා කරන්න හෝ ඒකාබද්ධ කරන්න ඕනෑ නම් ඒ සඳහා නීති සම්පාදනය කිරීමේ බලය පාර්ලිමේන්තුවට තියෙනවාය කියලා. මේ බලය පාවිච්චි කරලා පාර්ලිමේන්තුව 1987 අංක 42 කියන නීතිය සම්මත කළා. Provincial Council Act, 1987 අංක 42 දරන පළාත් සභා පනත. එහි 37 වන වගන්තියේ අන්තර්කාලීන විධිවිධාන ඇතුළත් කරලා තියෙනවා. ඒ අන්තර් කාලින විධි විධාන

[සභාවේ ඝෝෂා]

ඔබතුමන්ලාට උත්තර දෙන්න බැරි හින්දා කථා කරන දේ නවත්තවන්න හදන්න එපා. නොතේරෙනවා නම් මෝඩයෝ වගේ කෑගහන්නේ නැතිව -

[සභාවේ ඝෝෂා]

පස්සේ උත්තර දෙන්න. මට පස්සේ කථා කරන එක්කෙනාට කියන්න උත්තර දෙන්න කියලා. නිකන් සද්ද කරන්න එපා. සද්ද කරන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කළබල වෙන්න එපා ගරු මන්ත්‍රීතුමා. කථාව කරගෙන යන්න.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

1987 අංක 42 කියන පනතේ 37 වන වගන්තියේ තියෙනවා, අන්තර් කාලීන විධිවිධාන. ගරු ඇමතිතුමා කථා කරනවා ඇති ඔබතුමාට උත්තර දෙන්න පුළුවන්. ඒ අන්තර් කාලීන විධිවිධාන සම්මත කළේ, මීට අවුරුදු විසි හයකට ඉස්සෙල්ලා. ඒ අන්තර් කාලීන විධිවිධානවලින් කියනවා, අතිගරු ජනාධිපතිතුමාට අවශ්‍ය නම් පළාත් දෙකක් හෝ තුනක් ඒකාබද්ධ කරන්නට ප්‍රකාශයක් කළ හැක. ඒ ප්‍රකාශය කිරීමත් සමඟ ඒ පළාත් දෙක හෝ තුන ඒකාබද්ධ වනු ඇත. ඉන් පසුව ජනාධිපතිවරයාට ඒ ඒකාබද්ධ වූ පළාත් සභා දෙක, ඒ එකාබද්ධ වූ ඒකකය සඳහා ඡන්දය පැවැත්වීමෙන් පසුව නැවත ඡන්ද පැවැත්විය යුතුය. ඒකාබද්ධ කළ එක් එක් පළාත තුළ ඔවුන්ගේ කැමැත්ත විමසීමට කාරණා දෙකකින් එකක් සම්බන්ධය. ඔවුන් ඒකාබද්ධ කළ, මේ පළාත් සභාවේ තවදුරටත් රැදී සිටින්නට කැමතිද? එසේ නැත්නම් එයින් ඉවත් වන්නට ඔවුන්ට අවශ්‍ය වේද? යන කාරණාව පිළිබඳව. එම ඡන්ද විමසීමේ දී ඒ පළාත් සභාව, අපි තවදුරටත් මේ පරිපාලන ඒකකයේ රැදී සිටින්නට අකැමතිය. අපි මේ ඒකකයෙන් නිදහස්වන්නට ඕනෑය කියලා ඡන්දෙයේ දී ප්‍රකාශ කළොත් එදා වනකොට අර ඒකාබද්ධ කරපු ඒකකය අවසන් වෙනවා.

දැන් මේ ප්‍රතිපාදන පාවිච්චි කරලා තමයි උතුර සහ නැගෙනහිර කියන පළාත් දෙක ඒකාබද්ධ කළේ. ඒකාබද්ධ කරලා ඒකේ ඡන්දය පාවිච්චි කරන්න එනකොට කරගන්න බැරි හින්දා හදිසි අවස්ථා නීතිය යටතේ විටින් විට අවුරුද්දෙන් අවුරුද්ද ඒක කල් දැම්මා. 2006 වර්ෂයේ දී ඒ ඡන්දය පවත්වන්න පුළුවන් කමක් තිබුණේ නැහැ. 2006 වර්ෂයේ දී පුරවැසියන් කිහිපදෙනෙක් ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා මේ විධිවිධාන අභියෝගයට ලක් කළා. ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රකාශ කළා, ඒ තීරණය වැරදි සහගතය. ඒ නිසා එය ඒකාබද්ධ කිරීම වලංගු නොවේය කියලා. එහෙනම් එතැනින් පස්සේ ගරු සභාපතිතුමනි, අද වන තුරු පාර්ලිමේන්තුව කිසිම නීතියක් සම්මත කරලා නැහැ. මේ රටේ පළාත් දෙකක් හෝ තුනක් ඒකාබද්ධ කරලා එක පරිපාලන ඒකකයක් හැටියට එකතු කරන්නට කිසිම නීතියක් අද දක්වා පාර්ලිමේන්තුව මගින් සම්මත කරලා නැහැ. තියෙනවා නම් තියෙන්නේ, මම කියපු 1987 අංක 42 තියෙන අන්තර් කාලීන විධිවිධාන පමණයි. අන්තර් කාලීන විධිවිධාන අවුරුදු 26 කට පස්සේ ක්‍රියාත්මක කරන්න කාටවත් බැහැ. ඒ නිසා ගරු සභාපතිතුමනි, අතිගරු ජනාධිපතිතුමාට අද අවශ්‍ය වුණා පළාත් දෙකක් හෝ තුනක් ඒකාබද්ධ කරන්නට පුළුවන් නීතියක් මේ රටේ ක්‍රියාත්මක වෙන්නේ නැහැ. එහෙම නම් අවශ්‍ය නොවන සංශෝධනයක්, එහෙම නීතියක් අද ජනාධිපතිතුමාට අවශ්‍ය වුණත් එහෙම නීතියක් අද මේ රටේ ක්‍රියාත්මක වෙන්නේ නැහැ. පළාත් දෙකක් හෝ තුනක් ඒකාබද්ධ කරන්නට ප්‍රකාශයක් කරන්නට. එහෙනම් අවශ්‍ය නැති සංශෝධනයක් ඇති කරන්නට අවශ්‍යයයි කියලා මේ රජය අද මහා විශාල සාකච්ඡාවක් සමාජගත කරලා තියෙනවා. නැති යකෙක්ව ඉන්නවාය කියලා තොවිල් නටනවා.

[සභාවේ ඝෝෂා]

ඇහුන්කන් දීලා මොකක් හරි ඉගෙන ගන්න බලන්න. නැති යකෙක් පෙන්නලා. නැති භූතයෙක් පෙන්නලා. මේ භූතයා එලවන්නට තොවිල් නටනවා. තොවිල් නටන කොට අපිත් තොවිලේ දිහා බලා ගෙන ඉන්නවා. අපට නොදැනී අපේ බඩගොස්තරයට වදිනවා. හැබැයි, අපි තොවිලේ බලා ගෙන නටන තොවිලේ දිහා බලා ගෙන, නැති යකා එළවන කන් උඩ පැන පැන මෙතන කෑගහනවා.

**ගරු මෙරිල් පේරේරා**
Hon. Meril Perera

එහෙමයි ස්වාමිනි.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

කාලේ කනවා.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

දෙවැනි කාරණාව. මේ දෙවැනි යෝජනාව ඉදිරිපත් කරන්නේ.

[සභාවේ ඝෝෂා]

උත්තර දී ගන්න බැරි වුණාම කෑ ගහගන්න එපා. මහා ඇමතිතුමා උත්තර දෙයි. අපි බලමු -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බාධා කිරීම් කරන්න එපා එතුමාට. කරුණාකර නිශ්ශබ්දවන්න.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

[සභාවේ ඝෝෂා]

දෙවන කාරණාව ගරු සභාපතිතුමනි, දෙවන කාරණාව තමයි මේ පළාත් සභා පිහිටවපු ඒ හා සම්බන්ධ විධිවිධාන, ව්‍යවස්ථාවේ 17 (ඒ) කියන පරිච්ඡේදයේ තියෙන විධිවිධාන හෝ එයට අදාළ පළාත් සභාවල බලතල සඳහන් කෙරෙන නමවෙනි ලැයිස්තුවේ තියෙන විධිවිධාන හෝ වෙනස් කරනවා නම්, ඒ සඳහා ලංකාවේ තිබෙන සියලු ම පළාත් සභාවල අනුමැතිය ලබා ගත යුතුය. ඒ වගේ විධිවිධානයක් තිබුණොත්, එක පළාත් සභාවක් හෝ ඒකට විරුද්ධ වුණොත් එය සංශෝධනය කළ නොහැක. ඒ නිසා සියලු පළාත් සභාවල අනුමැතිය ලබා ගැනීම වෙනුවට බහුතරයක් පළාත් සභාවල අනුමැතිය ලබා ගෙන එවැනි වෙනස් කමක් කිරීමට අවශ්‍ය ආකාරයට මේ සංශෝධනය ගෙන එන්නටය කියලා මේ යෝජනාව කරන්නේ. මම හිතන්නේ නීතිය ගැන අවබෝධයක් තියෙන කෙනෙක් නම් මේ වගේ යෝජනාවක් ඉදිරිපත් කරන්නට ඉස්සරහට එන්නේ නැහැ. මොකද ?

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

පොඩ්ඩක් ඉන්න. නොදන්න දෙයක් ඉගෙන ගන්න බලන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

සද්ද දාන්න එපා. සද්ද දාන්න එපා. ඔය පුස් වෙඩිලි ගේන්න එපා.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ව්‍යවස්ථාවේ 154 උ 2 න් කියනවා.

[සභාවේ ඝෝෂා]

[ ගරු ශ්‍රීනාත් ම. පෙරේරා ]

කියන්න දෙයක් නැති වුණාම කෑ ගහන්නේ. එච්චරයි දන්නේ.

[සභාවේ ඝෝෂා]

වෙන දෙයක් දන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා එතුමාට බාධා කිරීම් කරන්න එපා. නිකම් විහිළුවට ගන්න එපා. රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය හූ කියන්න එපා.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

154 උ 2 කියන විධානයෙන් කියනවා, මේ 17 (ඒ) ඡේදයේ තියෙන විධිවිධාන සහ හෝ 9 වන ලැයිස්තුවේ තිබෙන කරුණු වෙනස් කරන්න ක්‍රම වේද දෙකක් දීලා තියෙනවා. එකක් තමයි සියලු පළාත් සභාවල අනුමැතිය ලබා ගෙන සුළුතර ඡන්දයකින් ඒක වෙනස් කළ හැකිය. ඒක විතරක් නොවෙයි. තවත් ක්‍රමයක් යෝජනා කරලා තියෙනවා. ඒ ක්‍රමය ගැන කිසි කෙනෙක් මේ සභාවේ කථා කළේ නැහැ. ඒ දෙවන ක්‍රමයෙන් කියන්නේ, පළාත් සභා කිසිවක අනුමැතිය නොලැබුණත්, පාර්ලිමේන්තුවේ 2/3 ක ඡන්දය ලැබෙනවා නම්, ඔය කියන පරිච්ඡේදයේ තියෙන ඕනෑම කාරණාවක් සහ හෝ 9 වන ලැයිස්තුවේ තියෙන ඕනෑම කාරණාවක් සංශෝධනය කළ හැකිය කියලා කියනවා, 82 වන ව්‍යවස්ථාව යටතේ. 82 වන ව්‍යවස්ථාවෙන් කියන්නේ, මන්ත්‍රීවරු 152 දෙනෙක් ඡන්දය දෙනවා නම්, සියලුම පළාත් සභා ඒකට විරුද්ධ වුණත්, එය සංශෝධනය කළ හැකිය කියන එකයි. එහෙනම් 152 දෙනෙක් - මේ පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරු කියන්නේ, මහජනතාවගේ බලාපොරොත්තු වෙනුවෙන් පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරු. මේ මන්ත්‍රීවරු 152 ක්. 225 ක් නොවෙයි. 152 ක් කල්පනා කරනවා නම් මේ සංශෝධනය කළ යුතුයි කියලා, ලංකාවේ තියෙන බස්නාහිර පළාත් සභාව ඇතුළුව සියලු පළාත් සභා ඒකට ඒකච්ඡන්දයෙන් විරුද්ධ වුණත් ඒක වෙනස් කිරීමේ අයිතිය, හැකියාව, නීතිමය බලය ලංකාවේ පාර්ලිමේන්තුවට තියෙනවා. එහෙනම් මේ අවශ්‍ය නැති, නැති යකෙක්ව පෙන්නලා මේ රටේ ජනතාව මුලා කරලා, මේ රටේ ජනතාව මුහුණ දෙන විවිධ වූ ප්‍රශ්න යටපත් කරලා දාලා, මිනිසුන්ගේ මනසට මේ නැති යකෙක්ව පෙන්නලා, අවශ්‍ය නැති තොවිලයක් නටලා ඒ දිහාවට මේ ආණ්ඩුව සූක්ෂමව යොමු කරන ක්‍රියාවලියක්, ඒ පැත්තට ඔවුන්ගේ මනස යොමු කරලා, ඒ මඟින් ජනතාව මුහුණදෙන ප්‍රශ්න යටපත් කරලා, නැති කරලා, විනාශ කරලා දමන ක්‍රියාවලියක මේ ඉන්නේ. ඒ විතරක් නොවේ ගරු සභාපතිතුමනි, මම ඔබතුමාගේ අවධානයට යොමු කරනවා, ව්‍යවස්ථාවේ 154 (ඕ) කියන විධානයට. 154 (ඕ). අපි කියනවා, උතුරට, නැගෙනහිරට බලය දුන්නොත්, පළාත් සභාවලට බලය දුන්නොත් මේ රටේ - මට මිනිත්තු හතරක්, පහක් දෙන්න ගරු සභාපතිතුමනි. මිනිත්තු හතරක්. 154 (ඕ) කියන විධානයෙන් කියනවා, යම් කිසි හෝ පළාත් සභා - කථා කරන හැමෝම කියනවා, උතුරේ පළාත් සභාව අපට පාලනය කර ගන්න බැරි වෙලා, එක එක විවිධාකාරයේ තත්ත්වයන් ඇති කරයි කියලා. ඒක කරන්න බැරි දෙයක් ගරු සභාපතිතුමනි, 154 (ඕ) කියන විධානයෙන් කියනවා - පොඩ්ඩක් ඉන්න කෝ කථා කරන්න දෙන්න කෝ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර බාධා කිරීම් කරන්න එපා. විපක්ෂයේ අවසන් කථාව. ඒ නිසා බාධා කිරීම් කරන්න එපා. මෙතුමා තව විනාඩි කිහිපයයි ගන්නේ. ඔබතුමාට කාලය දෙන්නම් කථා කරන්න.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

154 (ඕ) එකෙන් කියනවා, යම්කිසි පළාත් සභාවක පරිපාලනය බිඳ වැටිලා තියෙනවා කියලා ඒ පළාතේ ආණ්ඩුකාරවරයා, ජනාධිපතිවරයාට වාර්තා කළ හොත් හෝ වෙනත් කිසියම් ආකාරයකින් හෝ ජනාධිපතිතුමා යම් කිසි පළාතක පරිපාලනය ඇණහිටලා තියෙනවා කියලා නිගමනයකට ආවොත් එතුමාට බලය දීලා තියෙනවා, මේ ව්‍යවස්ථාව යටතේ පළාතේ පරිපාලනය එක්කෝ ආණ්ඩුකාරවරයා වෙත පවරන්න. එහෙම නැත්නම් තමන් තීන්දු කරන මණ්ඩලයක් වෙත පවරන්න. එහෙමත් නැත්නම් තමන් යටතට පවරා ගන්න. තමන් කියන්නේ ගරු ජනාධිපතිවරයා වෙත පවරා ගන්න. එහෙමත් නැත්නම් පළාත් සභාවේ බලතල පාර්ලිමේන්තුවට පුළුවන් පාර්ලිමේන්තුව යටතට ගන්න. එහෙම නැත්නම් වෙනත් ආයතනයකට පවරලා දෙන්න. එහෙනම් මේ විවිධ පළාත්වල ඉන්න අයට හිතෙන හිතෙන විධියට නාඩගම් නටන්න පුළුවන් ක්‍රමයක් මේ ව්‍යවස්ථාව යටතේ පුළුවන් කමක් නැහැ. යම්කිසි පළාත් සභාවක් රෙගුලාසිවලට විරුද්ධව රටේ ඒකීයභාවයට විරුද්ධව, රටේ නීතියට විරුද්ධව පියවර ගන්නවා නම්, ඒක පාලනය කරන්න අතිගරු ජනාධිපතිවරයාට සම්පූර්ණ බලතල -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා කථාව කෙටි කළොත් හොඳයි.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

මේ ව්‍යවස්ථාව යටතේ තියෙනවා. මම අවසාන වශයෙන් කියනවා ගරු සභාපතිතුමනි, මේ රටේ පවතින නීතිය යටතේ පළාත් සභාවකට පාර්ලිමේන්තුව ඉක්මවා යාමේ අයිතියක්, බලයක් නැහැ. නීති හැදීමේ සහ පාලනය කිරීමේ බලය තියෙන්නේ පාර්ලිමේන්තුවටයි. එහෙනම් මම හිතන්නේ, මේක නැති යකෙක්ව පෙන්නලා, තොවිලේ නටනවා. අපි තොවිලේ දිහා

බලන් ඉන්නවා. අපේ පොකැට්ටුවට හතර වටින් ආණ්ඩුව ගහනවා. මෙන්න මේ ක්‍රම වේදය තමයි අද පවතින්නේ. අපේ ගරු මහ ඇමතිතුමා මේ අවසාන වශයෙන් කියලා තියෙන තුන්වන කාරණාව හැටියට මේ බලතල අඩුකරන අතර, මේ පළාත් සභාවේ බලතල ශක්තිමත් කරන්නට ඕනෑය කියලා. මට නම් තේරෙන්නේ නැහැ ගරු සභාපතිතුමනි. ගරු මහ ඇමතිතුමා මනුෂයෙකුගේ අත් දෙක කඩලා දැම්මා. කකුල් දෙක ගලවල දැම්මා. ඔළුවට ඇණ ගහලා ඉවරවෙලා මේ යකාව තවත් අපි ශක්තිමත්මත් කරමු කියලා මේ සභාවට යෝජනා කරන්නේ කොහොමද කියන එක මට තාම වටහා ගන්න බැරි වෙලා තියෙන කාරණාවක්. ඒ නිසා මේ වගේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා -

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

මේ රටේ ජනතාව විහිළුවට ලක් කරන්නේ නැතුව, මේ විදියට මේ රටේ ජනතාවට මේ මිනිස්සුන්ට වංචා කරන්නේ නැතිව, මුලා කරන්නේ නැතිව ඇත්ත ඇති හැටියෙන් අඩු ගාණේ අද ඉඳලාවත් කටයුතු කරන්න ඉගෙන ගන්න කියලා මේ ආණ්ඩුවට නැවත වාරයක් කියමින් මේ ලබා දුන්නු අවස්ථාව ගැන ඔබතුමාට ස්තුති කරමින් මාගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට අවස්ථාව.

[ අ.භා. 04.34 ]

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

ගරු සභාපතිතුමනි, ආකිමිඩීස් කියලා විද්‍යාඥයෙක් හිටියා. මම නම් හිතන්නේ, අපි පහේ, හයේ පන්තිවලත් ඉගෙන ගෙන තියෙනවා. එතුමා වතුර බාල්දියක නාමින් සිටියදී හොයා ගත්තා, වතුර බාල්දියක බැස්සහම ඒ හා සමාන ප්‍රමාණයක ජලය වතුර බාල්දියෙන් පිටවෙනවාය කියන නියමය. මේක සොයා ගැනීම නිසා කොතරම් ආකිමිඩීස් සන්තෝෂ වුවාද කිවහොත්, ඔහු ඇඳුම් නැතිව සිටි බව ඔහුට අමතක වුණා. එසේ ඇඳුම් නැතිව ඔහු මහ පාරේ දුවමින් යුරේකා, යුරේකා මම සොයා ගතිමි, මම සොයා ගතිමි යනුවෙන් කෑ ගසා මං මාවත දිගේ දුවන කොට මිනිස්සු කිව්වා විද්‍යාඥතුමනි, ඔබතුමා ඇඳුම් නැතිවයි ගමන් කරන්නේ කියලා.

මේ කථාව ඇයි මෙතැනට ගැළපෙන්නේ කියන එක තමයි මම මේ කියන්න යන්නේ. අධ්‍යාපන උසස් පෙළ විභාගයට ඉගෙන ගන්නා, එහෙම නැත්නම් සාමාන්‍ය පෙළ ඉගෙන ගන්නා දරුවෝ පවා අද මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කියවල තියෙනවා උගත් මන්ත්‍රීතුමනි. ඒ නිසා මේ මන්ත්‍රීවරුන්ට ඔබතුමා කිව්වා වූ ඔය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ වගන්ති නැවත ඉගෙන ගන්න කිසිම අවශ්‍යතාවයක් නැහැයි කියන එකයි අපේ මතය. ඒ නිසා මගේ විශ්වාසය නම් මෙතුමා උගත් ජනාධිපති නීතිඥවරයෙක් හැටියට, අපේ ගුරුතුමෙක් හැටියට ඔබතුමාගේ වටිනා කාලය විනාඩි 15 ක්, 20 ක් අපතේ යැව්වාය කියන එකයි අපි විශ්වාස කරන්නේ. එහෙම නම් ඔබතුමාට යුතුකමක් තිබුණා, විපක්ෂ නායකතුමාට කථා කරලා පළමුවැනි කථාව හැටියට ඔබතුමාගේ කථාව කරලා, මේ විවාදයෙන් අපට කිසිම ප්‍රයෝජනයක් නැහැ. අපි නැගිට්ලා යනවා කියලා, මේ සභාවේ වටිනා කාලය ඉතුරු කරලා දෙන්න. ඔබතුමා -

[සභාවේ ඝෝෂා]

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

අපි කිව්වා -

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

ඔයා කිව්වට අපි පිළිගන්නේ නැහැ. ඒ වගේ දැනුවත්, උගත් ජනාධිපති නීතිඥවරයෙක් අපට කිව්වා නම් - අපට ඔය ජෝර්ජ් පෙරේරා කියන ඒවා පිළි අරගෙන යන්න බැහැ. එහෙම වැදගත් කෙනෙක් කිව්වා නම්, අපි හිස මුදුනින් පිළි අරගෙන, උදේ පාන්දරම ජන්දේ තියලා මේක සම්මත කරගෙන, අපි ගෙවල්වලට ගිහිල්ලා දැන් මොනවහරි වෙන වැඩක් කරගෙන ඉන්නවා. අපේ කාලය පමණයි මේකෙන් නාස්ති වුණේ. මෙතුමා කියපු කාරණා සියල්ල ඇත්ත. මේ සියළුම දේවල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තියෙනවා. නමුත් මතක තබා ගන්න, මේ 2/3 බලය හැම ආණ්ඩුවකටම ලබා ගන්න පුළුවන්කමක් නැහැ ගරු සභාපතිතුමනි. ජේ. ආර්. ජයවර්ධන ගරු ජනාධිපතිතුමා මේ ව්‍යවස්ථාව සම්පාදනය කළේ කිසිම පක්ෂයකට 2/3 බලයක් ලබා ගන්න බැරි වෙයි කියන උපකල්පනය මතයි. නමුත් මේ රට පාලනය කරපු විශිෂ්ට රාජ්‍ය තාන්ත්‍රිකයෙක් හැටියට පාර්ලිමේන්තුව තුළ තිබෙන්නා වූ බලය 2/3 ක් නොවේ, 5/6 ක් දක්වා වර්ධනය කරගන්න මහින්ද රාජපක්ෂ මැතිතුමා සමත් වෙලා තිබෙනවා.

[සභාවේ ඝෝෂා]

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

සල්ලි දීලා. පගාව දීලා. කෝටි ගණන් දීලා.

[සභාවේ ඝෝෂා]

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

දැන් ගරු සභාපතිතුමනි, මෙතුමා කියනවා. ගරු සභාපතිතුමනි මොළය වැඩි නිසා ම හිසේ කෙස් අඩු අපේ ගරු මන්ත්‍රීතුමා කියනවා පගාව දීලා, වරප්‍රසාද දීලා -

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

වරදාන දීලා

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

වරදාන දීලා, තව තව දේවල් දීලා තමයි මේ අය ගත්තේ කියලා. තමන්ගේ පක්ෂයේ අවුරුදු ගණනක් හිටපු මන්ත්‍රීවරු, හොරු, පගාකාරයෝ, වංචාකාරයෝ කියලා කියන්නේ, මේ මන්ත්‍රීතුමන්ලා.

[සභාවේ ඝෝෂා]

**ගරු ෴. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

පගාව ගත්තා. සියල්ලම ගත්තා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

සංවිධායකකමත් ගත්තා.

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

ගරු සභාපතිතුමනි, ඔය පබා කියන නිළිය යන එන මං නැතිව ගම්පහ දිස්ත්‍රික්කයට ආපු වෙලාවේ කාර් එකේ දාගෙන ගිහිල්ලා, ඡන්ද අරන් දීලා පාර්ලිමේන්තුවට ඇරියේ මේ කෙස් අඩු මන්ත්‍රීතුමා කියන එක මේ වෙලාවේ සඳහන් කරන්න කැමතියි. තවමත් ගරු සභාපතිතුමනි, පබා ජා - ඇළ පැත්තෙන් යන කොට මේ මන්ත්‍රීතුමාගේ ගෙදරට ඇවිල්ලා තේ බිලා තමයි යන්නේ. එහෙම කරපු පබාලා එහෙම හිටපු එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු තමුන්ගේ පක්ෂයේ ඉන්න කාලේ, බොහොම හොඳයි, සටන්කාමියි, හොඳ නායකයෝ. හෙට අනිද්දා දයාසිරි ජයසේකර ආවහම ඒ මනුෂයත් පගාකාරයෙක්, හොරෙක්, වංචනිකයෙක් කියලා මේ මිනිස්සු කියාවි. මේවා ගිහිල්ලා කියන්න පොඩි එවුන්ට. මේවා ගිහිල්ලා කියන්න මොකුත් තේරෙන්නේ නැති අයට. තමන්ගේ පක්ෂයේ බලය රැක ගන්න බැරි මිනිස්සු. තමන්ගේ පක්ෂයේ මන්ත්‍රීවරු රැක ගන්න බැරි මිනිස්සු. එක්සත් ජාතික පක්ෂය කියන මේ ගිලෙන නැව දාලා යන කොට ඒ මිනිස්සු හොරු, පගාකාරයෝ කියලා හිත හදා ගන්න සූදානම් වෙන්න එපා. අපි කියනවා මේ මන්ත්‍රීතුමන්ලාට දැන්වත් දයාසිරිලා අපේ පැත්තට එන විධියට වැඩ කරන්න එපා. අපට ඕනෑ කරනවා ශක්තිමත් එක්සත් ජාතික පක්ෂයක්. විරුද්ධ පක්ෂයක්. අපට මහා වදයක් මේ යූ.එන්.පී එකෙන් එන කණ්ඩායම.

[සභාවේ ඝෝෂා]

ඇත්තම කියනවා නම් මේක ඇණයක්. අපේ බස් එකේ යූ.එන්.පී. කාරයෝ පිරිලා. දැන් foot board එකෙත් යන්න බැරි තත්වයකට ඇවිල්ලා තියෙන්නේ. ඒ නිසා ඔය ආවා හොඳටම ඇති. කරුණාකරලා ඉන්න අය තියා ගන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ධනසිරි ගැනත් කථා කරන්න.

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

ගරු සභාපතිතුමනි, මට මේ මන්ත්‍රීතුමා දැක්කහම මතක් වෙන්නේ මන්ද බුද්ධික ළමයි ඉන්නේ. අන්න, ඒ ළමයි වාගේ තමයි. නිකන් බාගෙට තමයි කියන්නේ. මෙච්චර හොඳ විවාදයක් යන වෙලාවේ පොඩි එකාගේ ලියුම වගේ කොළයක් බලාගෙන මොනවද කියෝගෙන කියෝගෙන ගියා. ගරු විපක්ෂ නායකතුමනි, අර ශිරාල් ලක්තිලකලා කෝ? මේ සභාවේ ලස්සනට වාද විවාද කරපු අන්න ඒ මනුස්සයගේ අත පය ගැලෙව්වා. ඒ මනුස්සයාගේ කඳ ගැලෙව්වා. ඒ මනුස්සයාගේ කකුල් දෙක ගැලෙව්වා. අන්තිමට සපත්තු දෙකත් ගැලෙව්වා.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමා මේ විවාදයට සම්බන්ධ වෙන්න. ඔය අනවශ්‍ය ඒවා ඕනේ නැහැ. ඔබ මේ මාතෘකාවට, විවාදයට සම්බන්ධ වෙන්න. ඔබතුමා මේ යෝජනාව සම්බන්ධව කථා කරන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

ගරු සභාපතිතුමනි, මම මේ කරුණු කාරණා කිව්වේ, අද දවස පුරාම මුළු සභාවම වෙහෙස මහන්සි වෙලා හිටියේ. මුළු සභාවම බොහෝ ම කාන්සියෙන් මහන්සියෙන් හිටියේ. ඒ නිසා ඒ අයගේ මානසිකත්වය ගොඩනගන්නයි මම මේ කථාවල් කළේ. ඒ නිසා මට සමාවෙන්න. ගරු සභාපතිතුමනි, මේ යෝජනාවේ කොතනකවත් පොලිස් බලතල ගැන සඳහන් වෙලා නැහැ.

මේ යෝජනාවේ කොතනකවත් ඉඩම් බලතල ගැන සඳහන් වෙලා නැහැ. මේ යෝජනාවේ තියෙන කරුණු කාරණා ගැන පමණයි අපි මේ සභාවේදී කථා කළ යුත්තේ. නමුත් අපේ මන්ත්‍රීවරු හුඟ දෙනෙක් මේ යෝජනාව පටලවාගෙන, යෝජනාවේ නැති කරුණු සම්බන්ධයෙන් කරුණු දක්වන්න ගිහිල්ලා තමයි පටලවා ගත්තේ. අපේ උගත් ජනාධිපති නීතිඥ ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ මේ පළාත් සභාවේ තිබෙන බලතල සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට තිබෙන්නා වූ බලය පිළිබඳ අපි කිසි කෙනෙකුට විවාදයක් නැහැ. නමුත් මම කියාගෙන ආවේ මුලදීම මේ ප්‍රශ්නය මතු වුණේ, විහිළු තහළු මතු වුණේ කොහොමද මේ 2/3 හදා ගත්තේ කියලා කියපු කාරණාව තුළයි. ගරු සභාපතිතුමා මාර්ගයෙන් මම ඔබතුමාගෙන් අහන්න කැමතියි. 2/3 ක් ලබා ගන්න පුළුවන් ආණ්ඩුවක් ඉදිරි කාලයකදි බිහි වෙයි ද කියන එකත් බොහෝ ම අවිනිශ්චිතයි මේ රටේ අද පවතින දේශපාලන වාතාවරණය අනුව. ඒ නිසා 2/3 ක් නැති ආණ්ඩුවකට මේ බලතල වෙනස් කිරීම සඳහා විශාල උත්සාහයක් දරන්න, පරිශ්‍රමයක් දරන්න වෙනවා. ඒ නිසා ඒ අනතුර වෙන්නට පෙර දැකලා තමයි රජයක් හැටියට අද මේ යෝජනාව ඉදිරිපත් කරලා තියෙන්නේ. එහෙම නැතුව මහා ඇමතිතුමාට වෙන අමාරුවකට ඉදිරිපත් කළා නොවෙයි, මේ වටිනා කාලය නැති කරන්න. මේ යෝජනා දෙක කැබිනට් මණ්ඩලයේ අනුමත වුණා. මේ යෝජනා දෙක ආණ්ඩු පක්ෂ කාණ්ඩායම අනුමත කෙරුවා. මේ යෝජනා දෙක ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මධ්‍යම කාරක සභාව අනුමත කළා. ඒ අනුමත කළ යෝජනා දෙක තමයි මේ මහා ඇමතිතුමා අද මේ සභාවට ඉදිරිපත් කරන්නේ. එහෙම නැතිව මෙය එතුමාගේ පෞද්ගලික න්‍යාය පත්‍රයක් නොවෙයි. මේ යෝජනා දෙක සියළු දෙනාගේම ඒකමතික යෝජනාවක් විධියට සම්මත කර ගැනීමේ අවශ්‍යතාවය තමයි අද අපි මේ අවස්ථාවේදී දකින්නේ.

අපි ස්තුතිවන්ත වෙනවා, යම් අන්තවාදී මත දරන පාර්ශවයන් පවා යම් ප්‍රමාණයකට මේ යෝජනාවට එකඟත්වය පළ කර තිබෙනවා. (බාධා කිරීමක්) දැන් නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා හෙලේනා ජයවර්ධන කිව්වා. එලීනා රූපසිංහ කියලා මම නේ ඒක කියලා දුන්නේ.

පොදු ජන එක්සත් පෙරමුණේ ආණ්ඩුව ඉතාම සංකීර්ණ (බාධා කිරීමක්) පොදුජන එක්සත් පෙරමුණු සන්ධානය කියලා කිව්වේ වැරැදිලා. පොඩ්ඩක් පැටලුනා. මොකද, පක්ෂ රාශියක් එක්ක සන්ධානගත වූ ආණ්ඩුවක් නේ? මේ වාගේ සංකීර්ණ සන්ධානයක්, විවිධ මත දරන දේශපාලන නායකයන්ගෙන් සමන්විත වූ සන්ධානයක්, ආණ්ඩුවක් මේ රටේ මීට පෙර තිබුණේම නැහැ. අපේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා තමයි මෙම විවිධ මත දරන කණ්ඩායම් එකතු කරලා එක්සත් ජනතා නිදහස් සන්ධානය බිහි කළේ. මීට කලින් D.S. සේනානායක හිටපු අගමැතිතුමත් පළමුවැනි පාර්ලිමේන්තුව පිහිටුවීමේදී ආණ්ඩු පක්ෂය විධියට විවිධ මත දරන පක්ෂ සහ විවිධ ජාතීන්ට අයත් පක්ෂ එකතු කරගෙන බිහි කරපු ආණ්ඩුවටත් වඩා ඉතාමත් සංකීර්ණ ආණ්ඩුවක් පිහිටුවාගෙන තමයි වර්තමාන ජනාධිපතිතුමා මේ ආණ්ඩුව අරගෙන යන්නේ. එතුමා මේ සියල්ල සිදු කරනු ලබන්නේ ජාතික අවශ්‍යතාවයක් ඉටු කිරීමට අවශ්‍ය නිසයි. මේ කණ්ඩායම්, මේ වාමාංශික කොටස් හැමදාම පෙනී සිටියේ ජාතික සමගිය වෙනුවෙන්. අපේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා, රේණුක පෙරේරා ආණ්ඩු පක්ෂ සංවිධායකතුමා ඒ පිළිබඳව වැඩිදුරටත් අදහස් ඉදිරිපත් කළා. ඒ නිසා මේ මතවාදයන්, මේ කරුණු කාරණා සියල්ලම එක තැනකට අරන්, ඉදිරියට ගෙන යාමේ අවශ්‍යතාවය මත තමයි අද මෙවැනි යෝජනාවක් සභාවට ඉදිරිපත් කර සම්මත කර ගන්නට යන්නේ. මම පෞද්ගලිකවම පළාත් සභා ක්‍රමයට විරුද්ධයි. මම එහෙම කිව්වේ අවුරුදු 26 ක් තිස්සේ ලබපු අත්දැකීම් තුළ මෙහි සාර්ථක මෙන්ම අසාර්ථක තත්ත්වයන් තියෙන නිසයි.

අද කල්පනා කරලා බලන්න අම්පාරේ ජීවත් වන මනුස්සයා තමන්ගේ ප්‍රශ්නයක් විසඳා ගන්න ත්‍රිකුණාමලයට එන්න ඕනෑ. ඊළඟට අගලවත්ත, වලල්ලාවිට ඉන්න මනුස්සයා එපමණ දුර ඉඳන් කොළඹට එන්න ඕනෑ. කිළිනොච්චිය, මුලතිව්, ඉන්න මනුස්සයා යාපනයට යන්න ඕනෑ. ඉතින් බලන්න කොපමණ දුරක, වෙහෙසක් මේ මිනිස්සුන්ට දරන්න වෙනවාද කියලා. අද අපට බස්නාහිරට තිබෙන ආදායම් මාර්ග ඒ දුෂ්කර පළාත්වලට නැහැ. මෙම තත්ත්වය ගැන නැවත කල්පනා කර යම් විසඳුමක් කරා යා යුතුව තිබෙනවාද කියා අපි විමසා බැලිය යුතුයි. අන්න එතැනදී මහජන පක්ෂයේ අදහස, ජාතික නිදහස් පෙරමුණේ අදහස, ජාතික හෙළ උරුමය විතරක් නොවෙයි, වාමාංශික දේශපාලන පක්ෂවල වාගේම මේ සියළුදෙනාගේම අදහස් සැලකිල්ලට අරගෙන ද්‍රවිඩ, සිංහල යන සියලුම ජනතාවට එක විධියට සතුටු වෙන්න පුළුවන්, සියලුම ශ්‍රී ලාංකිකයන්ට ගැළපෙන විසඳුමක් කරා අප යා යුතු යැයි මා තරයේ කල්පනා කරනවා. ඒ අනුව මා විශ්වාස කරන්නේ අපේ බලය දිස්ත්‍රික්ක මට්ටමට විමධ්‍යගත කළ යුතු බවයි. මක් නිසා ද අද බස්නාහිර පළාත අරගෙන බලන්න. බස්නාහිර පළාතේ මහා ඇමතිතුමා ඉන්නේ ගම්පහ. සෞඛ්‍ය ඇමතිතුමා ඉන්නේ කළුතර. අපේ අනාගත මහා ඇමති උපාලි කොඩිකාර ඇමතිතුමා ඉන්නේ කොළඹ.

[සභාවේ සෝෂා]

ඇමතිවරු තිදෙනා දිස්ත්‍රික් තුනක. ඒ ඇමතිවරුන් පෘථග්ජන මිනිස්සු හැටියට තමන්ගේ දිස්ත්‍රික්කයට විශේෂත්වයක් දක්වනවා. එහෙම නොවනවා කියන්න බැහැ. ඒ නිසා මම නම් දකින්නේ, නුදුරු අනාගතයේ අපි සියලුදෙනා විශේෂයෙන්ම වගකීමක් තියෙන, අනාගත ආණ්ඩු පක්ෂය හැටියට ක්‍රියා කරන එක්සත් ජාතික පක්ෂයට යුතුකමක් තියනවා. මේ අවස්ථාවේ දී අපේ කමිටුවට සහභාගිවෙලා, අපේ රටට ගැළපෙන ව්‍යුහයක්, දිස්ත්‍රික්ක මට්ටමේ ව්‍යුහයක් යෝජනා කිරීම සඳහා අප සමඟ අත්වැල් බැඳ ගන්න කියන ආයාචනය කරමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන ආමාත්‍යතුමා විසින් රීති අත්හිටුවමින් ගෙනෙන ලද යෝජනාව පිළිබඳ විවාදය මෙයින් අවසන් වෙනවා. ඒ පිළිබඳ ගරු ප්‍රධාන අමාත්‍යතුමා පිළිතුරු කථාවක් කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මේ යෝජනාව පිළිබඳ සභාවේ බෙදීමක් තිබෙනවාද ?

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, මම හිතනවා මේ මන්ත්‍රීවරුන්ට තමන්ගේ හෘදය සාක්ෂියට අනුව ඡන්ද පාවිච්චි කරන්න අවශ්‍යයි කියලා එතුමන්ලා තීන්දුවකට ඇවිල්ලා තියෙනවා. මම හිතන්නේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පළමුව යෝජනාවට බෙදීමක් තිබෙනවාද ?

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, බෙදීමක් තිබෙනවා. අපි රහස් ඡන්දයක් ඉල්ලනවා. රහස් ඡන්දයක් ඉල්ලන්න අයිතියක් තිබෙනවා. මොකද ඒ මන්ත්‍රීවරුන්මයි අපට කිව්වේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමතිතුමා - මොකක්ද, ඔබතුමාගේ අදහස ?

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු සභාපතිතුමනි, හැමදාම ඡන්දය විමසපු ක්‍රමයක් තිබුණා. ඕකට ආයේ මෙහෙම එකක් ඕනෑ නැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

අපේ අයිතිවාසිකමක්. ඇයි අපට ඒක ඉල්ලන්න බැරිද ?

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

මේ සභාවේ කාලය අනවශ්‍ය ලෙස කා දමන වැඩක්. මොකද, ආයෙත් U.N.P. යේ ගොඩ වැඩි වෙනවාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඉල්ලන්න පුළුවන් ප්‍රශ්නයක් නැහැ.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

අපි ඉල්ලීමක් කරන්නේ. බෙදීමක් තිබෙනවා. රහස් ඡන්දයකට යන්න දෙන්න. මොකද, මේ මන්ත්‍රීවරු ගණනාවක් ඉන්නවා, රහස් ඡන්දයක් තිබ්බොත් මේකට ඡන්දේ දෙන්න බලාගෙන.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

බොරු කියන්න එපා. බොරු කියන්න එපා.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

සභාවේ කාලය නාස්ති කරන්න එපා.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, විරුද්ධ පක්ෂයේ නායකතුමා විසින් කරන ලද ඉල්ලීම, මම හිතන්නේ අපට අදාළ නැහැ. මොකද, එතුමාට එතුමාගේ පක්ෂයේ මන්ත්‍රීවරු නොමැති නිසා. ඒ අයට විරුද්ධව විනය කටයුතු කරගන්න ඕනෑ නිසා. එතුමා තමයි ඡන්දය ඉල්ලන්න හදන්නේ. ඒ නිසා අපේ පක්ෂයේ එහෙම ගැටළුවක් නැහැ. ඒ නිසා මේක අවශ්‍ය නැහැ කියලා යෝජනා කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බොහෝම ස්තුතියි. කරුණාකර, සීනුව නාද කරන්න.

***අනතුරුව, ප්‍රශ්නය විමසන ලදින් 61 (3) රීතිය යටතේ පළාත් සභාව පක්ෂව 60 යි, විරුද්ධව 16 යි, වැළකුණු 04 යි යනුවෙන් බෙදුණේය.***
*Accordingly, question put and the Council divided as per Rule No 61 (3), 60 for, 16 against and 04 decliners.*

# කල් තැබීම
# ADJOURNMENT

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*"දැන් මම මෙම සභාව කල් තබනවා."*

***ඊට අනුකූලව පළාත් සභාව ප.ව. 05.00 ට, 2013 ජූලි මස 23 වන දින පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***
*Sitting, accordingly adjourned at 05.00 p.m till 9.30 a.m. on 23.07.2013.*